RESPECT
WOMEN

# මූලෝපාය සාරාංශය

## සම්බන්ධතා කුසලතා ශක්තිමත් කිරීම

(Relationship skills strengthened)

UN WOMEN

World Health Organization

මූලෝපාය සාරාංශය

# සම්බන්ධතා කුසලතා ශක්තිමත් කිරීම

**මූලෝපායේ අරමුණ :** අන්තර් පුද්ගල සන්නිවේදනය, ගැටුම් කළමනාකරණය සහ පොදුවේ තීරණ ගැනීමේදී පිරිමින්ගේ, කාන්තාවන්ගේ සහ යුවලවල කුසලතා සංවර්ධනය කිරීම

## තාර්කිකත්වය

සම්බන්ධතා ගතිකයන් කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන් අවදානමක් මෙන්ම ආරක්ෂණ සාධකයක් ද විය හැකිය. සමීප සහකරු සම්බන්ධතාවලදී කාන්තාවන් ප්‍රචණ්ඩත්වයට ලක්වීමේ අවදානම වැඩිය.[1] අසමාන බල සම්බන්ධතා, පාලන චර්යාවන් හෝ එක් සහකරුවකු/කාරියක සම්බන්ධතාවලදී ප්‍රචණ්ඩත්වය පිළිගැනීම මගින් එය නිරූපණය වේ. අනෙක් පැත්තෙන්, යුවල අතර සන්නිවේදනය ශක්තිමත්, සහකරුවන්/කාරියන් දෙදෙනාම සමාන සමාජභාවී ආකල්ප බෙදාගන්නා සහ වියදම් ද ඇතුළුව කාරණා සම්බන්ධයෙන් සමාන මට්ටමින් තීරණ ගන්නා සම්බන්ධතාවලදී කාන්තාවන් සමීප සහකරු ප්‍රචණ්ඩත්වයට ගොදුරු වීමේ අවදානම අඩුය.[2] බොහෝ සංදර්භයන්හිදී නීතිමය ඥාතීන් සමග දුර්වල සම්බන්ධතා මගින් ප්‍රචණ්ඩත්වයේ අවදානම් ඇතිවිය හැකිය.[3]

බහු විවාහ සංදර්භයන් ඇතුළු යුවල සහ වෙනත් වැඩිහිටි පවුල් සාමාජිකයන් සමග එකම නිවසේ වැඩකිරීම සිදුවන අවස්ථාවන්හිදී ඔවුන් අතර බල අසමතුලිතබව හා සමාජභාවී අසමානතා ආමන්ත්‍රණය කිරීමෙන් සම්බන්ධතා ශක්තිමත් කිරීමේ අනගි අවස්ථාවක් ලැබේ.

මෙම මූලෝපාය මගින් විධිමත් මෙන්ම අවිධිමත් යුවල ආවරණය කරනු ලැබේ. අවිධිමත් සමීප සම්බන්ධතා වෙත ළඟාවීම අසීරු බව වටහා ගනු ලැබේ. එහෙත්, රහස්‍යභාවය සම්බන්ධ කාරණා සම්බන්ධ වන විට සහ කාන්තා අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට ඉවහල් වන නීතිමය ගිවිසුම් නොමැති විට ඒවා වඩා ප්‍රචණ්ඩ විය හැකි බව ද අවබෝධ කරගනු ලැබේ. පවුල් සහ නව යොවුන් පුද්ගලයන් (තාවකාලික සම්බන්ධතාවලදී ප්‍රචණ්ඩත්වය) සමග වැඩකිරීමේදී ඵලදායී එළඹුම් කෙරෙහි වැඩිදුර මගපෙන්වීම් සහිතව වැඩිහිටි සම්බන්ධතා කෙරෙහි එමගින් අවධානය යොමුකරනු ලැබේ. එය පහත දැක්වෙන මූලෝපායික සාරාංශයෙහි ඇතුළත් කර තිබේ: **RESPECT Strategy Summaries on Environments Made Safe and Child and Adolescent Abuse Prevented.**

## අවදානම් සහ ආරක්ෂක සාධක


පහත දැක්වෙන අවදානම් සාධක කෙරෙහි සහ කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සම්බන්ධ ආරක්ෂණ සාධක ප්‍රවර්ධය කිරීම කෙරෙහි මෙම මූලෝපාය මගින් අවධානය යොමුකරනු ලැබේ:

| මට්ටම | අවදානම් සාධක | ආරක්ෂණ සාධක |
|---|---|---|
| **පුද්ගල** | ප්‍රචණ්ඩත්වය සාමාන්‍ය හෝ පිළිගත හැකි දෙයක් ලෙස සලකන ආකල්ප හා භාවිතාවන් (කාන්තා සහ පිරිමි) | සමාජභාවී වශයෙන් සාධාරණ ආකල්ප සහ භාවිතාවන් (කාන්තා සහ පිරිමි) |
| | අඩු ස්වයං සඵලතාව සහ ස්වයං අභිමානය (කාන්තා) | ඉහළ ස්වයං සඵලතාව සහ ස්වයං අභිමානය (කාන්තා) |
| | ළමා වියේදී ප්‍රචණ්ඩත්වය සහ/හෝ පවුල් ප්‍රචණ්ඩත්වය සම්බන්ධ අත්දැකීම් ලැබීම (කාන්තා සහ පිරිමි) | ළමා වියේදී ප්‍රචණ්ඩ නොවන සන්නිවේදනය සහ ගැටුම් නිරාකරණය සම්බන්ධ අත්දැකීම් ලැබීම (කාන්තා සහ පිරිමි) |
| **අන්තර් පුද්ගල** | සමීප සම්බන්ධතාවල සහ නීතියෙන් ඥාති වූවන් සමග ඉහළ මට්ටමේ අසමානතාව | පොදු තීරණ ගැනීම සහ ගෘහ වගකීම් ඇතුළු සමාජභාවී සමානාත්මතාව ලක්ෂණයක් වන සමීප සහ පවුල් සම්බන්ධතා. |
| | දුර්වල සන්නිවේදනය, අකාර්යක්ෂම ගැටුම් නිරාකරණය සහ ගැටලු විසඳීමේ කුසලතා | ප්‍රචණ්ඩත්වය ඇතිකරන සාධක අවම කරන සම්බන්ධතා කුසලතා (ගැටුම් නිරාකරණය, සන්නිවේදනය) |
| **ප්‍රජාව** | පිරිමින්ගේ වරප්‍රසාදිත තත්වය ප්‍රවර්ධනය කරන හා කාන්තාවන්ගේ ස්වාධිපත්‍යය සීමාකරන හානිකර සමාජභාවී සම්මතයන් | අහිංසාව, විවිධත්වයට ගරු කිරීම සහ සමාජභාවී සමානාත්මතාවට උපකාරී වන සමාජ සම්මතයන් සහ කාන්තාවන් සවිබලගැන්වීම ප්‍රවර්ධනය කිරීම |
| | සම්බන්ධතාවලදී ආතතිය ඇතිකරන ඉහළ මට්ටමේ දරිද්‍රතාව සහ විරැකියාව | |

### වෙනස්වීමේ න්‍යාය

පහත දැක්වෙන රූපසටහන විසින් සරල කරන ලද වෙනස් කිරීමේ න්‍යායක් ඉදිරිපත් කරනු ලැබේ. සම්බන්ධතා ශක්තිමත් කරන සාක්ෂි මත පදනම් වූ මැදිහත්වීම් මගින් කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය අවම වීම තිරසර කළ හැකි ආකාරය එමගින් නිරූපණය කරනු ලැබේ. විශේෂිත වැඩසටහන් වෙනුවෙන් එය වැඩිදුර සංවර්ධනය කිරීම හා අනුරූප කරගැනීම අවශ්‍යය. මූලෝපායන් කීපයක් වෙන වෙනම භාවිතා කිරීමෙන් හා බහුවිධ ප්‍රවේශ ස්ථාන භාවිතා කිරීමෙන් බලපෑම උපරිම කළ හැකි බව සාක්ෂි මගින් නිරූපණය වේ.[4]

## R: සම්බන්ධතා කුසලතා ශක්තිමත් කිරීම



## මැදිහත්වීම් වර්ග

මෙම මූලෝපාය යටතේ වන මැදිහත්වීම්වල මූලික අරමුණ වන්නේ පිරිමින්ට සහ ගැහැණුන්ට වැදගත්සන්නිවේදන හා සාකච්ඡා කුසලතා ලබාදීමයි. තම සහකරුවන්/කාරියන් හා වෙනත් පවුල් සාමාජිකයන් (උදා: නැන්දම්මා) සමග සන්නිවේදනයේදී, ප්‍රචණ්ඩත්වය ඇතිකරන සාධක කළමනාකරණයේදී සහ සාධනීය අහිංසාවාදී විකල්ප සමග අනුරූප වීමේදී ඒවා අදාළ වේ. පහත දැක්වෙන වගුව මගින් RESPECT රාමුවෙහි දැක්වෙන මැදිහත්වීම් වර්ග දෙකක් නිරූපණය කරනු ලැබේ. එසේම, වර්තමාන සාක්ෂි පදනම[5] පිළිබඳ සාරාංශයක් සපයමින් ඒවා සඳහා උදාහරණ වැඩසටහන් දක්වනු ලැබේ.

යතුර

- ● **බලාපොරොත්තු සහගත**, <1 පරිණාමය විසින් ප්‍රචණ්ඩත්ව ප්‍රතිඵලවල සැලකියයුතු අඩුවීමක් පෙන්නුම් කරනු ලැබේ.
- ■ **වැඩිදුර සාක්ෂි අවශ්‍යය**, <1 පරිණාමය විසින් ප්‍රචණ්ඩත්වය සම්බන්ධ මධ්‍යකාලීන ප්‍රතිඵලවල වර්ධනයක් පෙන්නුම් කරයි.
- ◆ **ගැටලු සහගත** - පරිණාමය විසින් ප්‍රචණ්ඩත්වය අවම කිරීම සම්බන්ධයෙන් පෙන්නුම් කරන්නේ එකිනෙකට පරස්පර ප්‍රතිඵලය.
- □ **සාක්ෂි නොමැත** - මැදිහත්වීම තවමත් එතරම් බැරෑරුම් ලෙස පරිණාමය වී නැත.
- ▼ **අකාර්යක්ෂම**, <1 පරිණාමය විසින් ප්‍රචණ්ඩත්ව ප්‍රතිඵලවල අඩුවීමක් පෙන්නුම් කරනු නොලැබේ.
- H ලෝක බැංකුවේ ඉහළ ආදායම් රටවල් (HIC)
- L ලෝක බැංකුවේ පහළ හා මැදි ආදායම් රටවල් (LMIC)

| මැදිහත්වීම් වර්ගය | විස්තරය | කාර්යක්ෂමතාවේ සාක්ෂි | උදාහරණ වැඩසටහන් |
|---|---|---|---|
| **කාන්තාවන් සහ පිරිමින් සහභාගී වන, සමානාත්මතා ආකල්ප සහ සම්බන්ධතා ප්‍රවර්ධනය කරනු ලබන කණ්ඩායම් පාදක වැඩමුළු** | සහභාගීත්ව වැඩමුළු මාලාවක් මෙම වර්ගයේ මැදිහත්වීම්වලට අයත් වේ. එමගින් සෞඛ්‍ය සම්පන්න, අහිංසාවාදී සම්බන්ධතා සම්බන්ධ කුසලතා පිරිමින් සහ කාන්තාවන් වෙත ලබාදෙයි. එසේම, සම්බන්ධතාවන්හි සමාජභාවී බල අසමානතා සම්බන්ධයෙන් කටයුතු කරනු ලැබේ. මෙම මැදිහත්වීම් අවදානම් සාධක අවම කිරීමෙහිලා ද ප්‍රයෝජනවත් වේ. මත්පැන් අවභාවිතය හා අසාධාරණ තීරණ ගැනීම් සහ සම්බන්ධතා තුළ වඩා හොඳ සන්නිවේදන කුසලතා ආරක්ෂණ සාධක වර්ධනය කිරීම ද උදාහරණ වේ.[6]<br><br>මෙම මැදිහත්වීම් වයස් හා සමාජභාවී සම කණ්ඩායම් සමග හෝ සමග ඇතැම් විට පවුල් සාමාජිකයන් ද සම්බන්ධ කරගනිමින් මැනැවින් ක්‍රියාත්මක වේ. පිරිමි හෝ ගැහැණු බොහෝ විට තමන් හා සමාන්තර ලිංගික කණ්ඩායම් සමග සම්බන්ධ වෙති. මිශ්‍ර ලිංගික සැසි නිර්මාණය කරන ඇතැම් මැදිහත්වීම් මගින් යුවලවලට එක්විය හැකිය. මෙම මැදිහත්වීම් ප්‍රචණ්ඩත්වයේ ඉතිහාසය නොතකා සෑම අයෙකු සමගම කටයුතු කරයි. ග්‍රාමීය රුවන්ඩාවේ විවාහක යුවලවල සිට දකුණු අප්‍රිකාවේ නාගරික තරුණ පුද්ගලයන් දක්වා සංදර්භයන් ගණනාවක ඒවා භාවිතා කර තිබේ. | L LMIC රටවලින් **බලාපොරොත්තු ඇතිකරන සාක්ෂි** ලැබී තිබේ. ඒ අනුව, මෙම වර්ගයේ මැදිහත්වීම් මගින් කාන්තාවන්ගේ සමීප සහකරු ප්‍රචණ්ඩත්වය අවම කළ හැකිය.<br><br>H මෙම වර්ගයේ මැදිහත්වීම් මගින් ප්‍රචණ්ඩත්වය සම්බන්ධ වර්ධනයන් සිදුකළ හැකි බවට HIC රටවලින් **වැඩිදුර සාක්ෂි අවශ්‍යය**. | Indashyikirwa (රුවන්ඩා)<br><br>Stepping Stones (උගන්ඩාව සහ ලෝකය)<br><br>Zindagii Shoista(තජිකිස්තානය)<br><br>PREPARE (දකුණු අප්‍රිකාව)<br><br>Unite for a Better Life (ඉතියෝපියාව) |

| මැදිහත්වීම් වර්ගය | විස්තරය | | කාර්යක්ෂමතාවේ සාක්ෂි | උදාහරණ වැඩසටහන් |
|---|---|---|---|---|
| **යුවල උපදේශනය සහ චිකිත්සාව** | මෙම ආකාරයේ මැදිහත්වීම් විසින් යුවල උපදේශනය සහ එකට ජීවත් වීමේ උවමනාව ඇති යුවල අතර ප්‍රචණ්ඩත්වය අවම කිරීමේ උපාය මාර්ගයක් ලෙස චිකිත්සාව භාවිතා කරනු ලැබේ. මෙම වර්ගයේ මැදිහත්වීම් සාමාන්‍යයෙන් සමීප සහකරු ප්‍රචණ්ඩත්වය සම්බන්ධ ඉතිහාසයක් ඇති යුවල ඉලක්ක කරයි. HIC රටවල බහුලව භාවිතා වේ.<br><br>යුවලු චිකිත්සක සැසි බොහෝ විට අක්‍රිය සම්බන්ධතා රටා කෙරෙහි අවධානය යොමු කරයි. සන්නිවේදන දුෂ්කරතා, ගැටුම් කළමනාකරණ ගැටලු, ලිංගිකත්ව ගැටලු සහ සම්බන්ධතා සංකූලතා එයට අයත් වේ.[7] චිකිත්සාව සාමාන්‍යයෙන් මත්පැන් සහ ද්‍රව්‍ය භාවිතය ද එය ප්‍රචණ්ඩත්වයට සම්බන්ධ වන ආකාරය ද ආමන්ත්‍රණය කරයි.<br><br>සැසිවලට හැසිරීම් සම්බන්ධ චිකිත්සාවේ සිට සංජානන චර්යාත්මක හෝ විසඳුම් කේන්ද්‍රීය චිකිත්සාව දක්වා විවිධ වර්ගයේ යුවල චිකිත්සාවන් ඇතුළත් වේ. බොහෝ වැඩසටහන්වලදී, යුවල විසින් හානියක් නොවන ගිවිසුමකට බැඳී චිකිත්සා කාලය තුළදී එකට වැඩ කිරීම සිදුවේ. එනම්, සාමාන්‍යයෙන් මාස 3-6.[8] | L<br><br>H | යුවලු චිකිත්සාව සහ උපදේශනය ප්‍රචණ්ඩත්වය සම්බන්ධ අතරමැදි ප්‍රතිඵල වැඩිදියුණු කිරීමට මගපෑදීම සම්බන්ධයෙන් බළුෂක රටවලින් තවත් සාක්ෂි අවශ්‍ය වේ.<br><br>ප්‍රචණ්ඩත්වය අවම කිරීම සඳහා යුවල චිකිත්සාවේ වාසි සම්බන්ධයෙන් ඉහළ ආදායම් ලබන රටවලින් හොඳ සාක්ෂි තිබේ. තත්වානුකූලව මෘදු-මධ්‍යස්ථ තත්වයන්ගේ ප්‍රචණ්ඩත්ව ඉතිහාසයක් ඇති යුවල එයට අයත් වෙති.[9] කෙසේ වෙතත්, මෙම ප්‍රතිලාභ යුවල අනුව වෙනස් විය හැක. | Becoming One (උගන්ඩාව) |

## උදාහරණ වැඩසටහන්

පහත වගුවෙහි සාරාංශ දැක්වෙන්නේ එකිනෙකට වෙනස් වැඩසටහන් කීපයකි. එමගින් වැඩසටහන් කාලරාමු තුළ කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය පැවැත්ම අඩුකිරීම සම්බන්ධයෙන් ප්‍රතිඵල පෙන්නුම් කර තිබේ (දළ වශයෙන් මාස හයේ මූලික ක්‍රියාකාරකම්). මෙම වගුව 9 පිටුවෙහි තිබෙන **සැලසුම් හා ක්‍රියාත්මක කිරීමේ පිරික්සුම් ලැයිස්තුව** සහ RESPECT ව්‍යුහය සමග ලබාදී තිබෙන **ඵලදායී වැඩසටහන්කරණයේ මාර්ගෝපදේශ මූලධර්ම** සමග සමාලෝචනය කළ යුතුය. සෑම වැඩසටහනක් ගැනම වඩා සවිස්තර තොරතුරු **වැඩසටහන් සාරාංශවල** සපයා තිබේ.

| වැඩසටහන | විස්තරය | ස්ථානය | ඉලක්ක ජනගහනය | මූලික ක්‍රියාකාරකම් | කාලය | ඇගයීම හා බලපෑම |
|---|---|---|---|---|---|---|
| Indashyikirwa | **යුවල පාදක කරගත් තීව්‍ර මැදිහත්වීමක්** වන මෙහි අරමුණ වන්නේ සම්බන්ධතා කුසලතා ශක්තිමත් කිරීම, වඩා සාධාරණ සම්බන්ධතා ගොඩනැගීම සහ සමාජභාවී සාධාරණත්වය හා සමීප සහකරු ප්‍රචණ්ඩත්වය යටපත් කරන සමාජ සම්මතයන් විශ්වාස කිරීම වැඩිකිරීම කිරීමයි. | **රුවන්ඩාවේ** නැගෙනහිර, උතුරු හා බටහිර පළාත් | කෙයාර් ජාත්‍යන්තරයේ ග්‍රාමීය ඉතුරුම් හා ණය සංගමය (VSLA) යටතේ බඳවාගන්නා ලද අඩුආදායම්ලාභී පවුල්වල විෂමලිංගික යුවල | යුවල කණ්ඩායම් 15ක් සහභාගී වන **සති 21 පුහුණුවකි**. එය මෙහෙයවනු ලබන්නේ එක් පිරිමි හා එක් ගැහැණු මෙහෙයවන්නකු විසිනි.<br><br>විෂයමාලාව විසින් බලය හා සමාජභාවය, හිමිකම්, සමීප සහකරු ප්‍රචණ්ඩත්වය ඇතිකරන තත්වයන් පිළිබඳ මූලික සංකල්ප ආවරණය කරනු ලැබේ. මත්පැන් අවභාවිතය, ඊර්ෂ්‍යාව, ආර්ථික අසමානතා, සමාජභාවී පවුල් භූමිකා, සෞඛ්‍ය සම්බන්ධතා, ක්‍රියාකාරිකත්වය හඳුන්වාදීම සහ සමීප සහකරු ප්‍රචණ්ඩත්වයට මුහුණදෙන අයට සවිබලගැන්වීමේ ප්‍රතිචාර සැපයීම මෙයට අයත් වේ. | මාස 6 | **ඇගයීම් වර්ගය:** පොකුරු සසම්භාවී පාලන පරීක්ෂණ (cRCT) සහ ඒ හා සම්බන්ධ ගුණාත්මක පර්යේෂණ.[10]<br><br>**බලපෑම:**<br>• කාන්තාවන් විසින් ශාරීරික සහ/හෝ ලිංගික සමීප සහකරු ප්‍රචණ්ඩත්වය වාර්තා කිරීමේ 55%ක අඩුවක්.<br>• පිරිමින් විසින් ශාරීරික සහ/හෝ ලිංගික සමීප සහකරු ප්‍රචණ්ඩත්වය සිදුකළ බව වාර්තා කිරීමේ 47%ක අඩුවක්.<br>• වර්ධනය වූ සම්බන්ධතා ගුණාත්මකබව, වඩා හොඳ සන්නිවේදනය, පුළුල් විශ්වාසය සහ වර්ධනය කරන ලද ගැටුම් කළමනාකරණය සහ බිරිඳට පහරදීම සාධාරණීකරණය කිරීම සඳහා ඉදිරිපත් කරනු ලබන හේතු සංඛ්‍යාව අවම වීම.<br>• නිවසේදී ළමයින්ට ශාරීරික දඬුවම් අඩුවීම |

| වැඩසටහන | විස්තරය | ස්ථානය | ඉලක්ක ජනගහනය | මූලික ක්‍රියාකාරකම් | කාලය | ඇගයීම හා බලපෑම |
|---|---|---|---|---|---|---|
| Stepping Stones | මෙම වැඩසටහන සැලසුම් කර තිබෙන්නේ වයස හා සමාජභාවය අනුව **සම කණ්ඩායම් හතරක්** විසින් භාවිතා කිරීමටයි. එහි අරමුණ වන්නේ, විධිමත් හා අවිධිමත් සම්බන්ධතාවලදී පරම්පරාන්තරව හා සමාජභාවයන් අතර අන්‍යෝන්‍ය ගෞරවාන්විත සන්නිවේනය හා සම්බන්ධතා කුසලතා ප්‍රවර්ධනය කිරීමයි.[11] | මුලින් ග්‍රාමීය උගන්ඩාවේ[12] සංවර්ධනය කරන ලද මෙම වැඩසටහන එතැන් සිට රටවල් 400ක පමණ පසුබිම් රැසක අනුරූප කරගෙන භාවිතා කරන ලදී. පාසල්, ආගමික ආයතන හා සිරගෙවල් එයට අයත් වේ. | **තරුණ පිරිමින් හා ගැහැණුන්** (වයස අවුරුදු 15 සහ ඊට වැඩි) වෙනුවෙන් සහ වැඩි වයස් පිරිමින් සහ ගැහැණුන් වෙනුවෙන් වන ඒක ලිංගික සම කණ්ඩායම් සමග සම්බන්ධ කාන්තාවන් සහ පිරිමින් (එකිනෙකා සමග සම්බන්ධතා නොමැති අය). | **පැය 23ක සැසි** මාස හයක කාලයක් තුළ සමාන්තරව පැවැත්වේ.[13]<br><br>සමාජභාවී සමානාත්මතාව හා ප්‍රචණ්ඩත්වය, තරුණයන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය, ප්‍රචණ්ඩත්වයේ ජීව චක්‍ර, ආදරය, පිළිකුල් කිරීම, ලිංගිකව සම්ප්‍රේෂණය වන ආසාදන/ එච්අයිවී, කොන්ඩම් භාවිතය, ස්වයං අභිමානය සහ මත්ද්‍රව්‍ය අවභාවිතය (වෙනත් ඒවා අතර) වැනි මාතෘකා සහභාගීත්ව පුහුණුවට අයත් වේ. | මාස 6 | **ඇගයුම් ස්වරූපය:** දකුණු අප්‍රිකාවේ පොකුරු සසම්භාවී පාලන පරීක්ෂණ (cRCT)[14] සහ විවිධ ක්‍රම.<br><br>**බලපෑම:** දකුණු අප්‍රිකාවේ පරීක්ෂණය මගින් පිරිමින් විසින් ලිංගික අවදානම් චර්යා ස්වයංව වාර්තා කිරීමේ හා සමීප සහකරු ප්‍රචණ්ඩත්වය සිදුකිරීමේ අඩුවක් සොයාගන්නා ලදී. කෙසේ වෙතත්, කාන්තා සහභාගිකයන් විසින් ලිංගික අවදානම් චර්යා හෝ සමීප සහකරු ප්‍රචණ්ඩත්වයේ වින්දිතයන් වීම සම්බන්ධ පහළ මට්ටමක් හෝ වාර්තා කර නොතිබිණි. එයට හේතුව විය හැක්කේ, තරුණ කාන්තාවන්ගේ සහ කරුවන් වැඩසටහනට සම්බන්ධ වී නොතිබීමයි. එයට පරස්පරව, ගැම්බියාවේ අනුරූප කරගන්නා ලද වැඩසටහනේදී සම කණ්ඩායම් හතරම, කාන්තාවන් මෙන්ම පිරිමි ද, සමීප සහකරු ප්‍රචණ්ඩත්වයේ අඩුවීමක් වාර්තා කළහ.[15] |
| Becoming one | **යුවල උපදේශන ආගමික වැඩසටහනක්** වන මෙය සැලසුම් කර තිබෙන්නේ සෞඛ්‍ය සම්පන්න, වඩා සමානාත්මතාවාදී සම්බන්ධතා ප්‍රවර්ධනය මගින් සමීප සහකරු ප්‍රචණ්ඩත්වය වැළැක්වීම සඳහාය. | බටහිර **උගන්ඩාව** | විෂමලිංගික යුවල් 2381<br><br>ආගමික නායකයන් 140 | පුහුණු ආගමික නායකයන් විසින් මෙහෙයවනු ලබන, සන්නිවේදන කුසලතා, චිත්තවේගී නියාමනය, පොදු මූල්‍ය පාලනය, ලිංගික කැමැත්ත හා සතුට ආවරණය කරනු ලබන පුද්ගල සැසි 12ක්.<br><br>බයිබලානුකූල මූලධර්ම සහ පද්‍ය ඇතුළත් වේ. පිරිමි ආධිපත්‍යය සහ කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සාධාරණීකරණය කිරීම සඳහා බොහෝවිට යොදාගනු ලබන බයිබල් කරුණු සාධාරණීකරණය කිරීම ඉලක්ක කරයි. | මාස 3-4 | **ඇගයීම් ස්වරූපය:** සසම්භාවී පාලිත පරීක්ෂණ (RCT) සහ ඒ සමග ක්‍රියාත්මක කරනු ලබන ගුණාත්මක සමීක්ෂණ.[16]<br><br>**බලපෑම:** මාස 18ක ඇගයීම 2018 ඔක්තෝබර් මාසයේදී ආරම්භ විය. කෝවිඩ්-19 අධි වසංගතය හේතුවෙන් ප්‍රතිඵල ප්‍රමාද විය. |

| වැඩසටහන | විස්තරය | ස්ථානය | ඉලක්ක ජනගහනය | මූලික ක්‍රියාකාරකම් | කාලය | ඇගයීම හා බලපෑම |
|---|---|---|---|---|---|---|
| Unite for a Better Life (UBL) | සැලසුම් කර තිබෙන්නේ **විෂමලිංගික යුවල්** වල සමීප සහකරු ප්‍රචණ්ඩත්වය අඩුකිරීම-ටයි. ඉතියෝපියාවේ පිරිමින්ට පමණක්, ගැහැණුන්ට පමණක් සහ යුවල කණ්ඩායම්වල කෝපි උත්සවවල සංදර්භය තුළ කණ්ඩායම් පාදක සැසි ලෙස මෙහෙයවන ලදී. | නිරිතදිග **ඉතියෝපියාවේ** ගැමි ප්‍රජාවන් | • විෂමලිංගික යුවල<br>• විෂමලිංගික පිරිමි පමණක්<br>• විෂමලිංගික කාන්තාවන් පමණක්<br>(මෙම සියලුදෙනා වයස අවුරුදු 15-49 අතර වර්තමානයේදී විවාහක හෝ එකට ජීවත් වන අයයි)<br>පිරිමි සහ කාන්තා මෙහෙයවන්නන් 48ක් පුහුණු කරන ලදී. | එකිනෙකට වෙනස් සමාජභාවී පරිවර්තක විෂයමාලා තුනක් එකිනෙකට සමාන්තරව පුහුණු මෙහෙයවන්නන් විසින් ඉදිරිපත් කරන ලදී. පිරිමි UBL, කාන්තා UBL සහ යුවල UBL. මේවා ඉදිරිපත් කරනු ලැබුවේ සම්ප්‍රදායික ඉතියෝපියානු කෝපි උත්සවවලදීය.<br>පුද්ගලයන් 20ක් වෙනුවෙන් සහභාගීත්ව හා කුසලතා ගොඩනැගීමේ සැසි 14ක් සති 7-14 අතර කාලයේදී පවත්වන ලදී. එහි අරමුණ වූයේ සමීප සහකරු ප්‍රචණ්ඩත්වයේ විවිධ හේතු සම්බන්ධයෙන් කටයුතු කිරීමයි. එය කරනු ලැබුවේ සමාජභාවී ඒකාකෘතිවලට අභියෝග කිරීමෙන් සහ සමාජභාවී සාධාරණ ආකල්ප හා චර්යාවන් ප්‍රවර්ධනය කිරීමෙනි. | සති 7-14 අතර | **ඇගයීම් වර්ගය:** සසම්භාවී පාලන පරීක්ෂණ (RCT)[17]<br>**බලපෑම: පිරිමි UBL**<br>• පසුගිය වසර තුළදී පිරිමින් ලිංගික සමීප සහකරු ප්‍රචණ්ඩත්වය වාර්තා කිරීමේ 30%ක අඩුවක්<br>• වසරේ කොටසකදී පිරිමින් විසින් ශාරීරික සහ/ හෝ ලිංගික සමීප සහකරු ප්‍රචණ්ඩත්වය වාර්තා කිරීමේ 20%ක අඩුවක්<br>• පසුගිය වසර තුළදී කාන්තාවන් ශාරීරික සහ/හෝ සමීප සහකරු ප්‍රචණ්ඩත්වය අත්දැකීමේ සංඛ්‍යාත්මකව කැපීපෙනෙන අඩුවීමක්.<br>**කාන්තා සහ යුවල UBL**<br>• ශාරීරික හෝ ලිංගික සමීප සහකරු ප්‍රචණ්ඩත්වයෙහි සංඛ්‍යාත්මකව කැපීපෙනෙන බලපෑමක් නැත.<br>• එහෙත්, ළමයින් රැකබලාගැනීමේ හා ගෘහ කටයුතුවල පිරිමින් යෙදීම කැපීපෙනෙන ලෙස වැඩිවී තිබේ. |

# සැලසුම් සහ ක්‍රියාත්මක කිරීමේ පිරික්සුම් ලැයිස්තුව

සම්බන්ධතා කුසලතා ශක්තිමත් කිරීම හා සම්බන්ධ **පොදු මූලිකාංග සහ ඵලදායී එළඹුම්වල මූලධර්මවලට** පහත දැක්වෙන කරුණු අයත් වේ:[18]

## සැලසුම් කිරීම හා අනුරූප කරගැනීම

1. **සමාජභාවී පරිවර්තක යුවල විෂයමාලාව සැලසුම් කිරීම, අනුරූප කිරීම සහ නියාමනය කිරීම සම්බන්ධයෙන් ප්‍රමාණවත් සම්පත් ඇති බව සහතික කරන්න.** සාර්ථක එළඹුම් ව්‍යුහගත කර තිබෙන්නේ හොඳින් සැලසුම් කරන ලද විෂයමාලා අනුවය. ඒවා විශේෂයෙන් සැලසුම් කර තිබෙන්නේ දේශීය සංදර්භයන්ට අනුකූලව වන අතර අන්තර්ගතය දේශීය සංදර්භයට යෝග්‍ය බව සහ ප්‍රධාන පණිවුඩ ඉලක්ක ජනගහණය අතර මනාව පැතිරෙන බව තහවුරු කිරීම සඳහා දැඩි ලෙස පරීක්ෂාවට ලක්කර හා නියාමනය කර තිබේ. ප්‍රසිද්ධ විෂයමාලා රැසක් තිබේ (පහත කොටුව බලන්න). ඒවා අලුත් සංදර්භයනට අනුරූප කරගත හැකිය. දැනට තිබෙන විෂයමාලා අනුරූප කරගන්නා විටදී, මුල් සංවර්ධකයන්/ ක්‍රියාත්මක කරන්නන් සමග සම්බන්ධ වන ලෙස, එළඹුමේ මූලික මූලධර්මවලට පක්ෂපාතීත්වය සහතික කරන ලෙස සහ වෙනත් තැන්වල අනුරූප කරගැනීමේ අත්දැකීම්වලින් ඉගෙනගන්නා ලෙස දැඩි ලෙස නිර්දේශ කරනු ලැබේ.

### විෂයමාලා උදාහරණ

Stepping Stones and Stepping Stones Plus (Global) විසින් සමාජභාවය, ජනනය, එච්අයිවී සන්නිවේදනය සහ සම්බන්ධතා කුසලතා පිළිබඳ තම පුහුණු පැකේජය යාවත්කාලීන කර තිබේ.

රුවන්ඩාවේ Indashyikirwa විවැඩසටහනෙහි යුවල සඳහා යාවත්කාලීන කරන ලද විෂයමාලා පුහුණු මොඩියුලයක් තිබේ. එයට අන්තර් ක්‍රියාකාරී පුහුණුවීම් සහ යුවල අතර ප්‍රචණ්ඩත්වය අවම කිරීම සඳහා ඉගෙනගෙන ගොස් කළ හැකි අභ්‍යාස ඇතුළත් කර තිබේ.

තජිකිස්තානයේ Zindagii Shoista (ගරුත්වයෙන් ජීවත් වීම) සතුව වැඩමුළු අත්පොත් දෙකක් තිබේ:
(1) Social Empowerment විසින් පවුලේ එක්සත්බව ප්‍රවර්ධනය කරන අතර ප්‍රචණ්ඩත්වය අවම කිරීමට ඉලක්ක කරයි.
(2) Enabling Economic Empowerment through Income Generating Activities පවුල් අයවැය කළමනාකරණය කරගැනීම සඳහා පවුල්වලට උපකාර කරයි. කාන්තාවන්ගේ තීරණ ගැනීම ශක්තිමත් කිරීම ද එයට අයත් වේ.

2. **සම්බන්ධතාවල සමාජභාවී බලය හා සමාජ සම්මතයන් පිළිබඳ න්‍යාය හා විශ්ලේෂණ සහිත බිම්මට්ටමේ යුවල විෂයමාලාව.** ෂබීයහසනසරඅ් යුවල විෂයමාලාව විසින් තමන්ගේම සම්බන්ධතාවලදී සහ ප්‍රජාවේදී ධනාත්මක හා ඍණාත්මක වර්ගවල සංකල්ප සහ එමගින් යුවලවලට සමීප සහකරු ප්‍රචණ්ඩත්වය හඳුනාගැනීම, වැළැක්වීම සහ ප්‍රතිචාර දැක්වීම සඳහා ලැබෙන පිටිවහල හඳුන්වාදෙන ලදී.[19] හානිකර සමාජ සම්මතයන් පිළිබඳ පණිවුඩ සන්නිවේදනයට වඩා, අලුත් ධනාත්මක හා අපේක්ෂා සහගත සම්බන්ධකම් ප්‍රවර්ධනය කිරීම චර්යා වෙනස්කම් දිරිමත් කරයි. ඇතිවිය හැකි ප්‍රතිචාර වැළැක්වීම සඳහා උපකාර වේ. 'පවුලේ සංවර්ධනය සඳහා එකට වැඩකිරීම', 'එකට යහපත් මව්පියන් බවට පත්වීම' සහ 'වර්ධනය කරන ලද ලිංගික සම්බන්ධතා' එවැනි සම්බන්ධතා සඳහා උදාහරණ වේ.

3. **දැනට පවතින දේශීය වටිනාකම්, භාෂාව සහ ප්‍රජා ව්‍යුහයන් සම්බන්ධයෙන් වැඩසටහන් නම්නීකරණය සහ සම්බන්ධ කිරීම කරන්න.** දේශීය සංදර්භයට සාර්ථක ලෙස අනුරූප කරගන්නා ලද එළඹුම් විසින් තම විෂයමාලාව සිතාමතාම දැනට පවත්නා සාධනීය සංස්කෘතික හා ආගමික වටිනාකම් වෙත නම්නීකරණය කර තිබේ. එසේම, දේශීය භාෂාවෙහි යෝග්‍ය සංකල්ප භාවිතා කරයි. එමගින් විශේෂිත සංදර්භයකදී සම්බන්ධතාවලට බලපාන වැදගත් පුද්ගලයන් සහ පාර්ශ්වකරුවන් හඳුනාගෙන ඇතුළත් කරනු ලැබේ. දැනට පවත්නා ප්‍රජා ව්‍යුහයන් යුවල, පවුල්, පිරිමි සහ කාන්තාවන් සමග සම්බන්ධ වීමේ වැදගත් ප්‍රවේශ ස්ථානයන් ලෙස භාවිතා කරනු ලැබේ.

### අනුරූප කරගැනීම හා පුළුල් කිරීම සඳහා සම්පත්

Community for Understanding Scale-up (CUSP) සතුව විවිධ මුලපිරුම් ඵලදායී හා ආචාරධාර්මික ලෙස අනුරූප කරගැනීම හා පුළුල් කිරීම සම්බන්ධ මාර්ගෝපදේශ තිබේ. Guidelines for Adapting Stepping Stones මාර්ගෝපදේශ විසින් ද වැඩසටහන්වල පක්ෂපාතීත්වය හා කාර්යක්ෂමතාව පවත්වාගැනීමට කළ යුතු දේ හා නොකළ යුතු දේ සම්බන්ධයෙන් මාර්ගෝපදේශ සපයනු ලැබේ.

## ක්‍රියාත්මක කිරීම හා පුළුල් කිරීම

4. **පිරිමින් හා ගැහැණුන් විචාරාත්මක ලෙස සම්බන්ධ කරගැනීම සහ යෝග්‍ය අවස්ථාවලදී වෙනත් පවුල් සාමාජිකයන් සම්බන්ධ කරගැනීම.** සමීප සම්බන්ධතාවක පුද්ගලයන් දෙදෙනාම සම්බන්ධ කරගැනීමෙන් කැපවීම තිරසර කරගත හැකියි එසේම, එමගින් යුවලවලට පවුලේ සමාජභාවී හා බල ගතිකයන්ට සහාය වීම සඳහා එකිනෙකාට උපකාර කරගත හැකිය. පිරිමින් සම්බන්ධ වීම තහවුරු කරගැනීම හා තිරසර කරගැනීම සඳහා විශේෂ ප්‍රයත්නයන් අවශ්‍යය.[20] ඇතැම් වැඩසටහන් විසින් පිරිමින් සම්බන්ධ කරගැනීමට පෙර හා ඉවත්වීමේ අනුපාතිකය අඩුකරගැනීම සඳහා අභිප්‍රේරණාත්මක සම්මුඛ සාකච්ඡා තාක්ෂණයන් භාවිතා කර තිබේ.[21] පුරුෂෝත්තමවාදී පසුබිම්වලදී ඇතිවිය හැකි නිශේධාත්මක ප්‍රතිචාර අවම කරගැනීම සඳහා නීතිමය නෑදෑයන් සම්බන්ධ කරගැනීම ද අවශ්‍ය වනු ඇත.

5. **සහකරුවන් අතර සම සහභාගීත්වය සඳහා ආරක්ෂිත අවකාශයක් නිර්මාණය කරන්න.**[22] යුවලවලට දැනුම බෙදාහදාගැනීමට හා ඉගෙනීමට ආරක්ෂිත සහ ඵලදායී වාතාවරණයක් තහවුරු කිරීම සඳහා වැඩසටහන විසින් කණ්ඩායම්වල ප්‍රමාණය, ස්ථානය සහ කාලය පරිස්සමෙන් සැලකිල්ලට ගත යුතුය. මේ සඳහා පිරිමින් සහ ගැහැණුන් වෙනුවෙන් වෙනම ලිංගිකත්වය සඳහා නිශ්චිත හා වයස අනුව නිශ්චිත සැසි මෙන්ම සහකරුවන්/කාරියන් දෙදෙනාම ඇතුළත් වන ඒකාබද්ධ සැසි ද ඇතුළත් කළ යුතුය. Stepping Stones වැඩසටහනේදී, සම කණ්ඩායම් එකිනෙක විසින් වඩාත්ම යහපත් ආකාරයෙන් තමන්ගේ අවකාශය සහ රැස්වීම සඳහා වේලාව තෝරාගන්නා ලදී.[23]


6. **සන්නිවේදනයේ හා ගැටුම් විසඳීමේ කුසලතා ගොඩනගන්න.** සාර්ථක ප්‍රවේශයන් විසින් කුසලතා ගොඩනැගීම කෙරෙහි අවධානය යොමුකරනු ලැබේ. පුහුණු වී නිවසේදී භාවිතා කළ හැකි අලුත් කුසලතා ලබාගැනීම සඳහා අවස්ථා ලබාදෙයි.

7. **සම්බන්ධතා ශක්තිමත් කිරීම සඳහා පිරිමි හා ගැහැණු මෙහෙයවන්නන් පරිස්සමින් තෝරාගන්න.** මෙම මැදිහත්වීම්වල තීව්‍ර ස්වභාවය අනුව, මෙහෙයවන්නන් විසින් වැඩසටහනේ සහභාගී වන්නන් බවට පත්වී මුලින්ම එහි අත්දැකීම් ලබාගත යුතුය. ඒ හරහා ඔවුන් තමන්ගේ ම පරිවර්තනීය හා ඉගෙනුම් ක්‍රියාවලියක් හරහා යා යුතුය. ඔවුන්ට මෙහෙයවන්නන් බවට පත්විය හැක්කේ ඉන් අනතුරුවය.[24] වැඩිදුරටත්, මෙහෙයවන්නන්ට සහභාගීත්ව මෙහෙයවීමේ විලාසිතාවක් වෙනුවෙන් ශක්තිය හා සහාය ලබාදිය යුතුය. වෙනස සඳහා ගමනෙහි සහභාගිකයන්ට ප්‍රමාණවත්සහාය සැපයීමට හැකි විය යුතුය.

8. **ආපසු හැරී බැලීමට හා සහාය වීමට අවස්ථා සහිත සහභාගීත්ව එළඹුම් යොදාගන්න.** ඵලදායී සහභාගිත්ව ඉගෙනුම් තාක්ෂණයන් විසින් සමාජභාවී භූමිකා, කාන්තාවන්ගේ ස්ථානය ප්‍රවර්ධනය කිරීම, අසමාන සම්පත් බෙදාහැරීමට අභියෝග කිරීම සහ පිරිමින් සහ ගැහැණුන් අතර බල අසමතුලනය සම්බන්ධයෙන් සංවාදයට සහ විචාරාත්මක චින්තනයට සහාය දිරිගන්වනු ලැබේ.

9. **පහසුවෙන් ලබාගත හැකි, අදාළභාවය සහිත සහ ජනතාව සම්බන්ධ කරගන්නා සන්නිවේදන මෙවලම් භාවිතා කරන්න.** ඉගෙනගෙන පවුලේදී භාවිතා කළ හැකි සම්පත් ඇතුළු වර්ණවත් සහ සුබවාදී දෘෂ්‍ය සන්නිවේදන මෙවලම් අඩු සාක්ෂරතාවක් සහිත ක්ෂේත්‍රවලදී අත්‍යවශ්‍යය. එය සහභාගී වන්නන්ගේ අවධානය ග්‍රහණය කරගැනීමට ඉවහල් වේ. ප්‍රධාන පණිවුඩ සන්නිවේදනයට උපකාර වේ.[25] සහභාගී වන්නන්ගේ සාක්ෂරතාව අඩු පසුබිම්වලදී ඔවුන්ට පුහුණු මෙවලම් අවබෝධ කරගැනීම සඳහා පහසු කිරීම පිණිස මෙහෙයවන්නන් දෙදෙනෙකු සහභාගී කරගැනීම ප්‍රයෝජනවත් වේ. Indashyikirwa වැඩසටහනේදී එසේ කරන ලදී.

10. **වඩාත්ම කොන්කිරීමට ලක්වූ යුවල සම්බන්ධ කරගැනීම සඳහා සියල්ලන් ඇතුළත් කරගන්නා එළඹුමක් යොදාගන්න.** වැඩසටහන ආබාධ සහිත පුද්ගලයන්ට සහභාගී වියහැකි එකක් බව තහවුරු කිරීම සඳහා Indashyikirwa වැඩසටහන විසින් විශේෂිත මූලෝපායන් භාවිතා කරන ලදී. ආබාධ සහිත ජනයා සඳහා වන ජාතික සභාව සමග හවුල්කාරිත්වයක් නිර්මාණය කරගැනීම, ආබාධ සහිත පුද්ගලයන් 280ක් ඉලක්ක කිරීම සහ ඔවුන් වෙනුවෙන් සුවිශේෂයෙන් සකස් කරන ලද සන්නිවේදන මෙවලම් භාවිතා කිරීම එයට ඇතුළත් විය.[26]



## ඇතුළත් වීමේ ස්ථාන

බලපෑම උපරිම කිරීම සඳහා සම්බන්ධතා කුසලතා වර්ධනය කිරීම සඳහා වන එළඹුම් බහුවිධ පරිසරයන් සහ අංශ සමග ඒකාබද්ධ කළ හැකිය. වැළැක්වීමේ වැඩසටහන්වල ව්‍යාප්තිය වර්ධනය කිරීම හා දැනට පවතින මුලපිරුම් ශක්තිමත් කිරීම සඳහා දැනට ක්‍රියාත්මක මුලපිරුම් සහ ව්‍යුහයන් සමග සම්බන්ධ වීම එයට ඇතුළත්ය. පහත දැක්වෙන වගුව විසින් අවධාරණය කරනු ලබන්නේ මෙම මූලෝපාය ක්‍රියාත්මක කිරීම සඳහා ඇතුළත් විය හැකි ස්ථානයි. එයට උදාහරණ වැඩසටහන් ද ඇතුළත් වේ.

| පිවිසුම් ලක්ෂ්‍ය | තර්කනය |
|---|---|
| **දැනට තිබෙන ප්‍රජා පාදක සමාජ හා ආර්ථික ආයතන**<br><br>උදා: ආගමික කණ්ඩායම්, ඉතුරුම් හා ණය කණ්ඩායම්, ස්වයං උපකාර කණ්ඩායම්, සමාජ ආරක්ෂණ ප්‍රතිලාභීන් | ප්‍රජා මට්ටමේ දැනට පවත්නා සමාජ හා ආර්ථික ව්‍යුහයන් සහ ආයතන මගින් පිරිවැය අතින් ඵලදායී පිවිසුම් ස්ථාන සම්පාදනය කළ හැකියි එමගින් යුවල, පවුල්, පිරිමින් සහ කාන්තාවන් සමග වැඩ කළ හැකිය. වෙනස් වීම හා වෙනස ස්ථාවර කරගැනීම සඳහා යුවලවලට හැකියාව ලබාදෙන පරිසරයක් නිර්මාණය කිරීමට මෙම ප්‍රජා ව්‍යුහයන්ට හැකිය. දැනට පවතින ව්‍යුහයන් භාවිතා කිරීම මගින් වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා අවස්ථා පුළුල් කළ හැකිය. යුවල බවට පත්වීමට අපේක්ෂිත අය ද සම්බන්ධ කරගැනීමේ හැකියාවක් තිබේ. එනම්, ආගමික ආයතන මගින් හෝ රාජ්‍ය ව්‍යුහයන් විසින් විවාහය වෙත යොමුකරනු ලබන පුද්ගලයන්ය.<br><br>උදාහරණයක් ලෙස, රුවන්ඩාවේ Indashyikirwa මැදිහත්වීමෙහිදී, යුවල සම්බන්ධ කරගැනීම සඳහා කෙයාර් සංවිධානයේ එවකට පැවති ඉතුරුම් හා ණය සමිති (VSLA) මත පදනම්ව ක්‍රියාත්මක වන ලදී. උගන්ඩාවේ Stepping Stones වැඩසටහනේදී, Redd Barna සංවිධානයේ ආදායම් උත්පාදන වැඩසටහන් මත පදනම් විය.[27] උගන්ඩාවේ පදනම් වුණේ එරට දේවස්ථාන විසින් සපයන ලද පූර්ව විවාහ හා විවාහ උපදේශන සේවා මතයි. එමගින් යුවලවලට කුසලතා පාදක උපදේශනය සැපයීම සඳහා ආගමික නායකයන් සම්බන්ධ කරගන්නා ලදී. එහිදී සන්නිවේදනය, පොදු මුදල්, ලිංගික කැමැත්ත හා සතුට ආවරණය කරන ලදී. සුබවාදී සම්බන්ධතා ගොඩනැගීම සඳහා බයිබලය උපයෝගී කරගන්නා ලදී. |
| **පාසල් හා අධ්‍යාපනික පහසුකම්** | ගෞරවනීය සම්බන්ධතා තරුණ පුද්ගලයන් අතර ප්‍රවර්ධනය කිරීම සඳහා පාසල් පාදක මැදිහත්වීම් මගින් අවස්ථාව ලැබේ. වඩාත්ම පුළුල් ලෙස ඇගයීමට ලක්කරනු ලැබුවේ තාවකාලික සම්බන්ධකම් පිළිබඳ මැදිහත්වීම්ය. එමගින් සමාන සම්බන්ධතා නිර්මාණය කිරීමට සහ තාවකාලික සම්බන්ධතා පිළිබඳ ආකල්ප හා සමාජ සම්මතයන් වෙනස් කිරීමට උත්සාහ දරණ ලදී.<br><br>උදාහරණයක් ලෙස, දකුණු අප්‍රිකාවේ PREPARE වැඩසටහනට පාසලින් පසු පවත්වන ලද ගැඹුරු වැඩමුළු 21ක් අයත් විය. සමීප සම්බන්ධතාවලදී වටිනාකම් සහ අපේක්ෂා, සන්නිවේදන කුසලතා, සමාජභාවී බල අසමානතා, ගෞරවනීය සම්බන්ධතා සහ ලිංගික තීරණ ගැනීම් එහිදී ආවරණය කරන ලදී. වැඩසටහන මගින් සමීප සහකරු ප්‍රචණ්ඩත්වයේ අඩුවක් සිදුවිය.[28] නවයොවුන් පුද්ගලයන් විශේෂයෙන් ඉලක්ක කරනු ලබන වැඩසටහන් පිළිබඳ පහත දැක්වෙන ලේඛනයේ විස්තර කරනු ලැබේ:**RESPECT Strategy Summaries on Environments Made Safe and Child and Adolescent Abuse Prevented.** |
| **ලිංගික හා ප්‍රජනන සෞඛ්‍ය සේවා ඇතුළු සෞඛ්‍ය ක්ෂේත්‍රය** | සෞඛ්‍ය ක්ෂේත්‍රය විසින් යුවල සමග පුළුල් පරිමාණයෙන් සම්බන්ධ වීම සඳහා කැපීපෙනෙන අවස්ථා පිරිනමනු ලැබේ. උදාහරණයක් ලෙස, ලිංගික හා ප්‍රජනන සෞඛ්‍යය සේවා මගින් එසේ කළ හැකිය. දැනට පවතින එවැනි වැඩසටහන් සහ උපදේශන සේවා තුළට කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වැළැක්වීම සම්බන්ධ පණිවුඩ ඇතුළත් කළ හැකිය. එසේම, විශේෂිත අවදානම්වලට මුහුණදෙන යුවල හඳුනාගත හැකි අතර වඩා ගැඹුරු යුවල පාදක මැදිහත්වීම් වෙත ඔවුන් යොමුකළ හැකිය. සෞඛ්‍ය වෘත්තිකයන් ද සම්බන්ධ කරගත හැකි අතර හානිකර සම්බන්ධතා සමාජ සම්මතයන් පරිවර්තනය කිරීම සම්බන්ධ දැනුමින් ඔවුන් සන්නද්ධ කළ හැකිය. ඒ සඳහා අධ්‍යාපනික මෙවලම් සහ රැඳීසිටින ස්ථානවල, පරීක්ෂණ මැදිරිවල සහ උපදේශන අවකාශවල තිබෙන සම්පත් සහ පෞද්ගලිකව සේවාදායකයන්ට/ රෝගීන්ට සන්නිවේදනය කරන පණිවුඩ භාවිතා කළ හැකිය.[29] |

# ප්‍රධාන සම්පත්

## යුවල සමග වැඩසටහන්කරණය

Preventing partner violence, working with couples. Practice brief. Starmann, E. The Prevention Collaborative. 2018
මෙම ප්‍රායෝගික සාරාංශය විසින් යුවල සමග සමීප සහකරු ප්‍රචණ්ඩත්වය වැළැක්වීම සඳහා වැඩකිරීම සම්බන්ධ කෙටි විස්තරයක් ඉදිරිපත් කරයි. වැදගත් සැලසුම් මූලිකාංග සහ ක්‍රියාත්මක කරවීම් ද, අප්‍රිකාවේ වැඩසටහන්වලින් ලබාගත් අදහස් ද එහි අඩංගු වේ.

Working with couples to prevent IPV, Indashyikirwa, Rwanda What Works Evidence Brief. Stern, E., Mclean, L., and Heise, L. 2018
මෙම ප්‍රායෝගික සාරාංශය විසින් යුවල සමග සමීප සහකරු ප්‍රචණ්ඩත්වය වැළැක්වීම සඳහා වැඩකිරීම සම්බන්ධයෙන් Indashyikirwa වැඩසටහනේ පාඩම් පිළිබඳ කෙටි විස්තරයක් ඉදිරිපත් කරයි.

Programme Summary: The Indashyikirwa Programme Rwanda. The Prevention Collaborative. 2019
මෙම සාරාංශ ලේඛනය මගින් රුවන්ඩාවේ Indashyikirwa යුවල වැඩසටහන පිළිබඳ කෙටි විස්තරයක් ඉදිරිපත් කරයි. වැඩසටහන් උපාංග පිළිබඳ සවිස්තර තොරතුරු මෙන්ම වැඩසටහන්කරණයේදී උගත් පාඩම් ද එහි අඩංගු වේ.

## විධිමත් සහ අවිධිමත් ලිංගික සහකරුවන් සමග වැඩසටහන්කරණය පිළිබඳ සාක්ෂි

Couple therapy for intimate partner violence: A systematic review and meta-analysis. Karakurt G, Whiting K, Van Esch, Bolen S, Calabrese J. J Marital Family Therapy, Volume 42, No. 4, p567583: doi:10.1111/jmft.12178. 2016
ප්‍රචණ්ඩත්වයට ප්‍රතිකාරයක් ලෙස යුවල ප්‍රතිකාරවල ඵලදායීතාව පිළිබඳ එක්සත් ජනපදයේ අධ්‍යයන හයක ප්‍රතිඵල මෙම විධිමත් සමාලෝචනයෙහි අඩංගු වේ.

Synchronising gender strategies: A cooperative model for improving reproductive health and transforming gender relations
Greene, M and Levack, A. USAID. 2010
සමාජභාවී සමාජ සම්මතයන්ට අභියෝග කරන ආකාරයෙන්, සමාජභාවී සමානාත්මතාව ප්‍රවර්ධනය වන ආකාරයෙන් සහ සෞඛ්‍යය වර්ධනය වන ආකාරයෙන් පිරිමින් සහ කාන්තාවන් ද, පිරිමි ළමයින් සහ ගැහැණු ළමයින් ද සමග අභිප්‍රායන්ට අනුකූලව හා අන්‍යෝන්‍ය වශයෙන් වැරගැන්වෙන ආකාරයට වැඩකිරීම සම්බන්ධ සාක්ෂි සහ වැඩසටහන් උදාහරණ මෙම ප්‍රකාශනය විසින් ඉදිරිපත් කරනු ලැබේ.

## පිරිමින් සහ පිරිමි ළමයින් සම්බන්ධ කරගැනීම සම්බන්ධ න්‍යාය

From work with men and boys to changes of social norms and reduction of inequities in gender relations: A conceptual shift in prevention of violence against women and girls. Jewkes, R. K., Flood, M. G. and Lang, J.
The Lancet, 385 (9977), 1580-1589. 2015
මෙම විද්‍යාර්ථී ලේඛනය සාකච්ඡා කරන්නේ පිරිමින් සහ පිරිමි ළමයින් කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේ කටයුතුවලට සම්බන්ධ කරගැනීමේ වැදගත්කම පිළිබඳවයි.
අනාගත කටයුතුවලදී පිරිමින් සහ පිරිමි ළමයින් මෙන්ම කාන්තාවන් සහ ගැහැණු ළමයින් ද කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය ධාවනය කරන සමාජභාවය සම්බන්ධ සමාජ සම්මතයන් වෙනස් කිරීමට සම්බන්ධ කරගත යුතු බව එමගින් යෝජනා කරනු ලැබේ.

**© UN Women 2020**
මෙම ලේඛනය **RESPECT ව්‍යුහයේ ක්‍රියාත්මක කිරීමේ මාර්ගෝපදේශයේ** කොටසකි. එය එක්සත් ජාතීන්ගේ කාන්තා ඒකකයේ අනුග්‍රහය මත Social Development Direct විසින් සංවර්ධනය කරන ලදී. එය මෙතැනින් ලබාගත හැකිය.

**Suggested citation:** UN Women and Social Development Direct (2020) Relationship Skills Strengthened, RESPECT: Preventing Violence against Women Strategy Summary.

# පසු සටහන

[1] Heise (2011) What works to prevent partner violence? An evidence review. December 2011.

[2] Fulu, E and Kerr-Wilson, A (2015) What works to prevent violence against women and girls evidence reviews Evidence review of interventions to prevent violence against women and girls. September 2015

[3] Shai, N., Devi Pradhan, G., Chirwa, E., Shrestha, R., Adhikari, A. & Kerr-Wilson, A (2019) Factors associated with IPV victimisation of women and perpetration by men in migrant communities of Nepal, PLOS One, DOI: https://doi.org/10.1371/journal.pone.0210258

[4] UN Women (2015) A Framework to Underpin Action to Prevent Violence against Women, New York: UN Women.

[5] සාක්ෂි ශ්‍රේණිගත කිරීම් විශාල වශයෙන් උකහාගනු ලබන්නේ එකකට වඩා මැදිහත්වීම් ඇගයීම්වලිනි. ඒවා විසින් බොහෝවිට පර්යේෂණාත්ම සැලසුම භාවිතා කරනු ලැබේ. සසම්භාවී, පොකුරු සසම්භාවී හා අර්ධ පර්යේෂණාත්මක ක්‍රම එයට අයත් වේ. අධිකරණ ක්ෂේත්‍රයේ මැදිහත්වීම් වැනි ඇතැම් මූලෝපායන් සඳහා විකල්ප ඇගයීම් ක්‍රම වඩා යෝග්‍ය විය හැකි බව හඳුනාගෙන තිබේ. කාල ශ්‍රේණි, නිරීක්ෂණ සහ අංශාන්තර සැලසුම් එයට ඇතුළත් වේ. ඒවා සාමාන්‍යයෙන් සැලකෙන්නේ ගුණාත්මක අතින් පහළ ඒවා ලෙසයි. මෙය අලුතෙන් පැනනැගෙමින් පවතින ක්ෂේත්‍රයකි. එම නිසා, අධ්‍යයන සැලසුම් හා ඇගයීම් සම්බන්ධයෙන් පුළුල් පරිමාණයක විචල්‍යයන් තිබේ. මෙම සමාලෝචන සහ අධ්‍යයනයන් සඳහා මූලාශ්‍ර යොමුකිරීම්වල කොටසක් ලෙස ඉදිරිපත් කර තිබේ.

[6] Fulu, E and Kerr-Wilson, A (2015) Ibid.

[7] Karakurt, G., Whiting, K., Van Esch, C., Bolen, S. & Calabrese, J. (2016) Couple Therapy for Intimate Partner Violence: A Systematic Review and Meta Analysis, Journal of Marital Family Therapy, 42(4): 567-583

[8] Carr, A (2020) 'Evidence for the efficacy and effectiveness of systemic family therapy' in Wampler, K. et al (Eds.) The Handbook of Systemic Family Therapy, Chichester: John Wiley & Sons.

[9] See forthcoming Becoming One Evaluation; Karakurt G, Whiting K, Van Esch, Bolen S, Calabrese J (2016). Couple therapy for intimate partner violence: A systematic review and meta-analysis. J Marital Fam Ther, Volume 42, No. 4, p567583.

[10] Dunkle, K., Stern, E., Chatterji, S,. and Heise, L., (2019) Indashyikirwa programme to reduce intimate partner violence in Rwanda: Report of findings from a cluster randomized control trial. CARE. London.

[11] විධිමත් සහ අවිධිමත් සම්බන්ධතාවල වෙනස්කම් පිළිබඳ ප්‍රශ්නය මුල් Stepping Stones විසින් විශේෂ වශයෙන් මතුකරන ලදී. එය සිදුකරනු ලැබුවේ 'ආදරය යනු කුමක්ද?' යන අභ්‍යාසය ඔස්සේය. වැඩසටහන සැලසුම් කර තිබෙන්නේ අවිධිමත්/ රහස් ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන් මෙන්ම විධිමත් ලිංගික සම්බන්ධතා සහ බහු විවාහ සම්බන්ධතා පිළිබඳ කටයුතු කිරීම සඳහාය.

[12] See Stepping Stones website for further information: www.steppingstonesfeedback.org

[13] Salamandar Trust (2019) Stepping Stones and Stepping Stones Plus

[14] Jewkes R, Nduna M, Levin J, Jama N, Dunkle K, Puren A, Duvvury N. (2008) Impact of stepping stones on incidence of HIV and HSV-2 and sexual behaviour in rural South Africa: cluster randomised controlled trial. Bmj. Aug 7;337:a506. For a summary, see https://pubmed.ncbi.nlm.nih.gov/18687720/

[15] Paine, K., Hart, G., Jawo, M., Ceesay, S. & Jallow, M. (2010) 'Before we were sleeping, now we are awake': Preliminary evaluation of the Stepping Stones sexual health programme in The Gambia, African Journal of Aids Research, Volume 1, Issue 1.

[16] https://airbel.rescue.org/projects/becoming-one/ See forthcoming Becoming One Evaluation

[17] https://www.uniteforabetterlife.org

[18] McLean, L., Heise, L. & Stern, E. (2019) Shifting and transforming gender-inequitable beliefs, behaviours and norms in intimate partnerships: the Indashyikirwa couples programme in Rwanda, Culture, Health & Sexuality, DOI: 10.1080/13691058.2019.1679394; Starmann, E. (2018) Preventing Partner Violence, Working with Couples. Prevention Collaborative Prevention Brief ; The Prevention Collaborative (2019) Programme Summary: Stepping Stones. The Prevention Collaborative, December 2019 .

[19] Mclean et al (2019) Ibid.

[20] Starmann, E (2018) Preventing partner violence working with couples. Practice brief The Prevention Collaborative.

[21] Saftlas, A. F., Harland, K. K., Wallis, A. B., Cavanaugh, J., Dickey, P., & Peek-Asa, C. (2014). Motivational interviewing and intimate partner violence: a randomized trial. Annals of epidemiology, 24(2), 144-150; Lila, M., Gracia, E., Catalá-Miñana, A., 2018. Individualized motivational plans in batterer intervention programs: A randomized clinical trial. Journal of consulting and clinical psychology 86 (4), 309–320; Schumacher, J.A., Coffey, S.F., Stasiewicz, P.R., Murphy, C.M., Leonard, K.E., Fals-Stewart, W., 2011. Development of a brief motivational enhancement intervention for intimate partner violence in alcohol treatment settings. Journal of Aggression, Maltreatment & Trauma. 20 (2), 103–127.

[22] Stern, E.; Nyiratunga, R. (2017) A Process Review of the Indashyikirwa Couples Curriculum to Prevent Intimate Partner Violence and Support Healthy, Equitable Relationships in Rwanda. Soc. Sci. 2017, 6, 63.

[23] Stern, E., Mclean, L., and Heise, L (2018) Working with couples to prevent IPV. The Indashyikirwa in Rwanda.

[24] Starmann, E (2018) ibid.; Community for Understanding Scale-up (CUSP) guidance; Salamandar Trust (2017) Guidelines for Adapting Stepping Stones.

[25] Ibid.

[26] Dunkle et al (2019) Ibid.

[27] Salamandar Trust (2015) Stepping Stones Revisited: Stories from the village of Buwenda. Video on Vimeo by Salamandar Trust

[28] Mathews, C., Eggers, S.M., Townsend, L. et al (2016). Effects of PREPARE, a Multi-component, School-Based HIV and Intimate Partner Violence (IPV) Prevention Programme on Adolescent Sexual Risk Behaviour and IPV: Cluster Randomised Controlled Trial. AIDS Behav 20, 1821–1840 (2016).

[29] Shepard, B (2010) Addressing violence against women and girls in sexual and reproductive health services. New York: UNFPA

# RESPECT
# WOMEN

## මූලෝපාය සාරාංශය

### කාන්තාවන් සවිබලගැන්වීම

(Empowerment of women)

UN WOMEN

World Health Organization

# කාන්තාවන් සවිබලගැන්වීම

**මූලෝපායේ අභිමතාර්ථය :** කාන්තාවන්ගේ ආර්ථික ස්වාධීනත්වය ප්‍රවර්ධනය කිරීම, සම්බන්ධතා වර්ධනය කිරීම සහ පවුල්, ප්‍රජාවන් සහ සමාජය තුළ සාධාරණ සමාජභාවී බල සම්බන්ධතා ගොඩනැගීම සඳහා ආර්ථික, සමාජ, මානසික,සහ දේශපාලනික වශයෙන් කාන්තාවන් සහ ගැහැණු ළමයින් සවිබලගැන්වීම සඳහා පහසුකම් සැපයීම.

## තාර්කිකත්වය

ආර්ථික සමාජ, මානසික සහ දේශපාලනික වශයෙන් කාන්තාවන් සවිබලගැන්වීම යනු කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය අවම කිරීමේ ආරක්ෂණ සාධකයකි.[1] කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය යනු, සමාජය හා පවුල තුළ කාන්තාව හොබවන පහත් තත්වය පවත්වාගෙන යන සාධකයකි.

මෙම මූලෝපාය යටතේ කරනු ලබන මැදිහත්වීම් විසින් කාන්තාවන්ගේ සහ ගැහැණු ළමයින්ගේ ස්වයං සඵලත්වය (self-efficacy) ගැන ස්වයං විශ්වාසය හා කුසලතා ද, ස්වයං ගරුත්වය සහ සාකච්ඡා කුසලතාද ගොඩනගනු ලැබේ. එමගින් කාන්තාවන්ගේ ආර්ථික සාක්ෂරතාව, දේපල හා ස්වාධිපත්‍යය ද වර්ධනය වේ. පිරිමින් සහ පවුලේ වෙනත් සාමාජිකයන් මත මූල්‍ය වශයෙන් රඳාපැවතීම අවම වේ. සවිබලගැන්වීමේ මූලෝපායන් හේතුවෙන් කාන්තාවන්ගේ කේවල් කිරීමේ බලය, විශ්වාසය, තීරණ ගැනීමේ ස්වාධිපත්‍යය වර්ධනය වේ. ඔවුන්ට තමන් සහ තම පවුල වෙනුවෙන් ගෞරවනීය හා ආරක්ෂාකාරී ලෙස ක්‍රියාත්මක වීම සම්බන්ධයෙන් තෝරාගැනීම් හා නියෝජිතභාවය හිමිවේ.

ප්‍රජාවේ සිටින කොන්කරන ලද කාන්තා කණ්ඩායම් (උදා: කාන්තා ලිංගික ශ්‍රමිකයන් සහ ආබාධ සහිත කාන්තාවන්) ඇතුළු කාන්තාවන් සහ ගැහැණු ළමයින් සමග වැඩකිරීමේ ප්‍රවේශයන් මූලෝපායට අයත් වේ. විශේෂිත කාන්තා කණ්ඩායම් සමග එළඹුම් කෙරෙහි අවධානය RESPECT මාර්ගෝපදේශ මූලධර්මවලට අනුකූල වේ. බහුවිධ හා එකිනෙක විනිවිද යන විෂමතා ස්වරූප සහ අසමානතා සම්බන්ධයෙන් කටයුතු කිරීම මගින් කිසිවකු අත්හැර නොදැමීම එයට අයත් වේ.[2] තම තරුණ විය හා සම්බන්ධ බල ගතිකයන් හේතුවෙන් විශේෂ අවදානම්වලට හා අනතුරුවලට ලක්විය හැකි නවයොවුන් ගැහැණු ළමයින් ඉලක්ක කිරීමේ ප්‍රයත්නයන් ද එයට අයත් වේ.

## අවදානම් සහ ආරක්ෂණ සාධක


පහත දැක්වෙන අවදානම් සාධක සම්බන්ධයෙන් කටයුතු කිරීමට සහ කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සඳහා වන පහත දැක්වෙන ආරක්ෂණ සාධක ප්‍රවර්ධනය කිරීමට මෙම මූලෝපාය ඉලක්ක කරයි.

| මට්ටම | අවදානම් සාධක | ආරක්ෂණ සාධක |
|---|---|---|
| **පුද්ගල** | ආර්ථික අනාරක්ෂිතභාවය (කාන්තා)<br>ප්‍රචණ්ඩත්වය සාමාන්‍ය හෝ පිළිගත හැකි දෙයක් ලෙස සාධාරණීකරණය කරන ආකල්ප (පිරිමි සහ ගැහැණු)<br>පහළ ස්වයං සඵලත්වය සහ ස්වයං අභිමානය[3] | ආර්ථික අනාරක්ෂිතභාවය (පිරිමි සහ කාන්තාවන්)<br>මූල්‍ය ස්වාධිපත්‍යය (කාන්තා)<br>සමාජභාවී වශයෙන් සාධාරණ ආකල්ප හා භාවිතාවන් (පිරිමි සහ ගැහැණු)<br>ස්වයං සඵලත්වය හා ස්වයං අභිමානය පිළිබඳ ඉහළ හැඟීම (ගැහැණු) |
| **අන්තර් පුද්ගල** | සමීප සහකරු හා නීතියෙන් ඇති වූ සම්බන්ධතාවලදී ඉහළ මට්ටමේ අසමානතාව.<br>කාන්තාවන්ගේ මූල්‍ය ස්වාධීනත්වය හා පවුලේ තීරණ ගැනීමේදී සීමිත බලය | සමීප සම්බන්ධතාවල ලක්ෂණ වන්නේ, සමාජභාවී සමානතාවයි. පවුලේ තීරණ හා වගකීම් හවුලේ ගැනීම එයට අයත් වේ.<br>කාන්තාවන් සහ පිරිමින් අතර අධ්‍යාපන මට්ටමේදී වැඩි සමානත්වය |
| **ප්‍රජාව** | පිරිමින් වරප්‍රසාදිත තත්වයට පත්කරන හා කාන්තාවන් පවුලේ තීරණ ගැනීම සීමාකරන හානිකර සමාජභාවී සම්මතයන් | අවිහිංසාවට, විවිධත්වයට ගරුකිරීමට හා සමාජභාවී සමානාත්මතාව දිරිදෙන සමාජ සම්මතයන් සහ කාන්තාවන් සවිබලගැන්වීම ප්‍රවර්ධනය කිරීම |
| **සමාජයීය** | විරැකියාවෙන් පෙළෙන, ඌන රැකියා නියුක්තිය සහිත සහ සූරාකෑම සිදුවන සේවා පරිසරයන්හි සිටින කාන්තාවන්<br>කාන්තාවන්ගේ පහළ මට්ටමේ දේශපාලන සහභාගීත්වය | කාන්තා රැකියා නියුක්තියේ ඉහළ මට්ටම<br>කාන්තාවන්ගේ අධ්‍යාපනයේ ඉහළ මට්ටම<br>කාන්තාවන් සක්‍රිය ලෙස දේශපාලනයේ නියුතු වීමේ ඉහළ මට්ටම |

### වෙනස්වීමේ න්‍යාය

පහත දැක්වෙන රූපසටහනෙන් නිරූපණය කරනු ලබන්නේ, සමාජමය හා ආර්ථික වශයෙන් කාන්තාවන් සවිබලගන්වන හා කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය අඩුකිරීමට හේතු වන සාක්ෂි මත පදනම් වූ මැදිහත්වීම් සඳහා සරල කරන ලද වෙනස්කිරීමේ න්‍යායකි. එය විශේෂිත වැඩසටහන් සඳහා තවදුරටත් සංවර්ධනය කර අනුරූප කරගත යුතුය.

## E: කාන්තාවන් සවිබලගැන්වීම



## මැදිහත්වීම් වර්ග

මෙම මූලෝපාය යටතේ මැදිහත්වීම්වලට පහත සඳහන් කරුණු ඇතුළත් වේ:කාන්තාවන්ගේ වෘත්තීය, මූල්‍ය හා ජීවන කුසලතා, අසමාන ලෙස උරුමය බෙදීයාම හා දේපළ අයිතිය වැනි සමාජ, දේශපාලනික හා ආර්ථික වශයෙන් ඇතුළත් කරගැනීමට ඇති බාධා සහ සමාජ ජාල හා සාමූහික නියෝජනයන් නිර්මාණය කරගැනීම. මෙම මූලෝපායන්ගේ අරමුණ වන්නේ, තම සම්බන්ධතාවන්වලදී, පවුල්වලදී හා ප්‍රජාවේදී අසමානතාවට හා යටත් කරගැනීමට අභියෝග කිරීම සඳහා පුද්ගල, කණ්ඩායම් හා සමූහ බලය ගොඩනැගීමයි. ඇතැම් අවස්ථාවලදී, වැඩසටහන් විසින් සහමුලින්ම එක් ආර්ථික හෝ සමාජ සවිබලගැන්වීමක් කෙරෙහි අවධානය යොමුකරනු ලැබේ. වෙනත් වැඩසටහන් සමාජ හා ආර්ථික මැදිහත්වීම් සමග සම්බන්ධ කරයි. පහත දැක්වෙන වගුව විසින් නිරූපණය කරනු ලබන්නේ RESPECT ව්‍යුහයෙහි දක්වා තිබෙන ප්‍රධාන මැදිහත්වීම් වර්ගයි. වර්තමාන සාක්ෂි පදනම හා වැඩසටහන් උදාහරණ ගැන ද එහි දැක්වේ.

**LEGEND**

- ● **බලාපොරොත්තු සහගත**, <1 පරිණාමය විසින් ප්‍රවණ්ඩත්ව ප්‍රතිඵලවල සැලකියයුතු අඩුවීමක් පෙන්නුම් කරනු ලැබේ.
- ■ **වැඩිදුර සාක්ෂි අවශ්‍යය**, <1 පරිණාමය විසින් ප්‍රවණ්ඩත්වය සම්බන්ධ මධ්‍යකාලීන ප්‍රතිඵලවල වර්ධනයක් පෙන්නුම් කරයි.
- ◆ **ගැටලු සහගත** - පරිණාමය විසින් ප්‍රවණ්ඩත්වය අවම කිරීම සම්බන්ධයෙන් පෙන්නුම් කරන්නේ එකිනෙකට පරස්පර ප්‍රතිඵලය.
- ☐ **සාක්ෂි නොමැත** - මැදිහත්වීම තවමත් එතරම් බැරෑරුම් ලෙස පරිණාමය වී නැත.
- ▼ **අකාර්යක්ෂම**, <1 පරිණාමය විසින් ප්‍රවණ්ඩත්ව ප්‍රතිඵලවල අඩුවීමක් පෙන්නුම් කරනු නොලැබේ.
- H ලෝක බැංකුවේ ඉහළ ආදායම් රටවල් (HIC)
- L ලෝක බැංකුවේ පහළ හා මැදි ආදායම් රටවල් (LMIC)

| මැදිහත්වීම් වර්ගය | විස්තරය | කාර්යක්ෂමතාවේ සාක්ෂි | උදාහරණ වැඩසටහන් |
|---|---|---|---|
| **කාන්තාවන් සහ ගැහැණු ළමයින් සඳහා සවිබලගැන්වීම පුහුණුකිරීම. ජීවන කුසලතා, ආරක්ෂිත අවකාශ[4] සහ මාර්ගෝපදේශය** | කාන්තාවන් සහ ගැහැණු ළමයින්ගේ සමාජ සවිබලගැන්වීම කෙරෙහි අවධානය යොමු කළ මැදිහත්වීම් මෙයට ඇතුළත් වේ. ජීවන කුසලතා, ආරක්ෂිත අවකාශ සහ මාර්ගෝපදේශය එයට අයත්ය.<br><br>ලිංගික ශ්‍රමිකයන් වැනි කොන්කරන ලද කාන්තා කණ්ඩායම් ද එයට ඇතුළත් විය හැකිය. | L මෙම වර්ගයේ මැදිහත්වීම් මගින් කාන්තාවන් සහ ගැහැණු ළමයින් සමීප සහකරු ප්‍රචණ්ඩත්වය ඇතුළු ප්‍රචණ්ඩත්වය අත්දැකීම අඩුකළ හැකි බවට LMIC රටවලින් **බලාපොරොත්තු සහගත** සාක්ෂි තිබේ.<br><br>H මෙම වර්ගවල ප්‍රවේශයන් මගින් ප්‍රචණ්ඩත්වය වැඩිවිය හැකි බවට HIC රටවලින් **වැඩිදුර සාක්ෂි අවශ්‍යය**.<br><br>නවයොවුන් ගැහැණු ළමයින් සමග වැඩකිරීමේදී, වඩාත්ම ඵලදායී ප්‍රවේශයට වසරක් හෝ වැඩි කාලයක් තුළ සම්පාදනය කරන ලද තීව්‍ර කණ්ඩායම් පාදක සමාජ සවිබලගැන්වීමේ මැදිහත්වීම් සම්බන්ධ වේ.[5] | The Adolescent Girls Initiative (AGI) (කෙන්යාව)<br><br>AVAHAN sex worker collectivisation (ඉන්දියාව) |
| **උරුමය හා දේපළ හිමිකාරීත්වය ප්‍රතිපත්ති සහ මැදිහත්වීම්** | ඉඩම් සහ වෙනත් ඵලදායී දේපළ සම්බන්ධයෙන් කාන්තාවන්ගේ ප්‍රවේශය හා පාලනය උරුමය සහ දේපළ හිමිකම් සම්බන්ධ නීති වැඩිදියුණු කිරීම ඉලක්ක කරන මෙන්ම පවුල්වලට ගැහැණු ළමයින්ගේ වටිනාකම වැඩිකරන මැදිහත්වීම් මෙයට ඇතුළත්ය. | L අසමාන උරුමය හා දේපළ අයිතිය සංශෝධනය කිරීම සමස්ත කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය මට්ටම අඩුකිරීමේදී වැදගත් වන බව බළුෂක රටවලින් **බලාපොරොත්තු සහගත සාක්ෂි** තිබේ. උරුම හිමිකම් පිරිමින් හා ගැහැණුන් අතර සමාන අන්දමින් බෙදී යන තත්වය සැකසූ ඉන්දියාවේ ප්‍රාන්තව විශ්ලේෂණවලින් ද එය හෙළි විය. 1976 - 2004 අතර වකවානුවේදී පොලිසියට වාර්තා වූ කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය 36%කින් පහළ වැටිණි.<br><br>H HIC රටවලින් **සාක්ෂි ලැබී නැත**. | The change in inheritance law (ඉන්දියාව) |

| මැදිහත්වීම් වර්ගය | විස්තරය | කාර්යක්ෂමතාවේ සාක්ෂි | උදාහරණ වැඩසටහන් |
|---|---|---|---|
| **සමාජභාවය සමග සම්බන්ධ කරන ලද ක්ෂුද්‍ර මූල්‍ය ණය සහ සවිබලගන්වන ලද පුහුණු සංරචක** | ආර්ථික හා සමාජ සවිබලගැන්වීමේ ෂංරචක ඒකාබද්ධ කරන බලාපොරොත්තු සහගත එළඹුම් රැසක් තිබේ. මෙම මැදිහත්වීම් කාන්තාවන්ගේ හා ගැහැණු ළමයින් සවිබලගැන්වීම, කාන්තාවන්ගේ සමාජ කුසලතා හා විශ්වාසය සහ ඔවුන්ගේ මූල්‍ය සාක්ෂරතාව හා ස්වාධීනත්වය වර්ධනය කිරීම අරමුණු කරගත් ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් සාකල්‍ය දැක්මකින් කටයුතු කරයි. ඇතැම් මැදිහත්වීම්වලදී පිරිමි සහකරුවන් හෝ සම වයස් පිරිමි ළමයින් සම්බන්ධ කරගනු ලැබේ. එහි අරමුණ වන්නේ ඇතිවිය හැකි ප්‍රතිරෝධයන් අවම කිරීම සහ පිරිමින්ගේ හා පිරිමි ළමයින්ගේ සහාය ලබාගැනීමයි. පිරිමින් හෝ පිරිමි ළමයින් වඩා ගැඹුරින් මෙම වැඩසටහන් සමග සම්බන්ධ කිරීම වෙනත් වර්ගවල මැදිහත්වීම්වලට අයත්ය. එහි අරමුණ වන්නේ පිරිමින් හා පිරිමි ළමයින් හට ද මැදිහත්වීම හරහා පූර්ණ ආර්ථික හා සමාජ සවිබලගැන්වීම ලබාදීමයි. | ආර්ථික හා සමාජ සවිබලගැන්වීමේ සංරචක (ජීවන කුසලතා, ආරක්ෂිත අවකාශ සහ ආර්ථික මැදිහත්වීම් සමග සම්බන්ධ මාර්ගෝපදේශනය ඇතුළු) ඒකාබද්ධ කළ කාන්තාවන්ගේ හා ගැහැණු ළමයින්ගේ සමාජ සවිබලගැන්වීමේ අරමුණු මගින් කාන්තාවන් සහ ගැහැණු ළමයින් සමීප සහකරු ප්‍රචණ්ඩත්වයට මුහුණදීම අඩුකළ හැකි බවට LMIC රටවලින් **බලාපොරොත්තු සහගත සාක්ෂි** තිබේ. මෙම මැදිහත්වීම්වලට පිරිමින් හා කාන්තාවන් සම්බන්ධ විටදී, ඔවුන්ට පිරිමින්ගේ වාර්තාගත සමීප සහකරු ප්‍රචණ්ඩත්ව වැරදි අඩුකළ හැකි බවට ද සාක්ෂි තිබේ. HIC රටවලින් **සාක්ෂි ලැබී නැත.** | MAISHA (ටැන්සානියාව)<br><br>Zindagii Shoista (තජිකිස්තානය)<br><br>Do Kadam Barabari Ki Ore (Two Steps Towards Equality) (ඉන්දියාව) |

## උදාහරණ වැඩසටහන්

වැඩසටහන් කාල රාමුව තුළදී කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය පැවැත්මෙහි අඩුවීමක් වාර්තා කළ එකිනෙකට වෙනස් වැඩසටහන් තුනක් පහත දැක්වෙන වගුවේ සාරාංශගත කර තිබේ. මෙම ක්‍රමවේද ඕනෑම එකක් අනුරූප කරගැනීමේදී මෙම වගුව 8වන පිටුවෙහි තිබෙන **සැලසුම් හා ක්‍රියාත්මක කිරීමේ පිරික්සුම් ලැයිස්තුව** සහ සඤ්ජනනඹ ව්‍යුහය සමග ලබාදී තිබෙන **ඵලදායී වැඩසටහන්කරණයේ මාර්ගෝපදේශ මූලධර්ම** සමග සමාලෝචනය කළ යුතුය. සෑම වැඩසටහනක් ගැනම වඩා සවිස්තර තොරතුරු **වැඩසටහන් සාරාංශවල** සපයා තිබේ.

| වැඩසටහන | විස්තරය | ස්ථානය | ඉලක්ක ජනගහනය | මූලික ක්‍රියාකාරකම් | කාල පරිච්ඡේදය | ඇගයීම හා බලපෑම |
|---|---|---|---|---|---|---|
| MAISHA **(based on IMAGE)**[6] | ක්ෂුද්‍ර මූල්‍ය හා සමාජභාවී සවිබලග ැන්වීමේ මැදිහත්වීමකි. එහි අරමුණ වන්නේ ප්‍රජාවන්ගේ ආර්ථික යහපැවැත්ම සහ ස්වාධීනත්වය වර්ධනය කිරීමයි. එච්අයිවී හා කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය අවදානම අඩුකිරීමට ද ඉලක්ක කරනු ලැබේ. | ටැන්සානියාව | ක්ෂුද්‍ර මූල්‍ය කණ්ඩායම්වල දුප්පත් ග්‍රාමීය කාන්තාවන් | කලින් පිහිටුවන ලද ක්ෂුද්‍ර මූල්‍ය කණ්ඩායම්වල කාන්තාවන්ට දින 20ක කාලයක් තුළ **සහභාගීත්ව සවිබලගැන්වීමේ සැසි 10කට** සහභාගී වීමට ආරාධනා කරන ලදී.<br><br>සෑම වැඩසටහනක්ම පැය 1.5 - 2 අතර කාලයක් පැවැත්විණි. එය ඉදිරිපත් කරනු ලැබුවේ කාන්තා මෙහෙයවන්නියක විසිනි. Wanawake Na Maisha (කිස්වහිලි බසින් කාන්තාවන් හා ජීවිතය) විෂයමාලාව අනුගමනය කරන ලදී | මාස 24 | **ඇගයීම් වර්ගය:** අහඹු ලෙස පාලිත පරීක්ෂණය (RCT) සහ සිරස් ගුණාත්මක පර්යේෂණ (longitudinal qualitative research)[7]<br><br>**ප්‍රධාන සොයාගැනීම්:**<br>• කාන්තාවන් ශාරීරික සහ/ හෝ ලිංගික සමීප සහකරු ප්‍රචණ්ඩත්වයට ගොදුරු වීම 25%කින් අඩුවීම<br>• සමීප සහකරු ප්‍රචණ්ඩත්වය හා වැඩිවුණු කාන්තා ආත්ම විශ්වාසය සම්බන්ධයෙන් වර්ධනය වූ අදහස් |

| වැඩසටහන | විස්තරය | ස්ථානය | ඉලක්ක ජනගහනය | මූලික ක්‍රියාකාරකම් | කාල පරිච්ඡේදය | ඇගයීම හා බලපෑම |
|---|---|---|---|---|---|---|
| Zindagii Shoista<br>**(ගරුත්වයෙන් ජීවත් වීම)** | සමාජභාවී සවිබල-ගැන්වීම, ආදායම් උත්පාදනය කිරීමේ ක්‍රියාකාරකමක් ආරම්භ කිරීමේ පුහුණුව සහ පවුල් තුළ එයට සහාය වීම සඳහා ක්ෂුද්‍ර ප්‍රදාන සහිත පවුල් මූලික මැදිහත්වීමකි. | ග්‍රාමීය තජිකිස්තානය | තරුණ විවාහක කාන්තාවන් සහ ඔවුන්ගේ පවුල් (නීතිමය ඥාතීන් ද ඇතුළුව) | මැදිහත්වීම ක්‍රියාත්මක කරනු ලැබුවේ බහු පාරම්පරික පවුල් සාමාජිකයන් සිව්දෙනෙකු දක්වා පිරිසකගෙනි. එහි පහත දැක්වෙන අය ඇතුළත් වූහ:<br>• සති 10ක් පුරා සමාජභාවී සාධාරණත්වය, ගරුත්වය, සන්නිවේදනය සහ ප්‍රචණ්ඩත්වය අවම කිරීම ඇතුළත් සමාජ සවිබලගැන්වීමේ සැසි 10ක්ග<br>• සති 10ක් පුරා සමාජභාවය, වැඩ සහ ජීවනෝපාය ශක්තිමත් කිරීම, ව්‍යාපාර සංවර්ධනය සහ ආදායම් උත්පාදන ක්‍රියාකාරකම් සහිත තරුණ විවාහක කාන්තාවන් සහ පවුලේ වෙනත් සාමාජිකයන් ඉලක්ක කරගත් ආර්ථික සවිබලගැන්වීමේ සැසි<br>• සෑම පවුලකටම ආදායම් උත්පාදන ක්‍රියාකාරකමක් ආරම්භ කිරීම සඳහා ඩොලර් 370ක මුදලක් ලබාදෙන ලදී.<br>• අධීක්ෂණය සහ ආදායම් උත්පාදන ක්‍රියාකාරකම් සඳහා උපකාර කිරීම[8] | මාස 18යි | **ඇගයීම් වර්ගය:** මිශ්‍ර ක්‍රමය<br>**ප්‍රධාන සොයාගැනීම්:**<br>• සම්බන්ධතා ගතිකයන්ගේ, මානසික සෞඛ්‍යයේ සහ සමාජ ආර්ථික තත්වයන්ගේ සාධනීය වෙනස්කම් සොයාගන්නා ලදී.<br>• පිරිමින් විසින් සිදුකරන හා කාන්තාවන් විසින් විඳිනු ලබන සමීප සහකරු ප්‍රචණ්ඩත්වයේ සෑම ස්වරූපයකම සංඛ්‍යාත්මක වශයෙන් කැපීපෙනෙන අඩුවීමක් සිදුවිය. |

| වැඩසටහන | විස්තරය | ස්ථානය | ඉලක්ක ජනගහනය | මූලික ක්‍රියාකාරකම් | කාල පරිච්ඡේදය | ඇගයීම හා බලපෑම |
|---|---|---|---|---|---|---|
| The Adolescent Girls Initiative, **කෙන්යාව** | නවයොවුන් ගැහැණු ළමයින් සඳහා බහුආංශික සවිබලගැන්වීමේ මැදිහත්වීම් (සමාජ, සෞඛ්‍ය, අධ්‍යාපනික සහ ආර්ථික) | කෙන්යාවේ කොන්කරන ලද ප්‍රදේශ දෙකක්<br><br>නයිරෝබිහි කිබරා සහ ඊසානදිග කෙන්යාවේ වජීර් ප්‍රාන්තය | වයස 11-15 අතර නව යොවුන් වියේ පසුවන ගැහැණු දරුවන් | මෙම වැඩසටහනෙහි එකිනෙකට වෙනස් අංග හතරකි. ප්‍රජා පාදක ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේ වැඩසටහනක්, අධ්‍යාපන කොන්දේසිය මත මුදල් ලබාදීමේ වැඩපිළිවෙලක්, සෞඛ්‍යය මූලික කරගත් ගැහැණු ළමයින් සවිබලගැන්වීමේ සමාජ සහ මූල්‍ය අධ්‍යාපය හා ඉතුරුම් | වයස අවුරුදු 20 වැඩි | **ඇගයීම් වර්ගය:** අහඹු ලෙස පාලිත පරීක්ෂණය (RCT) සත්කාර අංග හතරක් සමග[10]<br><br>**අවුරුදු දෙකක මැදිහත්වීමෙන් පසු ප්‍රධාන සොයාගැනීම්:**<br>• ප්‍රචණ්ඩත්වය අඩුකිරීම සම්බන්ධයෙන් කැපීපෙනෙන සාධනීය ප්‍රතිඵල, ප්‍රාථමික අධ්‍යාපනය සම්පූර්ණ කිරීම, ලිංගික හා ප්‍රජනන සෞඛ්‍ය දැනුම, සමාජ ආරක්ෂණ ජාල, මූල්‍ය සාක්ෂරතාව සහ ඉතුරුම් චර්යා සහ නාගරික ප්‍රදේශවල පවුල් ආර්ථික තත්වය<br><br>**සම්පූර්ණ කිරීමෙන් දෙවසරකට පසු ප්‍රධාන සොයාගැනීම්:**<br>• ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන් තිරසර බලපෑමක් නැත.<br>• වජීර්හි මූලික මට්ටමේදී පාසලෙන් ඉවත්වූ ගැහැණු ළමයින් සම්බන්ධයෙන් විවාහය හා ගර්භණීභාවය ප්‍රමාද වීම සම්බන්ධ කැපීපෙනෙන සාධනීය බලපෑම් සහ පාසලට ඇතුළත්වීම වැඩිවීම<br>• කිබරාහි වැඩිමහල් ගැහැණු ළමයින් සම්බන්ධයෙන් ලිංගික ජීවිතයට ඇතුළු වීම හා ළමයින් හැදීම සම්බන්ධයෙන් කැපීපෙනෙන සාධනීය බලපෑම් |

# සැලසුම් සහ ක්‍රියාත්මක කිරීමේ පිරික්සුම් ලැයිස්තුව

කාන්තාවන්ගේ සමාජ හා ආර්ථික සවිබලගැන්වීමට අදාළ වන **ඵලදායී එළඹුමක පොදු ලක්ෂණ සහ මූලධර්ම**

## වැඩසටහන් සැකසීම හා අනුරූප කරගැනීම

1. **ඉලක්ක ජනගහනය හඳුනාගන්න.** ජීවිත යථාර්ථයන්ට අනුව හැඩගැස්වන ලද ඉලක්ක එළඹුම් හා යෝග්‍ය මැදිහත්වීම් ඔස්සේ වඩාත්ම කොන්කරන ලද කාන්තාවන් සහ ගැහැණු ළමයින් සමග වැඩකරන්න. සංදර්භයන්ට නිශ්චිත අවදානම් හඳුනාගැනීමට හා පාසලෙන් බැහැර වූ ගැහැණු ළමයින් සහ ආබාධ සහිත කාන්තාවන් හා ගැහැණු ළමයින් වැනි විශේෂයෙන් කොන්කරන ලද උප ජනගහනයන් වෙත ළඟාවීම සඳහා සහභාගීත්ව මෙවලම් හා උපදෙස් විමසීමේ ක්‍රියාවලි උපයෝගී කරගත හැකිය. මැදිහත්වීම් සැලසුම් කිරීමට පෙර, විශේෂිත කාන්තා උප කණ්ඩායම් මුහුණදෙන බාධක හඳුනාගැනීම් සඳහා තත්ව විශ්ලේෂණයක් හා අවශ්‍යතා තක්සේරුවක් සිදුකළ යුතුය.[11] මැදිහත්වීම් සැලසුම් කළ යුතු වන්නේ සහ හැඩගැස්වාගත යුත්තේ ඒ අනුවයි.

2. **සමාජභාවී භූමිකා සහ ආදායම් උත්පාදනය පිළිබඳ සංවර්ධනාත්මක සමීක්ෂණ පවත්වන්න.** විවාහක සහ අවිවාහක කාන්තාවන් විසින් ආදායම් ඉපැයීම භාරගත හැක්කේ කුමන තත්වයන් යටතේද, කළ යුත්තේ කුමන රැකියාද, ඒ ඇයිද යන්න තේරුම්ගැනීම සඳහා මෙය ඉතා වැදගත්ය. වැඩකරන කාන්තාවකට පිරිමින්, පවුල සහ ප්‍රජාව ප්‍රතිචාර දක්වන්නේ කෙසේද යන්න සම්බන්ධයෙන් එහි විශාල බලපෑමක් තිබේ. මැදිහත්වීම් සමාජභාවී භූමිකාවන්ට අභියෝගාත්මක වන විට ඇතිවිය හැකි ප්‍රතිචාර අවම කිරීම සඳහා සූදානම් වන්න.

3. **ආර්ථික සවිබලගැන්වීමේ සංරචක ප්‍රාදේශීය ජීවනෝපාය අවස්ථා මත පදනම් වන බව සහතික කරන්න.** උදාහරණයක් ලෙස, ආර්ථික සවිබලගැන්වීමේ මැදිහත්වීම් සැලසුම් කළ යුත්තේ කාන්තාවන් සඳහා තිබෙන ජීවනෝපාය විකල්ප පිළිබඳ වෙළඳපොළ විශ්ලේෂණයක් මතය. හැකි විටදී, තිබෙන සහාය ලබාගත යුතුය.[12] (උදා: ක්ෂුද්‍ර ණය, ග්‍රාමීය ඉතුරුම් සහ ණය සංගම් (VSLAs), ස්වයං උපකාර කණ්ඩායම් (SHGs)

4. **ඇතිවිය හැකි ප්‍රතිචාර හඳුනාගෙන අවම කරන්න.** මෙම මූලෝපාය මගින් පීතෘමූලික පසුබිම් තුළදී සම්ප්‍රදායික සමාජභාවී භූමිකාවන්ට සෘජුව අභියෝග විය හැකිය. එම නිසා, ඇතිවිය හැකි ප්‍රතිරෝධය අවම කිරීමේ උත්සාහයන් එයට ඇතුළත් විය යුතුය. ප්‍රචණ්ඩත්වය වැඩිකිරීමේ අවදානම ද එයට අයත් වේ. සම්බන්ධතාවලදී හෝ පවුලේදී මූල්‍ය ගැටුම් හැසිරවිය යුත්තේ කෙසේද යන පුහුණුව ද එයට ඇතුළත් විය යුතුය.[13] පිරිමි සහකරුවන් සමග සම්බන්ධ වන මූලෝපාය ද එහි තිබිය යුතුය.[14] උදාහරණයක් ලෙස, කාන්තාවන්ගේ ඉහළ ගිය මූල්‍ය ආදායම් පවුලේ ආදායමට දායකත්වයක් ලෙස සැලකීම ප්‍රවර්ධනය කිරීම සහතික කිරීම සඳහා පවුලේ ආර්ථික සංවර්ධනය වෙනුවෙන් එක්ව වැඩකිරීමේ අදහස උපකාරී විය හැකිය. නීතියෙන් ඥාති වූවන්ගේ බලපෑම් මත කාන්තාවන්ගේ ජීවිත සීමාකර තිබෙන විටදී, පවුල් පාදක එළඹුම් යෝග්‍ය විය හැකිය. උදාහරණයක් ලෙස, තජිකිස්තානයේ Zindagii Shoista විසින් තරුණ විවාහක කාන්තාවන් සහ ඔවුන්ගේ ඥාතීන් (නීතිමය නෑදෑයන්) ඉලක්ක කරන ලදී. විය හැකි ප්‍රතිරෝධය අවම කිරීමට එය ඉවහල් විය. එසේ වන්නේ පවුල තුළ කාන්තාවන්ගේ තත්වය සහ ඔවුන් මුහුණදෙන විවිධ ස්වරූපවල ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන් කටයුතු කරන අතරය.[15]

5. **පුහුණුව හා ධාරිතා ගොඩනැගීම මෙහෙයවන්නන්ට ප්‍රමාණවත් කාලය සහ සම්පත් තහවුරු කිරීම.** සමාජභාවී පරිවර්තනීය මැදිහත්වීම් සඳහා හොඳින් පුහුණු වූ මෙහෙයවන්නන් අවශ්‍යය. එසේම, ප්‍රමාණවත් කාලය සහ පෞද්ගලික නැවත සලකාබැලීම් හා ප්‍රශ්න කිරීම් සහ මෙහෙයවන්නන්ට විවිධ තත්වයන් හා සහභාගිකයන්ගේ ප්‍රශ්න හැසිරවීම ඉගෙනීම සඳහා ප්‍රමාණවත් කාලයක් අවශ්‍යය.[16] උදාහරණයක් ලෙස, මෙහෙයවන්නන්ට විෂය මාලාව සහ භාවිතා කිරීමේ කුසලතා හුරුවීම සඳහා පුළුල් පුහුණුව MAISHA තුළ අඩංගු විය.[17]

6. **ක්‍රියාත්මක කිරීමේ හවුල්කරුවන් සතුව ප්‍රමාණවත් විශේෂඥභාවය තිබෙන බව සහතික කරන්න.** ක්ෂුද්‍ර මූල්‍ය වැනි මැදිහත්වීම් සඳහා ආයතනික (යෝග්‍ය අධීක්ෂණ හා ඇගයීම් පද්ධති වැනි) සහ පුද්ගල කාර්ය මණ්ඩල නිපුණතා (ශක්තිමත් මෙහෙයවීමේ කුසලතා සහ සමාජභාවී සාධාරණ ආකල්ප වැනි) විශේෂිත කුසලතා සහ අත්දැකීම් අවශ්‍යය. සේවා සම්පාදනය කළ යුතු වන්නේ ශක්තිමත් ක්‍රියාත්මක කිරීමේ හවුල්කරුවන් සමගය. ඔවුන්ට අදාළ අත්දැකීම් තිබිය යුතුය. එවැනි මැදිහත්වීම් මෙහෙයවීම සම්බන්ධයෙන් පුළුල් පුහුණුව ලබා සිටිය යුතුය. වටිනාකම්, මූලධර්ම හා එළඹුම් ගැන අවබෝධය තිබිය යුතුය.[18]

## ක්‍රියාත්මක කිරීම හා පුළුල් කිරීම

7. **කාන්තාවන්ගේ ආර්ථික තත්වයෙහි සැලකියයුතු වෙනසක් ඇතිකිරීම සඳහා ආර්ථික වශයෙන් සවිබලගැන්වීමේ කාර්යයන් සඳහා අවශ්‍ය තරම් අරමුදල් තහවුරු කරගන්න.** පරිණත වීම සඳහා ප්‍රමාණවත් කාලයක් ලබාදෙන්න. ක්ෂුද්‍ර මූල්‍ය සහ කුඩා පරිමාණ ආදායම් උත්පාදන ක්‍රියාකාරකම්වල ආර්ථික වාසි කාන්තාවන්ට හා ඔවුන්ගේ පවුල්වලට ලැබීමට කාලයක් (මාස 12කට වැඩි) ගතවේ. අනපේක්ෂිත කම්පනයන් නිසා ඒවාට තර්ජන එල්ලවීමට ද පුළුවන. කාන්තාවන්ගේ ආර්ථික වාසි කාන්තාවන්ට තම සම්බන්ධතා පරිවර්තනය කරගැනීම සඳහා අවශ්‍ය ආර්ථික වත්කම් ලබාදීම සඳහා ප්‍රමාණවත් තරම් කැපීපෙනෙන මට්ටමක තිබිය යුතුය. සමාජභාවී ආකල්ප හා භාවිතාවන්ගේ වෙනස්කම්වලට ඉඩදීම සඳහා ද කාලයක් ගතවේ. ක්‍රියාත්මක කිරීම සඳහා නිර්දේශිත කාලය අවුරුදු තුනකට වැඩිය. අවුරුද්දක සූදානම් වීමේ කාලයක් ද අවශ්‍යය.

8. **සෑම සංරචකයක් වෙනුවෙන්ම වෙනම අරමුදලක් පවත්වාගන්න.** සමාජභාවී සවිබලගැන්වීම තහවුරු කිරීම සඳහා පුළුල් කිරීමේදී ස්වයංව තිරසර වීමේ හැකියාව තිබෙන ක්ෂුද්‍ර මූල්‍ය වියදම්වලට බලපෑමක් ඇතිවන්නේ නැත. සමාජභාවී සවිබලගැන්වීමේ සංරචකය සඳහා බාහිර අරමුදල් අවශ්‍ය වීමේ ඉඩක් තිබේ.[19]


9. **වැඩිකරන ලද ඉතුරුම් සහ ආදායම් ගෘහස්ථ මට්ටමේදී භාවිතා කරන බව තහවුරු කිරීම සඳහා පරිස්සමෙන් අධීක්ෂණය කරන්න.** උදාහරණයක් ලෙස, කාන්තාවන්ට සම්පත් සම්බන්ධයෙන් තනි හෝ හවුල් පාලනය තිබෙන බව තහවුරු කිරීම සඳහාත්, මැදිහත්වීම්වල ප්‍රතිඵලයක් ලෙස සම්බන්ධතාවල හා පවුල්වල ප්‍රචණ්ඩත්වය වැඩි නොවන බව තහවුරු කිරීම සඳහාත් අධීක්ෂණය අවශ්‍යය.[20] සවිබල-ගැන්වීමේ මූලෝපායන් ක්‍රියාත්මක කිරීම, විශේෂයෙන්ම, ආර්ථික වශයෙන් සවිබලගැන්වීමට අදාළ ඒවා ද අධීක්ෂණය කරන්න. වැටුප් නොගෙවන කාන්තා ශ්‍රමය භාවිතා කිරීම පිළිබඳ අදහස වැරගැන්වීම හෝ සුරැකෙන පරිදි කටයුතු කිරීම නොකරන්න. ඔවුන්ගේ සවිබලගැන්වීම අහිමි කරන අමතර කාලභාරයන් නොපණවන්න.[21]

10. **ගැහැණු ළමයින්ගේ සංකීර්ණ හා බහුවිධ අවශ්‍යතා සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා සවිබලගැන්වීමේ මැදිහත්වීම් අධ්‍යාපනය හා සෞඛ්‍යය සමග ඒකාබද්ධ කරන්න.** ඒ නවයොවුන් ගැහැණු ළමයින්ගේ ජීවිතවල ඉතා වැදගත් සමයන්හිදී මැදිහත්වීම්වල බලපෑම සහ පිරිවැය කාර්යක්ෂමතාව උපරිම කිරීම සඳහාය. උදාහරණයක් ලෙස, ලිංගික හා ප්‍රජනන සෞඛ්‍ය තොරතුරු වෙත ප්‍රවේශය තහවුරු කිරීම නවයොවුන් ගැහැණු ළමයින්ට ඉතා වැදගත්ය. එමගින් ඔවුන්ට තම ශරීරය හා ජීවිත ගැන තෝරාගැනීම් කළ හැකිය.[22] ලිංගික හා ප්‍රජනන සෞඛ්‍ය තොරතුරු සහ සේවා බොහෝවිට අහිමි වන ආබාධ සහිත නවයොවුන් ගැහැණු ළමයින් ඇතුළත් කරගත යුතුය. කිසිවකුට හානි නොකිරීමේ මූලධර්මය මත පදනම්ව, නවයොවුන් ගැහැණු ළමයින්ගේ ජීවනෝපාය ඉපයීමේ ඕනෑම ක්‍රියාකාරකමක් ප්‍රවේශමෙන් අධීක්ෂණය කරන්න. එමගින් ඔවුන් නොසිතූ අන්දමේ සූරාකෑමකට හෝ අපයෝජනයට ලක්නොවිය යුතුය. එසේම, එමගින් ඔවුන්ට අධ්‍යාපනය අහිමි නොවිය යුතුය.

11. **කාන්තාවන් සහ ගැහැණු ළමයින් සම්බන්ධයෙන් පවත්නා යථාර්ථයන් හා සීමාවන් සමග ගැලපෙන පරිදි ක්‍රියාකාරකම් සැලසුම් කරන්න.** උදාහරණයක් ලෙස, ගෘහස්ථ හා ළමයින් රැකබලාගැනීමේ වගකීම්, පාසල් හා විශ්වවිද්‍යාල අධ්‍යයන. කාන්තාවන්ට හා ගැහැණු ළමයින්ට අඳුරු වැටුණු පසු ගමන් යාමේ සීමා, ආරක්ෂාව හා ගමන් බිමන් යාම සම්බන්ධ ගැටලු ආදිය සැලකිය හැකිය.

12. **කාන්තාවන් සහ ගැහැණු ළමයින් නමට පමණක් සහභාගී කරගැනීමෙන් වළකින්න.** ඒ වෙනුවට, ව්‍යාපෘතිය හරහා කෙතරම් හොඳින් කාන්තාවන් සවිබලගැන්විය හැකිද යන කරුණ සම්බන්ධයෙන් අඛණ්ඩව සිහි කැඳවීම වෙනුවෙන් අවස්ථා නිර්මාණය කරන්න. හවුල් නිෂ්පාදනය ද සිතෙහි තබාගන්න.

13. **කාන්තාවන්ට සහ ගැහැණු ළමයින්ට හමුවිය හැකි, සමාජානුයෝගය විය හැකි, වැදගත් කරුණු සාකච්ඡා කළ හැකි සහ කුසලතා සංවර්ධනය කරගත හැකි ආරක්ෂිත ස්ථාන සපයන්න.** උදාහරණයක් ලෙස, විශේෂිත වශයෙන් සැලසුම් කරන ලද ආරක්ෂිත ස්ථාන, කාන්තා මධ්‍යස්ථාන, සැලෝන් හෝ ප්‍රජා මධ්‍යස්ථානයක හමුවීම සඳහා වෙන්කරන ලද නිශ්චිත කාලයක්, සායන ආදිය සැලකිය හැකිය. කණ්ඩායම් පාදක මැදිහත්වීම් මගින් කාන්තාවන්ට සම්බන්ධතා ගොඩනැගීම, සන්නිවේදනය, ගැටලු විසඳීම හා ව්‍යාපාරික කුසලතා සම්බන්ධයෙන් එකිනෙකාට අවවාද දීමෙන් උපකාර කරගැනීම සඳහා වේදිකාවක් සැපයේ. එය ආර්ථික, චිත්තවේගී සහ ශාරීරික ලිංගික ප්‍රචණ්ඩත්වයේ අවදානම අඩුකිරීමට දායක වන බව සොයාගෙන තිබේ.[23] ආරක්ෂිත ස්ථාන විශේෂිත අවදානම් සහිත අය ද ඇතුළු සියලු කාන්තාවන්ට සහ ගැහැණු ළමයින්ට පිවිසිය හැකි ස්ථාන විය යුතුය. ඒවා කාන්තාවන්ට හා ගැහැණු ළමයින්ටත්, වෙනත් පවුල් සාමාජිකයන්ටත් පිළිගත හැකි ඒවා විය යුතුය.



## ඇතුළත් වීමේ ස්ථාන

පහත දැක්වෙන වගුවෙහි අවධාරණය කරනු ලන්නේ මෙම මූලෝපාය සඳහා වන ප්‍රධාන පිවිසුම් ලක්ෂ්‍යයන්ය. වැඩසටහන් උදාහරණ ද එයට ඇතුළත් වේ.

| පිවිසුම් ලක්ෂ්‍ය | තර්කනය |
|---|---|
| **දැනට පවතින ප්‍රජා ව්‍යුහයන් සහ ක්ෂුද්‍ර මූල්‍ය හෝ ඉතුරුම් හා ණය සේවා, ස්වයං උපකාරී කණ්ඩායම්ල ඉතුරුම් ගිනුම්ල ගැමි ඉතුරුම් හා ණය සමිති** | කාන්තාවන්ගේ ස්වයං උපකාරී කණ්ඩායම් හෝ ගැමි ඉතුරුම් හා ණය සමිති වැනි කාන්තාවන් සහභාගී වන දැනට පවත්නා ප්‍රජා ව්‍යුහයන් විසින් කාන්තාවන් සවිබලගැන්වීමේ මැදිහත්වීම් සඳහා පිවිසුම් ස්ථාන සැපයිය හැකිය. එම වැඩසටහන් අනුකරණය කිරීමට සහ පුළුල් කිරීමට එමගින් අවස්ථාව ලැබේ.<br><br>උදාහරණයක් ලෙස, බිහාරයේ Do Kadam Barabari Ki Ore (සමානාත්මතාව දෙසට පියවර දෙකක්) වැඩසටහන විවිධ කණ්ඩායම් ඉලක්ක කළ මැදිහත්වීම් හතරකින් සමන්විත විය. එක් මැදිහත්වීමක් විසින් විවාහක කාන්තාවන් ඉලක්ක කරන ලදී. ඔවුහු ඒ වන විටත් ගම් මට්ටමේ ස්වයං උපකාරී කණ්ඩායමක සාමාජිකයෝ වූහ. වැඩසටහන විසින් මෙම ස්වයං උපකාරී කණ්ඩායම් ශක්තිමත් කරන ලදී. කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය පිළිබඳ දැනුම හා දැනුවත්භාවය වර්ධනය කරන ලදී. එමගින් වැළැක්වීමේ කටයුතුවලට සහාය දෙන ලද අතර බේරුණු පුද්ගලයන්ට සහාය පිරිනමන ලදී. මෙම මැදිහත්වීම් උදාහරණය දැනට පවත්නා ඉතුරුම් කණ්ඩායම් සඳහා පිවිසුම් ලක්ෂ්‍යයක් ලෙස භාවිතා කරන ලදී. ඉතුරුම් කණ්ඩායම් පිහිටුවීම මගින් අනිවාර්යයෙන්ම ප්‍රචණ්ඩත්වය අඩුවීමක් සිදු නොවන බව සඳහන් කළ යුතුය. මේ වෙනුවෙන් වැඩිදුර සමීක්ෂණ අවශ්‍යය. සාක්ෂි පරස්පර වීම එයට හේතුවයි.<br><br>විශේෂයෙන්ම මෙම ප්‍රජා ව්‍යුහයන් පවත්වාගැනීම ශක්තිමත් කිරීම, නායකත්වය ගොඩනැගීම හා තිරසර කිරීම (සාක්ෂරතාව සහ සංඛ්‍යාත්මක සංරචක එකතු කිරීම ඇතුළුව) සහ පිරිමි සහකරුවන් වෙත ළඟාවීම සඳහා ක්‍රීඩා සහ තරුණ සමාජ වැනි විවිධ වේදිකා සලකාබැලීමේ අවශ්‍යතාව සඳහා සම්පත් කැපකිරීමේ අවශ්‍යතාව උගත් පාඩම් අතරට ඇතුළත්ය. |
| **ගැහැණු ළමයින් කණ්ඩායම් සහ පාසල්වල සහ/ හෝ ප්‍රජාවන්හි ආරක්ෂිත අවකාශ** | කාන්තාවන් සහ ගැහැණු ළමයින්ට ශාරීරික හා චිත්තවේගී ආරක්ෂාව සැලසෙන කාන්තාවන්ට පමණක් වන අවකාශයන් කාන්තාවන් සහ ගැහැණු ළමයින් සවිබලගැන්වීම සඳහා හොඳ පිවිසුම් ලක්ෂ්‍ය විය හැකිය. එමගින් ප්‍රචණ්ඩත්වය සම්බන්ධ ප්‍රතිචාර සේවා ගැන තොරතුරු සහ ඒවා වෙත ප්‍රවේශය ද සැපයේ. ආරක්ෂිත ස්ථාන සාමාන්‍යයෙන් පාදක වන්නේ පාසල් හෝ ප්‍රජාවන් මතය. ප්‍රජා පාදක වැඩසටහන් විවාහක ගැහැණු ළමයින්, පාසලින් පිටවූ ගැහැණු ළමයින් සහ/ හෝ ආබාධ සහිත ගැහැණු ළමයින් වැනි කොන්කරන ලද නවයොවුන් පුද්ගලයන් වෙත සමීප වීමට උපකාරී වේ. ඔවුහු ප්‍රචණ්ඩත්වයට ලක්වීමේ වැඩි අවදානමකට ලක්වෙති. ඔවුන් වෙත සමීප වීමේ අභිලාෂය සහිත ප්‍රයත්නයන් නොමැති වීමෙන් ඔවුන් නොතකාහැරීමට ලක්විය හැකිය.<br><br>උදාහරණයක් ලෙස, කෙන්යාවේ නවයොවුන් ගැහැණු ළමයින්ගේ මුලපිරුම (AGI) ගැහැණු ළමයින් සවිබලගැන්වීමේ සමාජ සම්බන්ධ කරගන්නා ලදී. එම සමාජවල අවධානය යොමුවන්නේ සෞඛ්‍ය දැනුම වර්ධනය, ස්වයං සඵලත්වය සහ සමාජ ආරක්ෂණ ජාල කෙරෙහිය. ගැහැණු ළමයි සතිපතා කණ්ඩායම් රැස්වීම්වලට හෝ ආරක්ෂිත අවකාශවලට සහභාගී වූහ. ඒවා මෙහෙයවනු ලැබුවේ ප්‍රජාවේ තරුණ කාන්තා මාර්ගෝපදේශකවරයකු විසිනි.<br><br>ගැහැණු ළමයින් විසින් සෞඛ්‍ය සහ ජීවන කුසලතා මාතෘකා පරාසයක් සාකච්ඡා කරන ලදී. විවෘත සාකච්ඡාවලට අවස්ථාව ලබාගන්නා ලදී. මැදිහත්වීමේ කොටසක් ලෙස ඇතැම් ගැහැණු ළමයින් මූල්‍ය අධ්‍යාපන විෂයමාලාවක් තම ආරක්ෂිත අවකාශයේදී හදාරන ලදී.<br><br>සති අන්ත පාසල් සැසි, නේවාසික පාසල්වල ඉගෙනීම, පවුල් වගකීම් සහ ආගමික සේවා වැනි ගැටුම් සහගත වගකීම් හේතුවෙන් ගැහැණු ළමයින්ට ආරක්ෂිත අවකාශවලට ස්ථාවරව සහභාගී වීමට තිබෙන ගැටලු උගත් පාඩම් අතරට අයත් වේ. කාලීනව කාන්තාවන්ගේ සහ ගැහැණු ළමයින්ගේ ජීවිත යථාර්ථයන් සම්බන්ධව අවබෝධය ගොඩනගාගැනීම සහ පවුලේ සහාය සහ අවබෝධය ලබාගැනීමේ වැදගත්කම සොයාගැනීම් මගින් අවධාරණය කරනු ලැබේ.[24] |

| පිවිසුම් ලක්ෂ්‍ය | තර්කනය |
|---|---|
| **නීති සහ ව්‍යවස්ථා** | 2020 ලෝක බැංකුවේ කාන්තා, ව්‍යාපාරික සහ නීති වාර්තාව අනුව, ලෝක ආර්ථිකයන්ගෙන් 40%ක් විසින් කාන්තාවන්ගේ දේපළ අයිතිවාසිකම් සීමාකරනු ලැබේ.[25] නීතිය විසින් කාන්තාවන්ගේ දේපළ හිමිකම් පිළිගන්නා අවස්ථාවලදී පවා එහි ප්‍රායෝගිකත්වය අභියෝගාත්මක වේ. ප්‍රචණ්ඩත්වය අඩු කිරීමට කටයුතු කරන උද්දේශකයන් සහ සමාජ ව්‍යාපාර විසින් කාන්තාවන්ට සහ ගැහැණු ළමයින්ට වෙනස් අන්දමින් සලකන උරුමය, විවාහය, පවුල සහ දේපළ සම්බන්ධ නීති ප්‍රතිසංස්කරණය කිරීම සඳහා බලපෑම් කළ යුතුය. |
| **කාන්තා ලිංගික ශ්‍රමිකයන් සමග මැදිහත්වීම්** | කාන්තා ලිංගික ශ්‍රමිකයන් සවිබලගැන්වීම ඉලක්ක කරන මැදිහත්වීම් ගනුදෙනුකරුවන්, පොලිසිය සහ සමීප සහකරුවන් වෙතින් සිදුවන ප්‍රචණ්ඩත්වය අඩුකිරීම සඳහා ප්‍රවේශයට හොඳ ලක්ෂ්‍යයකි.<br><br>මෙම වැඩසටහන්වලදී බොහෝවිට ලිංගික ශ්‍රමිකයන් එක්රැස් කර ජීවත් වීමේ හා වැඩකිරීමේ තත්වයන් වැඩිදියුණු කිරීම පිළිබඳ පැහැදිලි කරනු ලැබේ. මානව හිමිකම් පිළිබඳ පුහුණුව, අපකීර්තිමත් ආකල්ප අවම කිරීම සඳහා ප්‍රචාරණ කටයුතු සහ ප්‍රචණ්ඩත්වයට මුහුණදෙන ලිංගික ශ්‍රමිකයන් සඳහා ප්‍රතිචාරාත්මක සේවා වැනි වෙනත් මූලෝපායන් ද ක්‍රියාත්මක වේ. ඒවා සාමාන්‍යයෙන් ක්‍රියාත්මක කරනු ලබන්නේ සෞඛ්‍ය රාජ්‍ය නොවන සංවිධාන, කාන්තා අයිතිවාසිකම් සංවිධාන හෝ ලිංගික ශ්‍රමිකයන් විසින් පිහිටුවන ලද සංවිධාන ආදිය මගිනි.<br><br>උදාහරණයක් ලෙස, ඉන්දියාවේ 'අවහන්' වැඩසටහන මගින් තම අයිතිවාසිකම් වෙනුවෙන් උද්දේශනය කිරීම සඳහා කාන්තා ලිංගික ශ්‍රමිකයන් බලමුළුගන්වනු ලැබේ. කර්ණාටක සෞඛ්‍ය ප්‍රවර්ධන භාරය විසින් ක්‍රියාත්මක කරනු ලබන මෙම මැදිහත්වීමට ගනුදෙනුකරුවන් සහ පොලිසිය වෙතින් සිදුවන ප්‍රචණ්ඩත්ව වැළැක්වීමේ සංරචකයක් ද අයත් වේ. ඒ වෙනුවෙන් සෑම දිස්ත්‍රික්කයකම 24 පැයේ ක්‍රියාත්මක වන අර්බුද කළමනාකරණ කණ්ඩායමක් තිබේ. මානව හිමිකම් නීතීඥවරුන් විසින් ලිංගික ශ්‍රමිකයන්ගේ අයිතිවාසිකම් පිළිබඳ ඔවුන් පුහුණු කර ඇත. වැරදිකරුවන් නීතිය හමුවට ගෙන ඒමට කටයුතු කර තිබේ. අවහන් පිළිබඳ කරන ලද ඇගයීමකින් සොයාගත් පරිදි ලිංගික ශ්‍රමිකයන් ගනුදෙනුකරුවන් සහ පොලිස් නිලධාරීන් වෙතින් ප්‍රචණ්ඩත්වයට ලක්වීම කැපීපෙනෙන පරිදි අඩුවී තිබිණි.[26] |

# ප්‍රධාන සම්පත්

## සවිබලගැන්වීම අර්ථ නිරූපණය කිරීම හා මැනීම

Understanding and Measuring Women's Economic Empowerment. Definition, Framework and Indicators, Washington, DC. International Center for Research on Women (ICRW) Golla, Anne Marie, Anju Malhotra, Priya Nanda, and Rekha Mehra. 2011
මෙම ප්‍රයෝජනවත් ලේඛනය විසින් කාන්තාවන්ගේ ආර්ථික සවිබලගැන්වීම අර්ථ නිරූපණය කරයි. මිනුම් රාමුවක් සහ දර්ශක සපයයි. කාන්තාවන් ආර්ථික වශයෙන් සවිබලගැන්වීම සඳහා වැඩසටහන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ ඇගයීම එයට අයත් වේ.

A Review of Approaches and Methods to Measure Economic Empowerment of Women and Girls, Gender and Development 22(2): 233–251. Pereznieto, Paola, and Georgia Taylor. 2014
මෙම විවරණයේ අරමුණ වන්නේ ඇගයීම් මෙහෙයවන ප්‍රතිපත්ති සම්පාදකයන්ට කාන්තාවන් ආර්ථික වශයෙන් සවිබලගැන්වීම ඇතුළත් කරගැනීම සඳහා තොරතුරු සැපයීමයි. ඒ අතර, සාර්ථක ආර්ථික සවිබලගැන්වීමේ වැඩසටහන්වල මූලිකාංග හඳුනාගැනීම සඳහා භාවිතා කරන්නන්ට උපකාර කරනු ලැබේ.

## ආර්ථික සහ සමාජ සවිබලගැන්වීමේ මැදිහත්වීම්වල සාක්ෂි

Combined Economic Empowerment and Gender-transformative Interventions. Evidence Review. What Works to Prevent VAWG programme. Gibbs, A and Bishop, K. 2019
මෙම විවරණය විසින් සවිබලගැන්වීමේ මැදිහත්වීම් හතරක සොයාගැනීම් ඉදිරිපත් කරනු ලැබේ.  DFID හි What Works to Prevent Violence against Women and Girls Global Programme (What Works) වැඩසටහන මගින් ඒවා ඇගයීමට ලක්කරනු ලැබේ.

Promoting Women's Economic Empowerment: What Works? The World Bank Group, Policy Research Working Paper 7087. Buvinic, M. and Furst-Nichols, R. 2014
ආර්ථික සවිබලගැන්වීමේ මැදිහත්වීම්වල දැඩි ඇගයීම්වල ලෝක බැංකු විවරණයකි.

Gender, livelihood capabilities and women's economic empowerment: Reviewing Evidence Over the Life Course. London: AGEG. Kabeer, N (2018)
මෙම විවරණය විසින් ආර්ථික හා ජීවනෝපාය ක්ෂේත්‍රවල කාන්තාවන් සවිබලගැන්වීම ප්‍රවර්ධනය කිරීම සඳහා සැලසුම් කරන ලද ප්‍රතිපත්ති සහ වැඩසටහන් සම්බන්ධ සාක්ෂි අධ්‍යයනය කරනු ලැබේ. වැඩිහිටි (60ට වැඩි) කාන්තාවන්, වැඩකරන වයසේ කාන්තාවන් (20-59) සහ අවසානයේදී නවයොවුන් ගැහැණු ළමයින් (10-19) පිළිබඳ සාක්ෂි විශ්ලේෂණයක් ද එයට ඇතුළත් වේ.

## ආර්ථික සවිබලගැන්වීමේ වැඩසටහන

UN Women Economic Empowerment, New York: UN Women, 2020.
මෙම වෙබ් පිටුව විසින් එක්සත් ජාතීන්ගේ කාන්තා ඒකකයේ කාන්තාවන් ආර්ථික වශයෙන් සවිබලගැන්වීමේ තොරතුරු ඉදිරිපත් කරනු ලැබේ.

A Roadmap for Promoting Women's Economic Empowerment. Exxon and the United Nations Foundation. Buvinic, M. et al. 2013
සාක්ෂි මත පදනම් වූ ක්‍රියාමාර්ග සඳහා වන මාර්ග සිතියමක් මෙම සමීක්ෂණය වාර්තාව විසින් ඉදිරිපත් කරනු ලැබේ. විවිධ රාජ්‍ය සංදර්භයන් තුළ කාන්තාවන් ආර්ථික වශයෙන් සවිබලගැන්වීම සහ ප්‍රතිපත්ති සඳහා වන විකල්ප එමගින් ඉදිරිපත් කරනු ලැබේ. එය මූලික වශයෙන් ඉලක්ක කරනුයේ පෞද්ගලික සහ රාජ්‍ය හවුල්කාරිත්වයන්ය. වාර්තාව විසින් සවිබලගැන්වීම මනිනු ලබන්නේ ඵලදායීතාවේ හා ආදායම්වල වර්ධනය ලෙසයි.

## නවයොවුන් ගැහැණු ළමයින්

Investments in Adolescent Girls' Physical and Financial Assets: issues and review of the evidence. Girl Hub. Quisimbing, A.R. and Kovarik, C. 2013
දේපළ සමාජභාවී වශයෙන් බෙදීයාම, සවිබලගැන්වී සහ යහපැවැත්ම පිළිබඳ සංකල්පීය රාමුවක් මෙම පත්‍රිකාව විසින් ඉදිරිපත් කරනු ලැබේ. ගැහැණු ළමයින්ගේ දේපළ වර්ධනය කිරීම අරමුණු කරගනිමින් කරනු ලබන මැදිහත්වීම් පිළිබඳ සාක්ෂි එමගින් විවරණය කරනු ලැබේ. විශේෂයෙන්ම, මූල්‍ය සම්පත් වර්ධනය කිරීමේ ප්‍රයත්නයන් අධ්‍යාපනය සහ පුහුණුව සමග ඒකාබද්ධ කරන ඒකාබද්ධ සහ සාකල්‍ය වැඩසටහන් කෙරෙහි අවධානය යොමුකරනු ලැබේ.

Interventions Promoting Adolescent Girls' Economic Capabilities: What Works? London: GAGE Programme, Stavropolou, M, 2018
මෙම වේගවත් සාක්ෂි සමාලෝචනය විසින් අවධානය යොමුකරනු ලබන්නේ LMIC රටවල ගැහැණු ළමයින්ගේ ආර්ථික හැකියාවන් ප්‍රවර්ධනය කිරීම සහ ඔවුන් සවිබලගැන්වීම ඉලක්ක කරනු ලබන ආර්ථික මූලෝපායන් කෙරෙහිය.

Delivering Impact for Adolescent Girls: Emerging Findings from Population Council Research. New York: Girl Center, 2018
නවයොවුන් ගැහැණු ළමයින් සම්බන්ධයෙන් හොඳම ප්‍රතිඵල ලබාදිය හැක්කේ කුමන මැදිහත්වීම් පැකේජය විසින්ද යන්න ගවේෂණය කිරීම සඳහා වන බලපෑම් ඇගයීම් නවයක සොයාගැනීම් මෙම සමීක්ෂණය විසින් සාරාංශගත කරයි. ප්‍රචණ්ඩ සහ සමාජභාවී සාධාරණ ප්‍රතිඵල ද එයට අයත් වේ.

# පසු සටහන

[1] රටවල් 44ක සහ කාන්තාවන් 481,205ක සමීප සහකරු ප්‍රචණ්ඩත්වයේ අවදානම් සමග සම්බන්ධ මහේක්ෂ මට්ටමේ සාධක අධ්‍යයනයක් මගින් පෙන්වාදෙන ලද පරිදි සමීප සහකරු ප්‍රචණ්ඩත්වය පුද්ගල මට්ටමේදී අවම කිරීම සම්බන්ධ මහේක්ෂ මට්ටමේ සාධකවලට ඉඩම්, දේපළ, උරුමය හා සම්පත් අදාළ වේ. සමාජ මට්ටමේදී රැකියා, අධ්‍යාපනය සහ දේපළ වෙත කාන්තාවන්ගේ ප්‍රවේශය ද කාන්තාවන් සවිබලගැන්වීමේ සහ සමීප සහකරු ප්‍රචණ්ඩත්වයේ මට්ටම අනුමාන කිරීමේ දර්ශක බව අධ්‍යයනය විසින් නිගමනය කරන ලදී. මූලාශ්‍රය:
Heise, L. & Kotsadam, A. (2015) Cross-national and multilevel correlates of partner violence: an analysis of data from population-based surveys, Lancet Global Health, 3(6): E332-E340

[2] තිරසර සංවර්ධන අරමුණුවල කිසිවකු අත්නොහැරීමේ මූලධර්මය පිළිබඳ වැඩිදුර විස්තර සඳහා බලන්න:
United Nations Committee for Development Policy (CDP) (2018) Leaving no one behind; UNDP (2018) What does it mean to leave no one behind? New York: UNDP; United Nations SDG (2019) Leaving No One Behind: A UNSDG Operational Guide for UN Country Teams, New York: UNSDG.

[3] ස්වයං සඵලතාව මගින් අදහස් කරනු ලබන්නේ පුද්ගලයකුට නිශ්චිත කාර්යසාධන ජයග්‍රහණයන් නිර්මාණය කරගැනීම සඳහා අවශ්‍ය චර්යාවන් සඳහා තමන්ගේ හැකියාව කෙරෙහි තිබෙන විශ්වාසයයි. (Bandura, A. (1997). Self-Efficacy: The exercise of control. New York, NY: W. H. Freeman)

[4] ආරක්ෂිත ස්ථාන යනු කාන්තාවන්ට සහ ගැහැණු ළමයින්ට සවිබලගැන්වීමේ ක්‍රියාවලියක් හරහා උපකාර කළ හැකි ස්ථානයි. බලන්න:
International Medical Corps (IMC) and International Rescue Committee (IRC) (2020) Women and Girls Safe Spaces: A Toolkit for Advancing Women's and Girls' Empowerment in Humanitarian Settings. London and New York: IMC and IRC.

[5] Kerr Wilson A, Gibbs A, McAslan Fraser E, Ramsoomar L, Parke A, Khuwaja H and Jewkes R (2020) What Works to Prevent Violence against Women and Girls? A Rigorous Global Evidence Review of Interventions to Prevent Violence against Women and Girls, South Africa; What Works to Prevent VAWG

[6] Intervention for Microfinance for AIDS and Gender Equity (IMAGE) Project (South Africa) – an intervention combining microfinance and gender training for women. See: Pronyk, P. M., Hargreaves, J. R., Kim, J. C., Morison, L. A., Phetla, G., Watts, C., ... & Porter, J. D. (2006) Effect of a structural intervention for the prevention of intimate-partner violence and HIV in rural South Africa: A cluster randomised trial. The Lancet, 368(9551), 1973- 1983

[7] Harvey, S., Mshana, G., Kapinga, I., Lees, S., Kapiga, S. (2019) STRIVE Impact Case Study: MAISHA – set to reduce violence against women in Tanzania; Mwanza Intervention Trials Unit, Mwanza, Tanzania; National Institute for Medical Research, Mwanza, Tanzania; London School of Hygiene & Tropical Medicine, London, UK; 2019; Kapiga, S., Harvey, S., Mshana, G., Holm Hansen, C., Mtolela, G.J., Madaha, F. … & Watts, C. (2019). A social empowerment intervention to prevent intimate partner violence against women in a microfinance scheme in Tanzania: findings from the MAISHA cluster randomised controlled trial. The Lancet Global Health, 7(10), 1423- 34.

[8] Gibbs, A., and Bishop, K., (2018) Combined economic empowerment and gender-transformative interventions. Evidence Review. What Works to Prevent VAWG programme.

[9] Mastonshoeva, S., Shonasimova, S., Gulyamova P., Jewkes R., Shai, N., Chirwa, E.D., & Myrttinen, H. (2019). Mixed methods evaluation of Zindagii Shoista (Living with dignity) intervention to prevent violence against women in Tajikistan.

[10] Austrian, K., Soler-Hampejsek, E., Mumah, J., Kangwana, B., Wado, Y., Abuya, B., Shah, V. and Maluccio, J. (2018). Adolescent Girls Initiative-Kenya: Midline Results Report. Nairobi: Population Council.

[11] සමීප සහකරු ප්‍රචණ්ඩත්වයේ අවදානමට වැඩිපුර ගොදුරු වන වයස අවුරුදු 30ට අඩු කාන්තාවන් ගෙදරදොර කටයුතු සහ ළමයින් බලාගැනීමේ වගකීම් හේතුවෙන් සහභාගීත්වය සීමිත වේ. WEE සහ SE වැඩසටහන් අත්නොහැර තබාගැනීම අවශ්‍යය. සමාජ සහායෙන් සහ සම වයස් කණ්ඩායම් සහායෙන් ප්‍රතිඵල ලබාගැනීම අඩුය. බලන්න:
Knight, L., Ranganathan, M., Abramsky, T., Polzer-Ngwato, T., Muvhango, L., Molebatsi, M., Stockl, H., Lees, S. & Watts, C. (2020) Intervention with Microfinance for AIDS and Gender Equity (IMAGE): Women's Engagement with the Scaled-up IMAGE Programme and Experience of Intimate Partner Violence in Rural South Africa. Prevention science, 21, 268-281.
(Knight, 2019).

[12] මෑතදී ආරම්භ කරන ලද ආර්ථික සවිබලගැන්වීමේ වැඩසටහන් මෙන් නොව, දැනට පවත්නා සහ හොඳින් පිහිටුවන ලද වේදිකා බොහෝ විට වඩා ස්ථාවර සහ එකතු කරන ලද සංරචක ඒකාබද්ධ කරගැනීමට සූදානම් ඒවාය. ආර්ථික සවිබලගැන්වීමේ මැදිහත්වීම් දැනට පවත්නා සමාජ සවිබලගැන්වීමේ (ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේ) වැඩසටහන්වලට එකතු කළ හැකිය. ක්‍රියාත්මක කරන, සෑම හවුල්කරුවකුම වෙනුවෙන් ඒකාබද්ධ මැදිහත්වීම් මෙහෙයවන සහ ධාරිතා ගොඩනගන මාදිලිය තීරණය කිරීම වැදගත්ය. බලන්න:
Pronyk, K., Hargreaves, M., Morison L.A., Watts, C. & Porter, J. (2005) Microfinance and HIV prevention–emerging lessons from rural South Africa. Small Enterprise Development, 16, 26-38.

[13] Knight, L. et al (2020) Ibid.

[14] Manji, K, Heise, L and Cislaghi, B (2020) Couples' Economic Equilibrium, Gender Norms and Intimate Partner Violence in Kirumba, Tanzania in Violence Against Women 1-21

[15] What Works (2018) Working with families to prevent violence against women and girls in Tajikistan. What Works Evidence review.

[16] Goldmann, L., Lundgren, R., Welbourn, A., Gillespie, D., Bajenja, E., Muvhango, L. and Michau, L., 2019. On the CUSP: the politics and prospects of scaling social norms change programming. Sexual and reproductive health matters, 27(2), pp.51-63.

[17] Kapiga, S et al (2019) Ibid.

[18] Milat, A., Bauman, A. & Redman, S. (2015) Narrative review of models and success factors for scaling up public health interventions, Implementation Science, 10(15).

[19] Hargreaves, J., Hatcher, A., Strange, V., Phetla, G., Busza, J., Kim, J., Watts, C., Morison, L., Porter, J., Pronyk, P. and Bonell, C., 2010. Group-microfinance and health promotion among the poor: Six-year process evaluation of the Intervention with Microfinance for AIDS and Gender Equity (IMAGE) in rural South Africa. Health Education Research, 25(1), pp.27-40.

[20] Ranganathan, M., Knight, L., Abramsky, T., Muvhango, L., Polzer Ngwato, T., Mbobelatsi, M., Ferrari, G., Watts, C. and Stöckl, H., (2019) Associations between women's economic and social empowerment and intimate partner violence: Findings from a microfinance plus program in rural North West Province, South Africa. Journal of interpersonal violence, p.0886260519836952

[21] Molyneux, M (2008) Conditional Cash Transfers: A Pathway to Women's Empowerment? Pathways to Women's Empowerment Working Paper 5, Institute of Development Studies, Brighton

[22] For example, the Abriendo Oportunidades ('Opening Opportunities') Initiative which provides vulnerable Mayan girls in Belize, Guatemala, and Mexico with skills and support to improve their lives.

[23] Knight, L. et al. (2020) Ibid.

[24] Austrian, K., Soler-Hampejsek, E., Kangwana, B., Maddox, N., Wado, Y., Abuya, B., Shah, V., & Maluccio, J. (2020) Adolescent Girls Initiative–Kenya: Endline Evaluation Report. Nairobi: Population Council.

[25] World Bank (2020) Women, Business and the Law 2020. Washington DC.

[26] Beattie, T. S., Bhattacharjee, P., Isac, S., Mohan, H. L., Simic-Lawson, M., Ramesh, B. M., ... & Heise, L. (2015) Declines in violence and police arrest among female sex workers in Karnataka state, South India, following a comprehensive HIV prevention programme. Journal of the International AIDS Society, 18(1), 20-32.

**© UN Women 2020**

මෙම ලේඛනය **RESPECT ව්‍යුහයේ ක්‍රියාත්මක කිරීමේ මාර්ගෝපදේශයේ** කොටසකි. එය එක්සත් ජාතීන්ගේ කාන්තා ඒකකයේ අනුග්‍රහය මත Social Development Direct විසින් සංවර්ධනය කරන ලදී. එය මෙතැනින් ලබාගත හැකිය.

**Suggested citation:** UN Women and Social Development Direct (2020) Empowerment of Women, RESPECT: Preventing Violence against Women Strategy Summary

RESPECT

WOMEN

# මූලෝපාය සාරාංශය

## සේවා සහතික කිරීම

(Services ensured)

UN WOMEN

World Health Organization

# සේවා සහතික කිරීම

**මූලෝපායේ අරමුණ :** කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වයට මුහුණදී බේරුණු පුද්ගලයන්ගේ අවශ්‍යතා සපිරීම සහ පොලිස්, නීති, සෞඛ්‍ය සහ සමාජ සේවා වැනි අත්‍යවශ්‍ය සේවා[1] සම්පාදනය ඔස්සේ තවදුරටත් ප්‍රචණ්ඩත්වය සිදුවීම වැළැක්වීම. එම සේවාවන්ට පහත දැක්වෙන අංශ ඇතුළත් වේ. බේරුණු පුද්ගලයාට සත්කාර හා සහාය පිරිනැමීම. එමගින් ප්‍රචණ්ඩත්වය වැළැක්වීම හෝ නැවත සිදුවීම වැළැක්වීම හෝ අඩුකිරීම, මනෝසමාජ සහාය පිරිනැමීම. එමගින් අවදානමට මුහුණදෙන පිරිමින්, කාන්තාවන්, ළමයින්/ නවයොවුන් පුද්ගලයන් සහ පවුල් වෙනුවෙන් මත්පැන් හා මත්ද්‍රව්‍ය අවභාවිතය වැළැක්වීම, එමගින් මානසික සෞඛ්‍යය වැඩිදියුණු කිරීම, සම්බන්ධතා ගැටුම් අවම කිරීම සහ මත්ද්‍රව්‍ය අවභාවිතය අඩුකිරීම.

## තාර්කිකත්වය

ප්‍රචණ්ඩත්වයට මුහුණදුන් පුද්ගලයන්ට ගුණාත්මක සේවා සම්පාදනය කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේ ක්‍රියාමාර්ගවලට අඛණ්ඩව දායක වීමේදී වැදගත් දායකත්වයකි. පළමුව, වැළැක්වීමේ මැදිහත්වීම් හේතුවෙන් බොහෝවිට තමන් පීඩාවට පත්වන ප්‍රචණ්ඩත්වය පිළිබඳ කතාකිරීමට හා උපකාර සෙවීමට පෙළඹවීම වැඩිකරයි. එබැවින්, කාන්තාවන්ට ප්‍රචණ්ඩත්වය වාර්තා කිරීම සඳහා සහ ඔවුන්ට අවශ්‍ය සේවාවන් වෙත ඔවුන් යොමුකිරීම සඳහා ආරක්ෂිත විශ්වසනීය යාන්ත්‍රණයන් පැවතීම අත්‍යවශ්‍යය. දෙවනුව, කාන්තාවන්ගේ අයිතිවාසිකම්වලට ගරුත්වය ඇතිවන පරිදි ගුණාත්මක සේවාවන් සම්පාදනය කර තිබෙන විට, එමගින් අවදානම් සාධක අවම කළ හැකිය. එමගින් කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වයේ අවදානම් සාධක අඩු කළ හැකිය. ආරක්ෂණ සාධක ශක්තිමත් කළ හැකිය (එහෙත්,සේවා මගින් කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය නැවත සිදුවීම සම්බන්ධයෙන් ඍජු භූමිකාවක් ඉටුවේද, නැතිනම්, අලුත් සිදුවීම් වාර්තා වීම අධෛර්යවත් කෙරේද යන කරුණ සම්බන්ධයෙන් ලැබී තිබෙන සාක්ෂි මිශ්‍ර ඒවාය). තුන්වනුව, පොලිස්, නීති, සෞඛ්‍ය හා සමාජ සේවා මගින් දිවි ගලවාගත් පුද්ගලයන්ගේ සෞඛ්‍යය, ආරක්ෂාව සහ යහපැවැත්ම සම්බන්ධයෙන් තිබෙන නිශේධාත්මක ප්‍රතිඵල අවම කළ හැකිය. එමගින් ප්‍රචණ්ඩත්වය කල්තබා හඳුනාගැනීමේ පිවිසුම් ස්ථාන සැපයිය හැකිය. නැවත සිදුවීම සම්බන්ධයෙන් ප්‍රතිචාර දැක්විය හැකිය. කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේ සහ එයට ප්‍රතිචාර දැක්වීමේ මහා පරිමාණ වේදිකාවන් සඳහා ඇතුළත් වීමේ ස්ථාන සම්පාදනය කළ හැකිය.

පොලිස් හා නීතිමය සේවාවන් සම්පාදනය කිරීම සඳහා සහාය වීම කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වයට එරෙහි නීති ක්‍රියාත්මක වීම තහවුරු කිරීම සඳහා ඉතා වැදගත්ය. එමගින් එවැනි ප්‍රචණ්ඩත්වයන් පිළිගත නොහැකි බවට සංඥාවක් සමාජයන්ට සන්නිවේදනය වේ. මෙම නීති මගින් කාන්තාවන්ගේ සහ ගැහැණු ළමයින්ගේ ආරක්ෂාව සැලසෙන අතර, වැරදි කරන්නන්ට එරෙහි නීතියේ මුක්තිය අවසන් කර ඔවුන් වගවිය යුතු තත්වයට පත්කරනු ලැබේ. මෙම වර්ගයේ සේවා සම්පාදනය කරන ක්‍රියාකරුවන් ඇතැම්විට යුක්ති සේවා සපයන්නන් වෙත යොමුකරනු ලැබේ. එමගින් බලාපොරොත්තු වන්නේ විවිධාකාරයේ විධිමත් සහ අවිධිමත් යුක්ති ක්‍රියාකාරීත්වයන් විවිධ සංස්කෘතික, ආගමික, සම්ප්‍රදායික සහ නීතිමය සංදර්භයන් තුළ නිර්මාණය කිරීමයි.[2] ආගමික හෝ ප්‍රජා නායකයන් වැනි අවිධිමත් යුක්ති සම්පාදකයන් හට ඇතැම් විට කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සම්බන්ධ නඩු සම්ප්‍රදායික උසාවිවලදී අසන්නට සිදුවේ. නැතහොත්, කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන් බේරුම්කරුවන් ලෙස කටයුතු කිරීමට සිදුවේ. කෙසේවෙතත්, බේරුම්කරණය පරිස්සමෙන් සිදුකළ යුතුය. ඇතැම් පසුබිම්වලදී, අවිධිමත් අධිකරණ පද්ධතියේ පීතෘමූලික ස්වභාවය හේතුවෙන් පවුලේ ඒකීයත්වය ආරක්ෂා කිරීම වෙනුවෙන් බේරුම්කරණය භාවිතා කළ හැකිය. නැතිනම්, දූෂණ සිදුවීම්වලදී කාන්තාවන්ට වැරදි කරන්නන් විවාහ කරගැනීමට සිදුවිය හැකිය.[3]

වෛද්‍ය සත්කාර අවශ්‍ය බේරුණු පුද්ගලයන් හට ඉහළ ගුණාත්මකභාවයකින් යුක්ත සෞඛ්‍ය සේවා[4] ඉතා වැදගත් වේ. එයට මානසික සෞඛ්‍ය සත්කාර ද අයත් වේ. ඒවා වැඩසටහන්කරණය සඳහා වැදගත් පිවිසුම් ස්ථාන වේ. එයට හේතුව වන්නේ සෞඛ්‍ය සත්කාර සපයන්නන් බොහෝවිට බේරුණු පුද්ගලයන් හමුවන පළමු විධිමත් සේවා සම්පාදකයන් පිරිස වීමයි. එහිදී කාන්තාවන් ප්‍රචණ්ඩත්වය වාර්තා කිරීමට හෝ නොකර සිටීමට ඉඩ තිබේ. සෞඛ්‍ය සේවා මැදිහත්වීම් මගින් දිවි ගලවාගත් පුද්ගලයන්ගේ ශාරීරික. මානසික සහ ලිංගික හා ප්‍රජනන සෞඛ්‍ය අවශ්‍යතා සම්බන්ධයෙන් කටයුතු කළ හැකිය. තුවාලවලට ප්‍රතිකාර කිරීම, මානසික සහාය, දූෂණවලින් පසු කරනු ලබන සත්කාර, හදිසි ප්‍රතිසන්ධිරෝධක, ආරක්ෂිත නීතිමය ගබ්සා සහ ලිංගාශ්‍රිතව සම්ප්‍රේෂණය වන ආසාදන වැළැක්වීම සහ ප්‍රතිකාර, එච්අයිවීවලට නිරාවරණය වීමෙන් පසු සිදුකරනු ලබන ප්‍රතිකාර ආදිය එයට ඇතුළත් වේ. එමගින් බේරුණු පුද්ගලයන්ගේ කෙටිකාලීන හා දිගුකාලීන මානසික සෞඛ්‍ය අවශ්‍යතා සම්බන්ධයෙන් ද කටයුතු කළ හැකිය.[5]

සමාජ සේවා මගින් විවිධ ක්‍රියාකාරකම් රැසක් ඔස්සේ ප්‍රචණ්ඩත්වයෙන් බේරුණු පුද්ගලයන්ගේ යහපැවැත්ම, සෞඛ්‍ය සහ ආරක්ෂාව සඳහා සහාය පිරිනමනු ලැබේ. අර්බුද සම්බන්ධ උපදේශනය, උපකාරක සේවා පිළිබඳ තොරතුරු සහ සහාය, සේවා සමග සම්බන්ධ කිරීම, ආරක්ෂිත නිවාස සහ රැකවරණ ස්ථාන වෙත ප්‍රවේශය, මූල්‍ය සේවා සම්පාදනය සහ නීතිමය හා අයිතිවාසිකම් තොරතුරු සහ සහාය ලබාගැනීම එයට ඇතුළත් වේ.[6] වැළැක්වීම අරමුණු කරගත් මැදිහත්වීම් ද සමාජ සේවාවන්ට අයත් වේ. එමගින් අවදානම් කණ්ඩායම්වල මනෝසමාජයීය අවශ්‍යතා සම්බන්ධයෙන් කටයුතු කරනු ලැබේ. මත්ද්‍රව්‍ය අවභාවිතය අවම කිරීම සහ මානසික සෞඛ්‍ය අවශ්‍යතා සම්බන්ධයෙන් කටයුතු කිරීම ද එයට අයත් වේ.

පොලිසිය, නීතිමය අංශ, සෞඛ්‍ය සහ සමාජ සේවා සම්පාදනයේදී බේරුණු පුද්ගලයන්ගේ අයිතිවාසිකම් සම්බන්ධයෙන් ගරුකිරීම සහ බේරුණු පුද්ගලයන් කේන්ද්‍ර කරගත් සත්කාර වැදගත් වේ. එයට ආරක්ෂාව ද අයත් වේ. මේවා එක්සත් ජාතීන්ගේ අත්‍යවශ්‍ය සේවා පැකේජයෙහි විස්තර කර තිබේ. එය ප්‍රචණ්ඩත්වයට මුහුණදුන් සියලු කාන්තාවන්ට සහ ගැහැණු ළමයින්ට අදාළ වේ.[7]

### අවදානම් සහ ආරක්ෂක සාධක


මෙම මූලෝපාය විසින් පහත දැක්වෙන අවදානම් සාධක සම්බන්ධයෙන් කටයුතු කිරීමට ඉලක්ක කරයි. කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන් පහත දැක්වෙන ආරක්ෂණ සාධක ප්‍රවර්ධනය කරයි.

| මට්ටම | අවදානම් සාධක | ආරක්ෂණ සාධක |
|---|---|---|
| **පුද්ගල** | ප්‍රචණ්ඩත්වය සාමාන්‍ය දෙයක් ලෙස සාධාරණීකරණය කරන ආකල්ප (කාන්තා සහ පිරිමි)<br>මානසික අසමතුලිතබව/ දුර්වල චිත්තවේගී නියාමනය (පිරිමි)<br>මත්පැන් සහ මත්ද්‍රව්‍ය හානිකර භාවිතය (කාන්තා සහ පිරිමි) | සමාජභාවී වශයෙන් සාධාරණ ආකල්ප (පිරිමි සහ කාන්තා)<br>මනෝසමාජයීය යහපැවැත්ම (පිරිමි සහ කාන්තා) |
| **අන්තර් පුද්ගල** | දුර්වල සන්නිවේදනය, අකාර්යක්ෂම ගැටුම් නිරාකරණය සහ ගැටලු විසඳීමේ කුසලතා<br>කාන්තාවන් හුදකලා වීම සහ සමාජ සහාය අඩුවීම | ප්‍රචණ්ඩත්වය අවම කිරීමට හේතුවන සම්බන්ධතා කුසලතා (උදා: ගැටුම් නිරාකරණය, සන්නිවේදනය)<br>සමාජ සම්බන්ධතාව |
| **ප්‍රජා** | පිරිමින්ගේ වරප්‍රසාදිත තත්වය ප්‍රවර්ධනය කරන, කාන්තාවන්ගේ ස්වාධිපත්‍යය සීමාකරන හානිකර සමාජභාවී සමාජ සම්මතයන්<br>කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය පිළිගන්නා සමාජ සම්මතයන්<br>මත්පැන්, මත්ද්‍රව්‍ය සහ ආයුධ ලබාගත හැකි වීම | අහිංසාව සහ සමාජභාවී සාධාරණ සම්බන්ධතාවලට සහාය වන සහ කාන්තාවන් සවිබලගැන්වීම දිරිගන්වන සමාජ සම්මතයන්<br>කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සම්බන්ධ වැරදි කරන අයට එරෙහි සමාජ සම්බාධක |
| **සමාජයීය** | කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන් ක්‍රියා කරන නීති නැතිවීම හෝ ඒවා බලාත්මක නොවීම<br>ආයතනවල සමාජභාවී වෙනස්කම් (උදා: පොලිසිය, නීති, සෞඛ්‍ය වැනි ආයතන) | සමාජභාවී සමානාත්මතාව ප්‍රවර්ධනය කරන නීති (උදා: ඉඩම් හා උරුමය පිළිබඳ)<br>කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන් කටයුතු කරන නීති |

## වෙනස් කිරීමේ න්‍යාය

පහත දැක්වෙන රූපසටහන විසින් සරල කරන ලද වෙනස් කිරීමේ න්‍යායක් ඉදිරිපත් කරනු ලැබේ. ප්‍රචණ්ඩත්වයෙන් බේරුණු පුද්ගලයන්ට සේවාවන් සපයන, සාක්ෂි මත පදනම් වූ මැදිහත්වීම් මගින් කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය අවම විය හැකි ආකාරය එමගින් නිරූපණය කරනු ලැබේ. ඒ සඳහා විශේෂිත වැඩසටහන් වැඩිදුර සංවර්ධනය කිරීම හා අනුරූප කරගැනීම අවශ්‍යය.

## S: සේවා සහතික කිරීම



## මැදිහත්වීම් වර්ග

ඉහළ ආදායම් රටවල (HICs), අඩු සහ මැදි ආදායම් රටවල (LMICs) ප්‍රචණ්ඩත්වයෙන් බේරුණු පුද්ගලයන් හට සේවාවන් වෙත පිවිසීම පහසු කිරීම සඳහා විවිධ මැදිහත්වීම් රැසක් ක්‍රියාත්මක කර තිබේ. HIC සහ LMIC රටවල සේවා මැදිහත්වීම් කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය පැවැත්ම කෙරෙහි බලපාන ආකාරය පිළිබඳ සාක්ෂි, කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සම්බන්ධ අවදානම් සාධක සම්බන්ධ අතරමැදි ප්‍රතිඵල සහ කාන්තාවන්ගේ සෞඛ්‍යය, යහපැවැත්ම හා සවිබලගැන්වීම සමග සම්බන්ධ ද්විතීයක ප්‍රතිඵල මෙම වගුවෙහි සාරාංශගත කර තිබේ.[8] RESPECT ව්‍යුහයෙහි අවධාරණය කර තිබෙන ප්‍රධාන මැදිහත්වීම් වර්ග වගුව විසින් විස්තර කරනු ලැබේ. වර්තමාන සාක්ෂි පදනම සහ උදාහරණ වැඩසටහන් ද එහි සංක්ෂිප්තව දැක්වේ. තිබෙන අවස්ථාවලදී LMIC රටවල සහ/ හෝ කාන්තා සංවිධානවල වැඩසටහන් උදාහරණ ප්‍රමුඛ ලෙස දක්වා තිබේ. එම උදාහරණ වනාහි ප්‍රජාවේ කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වයට මුහුණදී බේරුණු පුද්ගලයන්ට සේවා සම්පාදනයේදී වැදගත් භූමිකාවක් තිබෙන අයගේ ඒවාය. සාක්ෂි ප්‍රධාන වශයෙන්ම ලබාගෙන තිබෙන්නේ 2014 - 2015 සමයේ කරන ලද ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේ සමාලෝචනවලිනි.[9] වඩාත් මෑත කාලීන සාක්ෂි අදාළ තැන්වලදී ඇතුළත් කර තිබේ. සෞඛ්‍ය සේවා සඳහා උදාහරණ පදනම් වන්නේ සමීප සහකරු ප්‍රචණ්ඩත්වයට සහ කාන්තාවන්ට එරෙහි ලිංගික ප්‍රචණ්ඩත්වයට ප්‍රතිචාර දැක්වීම සඳහා වන ලෝක සෞඛ්‍ය සංවිධානයේ මාර්ගෝපදේශ මතය.

**යතුර**

- ● **බලාපොරොත්තු සහගත.** <1 පරිණාමය විසින් ප්‍රචණ්ඩත්ව ප්‍රතිඵලවල සැලකියයුතු අඩුවීමක් පෙන්නුම් කරනු ලැබේ.
- ■ **වැඩිදුර සාක්ෂි අවශ්‍යය.** <1 පරිණාමය විසින් ප්‍රචණ්ඩත්වය සම්බන්ධ මධ්‍යකාලීන ප්‍රතිඵලවල වර්ධනයක් පෙන්නුම් කරයි.
- ◆ **ගැටලු සහගත** - පරිණාමය විසින් ප්‍රචණ්ඩත්වය අවම කිරීම සම්බන්ධයෙන් පෙන්නුම් කරන්නේ එකිනෙකට පරස්පර ප්‍රතිඵලය.
- □ **සාක්ෂි නොමැත** - මැදිහත්වීම තවමත් එතරම් බැරෑරුම් ලෙස පරිණාමය වී නැත.
- ▼ **අකාර්යක්ෂම.** <1 පරිණාමය විසින් ප්‍රචණ්ඩත්ව ප්‍රතිඵලවල අඩුවීමක් පෙන්නුම් කරනු නොලැබේ.
- H ලෝක බැංකුවේ ඉහළ ආදායම් රටවල් (HIC)
- L ලෝක බැංකුවේ පහළ හා මැදි ආදායම් රටවල් (LMIC)

| මැදිහත්වීම් වර්ගය | විස්තරය | කාර්යක්ෂමතාවේ සාක්ෂි | | උදාහරණ වැඩසටහන් |
|---|---|---|---|---|
| **සේවාවන් වෙත ප්‍රවේශය සහ උද්දේශනය පහසු කිරීම සඳහා සවිබලගැන්වීමේ උපදේශන මැදිහත්වීම් හෝ මනෝසමාජ සහාය** | ලබාදිය හැකි පුළුල් පරාසයක සේවාවන් සඳහා කාන්තාවන්ට තොරතුරු, සහාය සහ අනුග්‍රාහකත්වය සැපයීම මෙම වර්ගයේ මැදිහත්වීම්වලට අයත් වේ. උපදේශනය, මනෝසමාජ සහාය හෝ නීති උපදෙස් එම සේවාවන් අතර වේ. බේරුණු පුද්ගලයන් වෙනුවෙන් උද්දේශනය කරන්නන් සහ උපකාර ලබාගන්නේද, ඒ කොතැනින්ද යන්න තීරණය කිරීම සඳහා කාන්තාවන්ට තොරතුරු සහ සහාය සපයන්නන් ප්‍රධාන සේවා සම්පාදකයන් අතර වේ. මෙම සේවා සම්පාදකයෝ බොහෝවිට කාන්තාවන් සේවාවන් වෙත කැටුව යන අතර ඔවුන් වෙනුවෙන් උද්දේශනය කරති. | H | HIC රටවලින් **බලාපොරොත්තු ඇතිකරන සාක්ෂි** ලැබී තිබේ. ඒ අනුව, මෙම වර්ගයේ මැදිහත්වීම් ඔස්සේ කාන්තාවන් මුහුණදෙන ඇතැම් වර්ගවල සමීප සහකරු ප්‍රචණ්ඩත්වය (ශාරීරික හා චිත්තවේගී) කෙටිකාලීනව අඩුකළ හැකිය. විශේෂයෙන්ම උද්දේශනය තීව්‍ර නම් එසේ සිදුවේ. කෙසේ වෙතත්, දිගුකාලීන බලපෑම පිළිබඳ සාක්ෂි සීමිතය.[10] | The Community Advocacy Project (ඇමරිකා එක්සත් ජනපද) |
| | | L | උද්දේශන මැදිහත්වීම් සම්බන්ධයෙන් ඇගයීම් කර තිබෙන්නේ ඉතා මඳ වශයෙන් බැවින් LMIC රටවලින් **වැඩිපුර සාක්ෂි අවශ්‍යය**. අඩු වශයෙන් එක් අධ්‍යයනයකින් හෝ ප්‍රචණ්ඩත්වය සම්බන්ධ අතරමැදි ප්‍රතිඵල වැඩිදියුණු කරයි. ඇතැම් ආරක්ෂණ චර්යාවන්ට අනුරූප වීම එයට අයත් වේ.[11] මෙම මැදිහත්වීම් වැඩි වශයෙන් ක්‍රියාත්මක කර ඇත්තේ රටවලය. පූර්ව ප්‍රසව සත්කා සේවා සංදර්භය එයට අයත් වේ. ඒවා සම්පත් සමග දැඩිව බැඳී තිබේ. එම නිසා, LMIC රටවල පසුබිමේ ඒවා යොදාගැනීමේ හැකියාව තහවුරු කරගත යුතුය. | Empowerment intervention for pregnant women (එක්සත් ජනපදයේ සැලසුම් කර හොංකොං, ඉන්දියාවේ සහ පේරුහි අනුරූප කරගන්නා ලදී.)[12] |

| මැදිහත්වීම් වර්ගය | විස්තරය | | කාර්යක්ෂමතාවේ සාක්ෂි | උදාහරණ වැඩසටහන් |
|---|---|---|---|---|
| **ආරක්ෂිත නිවාස** | ආරක්ෂිත නිවාස මැදිහත්වීම් මගින් ප්‍රචණ්ඩත්වයෙන් බේරුණු කාන්තාවන්ට සහ ඔවුන්ගේ ළමයින්ට අන්තර්කාලීන නවාතැන් සපයනු ලැබේ. ඒ හරහා වෙනත් සේවාවන් වෙත ප්‍රවේශය ලබාගැනීම හෝ සම්බන්ධීකරණය කිරීම ද සිදුකළ හැකිය. එම සේවාවන් වන්නේ මනෝසමාජයීය උපදේශනය, සෞඛ්‍ය සත්කාර, රැකියා, ආර්ථික සහාය සහ පුහුණුව ආදියයි. | H<br>L | ආරක්ෂිත නිවාස නිසා බේරුණු පුද්ගලයන් මුහුණදෙන ප්‍රචණ්ඩත්වය අඩුවෙනවාද යන්න පිළිබඳ HIC මෙන්ම LMIC රටවලින් ද **වැඩිදුර සාක්ෂි අවශ්‍යය.**[a] එමගින් කෙටිකාලීනව ප්‍රචණ්ඩත්වය වැඩිවුණ ද දිගුකාලීනව අඩු විය හැකි බව ඇතැම් අධ්‍යයන විසින් පෙන්වාදෙනු ලැබේ. ආරක්ෂිත නිවාසවලින් නික්ම යන කාන්තාවන්ට ස්වාධීනව ජීවත් විය හැකිද, හිංසාකාරී සහකරුවන් අත්හැර යා හැකිද යන කාරණය මත අනාගතයේදී ප්‍රචණ්ඩත්වය සිදුවේද යන කරුණ තීරණය වේ. ආරක්ෂිත නිවාස හේතුවෙන් ප්‍රචණ්ඩත්වය සම්බන්ධ ද්විතීයක ප්‍රතිඵලවල වර්ධනයක් සිදුවිය හැකිය. බේරුණු පුද්ගලයන්ට වැඩි ආරක්ෂිතබවක් දැනීම ඒ අතර වේ. කෙසේ වෙතත්, ආරක්ෂිත නිවාසවල බලපෑම පිළිබඳ කරනු ලබන අධ්‍යයනවලට බලපාන ක්‍රමවේදීය සීමා රැසක් තිබේ. ස්වයංව වාර්තා කරන දත්ත කෙරෙහි විශ්වාසය තබන්නට සිදුවීම එකකි.[13] | Maiti Nepal Transit Homes (නේපාලය) |
| **උපකාරක සේවා** | දුරකථන හෝ අන්තර්ජාල උපකාරක සේවා යනු අර්බුද සම්බන්ධයෙන් මැදිහත්වීම් වර්ගයකි. එහිදී ප්‍රචණ්ඩත්වයෙන් බේරුණු පුද්ගලයන්ට හෝ ඔවුන්ට සමීප පුද්ගලයන්ට කිසියම් පුද්ගලයකු සමග කතාකර සහාය ලබාගත හැකි ආකාරය පිළිබඳ තොරතුරු ලබාගත හැකිය. | H<br>L | කාන්තාවන් ප්‍රචණ්ඩත්වයේ අත්දැකීම් ලැබීම අවම කිරීම සඳහා ආධාරක සේවාවන්ගේ ඵලදායීතාව ඇගයීම පිළිබඳ HIC මෙන්ම LMIC රටවලින් ද **වැඩිදුර සාක්ෂි අවශ්‍යය.** කෙසේ වෙතත්, පසුබිම සැකසීම සහ ආධාරක සේවා මගින් ප්‍රචණ්ඩත්වය සම්බන්ධ ද්විතීයක ප්‍රතිඵල වර්ධනය කළ හැකි බවට සාක්ෂි තිබේ. බේරුණු පුද්ගලයන්ට සහාය ලැබෙන බව අවබෝධ වීම සහ ඔවුන්ට සම්පත් සැපයීමේ අවශ්‍යතාව ඒ අතර වේ.[14] | SAWA Women's Protection Helpline (පලස්තීන භූමි ප්‍රදේශ) |

[a] ආරක්ෂිත නිවාස විසින් ප්‍රචණ්ඩත්වය වළක්වනවාද යන කරුණ කෙසේ වෙතත්, මෙම සේවාවන් අත්‍යවශ්‍යය. එමගින් තම නිවසින් පිටවීමට අවශ්‍ය කාන්තාවන්ට ආරක්ෂිත ස්ථානයක් සහ පහසුකම් සපයනු ලැබේ.

| මැදිහත්වීම් වර්ගය | විස්තරය | | කාර්යක්ෂමතාවේ සාක්ෂි | උදාහරණ වැඩසටහන් |
|---|---|---|---|---|
| **අර්බුද සම්බන්ධයෙන් සියලු සේවා එක් ස්ථානයකින් ලබාගත හැකි මධ්‍යස්ථාන** | සියලු සේවා එක් ස්ථානයකින් ලබාගත හැකි මධ්‍යස්ථාන බහු ආංශික එළඹුමකි. එහිදී සෞඛ්‍ය, සමාජ සහ නීතිමය සේවාවන් එක් ස්ථානයකින් සපයනු ලැබේ. මෙම මධ්‍යස්ථාන තනිව පිහිටි ඒවා හෝ රෝහල් හෝ අධිකරණ වැනි තැන්වල පිහිටුවන ලද ඒවා විය හැකිය. සියලු සේවා එක් ස්ථානයකින් ලබාගත හැකි මධ්‍යස්ථාන යනු සම්බන්ධීකරණය කරන ලද බහු ආංශික සේවා සපයන එක් මාදිලියක් පමණි.[15] | H<br><br>L | සියලු සේවා එක් ස්ථානයකින් ලබාගත හැකි මධ්‍යස්ථාන කාන්තාවන් මුහුණදෙන ප්‍රචණ්ඩත්වයට බලපාන ආකාරය පිළිබඳ HIC රටවලින් **සාක්ෂි නැත**.<br><br>LMIC රටවලින් **වැඩිදුර සාක්ෂි අවශ්‍යය**. විධිමත් සමාලෝචන දෙකක් මගින් හෙළිදරව් වන පරිදි එතරම් ගැඹුරු ඇගයීම් නැත. සිදුකර තිබෙන ඇගයීම් අනුව, අර්බුද සම්බන්ධයෙන් සියලු සේවා එක් ස්ථානයකින් ලබාගත හැකි මධ්‍යස්ථාන මගින් සේවාවන්ගේ ගුණාත්මකබව වැඩිකරන බවට හෝ සෞඛ්‍යය හෝ යහපැවැත්ම වර්ධනය කරන බවට හෝ සාක්ෂි නැත.[16] LMIC රටවල ඇතැම් ව්‍යාපෘති ඇගයීම් අනුව, එමගින් භාවිතා කරන්නන්ගේ තෘප්තිය වැඩිවිය හැකිය. හෙළිදරව් කිරීම් සමග සවිබලභාවය හා පහසුව දැනීම වැඩි වේ.[17] ඒවා වියදම් අධික විය හැකිය. කෙසේ වෙතත්, සියලු සංදර්භයන් සඳහා යෝග්‍ය නොවේ. එම නිසා, ඒවා සලකා බැලිය යුත්තේ වෙනත් සේවා සම්පාදන එළඹුම් සමගයි. | Isange One Stop Centre (රුවන්ඩා)<br><br>Thuthuzela Care Centres (දකුණු අප්‍රිකාව)<br><br>Dilaasa Crisis Centres (ඉන්දියාව) |
| **මත්පැන් අවභාවිතය වැළැක්වීමේ මැදිහත්වීම්** | මත්පැන් හෝ මත්ද්‍රව්‍ය අවභාවිතය වැළැක්වීමේ මැදිහත්වීම් මගින් ඉලක්ක කරනු ලබන්නේ එම හේතුව මත සමීප සහකරු ප්‍රචණ්ඩත්වය හෝ සහකරු නොවන ලිංගික ප්‍රචණ්ඩත්වය සිදුකරන පිරිමි වැරදිකරුවන්ය.<br><br>ඇතැම් මැදිහත්වීම් මගින් මත්පැන් සහ මත්ද්‍රව්‍ය අවභාවිතා කරන අවදානමට මුහුණදෙන කාන්තාවන් හෝ බේරුණු අය ද ඉලක්ක කරනු ලැබේ. | H<br><br>L | මත්පැන් අවභාවිතය වැළැක්වීමේ මැදිහත්වීම් සමීප සහකරු ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේදී සාර්ථක වන ආකාරය පිළිබඳ HIC මෙන්ම LMIC රටවලින් ද **වැඩිදුර සාක්ෂි අවශ්‍යය**. මනෝවිද්‍යාත්මක ප්‍රතිකාර සහ සමාජභාවී පරිවර්තන එළැඹුම් හෝ යුවළ සමග මැදිහත්වීම් වැනි වෙනත් සෞඛ්‍ය හෝ සමීප සහකරු ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේ එළඹුම් සමග සම්බන්ධ කළ විට මත්පැන් අවභාවිතය වැළැක්වීමේ මැදිහත්වීම් ඵලදායී වන බවට සාක්ෂි තිබේ. කෙසේ වෙතත්, කාන්තාවන් මුහුණදෙන ප්‍රචණ්ඩත්වය අඩුකිරීම සහ පිරිමින් කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සිදුකිරීම සම්බන්ධයෙන් මත්පැන් අවභාවිතය සම්බන්ධ තනි මැදිහත්වීම්වල බලපෑම මිශ්‍ර එකකි. HIC මෙන්ම LMIC රටවල ද මත්පැන් අවභාවිතය සම්බන්ධ මැදිහත්වීම් මගින් ප්‍රචණ්ඩත්වය සමග සම්බන්ධ අවදානම් සාධක අඩුකළ හැකිය. මානසික සෞඛ්‍යය වැඩිදියුණු කිරීම හෝ මත්පැන් හා මත්ද්‍රව්‍ය අවභාවිතය අඩුකිරීම එයට අයත් වේ.[18] | Common Elements Treatment Approach (CETA) (සැම්බියා)<br><br>Women's Health Co-op (දකුණු අප්‍රිකාව) |

| මැදිහත්වීම් වර්ගය | විස්තරය | | කාර්යක්ෂමතාවේ සාක්ෂි | උදාහරණ වැඩසටහන් |
|---|---|---|---|---|
| **වැරදිකරුවන්ට මැදිහත්වීම** | ප්‍රචණ්ඩත්වය සිදුකරන පිරිමි වැරදිකරුවන් ඉලක්ක කර මැදිහත්වීම මගින් ඉලක්ක කරනු ලබන්නේ නැවත වැරදි කිරීමට පෙළඹීම වැළැක්වීමයි. මෙයට බොහෝවිට සහභාගී කරගනු ලබන්නේ අධිකරණ විසින් එසේ සහභාගී වීමට නියම කරනු ලබන වැරදිකරුවන්ය. කෝපය පාලනය කරගැනීම පිළිබඳ සැසි සහ සම්බන්ධතාවල බලය සහ පාලනය වෙත අවධානය යොමුකරන ස්ත්‍රීවාදී එළඹුම් ඇතුළු මනෝ අධ්‍යාපනික එළැඹුම් මෙම මැදිහත්වීමට අයත් විය හැකිය. මෙම මැදිහත්වීම් ඇතැම්විට මත්පැන් සහ මත්ද්‍රව්‍ය අවභාවිතාව සමග සම්බන්ධ එළඹුම් සමග ද සම්බන්ධ වේ. මත්ද්‍රව්‍ය අවභාවිතාව සමග සම්බන්ධ එළඹුම් ඉහත දැක්වේ. | H<br><br>L | පිරිමි වැරදිකරුවන්ගේ මැදිහත්වීම් කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේදී HIC රටවල සාර්ථක ද යන්න පිළිබඳ **පරස්පර සාක්ෂි තිබේ**. තිබෙන සාක්ෂිවල කැපීපෙනෙන ක්‍රමවේදීය අභියෝග තිබේ. ඇතැම් මැදිහත්වීම් විසින් පිරිමි වැරදිකරුවන් සමග සම්බන්ධ මැදිහත්වීම් මත්පැන් හා මත්ද්‍රව්‍ය අවභාවිතය සම්බන්ධ වැඩසටහන් සමග හෝ යුවල උපදේශනය සමග සම්බන්ධ කරයි. මෙම ඒකාබද්ධ මැදිහත්වීම්ව ද ප්‍රතිඵල මිශ්‍ර ඒවාය.[19]<br><br>වරදකරු වෙනුවෙන් මැදිහත්වීමේ ඵලදායීතාව පිළිබඳ LMIC රටවලින් **වැඩිදුර සාක්ෂි අවශ්‍යය**. දැනට තිබෙන සාක්ෂිවල වැඩිපුර අවධානය යොමුකරනු ලබන්නේ වැරදිකරු සම්බන්ධ මත්පැන් හා මත්ද්‍රව්‍ය අවභාවිතය කෙරෙහිය. ඉහත දක්වන ලද පරිදි අවදානම් සාධ අඩුකිරීම හා සම්බන්ධ බලපෑම පිළිබඳ ඇතැම් සාක්ෂි තිබේ. | |
| **කාන්තා පොලිස් ස්ථාන/ ඒකක** | මෙම මැදිහත්වීම්වල සාමාන්‍යයෙන් තිබෙන්නේ, විශේෂයෙන් ප්‍රචණ්ඩත්වයට මුහුණදුන් කාන්තාවන්ට (සහ ඇතැම්විට ළමයින්ට) විශේෂිත සේවා සපයන පොලිස් ඒකක පිහිටුවීමයි. ඒවා බොහෝවිට සමන්විත වන්නේ විශේෂ පුහුණුව ලද කාන්තා නිලධාරිනියන්ගෙනි. එවැනි ඒකක මගින් පුළුල් පරාසයක කාර්යයන් ඉටුකළ හැකිය. පැමිණිලි සහ ප්‍රචණ්ඩත්වය පිළිබඳ වාර්තා ලබාගැනීම, වෙනත් සේවාවන් වෙත යොමුකිරීම සහ නීතිමය ක්‍රියාමාර්ග මුලපිරීම ඒ අතර වේ. මෙම ඒකක ඇතැම්විට නඩු සම්බන්ධයෙන් මැදිහත්වීම් සිදුකරන අතර කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සම්බන්ධ විමර්ශන ද කරනු ලැබේ. | H<br><br>L | HIC රටවල මෙම මැදිහත්වීම්වල ඵලදායීතාව සම්බන්ධයෙන් **සාක්ෂි නැත**. කාන්තාවන්ට එරෙහිව ප්‍රචණ්ඩත්වය අවම කිරීම සම්බන්ධයෙන් හෝ ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන් අතරමැදි ප්‍රතිඵල වර්ධනය කිරීම සම්බන්ධයෙන් එය අදාළ වේ.<br><br>LMIC රටවලින් **වැඩිදුර සාක්ෂි අවශ්‍යය**. කාන්තා පොලිස් ස්ථාන හෝ ඒකක පිහිටුවීම මගින් අපයෝජන වාර්තා කිරීම ඇතුළු ප්‍රචණ්ඩත්වය සම්බන්ධ ද්විතීයක ප්‍රතිඵලවල වර්ධනයක් සිදුවේ.[20] කෙසේ වෙතත්, කාන්තා පොලිස් ස්ථාන මගින් කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය හෝ කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය අවදානම් සාධක අඩුවන බවට සාක්ෂි මඳය. බ්‍රසීලයේ මෑතදී කරන ලද අධ්‍යයනයකට අනුව කාන්තා පොලිස් ස්ථාන පැවතීම හේතුවෙන් ඇතැම් කාන්තා කණ්ඩායම් අතර කාන්තා මිනීමැරුම් අඩුවී තිබේ.[21] | Comisaría de la Mujer (ආර්ජන්ටිනා)<br><br>Delegacias Especualizadas de Atendimento das Mulheres (බ්‍රසීලය) |

| මැදිහත්වීම් වර්ගය | විස්තරය | කාර්යක්ෂමතාවේ සාක්ෂි | උදාහරණ වැඩසටහන් |
|---|---|---|---|
| **සෞඛ්‍ය සේවා හරහා හඳුනාගැනීම** | තමන් සමීප සහකරු ප්‍රචණ්ඩත්වයට මුහුණදී තිබේදැයි සෞඛ්‍ය සේවා ලබාගැනීමට පැමිණෙන සියලු කාන්තාවන්ගෙන් ඇසීම හඳුනාගැනීමේ මැදිහත්වීම්වලට අයත් වේ. ඒ සඳහා සෞඛ්‍ය සේවා ලබාගැනීමට පෙර හෝ ලබාගන්නා අතරතුර ප්‍රමිතිගත මෙවලම්, ප්‍රොටොකෝල හෝ ප්‍රශ්න පරාසයක්ම භාවිතා කළ හැකිය. | H<br>L<br>HIC රටවලින් ලැබෙන සාක්ෂි අනුව, හඳුනාගැනීමේ මැදිහත්වීම් කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය අඩුකිරීමේදී **ඵලදායී නැත**. හඳුනාගැනීමේ කාර්යයන් නිසා කාන්තාවන් ප්‍රචණ්ඩත්වය වාර්තා කිරීම වැඩිවේ. එමගින් යොමුකිරීම් හෝ සේවාවන් ලබාගැනීම වැඩිවන බවට සාක්ෂි නැත.[22]<br>රටවල කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය හෝ කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය අවදානම් සාධක අඩුවීමට හඳුනාගැනීමේ ක්‍රියාකාරකම් ඵලදායීව ඉවහල් වන බවට LMIC රටවලින් **සාක්ෂි ලැබී නැත**.[23] | |
| **ආයතනික පිරිස් සංවේදී කිරීම සහ පුහුණු කිරීම (ආයතනික පරිසරය වෙනස් නොකර)** | පොලීසිය, අධිකරණය සහ සෞඛ්‍ය සේවා සම්පාදකයන් වැනි ආයතනික කාර්ය මණ්ඩල කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය දැනුවත්භාවය, වැළැක්වීම සහ ප්‍රතිචාර දැක්වීම සම්බන්ධයෙන් සංවේදී කිරීම සහ කුසලතා පාදක පුහුණුවීම් සිදුකිරීම මෙම වර්ගයේ මැදිහත්වීම්වලට ඇතුළත් වේ. | H<br>L<br>HIC සහ LMIC රටවලින් ලැබෙන සාක්ෂි අනුව ආයතනික ක්‍රියාකරුවන් පුහුණු කිරීම ප්‍රචණ්ඩ ප්‍රතිඵල අවම කිරීමෙහිදී **ඵලදායී නැත**. කෙසේ වෙතත්, පුහුණුව සමාජභාවී ආකල්ප, ආයතනික ප්‍රතිපත්ති සහ වැඩසටහන් කාර්ය මණ්ඩලයට උපකාර කිරීම හරහා පද්ධතිය පුරා පැතිරි ආයතනික වෙනස්කම් සමග සම්බන්ධ කිරීමෙන් බේරුණු පුද්ගලයන් කේන්ද්‍ර කරගත් ප්‍රතිචාර වැඩිදියුණු කළ හැකිය.[24] | |

## උදාහරණ වැඩසටහන්

වැඩසටහන් ව්‍යුහයන් තුළ කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය පැවැත්ම අඩුකිරීමට ඉවහල් වන වැඩසටහන් තුනක් පහත වගුවෙහි සාරාංශ කර දැක්වේ. මෙම වගුව 11 පිටුවෙහි තිබෙන **සැලසුම් හා ක්‍රියාත්මක කිරීමේ පිරික්සුම් ලැයිස්තුව** සහ RESPECT ව්‍යුහය සමග ලබාදී තිබෙන **ඵලදායී වැඩසටහන්කරණයේ මාර්ගෝපදේශ මූලධර්ම** සමග සමාලෝචනය කළ යුතුය. සෑම වැඩසටහනක් ගැනම වඩා සවිස්තර තොරතුරු **වැඩසටහන් සාරාංශවල** සපයා තිබේ.

| වැඩසටහන | විස්තරය | ස්ථානය | ඉලක්ක ජනගහනය | මූලික ක්‍රියාකාරකම් | කාල පරිච්ඡේදය | ඇගයීම හා බලපෑම |
|---|---|---|---|---|---|---|
| **සෞඛ්‍ය සම්පන්න ක්‍රියාකාරකම් වැඩසටහන** | මනෝසමාජයීය ප්‍රතිකාර මැදිහත්වීම. එය අනුරූප කරගනු ලැබුවේ 'චර්යාත්මක ක්‍රියාත්මක කිරීම' මගින් වන අතර මෙහෙයවනු ලබන්නේ විෂාධය රෝගීන් සඳහා වන උපදේශන සේවා සපයන්නන් විසිනි. | ගෝව, ඉන්දියාව | ප්‍රාථමික සෞඛ්‍ය සත්කාර සායන අටක රෝගීන්. ඔවුහු මධ්‍යස්ථ දරුණු තත්වයේ සිට දරුණු තත්වය දක්වා විෂාධයෙන් පෙළෙති.<br>ඔවුන්ට උපදේශන සේවා සපයන්නන් ප්‍රජාවේ සාමාජිකයෝය. | මනෝසමාජයීය ප්‍රතිකාරී උපදේශන සේවා සපයන්නන් මගින් මෙහෙයවනු ලැබේ. මූලික මූලෝපාය මගින් මෙහෙයවනු ලබන සැසිවලින් සමන්විතය. චර්යාත්මක ඇගයීමක් සහ ස්වයං අධීක්ෂණය, මානසික අධ්‍යාපනය, ගැටලු විසඳීම ව්‍යුහගත කළ ක්‍රියාකාරකම් එයට අයත් වේ.[25] | මාස 2 - 3 කාලය තුළදී 8ක් දක්වා සැසි පැවැත්වේ. සෑම සැසියක්ම විනාඩි 30 - 45 අතර වේ. | **ඇගයීම් ස්වරූපය:** සසම්භාවී පාලක පරීක්ෂාව (RCT)[26]<br>**ප්‍රධාන සොයාගැනීම්:** පාලක කණ්ඩායම සමග සන්සන්දනය කළ විට මැදිහත්වීමේ කණ්ඩායමේ සහභාගී වන්නන් තුළ කැපීපෙනෙන අන්දමින් විශාල ලෙස දරුණු විශාධ ලක්ෂණ අඩුවිය (මූලික ප්‍රතිඵලය). එසේම, ආබාධිතභාවයෙහි ද, වැඩට නොපැමිණෙන දින ගණනෙහි ද, සියදිවි නසාගැනීමේ සිතුවිලිවල ද, ශාරීරික සමී සහකරු ප්‍රචණ්ඩත්වය අත්දැකීමෙහි ද (කාන්තාවන් අතර) කැපීපෙනෙන අඩුවක් සිදුවිය.[27] |

## මූලෝපාය සාරාංශය

| වැඩසටහන | විස්තරය | ස්ථානය | ඉලක්ක ජනගහනය | මූලික ක්‍රියාකාරකම් | කාල පරිච්ඡේදය | ඇගයීම හා බලපෑම |
|---|---|---|---|---|---|---|
| **පොදු මූලිකාංග සත්කාර එළඹුමේ (CETA) ප්‍රචණ්ඩත්වය සහ මත්පැන් ප්‍රතිකාර පරීක්ෂණය (VATU)** | පොදු මූලිකාංග සත්කාර එළඹුම මගින් මානසික සෞඛ්‍යය වර්ධනය කිරීමට සහ මත්ද්‍රව්‍ය භවිතය අවම කිරීමටත්, සමීප සහකරු ප්‍රචණ්ඩත්වය අවම කිරීමටත් ඉලක්ක කරනු ලැබේ.[28] | සැම්බියාවේ ලුසාකාහි නාගරික සමාජයන් තුනක් | පවුල්වලින් පුද්ගලයන් තිදෙනා බැගින් වැඩිහිටි කාන්තාවක්, ඇගේ ස්වාමි පුරුෂයා හෝ සහකරු සහ පිරිමි හෝ ගැහැණු දරුවෙක් (වයස 8 - 17) | පිරිමින්, ගැහැණුන් සහ ළමයින් වෙනුවෙන් වෙන වෙනම කණ්ඩායම් සැසි පැවැත්වේ. මත්පැන් අවම කිරීමේ උපාංගය විසින් මත්පැන් ප්‍රශ්නයක් ලෙස දැනුවත් කිරීම සහ එය ප්‍රචණ්ඩත්වය සහ සමාජභාවී සමාජ සම්මතයන් සමග සම්බන්ධ වන ආකාරය දැනුවත් කිරීමට අවධානය යොමුකරනු ලැබේ. කෑම් අන්තර්ගතය විසින් අවධානය යොමුකරනු ලබන්නේ මත්ද්‍රව්‍ය භාවිතය, සාධනීය මාපිය හා පවුල් සම්බන්ධතා, ගැටුම් කළමනාකරණය සහ ප්‍රචණ්ඩත්වය පිළිබඳ ආකල්ප සහ විශ්වාසයන් කෙරෙහිය.[29] | සතිපතා සැසි 6 - 12. එක් සැසියක් පැය 1 - 2. | **ඇගයීම් ස්වරූපය:** RCT[30]<br><br>**ප්‍රධාන සොයාගැනීම්:** පිරිමි මත්පැන් භාවිතයේ, හානිකර මත්පැන් භාවිතයේ සහ සමීප සහකරු ප්‍රචණ්ඩත්වයේ සැලකිය යුතු අඩුවක් වාර්තා කළහ. කාන්තාවෝ කැපීපෙනෙන අන්දමින් මත්පැන් භාවිතයේ අඩුවක්, හානිකර මත්පැන් භාවිතයේ අඩුවක් සහ ශාරීරික සහ ලිංගික සමීප සහකරු ප්‍රචණ්ඩත්වයට මුහුණාදීමේ අඩුවක් පෙන්නුම් කළහ. පිරිමි සහ ගැහැණු දෙකොටසම දුබල මානසික සෞඛ්‍යයේ ලක්ෂණවල කැපීපෙනෙන අඩුවක් පෙන්නුම් කළහ.[31] |
| **ආරක්ෂිත නිවාස සහ සෑම කෙනෙකුටම ගරුකිරීමේ (SHARE) මැදිහත්වීම්** | කාලානුරූපව සිදුකරනු ලබන එච්අයිවී වැළැක්වීමේ සහ ප්‍රතිකාර සේවා සමග ඒකාබද්ධ කරන ලද ප්‍රජා පාදක බලමුළුගැන්වීම් | උගන්ඩාව | දේශීය පිරිමි සහ කාන්තා ප්‍රජා ස්වේච්ඡා සේවකයන් 40ක්.<br><br>ස්වේච්ඡා ප්‍රජා උපදේශක සේවකයන් 12ක්. | වැඩසටහන විසින් සමීප සහකරු ප්‍රචණ්ඩත්වයට සහ එච්අයිවී අවදානමට දායක වන ආකල්ප සහ සමාජ සම්මතයන් වෙනස් කිරීම සඳහා ප්‍රජා පාදක බලමුළුගැන්වීම්, කාන්තාවන් සමීප සහකරු ප්‍රචණ්ඩත්වය සඳහා පරීක්ෂා කිරීමට හා ඉන්පසු එච්අයිවී හෙළිදරව් කිරීම සමග සම්බන්ධ ප්‍රචණ්ඩත්වය අඩුකිරීමේ මැදිහත්වීම් සමගත්, එච්අයිවී උපදේශනය සහ පරීක්ෂාවන් ලබාගැනීමට අපේක්ෂා කරන කාන්තාවන් මුහුණදෙන ප්‍රචණ්ඩත්වය සමගත් ඒකාබද්ධ කරනු ලැබේ.<br><br>SHARE යනු SASA සහ Stepping Stones එළඹුම් ආදර්ශයට ගන්නා ලද වැඩසටහනකි.  විෂයමාලා විසින් උසස් තත්ත්වයේ, සංස්කෘතික වශයෙන් යෝග්‍ය ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේ ක්‍රියාකාරකම් පෙර සිට පවතින සෞඛ්‍ය සහ සමාජ සහයෝගිතා ව්‍යුහයන්ට සම්බන්ධ කරනු ලැබේ. | අවුරුදු 5 | **ඇගයීම් ස්වරූපය:** පොකුරු සසම්භාවී ඒකක අධ්‍යයනය<br><br>**බලපෑම:** පසුගිය වසර තුළදී කාන්තාවන් ශාරීරික සහ ලිංගික සමීප සහකරු ප්‍රචණ්ඩත්වය වාර්තා කිරීම අඩුවීම. කිනාත්වන් සහ පිරිමින් අතර එච්අයිවී පැවැත්මේ සහ එච්අයිවී හෙළිදරව් කිරීමේ අනුපාතයන් අඩුවීම.[32] |

# සැලසුම් සහ ක්‍රියාත්මක කිරීමේ පිරික්සුම් ලැයිස්තුව

සේවා සම්පාදනයේ ඵලදායී එළඹුම්වල පොදු මූලිකාංග හා මූලධර්මවලට පහත දැක්වෙන ලක්ෂණ අඩංගු වේ:

## වැඩසටහන් සැලසුම් සහ අනුරූප වීම:

1. **ප්‍රාථමික වැළැක්වීමේ සහ සේවා මූලිකාංග ඒකාබද්ධ කරන ක්‍රියාත්මක කිරීමේ මැදිහත්වීම්.** ඉහළ ගුණාත්මකභාවයක් සහිත, බේරුණු පුද්ගලයන් කේන්ද්‍ර කරගත් කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සම්බන්ධ සේවා මගින් කාන්තාවන්ට කතාකිරීමට සහ උපකාර සෙවීමටත්, වැළැක්වීමේ අරමුණුවලට දායක වන සුබවාදී පරිසරයක් නිර්මාණය කිරීමටත් උපකාර කළ හැකිය. කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය පැවැත්ම ඉහළ තත්වයක පවතින ඕනෑම ප්‍රජාවක ප්‍රාථමික වැළැක්වීම සේවා සමග ඒකාබද්ධ කිරීමෙන් වැළැක්වීමේ මැදිහත්වීම් විසින් සේවා සඳහා ඉල්ලුමක් නිර්මාණය කරනු ඇත. කාන්තාවන් කතාකිරීමට පටන් ගැනීම නිසා මෙම සේවා ක්‍රියාත්මක විය යුතු වීම එයට හේතුවයි. එක්සත් ජාතීන්ගේ අත්‍යවශ්‍ය සේවා පැකේජය සහ සෞඛ්‍ය උපාංගය වෙනුවෙන් කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වයට ඒකාබද්ධව ප්‍රතිචාර දැක්වීමේ ලෝක සෞඛ්‍ය සංවිධානයේ මෙවලම් විසින් ගුණාත්මක සේවා සම්පාදනය සඳහා වන ප්‍රයෝජනවත් මාර්ගෝපදේශයක් සපයයි (උදා: ආරක්ෂාවට ප්‍රමුඛතාව ලබාදීම, බේරුණු පුද්ගලයන් කේන්ද්‍ර කරගත් එළඹුම්, විශ්වසනීයත්වය, රහස්‍යභාවය සහ ස්වාධිපත්‍යය). එසේම, සම්බන්ධීකරණය හරහා අංශ සහ නියෝජිතායතන සමග සම්බන්ධ කරයි.

2. **ප්‍රචණ්ඩත්වයෙන් බේරුණු පුද්ගලයන් වෙනුවෙන් සෞඛ්‍ය සත්කාර සම්පාදනයේදී පද්ධතිය පුරා විහිදුණු එළඹුමක් භාවිතා කිරීම.** පද්ධතිය පුරා විහිදුනු එළඹුමක් වෙනුවෙන් ප්‍රතිපත්ති, ප්‍රොටොකෝල, යටිතල පහසුකම්, සම්පත්, කාර්ය මණ්ඩල ධාරිතාව, සමාජ භාවය සහ කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය පිළිබඳ කාර්ය මණ්ඩල ආකල්ප, සිද්ධි ලේඛනගත කිරීම, දත්ත පද්ධති සහ යොමුකිරීම් කෙරෙහි අවධානය අවශ්‍යය.[33] ප්‍රචණ්ඩත්වයෙන් බේරුණු පුද්ගලයන් වෙනුවෙන් සෞඛ්‍ය අංශයේ සේවා පුළුල් කිරීම සලකා බලන විට ප්‍රමාණවත් සෞඛ්‍ය යටිතල පහසුකම් සහ පද්ධති පැවතීම තහවුරු කිරීම විශේෂයෙන්ම වැදගත් වේ.[34]

3. **දැනට සිදුවන සේවා පුහුණුව පුළුල් ආයතනික ව්‍යුහයන් සමග සම්බන්ධ කිරීම.** ප්‍රචණ්ඩත්වය වැළැක්වීම, ප්‍රචණ්ඩත්වයට ප්‍රතිචාර දැක්වීම හෝ සාධනීය සමාජ සම්මතයන් තනිව සැලකූ කල පුහුණු සේවා සම්පාදකයන් සම්බන්ධයෙන් හුදකලා තනි ක්‍රියාකාරකම් විසින් සේවා සම්පාදක භාවිතාවන්වල වෙනස්කම් තිරසර කරන්නේ නැත. බලපෑම් සහගත වීම සඳහා, පුහුණු අවශ්‍යතා ආයතනික ව්‍යුහයන්, කාර්යරාමු, ප්‍රතිපත්ති හෝ විෂයමාලාවලට සම්බන්ධ කළ යුතුය. ඒවා 'සමාජභාවී වශයෙන් පරිවර්තනාත්මක' වීම සඳහා පුද්ගල ආකල්ප සහ සමාජභාවය සම්බන්ධ සමාජ සම්මතයන් මෙන්ම ආයතන තුළ පවතින ප්‍රචණ්ඩත්වය, වෙනස්කම් කිරීම හා අසමානතාව සහිත පද්ධති හා ව්‍යුහයන් ද වෙනස් කිරීමට කටයුතු කළ යුතුය. වේ.[35] බේරුණු පුද්ගලයන් කේන්ද්‍ර කරගත්, ඔවුන්ගේ බහුවිධ අවශ්‍යතා සලකා බලන සහ ද්විතීයක වින්දිතකරණය අවම කරන සත්කාර සම්බන්ධයෙන් සේවා සම්පාදකයන් පුහුණුව ලබාගත යුතුය. ආරක්ෂාව තහවුරු කිරීමේදී, ගුණාත්මක සේවාවන්හිදී සහ අංශ අතර සම්බන්ධීකරණයේදී භූමිකාවන් සහ මාර්ගෝපදේශ සම්බන්ධයෙන් සේවා සම්පාදකයන්ට පැහැදිලි අවබෝධයක් තිබිය යුතුය. බහු ආංශික කණ්ඩායමක් ලෙස බහුවිධ අංශවල සේවා සම්පාදකයන් අතර දියත් කරනු ලබන සේවාස්ථ පුහුණුව ද සම්බන්ධීකරණය කරන ලද ප්‍රතිචාර විධිවිධාන කෙරෙහි සාධනීය ලෙස බලපෑම් කිරීම සඳහා ඉවහල් වන බව දැකිය හැකිය.

## ක්‍රියාත්මක කිරීම සහ පුළුල් කිරීම


4. **කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වයට මුහුණදී බේරුණු පුද්ගලයන් වෙනුවෙන් ප්‍රජා පාදක සත්කාර සහ සහාය ශක්තිමත් කරන්න.** මැනැවින් පිහිටුවන ලද ප්‍රජා ජාලයන් සහ සේවා සම්පාදනය සම්බන්ධයෙන් කාන්තා අයිතිවාසිකම් සංවිධාන සතුව ශක්තිමත් ඉතිහාසයක් තිබේ.[36] ප්‍රජාවේ ස්වේච්ඡා සේවකයන් හට ප්‍රජා සාමාජිකයන් සහ රාජ්‍ය නියෝජිතායතන හා වෙනත් රාජ්‍ය නොවන සේවා සම්පාදකයන් අතර වැදගත් පාලමක් ලෙස කටයුතු කළ හැකිය. එසේ කළ හැක්කේ පීඩාවන් හෙළිදරව් කරන සහ සෞඛ්‍ය සත්කාර, ආරක්ෂාව, සමාජ සුබසාධනය සහ නීතිමය සේවා ලබාගැනීමට අපේක්ෂා කරන බේරුණු පුද්ගලයන් වෙනුවෙන් යොමුකිරීම් සිදුකිරීම, කැටුව යාම සහ සහාය පිරිනැමීම මගිනි.

5. **ප්‍රජා ස්වේච්ඡා සේවකයන් පරිස්සමෙන් තෝරාගන්න, පුහුණු කරන්න, අධීක්ෂණය කරන්න.** සම්පත් හිඟ පරිසරයන්හිදී, මනෝසමාජ උපදේශනය ඇතුළු ඇතැම් වර්ගවල සේවා සැපයීමේදී ප්‍රජා ස්වේච්ඡා සේවකයන්ට වැදගත් භූමිකාවක් ඉටුකළ හැකිය. එවැනි පසුබිමකදී, ප්‍රජා ස්වේච්ඡා සේවකයන් පරිස්සමෙන් තෝරාගෙන පුහුණු කර ඔවුන් සමාජභාවී වශයෙන් ප්‍රතිචාරාත්මක, බේරුණු පුද්ගලයන්ට සහායක ආකල්පයකින් යුක්ත සහ පළමු පෙළ සහාය පිරිනැමීමට සහ බේරුණු පුද්ගලයන්ට ප්‍රතිචාරාත්මක සේවාවන් වෙත ප්‍රවේශය ලබාගැනීමට උපකාර කිරීමට අවශ්‍ය කුසලතා සහ දැනුම සහිත අය බව තහවුරු කළ යුතුය. ස්වේච්ඡා සේවකයන් හට කාලීනව ප්‍රතිචාරාත්මක සහාය ලැබෙන බව තහවුරු කළ හැකි එක් ආකාරයක් වන්නේ පරිස්සමෙන් සංවර්ධනය කරන ලද අධීක්ෂණ/ මගපෙන්වීම් ක්‍රමයක් සම්පාදනය කිරීමයි. නිරන්තර පරීක්ෂා කිරීම්, වැදගත් සංකල්ප පිළිබඳ දැනුම යාවත්කාලීන කිරීමේ සැසි සහ ඔවුන් මුහුණදෙන කිසියම් විශේෂ අභියෝග යක් තිබේ නම්, එය පිළිබඳ සාකච්ඡා කිරීමට අවස්ථාව ලබාදීම ඒ අතර වේ.

6. **කාන්තාවන්ගේ සහ ගැහැණු ළමයින්ගේ ශාරීරික සහ මනෝසමාජයීය ආරක්ෂාවට ප්‍රමුඛතාව ලබාදෙන්න.** ප්‍රචණ්ඩත්වයට ප්‍රතිචාර දැක්වීමේ සහ වැළැක්වීමේ මැදිහත්වීම්වලදී කාන්තාවන්ට සහ ගැහැණු ළමයින්ට ඇතිවිය හැකි අවදානම් ස්ථාවර අධීක්ෂණය සහ ඇගයීම ඔස්සේ හඳුනාගන්නා බව තහවුරු කරන්න. එසේම, මෙම අවදානම් සම්බන්ධයෙන් කටයුතු කිරීමට සහ වැඩිදුරටත් හානි සිදුකිරීම වළක්වාගැනීමට වැඩසටහන්වල ප්‍රමාණවත් තරම් අවම කිරීමේ පද්ධති ක්‍රියාත්මක වන බව තහවුරු කරන්න.

7. **ඇතැම් වර්ගවල ප්‍රතිචාරාත්මක මැදිහත්වීම්වල ප්‍රමාණවත් තීව්‍රතාව සහ කාලය තහවුරු කරන්න.** සාක්ෂි මගින් යෝජනා කරන පරිදි, ඇතැම් වර්ගවල ප්‍රතිචාරාත්මක මැදිහත්වීම් මගින් කාන්තාවන්ට සාධනීය බලපෑමක් සිදුවීම සඳහා ප්‍රමාණවත් තීව්‍රතාවක් සහ කාලයක් අවශ්‍යය. උදාහරණයක් ලෙස, සවිබලගැන්වීමේ උපදේශනය සහ මනෝසමාජයීය සහයෝගය සහිත උද්දේශනය එය වඩා තීව්‍ර තැන්වලදී වඩා ඵලදායී බව පෙනේ. එමගින් යෝජනා කරනු ලබන්නේ 'සැහැල්ලු ස්පර්ශය' සහිත මැදිහත්වීම් සහ කෙටි කාලරාමු ප්‍රමාණවත් නොවන බවයි.

8. **සේවා සම්පාදකයන් වෙත ප්‍රවේශ වීමේ හැකියාව, ඔවුන් දර්ශනය වීම සහ ඔවුන් කෙරෙහි විශ්වාසය වැඩිකරන්න.** කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සම්බන්ධ සේවා වෙත ප්‍රවේශය ලබාගැනීමේදී කාන්තාවෝ බොහෝ බාධකවලට මුහුණදෙති. ගුණාත්මක සේවා සම්පාදනය ඉලක්ක කළ ඕනෑම මැදිහත්වීමක් විසින් මෙම අභියෝග සම්බන්ධයෙන් කටයුතු කිරීමට උත්සාහ කළ යුතුය. ඒවා සංදර්භීය සහ භූගෝලීය හා ජනගහන විවිධත්වය අනුව වෙනස් වේ. භාවිතා කරන්නාට හැකි තරම් සමීප අන්දමින් ප්‍රවේශය වැඩිදියුණු කිරීම සඳහා සේවාවන් සැපයිය යුතුය (උදා: ප්‍රාථමික සෞඛ්‍ය සේවා, ප්‍රජා පොලිස් සේවා, ජංගම අධිකරණ). සේවා සම්පාදකයන් දර්ශනය වීම ද වැදගත්ය. ප්‍රජාවන් සමග සංවාදයන්හි යෙදීම සඳහා නිරතුරුව භූමියට යාම මගින් දැනුවත්භාවය වැඩිකළ හැකිය. සේවා සම්පාදකයා කෙරෙහි විශ්වාසය ගොඩනැගීම අතිශය වැදගත් වේ. විශේෂයෙන්ම, කාන්තාවන්ට විශ්වාසය, පිළිකුලට සහ ඇණුම් බැණුම්වලට ලක්වීම පිළිබඳ ගැටලු තිබෙන විටදී එය වැදගත් වේ. එසේම, මෙම විශ්වාසය ගොඩනැගීම සඳහා කාන්තා අයිතිවාසිකම් සංවිධානවලට ද උපකාර කළ හැකිය. ඔවුන් සතු ප්‍රජා ජාලයන් එයට යොදාගත හැකිය. සංදර්භයට අනුකූල ඇතුළුවීමේ ලක්ෂ්‍යයන් භාවිතා කිරීම ද අත්‍යවශ්‍යය. උදාහරණයක් ලෙස, කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සම්බන්ධ සේවාවන්හිදී එම සේවා සම්පාදකයන්ට එතරම් පිළිගැනීමක් නොලැබිය හැකිය. එහෙත්, සෞඛ්‍ය කඳවුරක් වැනි අවස්ථාවකදී එසේ කිරීම ගැටලු අවම කරයි. වෛද්‍ය, මනෝසමාජයීය, නීතිමය ලේඛනගත කිරීම සහිත සහ යොමුකිරීම් සහාය ලබාදෙන සෞඛ්‍ය කඳවුරු දුෂ්කර ස්ථානවල සිටින බේරුණු පුද්ගලයන් වෙත සමීප වීම සඳහා උපකාර වේ.



## ඇතුළත් වීමේ ස්ථාන

සේවාවන් විසින් බේරුණු පුද්ගලයන්ට ස්ත්‍රී පුරුෂ සමාජභාවය සම්බන්ධ ප්‍රතිචාර විකල්ප වෙනුවෙන් වැදගත් ඇතුළත් වීමේ ස්ථාන සැපයිය හැකිය. එමගින් ප්‍රාථමික වැළැක්වීමේ වැඩසටහන් සඳහා ඇතුළත් වීමේ ලක්ෂ්‍ය ද සම්පාදනය කළ හැකිය. පහත දැක්වෙන වගුව විසින් අවධාරණය කරනු ලබන්නේ මෙම මූලෝපාය ක්‍රියාත්මක කිරීම සඳහා ඇතුළත් විය හැකි ස්ථානයි.

| ඇතුළත් වීමේ ස්ථානය | තර්කනය |
| --- | --- |
| **සෞඛ්‍ය සේවා**<br>ලිංගික හා ප්‍රජනන සෞඛ්‍ය සේවා ද ඇතුළුව (මාතෘ හා ළමා සෞඛ්‍යය ඇතුළු), මානසික සෞඛ්‍ය සේවා සහ එච්අයිවී සේවා | සෞඛ්‍ය පද්ධතිය ප්‍රචණ්ඩත්වයෙන් දිවි ගලවාගත් පුද්ගලයන් වෙත සමීප වීම සඳහා වැදගත් ප්‍රවේශ ස්ථානයකි. එයට හේතුව වන්නේ සෞඛ්‍ය සේවා වෘත්තිකයන් යනු බේරුණු පුද්ගලයන් වෙත සමීප වන පළමු සම්බන්ධතාවන් වීමයි. සෞඛ්‍ය සේවාවන් ලබාගැනීමේදී ඇතැම්විට ඔවුන් ගැටලු සඳහා හේතුව ලෙස ප්‍රචණ්ඩත්වය විශේෂයෙන් හෙළිදරව් කරන්නේ නැත. තනි මධ්‍යස්ථානවලට වඩා ප්‍රාථමික සෞඛ්‍ය සත්කාර මට්ටම්වල සේවාවන්හිදී දැනට පවත්නා ලිංගික හා ප්‍රජනන සෞඛ්‍යය, එච්අයිවී, මානසික සෞඛ්‍යය සහ නවයොවුන් සෞඛ්‍ය සේවා ඇතුළු සෞඛ්‍ය සේවාවන් වෙත කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය ඒකාබද්ධ කළ යුතු බව සමීප සහකරු ප්‍රචණ්ඩත්වයට සහ ලිංගික ප්‍රචණ්ඩත්වයට ප්‍රතිචාර දැක්වීමේ ලෝක සෞඛ්‍ය සංවිධානයේ මාර්ගෝපදේශ විසින් නිර්දේශ කරනු ලැබේ. සියලු සෞඛ්‍ය සේවකයන් හට සමීප සහකරු ප්‍රචණ්ඩත්වයට මුහුණදෙන කාන්තාවන් හඳුනාගැනීමට පුහුණුව ලබාදිය යුතු බව ද, ඔවුන් ඉදිරිපෙළ සහාය සහ පශ්චාත් අපයෝජන සත්කාර සැපයිය යුතු බව ද එමගින් නිර්දේශ කරනු ලැබේ. පුහුණුව විසින් ඔවුන්ගේ සමාජභාවී ආකල්ප සම්බන්ධයෙන් කටයුතු කළ යුතු අතර සෞඛ්‍ය පද්ධති පටිපාටිවල වෙනස්කම් ඒ සමග සිදුකළ යුතුය. එයට පහත දැක්වෙන අංශ අයත් වේ. සත්කාරවලට මගපෙන්වන ලිඛිත ප්‍රොටොකෝල, සත්කාර සේවා සම්පාදනයට උපකාර කිරීම පිණිස සාර්ථකත්වයට පත් බේරුණු පුද්ගලයන් යොදාගැනීම, රෝගීන් පැමිණීමේ වර්ධනය, පෞද්ගලිකත්වය හා රහස්‍යභාවය සම්බන්ධ යටිතල පහසුකම්, යොමුකිරීම් සම්බන්ධතා ශක්තිමත් කිරීම සහ කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය ලේඛනගත කිරීම් සෞඛ්‍ය තොරතුරු පද්ධතියට ඇතුළත් කිරීම.[37] ඇෆ්ගනිස්තානය විසින් ලෝක සෞඛ්‍ය සංවිධානයේ මාර්ගෝපදේශ අනුරූප කරගෙන ක්‍රියාත්මක කර තිබේ. පන්දහසකට වැඩි සෞඛ්‍ය සේවකයන් අවුරුදු පහක කාලය තුළදී පුහුණු කර සෞඛ්‍ය පද්ධතියේ සූදානම බොහෝ දිස්ත්‍රික්කවල වැඩිදියුණු කර තිබේ. උගන්ඩාව, නැමීබියාව, සැම්බියාව, පකිස්තානය, ඉන්දියාව සහ කාම්බෝජය ඇතුළු රටවල් විසින් ද එය ක්‍රියාත්මක කර තිබේ.<br><br>පුහුණු ප්‍රජා සේවකයන් (ප්‍රජා සෞඛ්‍ය සේවකයන්, වින්නඹුවන්, ප්‍රජා මනෝසමාජ සේවකයන් ඇතුළු) හට කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය විසින් ඇති කරන හානිකර බලපෑම්, උපකාර ලබාගත හැකි ආකාරය පිළිබඳ දැනුවත්භාවය නැංවිය හැකි අතර බේරුණු පුද්ගලයන් සේවා සමග සම්බන්ධ කළ හැකිය. නේපාලය හා බ්‍රසීලය වැනි රටවලදී, ප්‍රාථමික සෞඛ්‍ය සේවා මධ්‍යස්ථාන විසින් ඉදිරිපෙළ වෘත්තික කාඩරය ප්‍රජාව සෞඛ්‍ය සේවා සමග සම්බන්ධ කිරීම සඳහා යොදාගනු ලැබේ. එසේම, සමීප සහකරු ප්‍රචණ්ඩත්වය සහ අමතර උපකාර සෙවීමේ චර්යාවන් පිළිබඳ දැනුවත් කිරීමට ද ඔවුන් යොදාගනු ලැබේ.[38] |
| **පොලිස් සේවා**<br>කාන්තා පොලිස් ස්ථාන/ ඒකක ඇතුළු | කාන්තා පොලිස් ස්ථාන හා ඒකක ඇතුළු පොලිස් සේවා මගින් ප්‍රචණ්ඩත්වයෙන් බේරුණු පුද්ගලයන්ට විධිමත් අධිකරණ පද්ධති වෙත පිවිසීම සඳහා වැදගත් ඇතුළුවීමේ ස්ථානයන් සැපයිය හැකිය. එසේම, එය ප්‍රාථමික වැළැක්වීමේ මැදිහත්වීම් සමග සම්බන්ධ කළ හැකිය. කාන්තා පොලිස් ස්ථාන මගින් කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය අඩුකිරීම සම්බන්ධයෙන් බේරුණු පුද්ගලයන්ගේ දැක්ම වර්ධනය කළ හැකි බවට සාක්ෂි ප්‍රමාණයක් තිබේ. එහෙත්, එමගින් ඇත්ත වශයෙන්ම ප්‍රචණ්ඩත්වයේ පැවැත්ම අඩුවෙනවාද යන කරුණ සම්බන්ධයෙන් සාක්ෂි තිබෙන්නේ මඳ වශයෙනි. කෙසේ වෙතත්, ලේඛන මගින් යෝජනා කරන පරිදි, කාන්තා පොලිස් ස්ථාන මගින් බේරුණු පුද්ගලයන්ට අධිකරණ සේවා වෙත ප්‍රවේශය ලබාදිය හැකිය. එමගින් අනිවාර්යයෙන්ම වැරදිකරුවන්ට නඩු පැවරීමක් සිදුවන බව ප්‍රකාශ වන්නේ නැත.[39] වෙනත් පොලිස් හා අධිකරණ ප්‍රතිචාර මැදිහත්වීම් අතරට නඩු පැවරීමේ ක්‍රියාමාර්ග හා ආරක්ෂාව සැලසීමේ නියෝග ආදිය අයත් වේ. එමගින් ප්‍රචණ්ඩත්වය නැවත සිදුවීම, උත්සන්න වීම සහ ප්‍රචණ්ඩත්වයේ තර්ජන වළක්වාගත හැකිය.[40]<br><br>ආර්ජන්ටිනාවේ Comisaria de la Mujer කාන්තා පොලිස් ස්ථානවලට කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේ ජාතික ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීමේ බලය හිමිවේ. එය කළ යුතු වන්නේ පොලිස් බහු ආංශික සේවා සම්පාදනයේ ආදර්ශයක් ඔස්සේය. ඒ සමග සමාජ සේවකයෝ, නීතිඥවරු සහ මනෝ විද්‍යාඥයෝ ද සම්බන්ධ වෙති. දැනුවත්භාවය නිර්මාණය කිරීමේ ක්‍රියාමාලා සහ දේශීය වැළැක්වීමේ හා ප්‍රතිචාර දැක්වීමේ ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය මගින් ප්‍රචණ්ඩත්වය වැළැක්වීම සඳහා පොලිස් ස්ථාන පාසල්, ප්‍රාදේශීය ප්‍රජා කණ්ඩායම් සහ පළාත් පාලන ආයතන සමග ද සම්බන්ධ වේ. එහි ඉලක්කය වන්නේ කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය ධාවනය කරන ඍණාත්මක සමාජ සම්මතයන් වෙනස් කිරීමයි. Comisaria de la Mujer පිළිබඳ කරන ලද අධ්‍යයනයක් මගින් කාන්තා පොලිස් ස්ථාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධ පාඩම් කීපයක් ඉදිරිපත් කරනු ලැබේ. ප්‍රමාණවත් සම්පත් ලබාදීම සහ පොලිසියට හා කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වයට ප්‍රතිචාර දක්වන පළමු පුද්ගලයන් වන වෙනත් කාර්ය මණ්ඩලවලට උපදේශනය හා ස්වයං ආරක්ෂණ සහාය සැපයීමේ අවශ්‍යතාව ද එයට ඇතුළත් වේ. |

# වැදගත් සම්පත්

## සෞඛ්‍ය සේවා

Responding to intimate partner violence and sexual violence against women: WHO clinical and policy guidelines. Geneva: World Health Organisation. 2013.
මෙම ප්‍රයෝජනවත් ලේඛනය විසින් කාන්තාවන්ගේ ආර්ථික සවිබලගැන්වීම අර්ථ නිරූපණය කරයි. මිනුම් රාමුවක් සහ දර්ශක සපයයි. කාන්තාවන් ආර්ථික වශයෙන් සවිබලගැන්වීම සඳහා වැඩසටහන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ ඇගයීම එයට අයත් වේ.

Responding to children and adolescents who have been sexually abused: WHO clinical guidelines. Geneva: World Health Organisation. 2017
ලෝක සෞඛ්‍ය සංවිධානයේ මාර්ගෝපදේශ මූලික වශයෙන් අඩු සම්පත් සැකසීම් වලින්, දිවි ගලවා ගත් අයට සාක්ෂි මත පදනම් වූ, ගුණාත්මක භාවයෙන් යුතුව, ක්ෂතියෙන් තොරව සත්කාර සැපයීම සඳහා ඉදිරි පෙළ සෞඛ්‍ය සේවකයින්ට උපකාර කිරීම අරමුණු කර ගෙන ඇත. දරුවන්ගේ සහ නව යොවුන් වියේ දරුවන්ගේ ආරක්ෂාව ප්‍රවර්ධනය කිරීමේ වැදගත්කම, තේරීම් ඉදිරිපත් කිරීම සහ කැමැත්තට සහ ස්වාධීනත්වයට ගරු කිරීමේ වැදගත්කම මාර්ගෝපදේශ මගින් අවධාරණය කෙරේ.

Health care for women subjected to IPV and Sexual Violence: A clinical handbook. Geneva: World Health Organisation. 2014
ලෝක සෞඛ්‍ය සංවිධානයේ මෙම සායනික අත්පොත ප්‍රචණ්ඩත්වයට ලක් වූ කාන්තාවන් සඳහා සෞඛ්‍ය සේවා සපයන්නන්ට උපකාර කිරීම අරමුණු කර ගෙන ඇත. කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය පිළිබඳ දැනුවත් කිරීම්, සමීප සහකරු ප්‍රචණ්ඩත්වය සහ ලිංගික හිංසන සඳහා පළමු පෙළ සහාය, ලිංගික අතවරවලින් පසු අතිරේක සායනික සත්කාර සහ මානසික සෞඛ්‍යය සඳහා අමතර සහාය එහි ඇතුළත් වේ.

Strengthening health systems to respond to women subjected to intimate partner violence or sexual violence: A manual for health managers. Geneva: World Health Organisation. 2017
ලෝක සෞඛ්‍ය සංවිධානයේ මෙම අත්පොත ප්‍රචණ්ඩත්වයෙන් දිවි ගලවා ගත් අයට රහසිගත, ඵලදායී සහ කාන්තා කේන්ද්‍රීය සේවාවන් සැපයීම සඳහා සෞඛ්‍ය පද්ධති ශක්තිමත් කිරීමට සහ සක්‍රීය කිරීම සඳහා අදාළ සෞඛ්‍ය කළමනාකරුවන් ඉලක්ක කර ඇත.

Caring for women subjected to violence: A WHO curriculum for training health-care providers. Geneva: World Health Organisation. 2019
මෙම විෂය මාලාව සැලසුම් කර ඇත්තේ ගෘහස්ථ/ සමීප සහකරු ප්‍රචණ්ඩත්වයට සහ කාන්තාවන්ට එරෙහි ලිංගික හිංසනයට ප්‍රතිචාර දැක්වීම සඳහා සෞඛ්‍ය සේවා සපයන්නන්ට පදනමක් සැපයීම සඳහා ය. විෂය මාලාව කුසලතා ගොඩනැගීමට සහ ප්‍රචණ්ඩත්වයෙන් දිවි ගලවා ගත් අය කෙරෙහි සේවා සපයන්නන්ගේ ආකල්ප ආමන්ත්‍රණය කිරීමට උත්සාහ කරයි.

Psychological therapies for women who experience intimate partner violence. Tan, M., O'Doherty, L., Gilchrist, G., Taft, A., Feder, G., Tirado Munoz, J., Chondros, P., Sadowski, L. & Hegarty, K., Cochrane Systematic Review. 2018.
මෙම Cochrane සමාලෝචනය සමීප සහකරු ප්‍රචණ්ඩත්වය අත්විඳින කාන්තාවන් සඳහා මනෝවිද්‍යාත්මක මැදිහත්වීම් වල සඵලතාවය තක්සේරු කරයි.

Screening women for intimate partner violence in healthcare settings. O'Doherty L, Hegarty K, Ramsay J, Davidson LL, Feder G, Taft A. Cochrane Database of Systematic Reviews 2015.
මෙම Cochrane සමාලෝචනය (යාවත්කාලීන කිරීම) විසින් සෞඛ්‍ය ආරක්ෂණ සැකසුම් තුළ සමීප සහකරු ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන් කාන්තාවන් පරීක්ෂා කිරීම පිළිබඳ සාක්ෂි පරීක්ෂා කරයි. පරීක්ෂා කිරීම මගින් සමීප සහකරු ප්‍රචණ්ඩත්වය හඳුනාගැනීම වැඩි වන අතර, පූර්ව ප්‍රසව ගර්භනී කාන්තාවන් පරීක්ෂා කිරීමේදී සමීප සහකරු ප්‍රචණ්ඩත්වය අනාවරණය කිරීමට වැඩි ඉඩක් ඇති බව සොයා ගනී. කෙසේ වෙතත්, පරීක්ෂාව සෞඛ්‍ය ප්‍රතිඵලවලට සහ ප්‍රචණ්ඩත්වයට නැවත නිරාවරණය වීමට බලපාන බවට ප්‍රමාණවත් සාක්ෂි නොමැත.

## පොලිස්, අධිකරණ හා සමාජ සේවා

Essential services package for women and girls subject to violence. UNWOMEN, UNFPA, WHO, UNDP and UNODC, 2015.
මෙය ප්‍රචණ්ඩත්වය අත්විඳින කාන්තාවන් සහ ගැහැණු ළමයින් සඳහා සේවා සංවර්ධනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම කෙරෙහි විශේෂයෙන් අවධානය යොමු කරන පුළුල් සම්පත් සහ මාර්ගෝපදේශ පැකේජයකි. 2017 දී ප්‍රකාශයට පත් කරන ලද ක්‍රියාත්මක කිරීම පිළිබඳ අතිරේක මොඩියුලයක් සමඟ සෞඛ්‍ය, යුක්තිය සහ පොලිස්, සමාජ සේවා සම්බන්ධීකරණය සහ පාලනය පිළිබඳ මොඩියුල එයට ඇතුළත් වේ. (මෙතැනින් ලබාගත හැකිය)

UNWOMEN Virtual Knowledge Centre to End Violence against Women and Girls.
එක්සත් ජාතීන්ගේ කාන්තා ඒකකයේ අතථ්‍ය දැනුම මධ්‍යස්ථානය සතුව සෞඛ්‍යය, යුක්තිය සහ ආරක්ෂාව ඉලක්ක කරගත් මැදිහත්වීම් හා කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වයට වෙත නවාතැන් ප්‍රතිචාර දැක්වීම්වලට අදාළ මාර්ගෝපදේශ, සිද්ධි අධ්‍යයන සහ පොරොන්දු වූ පරිචයන් පිළිබඳ උදාහරණ ඇතුළුව අදාළ සම්පත් පරාසයක් ඇත.

The implementation and effectiveness of the one stop centre model for intimate partner and sexual violence in low- and middle- income countries: a systematic review of barriers and enablers, Olsen, R.M, García-Moreno, C. and Colombini, M. BMJ Glob Health. 2020; 5(3): e001883
මෙම ක්‍රමානුකූල සමාලෝචනය කාර්ය මණ්ඩලයේ කාල සීමාවන් සහ මූලික වෛද්‍ය සැපයුම් නොමැතිකම ඇතුළුව, එක් ස්ථානයකින් සියලු සේවා ලබාගත හැකි මධ්‍යස්ථාන ආකෘතිය ක්‍රියාත්මක කිරීමට සහ ඵලදායී වීමට ඇති බාධක කිහිපයක් හඳුනා ගනී. එය ප්‍රමිතිගත ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි සහ නිතිපතා අන්තර් සම්බන්ධතා රැස්වීම් වැනි සක්‍රීය කරන්නන් ද අවධාරණය කරයි.

# පසු සටහන

[1] UN Women, UNFPA, WHO, UNDP and UNODC (2015) UN Essential Services Package and Guidelines. සෞඛ්‍ය ක්ෂේත්‍රය වෙනුවෙන් ඉහත ප්‍රයෝජනවත් සම්පත් අංශයෙහි දැක්වෙන ලෝක සෞඛ්‍ය සංවිධානයේ මාර්ගෝපදේශ සහ මෙවලම් බලන්න.

[2] UN Women, UNFPA, WHO, UNDP and UNODC (2015) Ibid.

[3] UN Women (2012) UN Handbook for Legislation on Violence against Women, New York: UN Women.

[4] These should be provided in line with the WHO clinical and policy guidelines for responding to intimate partner violence and sexual violence (2013)

[5] Ibid.

[6] Ibid.

[7] UN Women, UNFPA, WHO, UNDP and UNODC (2015) Ibid.

[8] Here we use the term intermediate outcome to indicate an outcome that is part of the theory of change or pathway to reducing VAW prevalence. Secondary outcomes are not necessarily part of a theory of change but are other desirable outcomes associated with women's rights and wellbeing.

[9] García-Moreno, C., Hegarty, K., Lucas d'Oliveira, A.F., Koziol-Maclain, J., Colombini, M. & Feder G (2014) The health-systems response to violence against women. Lancet; Jewkes, R., Mclean Hilker, L., Khan, S., Busiello, F & Fraser, E. (2015) Response mechanisms to prevent violence against women and girls. What works to prevent violence against women and girls – Evidence Review 3; Ellsberg, M., Arango DJ., Morton, M., Gennari, F., Kiplesund, S., Contreras, M. & Watts, C. (2015) Prevention of violence against women and girls: what does the evidence say? Lancet, 385: 1555-66.

[10] Rivas, C., Ramsay, J., Sadowski, L. et al. (2016) Advocacy interventions to reduce or eliminate violence and promote the physical and psychosocial wellbeing of women who experience intimate partner abuse. Campbell Systematic Reviews, 2016:2, DOI: 10.4073/ csr.2016.2; Tirado-Muñoz, J., Gilchrist, G., Farré, M. et al. (2014) The efficacy of cognitive behavioural therapy and advocacy interventions for women who have experienced intimate partner violence: A systematic review and meta-analysis. Annals of Medicine, 46(8).

[11] Cripe, SM., Sanchez, S., Sanchez, E. et al. (2010) Intimate partner violence (IPV) during pregnancy: A pilot intervention program in Lima, Peru. Journal of Interpersonal Violence, 25(11): 2054-2076.

[12] Parker, B., McFarlane, J., Soeken, K. et al. (1999) Testing an intervention to prevent further abuse to pregnant women. Research in Nursing and Health, 22(1): 55-66; Tiwari, A., Leung, WC., Leung, TW. et al. (2005) A randomised controlled trial of empowerment training for Chinese abused pregnant women in Hong Kong. Obstetrics & Gynaecology, 112(9): 1249-1256; Cripe et al. (2010) Ibid; Sapkota, D., Baird, K., Saito, A. & Anderson, D. (2019) Interventions for reducing and/or controlling domestic violence among pregnant women in low- and middle-income countries: a systematic review, Systematic Reviews, 8(79).

[13] Jewkes et al. (2015) Ibid; Sullivan, CM. (2012) Domestic violence shelter services: A review of the empirical evidence. Harrisburg: National Resource Center on Domestic Violence.

[14] Jewkes et al. (2015) Ibid; Hayes, C. (2014) Tackling gender-based violence with technology: Case studies of mobile and internet technology interventions. STATT.

[15] UN Women, UNFPA, WHO, UNDP and UNODC (2015) Module 5: Coordination and Governance of Coordination; UN Women (2019) Coordinated Responses, Virtual Knowledge Centre to End VAW.

[16] Olsen, R.M, García-Moreno, C. and Colombini, M. (2020) The implementation and effectiveness of the one stop centre model for intimate partner and sexual violence in low- and middle-income countries: a systematic review of barriers and enablers, BMJ Glob Health. 2020; 5(3): e001883; WHO (2013) Responding to intimate partner violence and sexual violence against women: WHO clinical and policy guidelines. Geneva: World Health Organisation

[17] Jewkes et al. (2015) Ibid; Kirk, L., Terry, S., Lokuge, K. & Watterson, J. (2017) Effectiveness of secondary and tertiary prevention for violence against women in low and low-middle income countries: a systematic review. BMC Public Health, 17: 622; Keesbury, J., Onyango-Ouma, W., Undie, CC., et al. (2012) A review and evaluation of multi-sectoral response services ('one-stop centers') for gender-based violence in Kenya and Zambia. Nairobi: Population Council.

[18] Tarzia, L., Forsdike, K & Feder, G. (2017) Interventions in health settings for male perpetrators or victims of intimate partner violence. Trauma, Violence & Abuse, 21(1); Stephens-Lewis, D., Johnson, A., Huntley, A. et al. (2019) Interventions to reduce intimate partner violence perpetration by men who use substances: A systematic review and meta-analysis of efficacy. Trauma, Violence and Abuse, doi: 10.1177/1524838019882357; Ramsoomar, L., Gibbs, A., Machisa, M. et al. (2019) Associations between alcohol, poor mental health and intimate partner violence. Evidence Review, What Works to Prevent Violence Against Women and Girls Global Programme; Kerr-Wilson, A., Gibbs, A., McAslan, FE., Ramsoomar, L., Parke, A., Khuwaja, HMA. & Jewkes, R. (2020) A rigorous global evidence review of interventions to prevent violence against women and girls. What Works to prevent violence against women and girls global programme, Pretoria, South Africa.

[19] Arango D, Morton M, Gennari F, Kiplesund S, Contreras M, Ellsberg M. (2014) Interventions to reduce or prevent violence against women and girls: a systematic review of reviews. Washington, DC: Women's Voice, Agency and Participation Research Series, World Bank. Stephens-Lewis, D., Johnson, A., Huntley, A. et al. (2019) Interventions to reduce intimate partner violence perpetration by men who use substances: A systematic review and meta-analysis of efficacy. Trauma, Violence and Abuse. Feder, L., Austin, S., & Wilson, D. (2008) Court Mandated Interventions for Individuals Convicted of Domestic Violence. Campbell Systematic Review (12); UN Women (2010) Perpetrators of Violence / Batterers, Virtual Knowledge Centre to End VAW; ANROWS (2020) Working with perpetrators of domestic and family violence; ANROWS Notepad.

[20] Nair, S., Darak, S., Bhumika T.V, Darak, T., Mathews, M., Devi, L.D.Ratheebhai V, and Dave, A (2017) Gender-responsive policing initiatives designed to enhance confidence, satisfaction in policing services and reduce risk of violence against women in low and middle income countries - A systematic review . London: EPPI-Centre, University College London.

[21] Perova, E. & Reynolds, SA. (2017) Women's police stations and intimate partner violence: Evidence from Brazil. Social Science & Medicine, 174: 188-196.

[22] O'Doherty L, Hegarty K, Ramsay J, Davidson LL, Feder G, Taft A. (2015) Screening women for intimate partner violence in healthcare settings. Cochrane Database of Systematic Reviews.

[23] O'Doherty L, et al. (2015) Ibid. WHO (2013) Ibid.

[24] WHO (2013) Ibid; Ellsberg et al. (2015) Ibid; Morrison, A., Ellsberg, M. & Bott, S. (2007) Addressing gender-based violence: a critical review of interventions. The World Bank Research Observer, 22(1): 25-51. Feder, F., et al (2011) Identification and Referral to Improve Safety (IRIS) of Women Experienc-

ing Domestic Violence With a Primary Care Training and Support Programme: A Cluster Randomised Controlled Trial, Lancet, 378(9805):1788-95.

[25] Patel, V., Weobong, B., Nadkarni, A. et al. (2014) The effectiveness and cost-effectiveness of lay counsellor-delivered psychological treatments for harmful and dependent drinking and moderate to severe depression in primary care in India: PREMIUM study protocol for randomized controlled trials. Trials, 15: 101.

[26] Ibid.

[27] Patel, V., Weobong, B., Weiss, HA., Anand, A., Bhat, B., Katti, B. et al. (2016) The Health Activity Program (HAP), a lay counsellor-delivered brief psychological treatment for severe depression, in primary care in India: a randomised controlled trial. The Lancet, 389(10065): 176-185.

[28] Jewkes et al. (2015) Ibid.

[29] https://www.whatworks.co.za/about/global-programme/global-programme-projects/item/99-violence-alcohol-treatment- zambia-vatu

[30] Kane et al. (2017) Ibid.

[31] Ramsoomar et al. (2019) Ibid.

[32] The Prevention Collaborative (2019a) Study Summary: Integrating IPV and HIV Prevention: Impacts of the SHARE Intervention in Uganda

[33] García-Moreno, C., Hegarty, K., d'Oliveira, A., Koziol-McLain, J., Colombini, M., Feder, G. (2015) The Health-Systems Response to Violence Against Women, Lancet, 385(9977):1567-79; UNWOMEN Virtual Knowledge Centre to End Violence against Women and Girls, Health Module.

[34] Colombini, M., Mayhew, SH., Ali SH., Shuib, R. & Watts, C. (2012) An integrated health sector response to violence against women in Malaysia: lessons for supporting scale up. BMC Public Health, 12: 548.

[35] For example, teenage pregnancies caused by schoolteachers or negative attitudes from healthworkers to women living with HIV. See Orza, L., Bewley, S., Tyler Crone, E., Mworeko, L., Namiba, A., Otieno, T., Vazquez, M. & Welbourn, A. (2017) Ask women living with HIV what's needed to achieve safe pregnancies in serodifferent relationships, J Int AIDS Soc. 2017; 20(Suppl 1): 21469.

[36] Esplen, E. (2013) Leaders for change: why support women's rights organisations? London: Womankind Worldwide

[37] WHO (2013) Ibid.

[38] Perry, H., Zulliger, R., Scott, K., Javadi, D. & Gergen, J (2013) Developing and Strengthening Community Health Worker Programs at Scale A Reference Guide for Program Managers and Policy Makers, Baltimore: Jhpiego Corporation; Thapa, A., Betron, M., Amatya, R., Thapa, K., Schuster, A., & Arlotti-Parish, E. (2019) The Feasibility and Acceptability of Female Community Health Volunteers Facilitating GBV Survivor Care and Support In Nepal, Presentation at SVRI Forum, 2019; See also Jhpiego website

[39] Jubb, N. et al. (2010) Women's police stations in Latin America: An entry point for stopping violence and gaining access to Justice. Quito: CEPLAES, IDRC.

[40] Cordier, R., Chung, D., Wilkes-Gillan, S. and Speyer, R. (2019) The Effectiveness of Protection Orders in Reducing Recidivism in Domestic Violence: A Systematic Review and Meta-Analysis, Trauma, Violence & Abuse; UN Women, UNFPA, WHO, UNDP and UNODC (2015) Ibid (Module 3); UN Women (2019) Security Module, Virtual Knowledge Centre to End VAWG; UNODC (2010) Handbook on Effective police responses to violence against women, Vienna: UNODC.

**© UN Women 2020**

මෙම ලේඛනය **RESPECT ව්‍යුහයේ ක්‍රියාත්මක කිරීමේ මාර්ගෝපදේශයේ** කොටසකි. එය එක්සත් ජාතීන්ගේ කාන්තා ඒකකයේ අනුග්‍රහය මත Social Development Direct විසින් සංවර්ධනය කරන ලදී. එය මෙතැනින් ලබාගත හැකිය.

**Suggested citation:** UN Women, World Health Organization and Social Development Direct (2020) Services Ensured, RESPECT: Preventing Violence against Women Strategy Summary.

# RESPECT WOMEN

## මූලෝපාය සාරාංශය

### දිළිඳුකම අවම කිරීම

(Poverty reduced)

UN WOMEN

World Health Organization


# දිළිඳුකම අවම කිරීම

**මූලෝපායේ අරමුණ :** කාන්තාවන් හෝ පවුල් ඉලක්ක කර සිදුකරනු ලබන මුදල් ලබාදීම්, ඉතුරුම්, ක්ෂුද්‍ර මූල්‍ය ණය සහා ශ්‍රම බලකා මැදිහත්වීම් ඔස්සේ දිළිඳුකම දුරලීම.

## තාර්කිකත්වය

දිළිඳුකම[1] සහ කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය අතර තිබෙන සම්බන්ධය ඉතා පැහැදිලි කාරණයකි. දිළිඳු පවුල්වල කාන්තාවෝ ප්‍රචණ්ඩත්වයේ[2] වැඩි අවදානමකට ලක්වෙති. ගෝලීය වශයෙන්ම, දිළිඳු ජීවිත ගතකරන ජනතාව බොහෝවිට ජීවත් වන්නට වැඩි ඉඩක් තිබෙන්නේ ගැටුම් වැඩි ස්ථානවලය. ඔවුන්ට සහායක සේවා ප්‍රමාණවත් නැත. නීති පද්ධති ද දුර්වලය.[3] දිළිඳුකම හේතුවෙන් සමීප සහකරු ප්‍රචණ්ඩත්වයේ අවදානම ද වැඩි වේ. සෞඛ්‍ය ගැටලු, අවම අධ්‍යාපනික අවස්ථා සහ ගෘහ ජීවිතයේ ආතතිය ද එයට අයත් වේ. ඒ අතරතුර, ප්‍රචණ්ඩත්වය හේතුවෙන් කාන්තාවන් දිළිඳුභාවයට පත්වීමේ අවදානම වැඩිවේ. සෘජු ප්‍රචණ්ඩත්වයේ පිරිවැය එයට හේතුවයි. සෞඛ්‍යය වෙනුවෙන් තමන්ගේ අතින් වියදම් කිරීමට සිදුවීම සහ ආදායම් ඵලදායීතාව අඩුවීම වැනි වක්‍ර වියදම් ද එයට හේතු වේ.[4] ඒ අනුව, මෙම කාරණා දෙක අතර සම්බන්ධය එකිනෙක පෝෂණය කරන එකකි. එමගින් නිර්මාණය කරනු ලබන්නේ යහපත් හෝ අයහපත් චක්‍රයකි.

දිළිඳුකම අවම කිරීම සහ ආර්ථික ආරක්ෂාව වැඩිකිරීම අරමුණු කරගත් මැදිහත්වීම් විසින් කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා බලාපොරොත්තු සහගත හා පිරිවැය අතින් කාර්යක්ෂම විසඳුම් සම්පාදනය කළ හැකිය. විශේෂයෙන්ම, දිළිඳුකම හා සමීප සහකරු ප්‍රචණ්ඩත්වය අතර ද්විපාර්ශ්වීය සම්බන්ධතා එයට හේතු වේ (1 රූපය බලන්න). මෙම දිළිඳුභාවය අවම කිරීමේ වැඩසටහන් කාන්තාවන් විශේෂයෙන් ඉලක්ක කරනමුත්, කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේ අවධානයක් නොමැති විටදී පවා මෙය අදාළ විය හැකිය.[5] එම නිසා, මෙම මූලෝපාය විසින් සමාජයේ මහා පරිමාණ ආරක්ෂක ජාලයන් තත්වයෙන් උසස් කිරීම ඉලක්ක කරනු ලැබේ. මුදල් ලබාදීම, සමීප සහකරු ප්‍රචණ්ඩත්වය වැළැක්වීම, පුළුල් කිරීම සඳහා පෙර නොවූ අවස්ථා ලබාදීම ඒ අතර වේ.




**1 රූපය:** දිළිඳුකම සහ කාන්තාවන් ප්‍රචණ්ඩත්වය අත්දැකීම අතර ද්වි දිශා සම්බන්ධය. රූපය උපුටාගැනීම: Gibbs, Duvvury and Scriver (2017) What Works Evidence Review: The relationship between poverty and intimate partner violence

# මූලෝපාය සාරාංශය

## අවදානම් සහ ආරක්ෂක සාධක


මෙම මූලෝපාය විසින් පහත දැක්වෙන දිළිඳුභාවය අවම කිරීමේ අවදානම් සාධක සම්බන්ධයෙන් කටයුතු කිරීමට ඉලක්ක කරයි. කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන් පහත දැක්වෙන ආරක්ෂණ සාධක ප්‍රවර්ධනය කරයි.

| මට්ටම | අවදානම් සාධක | ආරක්ෂණ සාධක |
|---|---|---|
| **පුද්ගල** | ආර්ථික අනාරක්ෂිතබව (කාන්තා සහ පිරිමි)<br>දිළිඳුකම සමග සම්බන්ධ ආතතිය සහ චර්යාවන් හැඩගස්වාගැනීමේ දුර්ව (පිරිමි සහ කාන්තා)<br>අඩු ස්වයං සඵලතාව සහ ස්වයං අභිමානය (කාන්තා) | ආර්ථික ආරක්ෂිතබව (කාන්තා සහ පිරිමි)<br>මනෝසමාජයීය යහපැවැත්ම (පිරිමි සහ කාන්තා)<br>ඉහළ ස්වයං සඵලතාව සහ ස්වයං අභිමානය (කාන්තා)<br>මූල්‍ය ස්වාධීනත්වය (කාන්තා) |
| **අන්තර් පුද්ගල** | අනාරක්ෂිත සහ අස්ථාවර ගෘහ ආර්ථික තත්වයන් (ධනය හා මූල්‍ය දේපළ මඳවීම සහ ආහාර අනාරක්ෂිතභාවය)<br>ඉහළ මට්ටමේ ගෘහ ආතතිය සහ පවුල තුළ ගැටුම්<br>සමීප සම්බන්ධතාවල සහ නීතියෙන් ඥාති වූවන් සමග ඉහළ මට්ටමේ අසමානතාව | ආරක්ෂිත සහ ස්ථාවර පවුල් ආර්ථික තත්වය (ඉහළ මට්ටමේ ධනය, මූල්‍ය සම්පත් සහ ආහාර ආරක්ෂිතබව)<br>පහළ මට්ටම්වල ගෘහ ආතතිය සහ පවුල තුළ ගැටුම් අවම වීම<br>සමාජභාවී සමානාත්මතාව සහිත සමීප සම්බන්ධතා. පොදුවේ තීරණ ගැනීම සහ ගෘහ වගකීම් මෙයට අයත් වේ. |
| **ප්‍රජාව** | ඉහළ මට්ටමේ දරිද්‍රතාව සහ විරැකියාව<br>ආර්ථික හේතු මත සිදුවන අපරාධවල ඉහළ මට්ටම් | පහළ මට්ටම්වල දරිද්‍රතාව සහ විරැකියාව<br>ආර්ථික හේතු මත සිදුවන අපරාධවල පහළ මට්ටම් |
| **සමාජයීය** | කාන්තා රැකියා නියුක්තියේ පහළ මට්ටම්<br>ආර්ථික කම්පනයන් (ආර්ථිකය කඩාවැටීම, ආපදා, ගැටුම්) | කාන්තා රැකියා නියුක්තියේ ඉහළ මට්ටම්<br>ශක්තිමත් ආර්ථික සමාජ ජාල සහ සමාජ ආරක්ෂාව[6]<br>ආර්ථික ස්ථාවරත්වය |

### වෙනස්වීමේ න්‍යාය

පහත දැක්වෙන රූපසටහන විසින් සරල කරන ලද වෙනස් කිරීම් න්‍යායක් ඉදිරිපත් කරනු ලැබේ. දිළිඳුභාවය අවම කිරීමේ වැඩසටහන් මගින් කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය අවම විය හැකි ආකාරය එමගින් නිරූපණය කරනු ලැබේ. ඒ සඳහා විශේෂිත වැඩසටහන් වැඩිදුර සංවර්ධනය කිරීම හා අනුරූප කරගැනීම අවශ්‍යය.

## P: දිළිඳුකම අවම කිරීම



## මැදිහත්වීම් වර්ග

මෙම මූලෝපාය යටතේ වන මැදිහත්වීම්වල මූලික අරමුණ වන්නේ දිළිඳුකම දුරලීම හා සංවර්ධන ප්‍රතිඵල වර්ධනය කිරීමයි. පහත දැක්වෙන වගුව මගින් RESPECT රාමුවෙහි දිළිඳුකම දුරලීමේ මැදිහත්වීම්වල ප්‍රධාන සුලබ මැදිහත්වීම් තුනක් දක්වනු ලැබේ. සෑම මැදිහත්වීමක් මගින්ම කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වයට සිදුවන බලපෑම පිළිබඳ දැනට තිබෙන සාක්ෂි පදනමෙහි සාරාංශයක් ද, ඒවා ක්‍රියාත්මක තැන්වල උදාහරණ වැඩසටහන් ද එහි දැක්වේ.[7] මෙම දර්ශවාදය පරිසමාප්ත නැත. අනාගත සමීක්ෂණ විසින් දැනුම පුළුල් කරනු ඇත. විශේෂයෙන්ම, කාන්තාවන්ගේ දේපළ හිමිකාරීත්වයට හෝ ඉඩම් හෝ නිවාසවල උරුමය ඉල්ලාසිටීමට සහයෝගී මැදිහත්වීම් සම්බන්ධයෙන් එසේ සිදුවනු ඇත.[8] මෙම මූලෝපාය යටතේ වඩාත්ම බලාපොරොත්තු සහගත මැදිහත්වීම වන්නේ ආර්ථිකමය පිරිනැමීම්ය. අමතර උපාංග නොමැති ශ්‍රම බලකාය සහ ක්ෂුද්‍ර මූල්‍ය හෝ ඉතුරුම් මැදිහත්වීම් කාන්තාවන්ගේ සමීප සහකරු ප්‍රචණ්ඩත්ව අත්දැකීම් අවම කිරීමේ තනි මැදිහත්වීම් ලෙස නිර්දේශ කරනු නොලැබේ.

**යතුර**

- **බලාපොරොත්තු සහගත**, <1 පරිණාමය විසින් ප්‍රචණ්ඩත්ව ප්‍රතිඵලවල සැලකියයුතු අඩුවීමක් පෙන්නුම් කරනු ලැබේ.
- **වැඩිදුර සාක්ෂි අවශ්‍යය**, <1 පරිණාමය විසින් ප්‍රචණ්ඩත්වය සම්බන්ධ මධ්‍යකාලීන ප්‍රතිඵලවල වර්ධනයක් පෙන්නුම් කරයි.
- **ගැටලු සහගත** - පරිණාමය විසින් ප්‍රචණ්ඩත්වය අවම කිරීම සම්බන්ධයෙන් පෙන්නුම් කරන්නේ එකිනෙකට පරස්පර ප්‍රතිඵලය.
- **සාක්ෂි නොමැත** - මැදිහත්වීම තවමත් එතරම් බැරෑරුම් ලෙස පරිණාමය වී නැත.
- **අකාර්යක්ෂම**, <1 පරිණාමය විසින් ප්‍රචණ්ඩත්ව ප්‍රතිඵලවල අඩුවීමක් පෙන්නුම් කරනු නොලැබේ.
- H ලෝක බැංකුවේ ඉහළ ආදායම් රටවල් (HIC)
- L ලෝක බැංකුවේ පහළ හා මැදි ආදායම් රටවල් (LMIC)

| මැදිහත්වීම් වර්ගය | විස්තරය | | කාර්යක්ෂමතාවේ සාක්ෂි | උදාහරණ වැඩසටහන් |
|---|---|---|---|---|
| **කොන්දේසි සහිත/ රහිත මුදල් වව්චර ලබාදීම සහ භාණ්ඩ ලෙස කරන පිරිනැමීම් ඇතුළු ආර්ථික පිරිනැමීම්** | මධ්‍යම මට්ටමේ ආදායම් සහිත රටවල දිළිඳුකම අවම කිරීමේ හා දිළිඳු හා අවදානමට ලක්වන ජනයාගේ ජීවිත වර්ධනය කිරීමේ මෙවලම් ලෙස සෘජුව පවුල්වලට දෙන මුදල්, ආහාර වව්චර වැනි ආර්ථික පිරිනැමීම් වේගයෙන් පුළුල් වෙමින් තිබේ.<br><br>එළඹුම, ක්‍රමවේදය හා බෙදාහරින යාන්ත්‍රණය අනුව ආර්ථික පිරිනැමීම් සැලකිය යුතු තරමින් වෙනස් වේ. විශේෂිත චර්යාවන් සම්බන්ධයෙන් ඒවා කොන්දේසි සහිත හෝ රහිත විය හැකිය. ළමා සෞඛ්‍ය නිරීක්ෂණයන්, පාසල් පැමිණීම හෝ පෝෂණ උපදේශනයන්ට සහභාගී වීම් එවැනි ඒවාය. ඒවා රාජ්‍ය මූලික මහා පරිමාණ ජාතික සමාජ ආරක්ෂණ වැඩසටහන් හෝ රාජ්‍ය නොවන සංවිධානවල කෙටිකාලීන මැදිහත්වීම්වල කොටස් විය හැකිය. පිරිනැමීම්වල ප්‍රතිලාභීන් සාමාන්‍යයෙන් ගත් කල ගෘහ මූලිකයා හෝ පවුලේ කාන්තාවක් වේ. එය සිදුවන්නේ වැඩසටහනේ අභිමතාර්ථය අනුවයි. | L<br><br>H | LMIC රටවලින් **බලාපොරොත්තු ඇතිකරන සාක්ෂි** ලැබී තිබේ. දිළිඳු පවුල්පලට ආර්ථික පිරිනැමීම් සිදුකිරීමෙන් ප්‍රචණ්ඩ ප්‍රතිඵලවල සැලකියයුතු අඩුවීමක් සිදුවී තිබේ. මුදල් ලබාදීම් සහ සමීප සහකරු ප්‍රචණ්ඩත්වය අතර සම්බන්ධය පිළිබඳ අධ්‍යයනය 22ක සමාලෝචන අයත් වේ. එම අධ්‍යයන අතරින් 73%ක් විසින් පෙන්වාදෙනු ලැබුවේ සමීප සහකරු ප්‍රචණ්ඩත්වයේ අඩුවීමකි.[9] HIC රටවලින් **වැඩිදුර සාක්ෂි අවශ්‍යය**.<br><br>ප්‍රමාණාත්මක සාක්ෂි මගින් නිරූපණය කරන පරිදි, ශාරීරික සහ/හෝ සහ හෝ ලිංගික සමීප සහකරු ප්‍රචණ්ඩත්වය සම්බන්ධ අවම වීම් ප්‍රබලය. චිත්තවේගී අපයෝජනය හා පාලන චර්යාවන් වැනි වෙනත් ප්‍රචණ්ඩත්ව ස්වරූප සම්බන්ධයෙන් බලපෑම ඉතා දුර්වලය.[10] ගුණාත්මක සාක්ෂි මගින් නිරූපණය කරනු ලබන්නේ මෙම අඩුවීම් ප්‍රධාන මාර්ග තුනක් ඔස්සේ සිදුවිය හැකි බවයි. 1) පවුලේ ආර්ථික සුරක්ෂිතබව සහ චිත්තවේගී යහපැවැත්ම වැඩිවීම 2) පවුල තුළ ගැටුම් අවම වීම 3) කාන්තාවන්ගේ සවිබලගැන්වීම වැඩිවීම. ඉලක්ක කිරීම හා ක්‍රමවේදය අදාළ වන ආකාරය (විශේෂයෙන්ම කාන්තාවන්ටම එම ප්‍රතිලාභ ලැබෙන්නේ නම්) සහ වෙනත් මූලෝපායන් සමග කෙතරම් හොඳින් ඒකාබද්ධ විය හැකිද යන කරුණ තේරුම්ගැනීම සඳහා වැඩිදුර සාක්ෂි අවශ්‍යය (බලන්න **Empowerment of Women RESPECT Strategy Summary**). වැඩසටහන් කාලරාමුවලට ඔබ්බෙන් ප්‍රතිඵල තිරසර වන්නේද, ඒ කෙසේද යන්න සහ ගැටුම් පසුබිම්වලදී එමගින් සමීප සහකරු ප්‍රචණ්ඩත්වය අවම කළ හැකිද යන්න එමගින් අවබෝධ කරගත හැකිය.[11] | ලෝක ආහාර වැඩසටහනේ උතුරු ඉක්වදෝරයේ ආර්ථික ප්‍රදාන සහ බංග්ලාදේශයේ පෝෂණ වැඩසටහන්කරණය සමග සම්බන්ධ ආර්ථික ප්‍රදාන<br><br>දකුණු අප්‍රිකාවේ HPTN 068[12] |

| මැදිහත්වීම් වර්ගය | විස්තරය | | කාර්යක්ෂමතාවේ සාක්ෂි | උදාහරණ වැඩසටහන් |
|---|---|---|---|---|
| **රැකියා ප්‍රතිපත්ති සහ ජීවනෝපාය හා රැකියා පුහුණුව ඇතුළු ශ්‍රම බලකා මැදිහත්වීම්** | මෙම මැදිහත්වීම් මගින් පුද්ගලයකුට හෝ පවුලකට හෝ ආර්ථික දේපළ සංවර්ධනය කරගැනීම සඳහා උපකාර කරනු ලැබේ. ඒ රැකියා වැඩිකිරීම, ශ්‍රම බලකා සහභාගීත්වය හෝ ආදායම් සහ ආදායම් උත්පාදන අවස්ථා (ජීවනෝපාය පුහුණුව හෝ එළදායී දේපල පිරිනැමීම් හා වැඩ හා පොදු කාර්යයන් සඳහා මුදල් ලබාදීම) ඔස්සේය. | L<br><br>H | HIC රටවලින් **බලාපොරොත්තු සහගත ප්‍රතිඵල** ලැබී තිබේ. ඒ කාන්තාවන්ගේ රැකියා වැඩිකිරීම මගින් කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය අඩුවිය හැකි බවටය. LMIC රටවල් වෙතින් **වැඩිදුරටත් සාක්ෂි අවශ්‍යය.**<br><br>රටවලින් දැනට ලැබී තිබෙන සාක්ෂි අනුව දක්නට ලැබෙන්නේ මෙම මැදිහත්වීම් මගින් සමීප සහකරු ප්‍රචණ්ඩත්ව අත්දැකීම්ව ල ආරක්ෂක සාධක සම්බන්ධයෙන් වැඩිදියුණු කිරීම් සිදුකළ හැකි බවයි. එම වැඩිදියුණු කිරීම් අතර කාන්තාවන්ගේ සහ පවුල්වල ආර්ථික යහපැවැත්ම මෙන්ම කාන්තාවන්ගේ සම්බන්ධතාවල වැඩිදියුණු කිරීම් තිබේ.[13] කෙසේ වෙතත්, සෘජු, රළු ආකාරවලින් කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය අඩුකිරීමේ හැකියාවෙහි සීමිතකම පිළිබඳ සාක්ෂි ප්‍රමාණවත් නැත (වැඩිපුර සාක්ෂි තිබෙන්නේ වෙනත් සමාජ උපාංග සමග සම්බන්ධ වූ වැඩසටහන්කරණයේ කොටසක් ලෙසයි). | බර්කිනෝ ෆාසෝහි Trickle-Up ජීවනෝපාය පුහුණු වැඩසටහන[14] |
| **කිසිදු අමතර උපාංග යක් නොමැති ක්ෂුද්‍ර මූල්‍ය හෝ ඉතුරුම් මැදිහත්වීම්** | පුද්ගලයකුට හෝ පවුලකට ඉතුරුම් හෝ ණය මගින් තම ආර්ථික දේපළ සංවර්ධනය කරගැනීම සඳහා ආධාර කිරීම කෙරෙහි අවධානය යොමුකරන මැදිහත්වීම්. ක්ෂුද්‍ර මූල්‍ය සහ පුද්ගල හෝ සමූහ ග්‍රාමීය ඉතුරුම් හා ණය සංගම් (VSLAs) මෙයට අයත් වේ. ක්ෂුද්‍ර මූල්‍ය හෝ ඉතුරුම් ඒකාබද්ධ කරන මැදිහත්වීම් මෙයට අයත් නොවේ (එය **Empowerment of Women RESPECT Strategy Summary** තුළ අඩංගු වේ). | | LMIC රටවලින් ලැබෙන සාක්ෂි මගින් හෙළිදරව් වන පරිදි ක්ෂුද්‍ර මූල්‍ය හෝ ඉතුරුම් මැදිහත්වීම් පමණක් ප්‍රචණ්ඩ ප්‍රතිඵල අවම කිරීමේදී **ප්‍රමාණවත් වන්නේ නැත**. මැදිහත්වීම් තවමත් දැඩි ඇගයීමකට ලක්කර නොමැති නිසා HIC රටවලින් **සාක්ෂි ලැබී නැත**.<br><br>මැදිහත්වීම් රැසක් විසින් ක්ෂුද්‍ර මූල්‍ය හෝ ඉතුරුම් වෙනත් වර්ගවල සමාජ සවිබලගැන්වීමේ මැදිහත්වීම් සමග ඒකාබද්ධ කරයි. ඒවා කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය අවම කිරීම සම්බන්ධයෙන් වඩා බලාපොරොත්තු සහගත ප්‍රතිඵල පෙන්නුම් කර තිබේ.[15] ඒකාබද්ධ ආර්ථික සහ සමාජ සවිබලගැන්වීමේ වැඩසටහන් සඳහා උදාහරණ **Empowerment of Women RESPECT Strategy Summary** හි ඇතුළත් කර තිබේ. | බර්කිනෝ ෆාසෝහි Trickle-Up ජීවනෝපාය පුහුණු වැඩසටහන (VSLAs සහ ආරම්භක ප්‍රාග්ධනය) |

## උදාහරණ වැඩසටහන්

පහත වගුවෙහි සාරංශ දැක්වෙන්නේ එකිනෙකට වෙනස් ආර්ථික පිරිනැමුම් වැඩසටහන් දෙකකි. එමගින් වැඩසටහන් කාලරාමු තුළ කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය පැවැත්ම අඩුකිරීම සම්බන්ධයෙන් ප්‍රතිඵල පෙන්නුම් කර තිබේ. අනෙකුත් දෙයාකාරයේ මැදිහත්වීම් සම්බන්ධයෙන් උදාහරණ දැක්වෙන්නේ නැත. ඒවා තිබෙන සාක්ෂි මත පදනම්ව කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේ තනි වැඩසටහන් ලෙස නිර්දේශ කරනු නොලැබේ. මෙම වගුව 9 පිටුවෙහි තිබෙන **සැලසුම් හා ක්‍රියාත්මක කිරීමේ පිරික්සුම් ලැයිස්තුව** සහ RESPECT ව්‍යූහය සමග ලබාදී තිබෙන **ඵලදායී වැඩසටහන්කරණයේ මාර්ගෝපදේශ මූලධර්ම** සමග සමාලෝචනය කළ යුතුය. සෑම වැඩසටහනක් ගැනම වඩා සවිස්තර තොරතුරු **වැඩසටහන් සාරාංශවල** සපයා තිබේ.

| **එළඹුම** | **විස්තරය** | **ස්ථානය** | **ඉලක්ක ජනගහනය** | **මූලික ක්‍රියාකාරකම්** | **කාලය** | **ඇගයීම හා බලපෑම** |
|---|---|---|---|---|---|---|
| ලෝක ආහාර වැඩසටහනේ මුදල් ලබාදීමේ වැඩසටහන **(ඉක්වදෝරය)** | කොන්දේසි සහිත මුදල් ලබාදීමේ වැඩසටහනකි. එහි අරමුණ වන්නේ ලෝක ආහාර වැඩසටහන විසින් ක්‍රියාත්මක කරනු ලබන ආහාර විවිධත්වයට හා පෝෂණයටත්, ආහාර සුරක්ෂිතභාවය සම්බන්ධයෙන් කාන්තාවන්ගේ කේවල් කිරීමේ බලයටත්, කොලොම්බියානු සරණාගතයන් ඉක්වදෝර ප්‍රජාව වෙත ඒකාබද්ධ කිරීමටත් සම්බන්ධ වැඩසටහන්වලට උපකාර කිරීමයි. | උතුරු ඉක්වදෝරයේ දිළිඳු නාගරික ප්‍රදේශ | කොලොම්බියානු සරණාගතයන් හා සත්කාරක ඉක්වදොර් ජාතිකයන් ඇතුළු දිළිඳු කාන්තාවන් (වැඩිහිටි කාන්තාවක් නොමැති සුළු පවුල් ප්‍රමාණයක පිරිමින් ද ඉලක්ක කරන ලදී) | සහභාගී වන පවුල්වල කාන්තාවන් හට (සහ ඇතැම් පිරිමින්ට) මසකට ඇමරිකානු එක්සත් ජනපද ඩොලර් 40ක් පමණ (පවුලේ පරිභෝජනයෙන් 11%ක් පමණ) බැගින් වන පිරිනැමීම් මුදල්, වවුචර සහ ආහාර ලෙස ලැබිණි. මාසික පෝෂණ පුහුණුවට සහභාගී වීමේ කොන්දේසිය මත මෙම පිරිනැමීම් මාස හයක කාලයක් තිස්සේ ලබාදෙන ලදී. | මාස 6 | **ඇගයීම් වර්ගය**: සසම්භාවී පාලිත පරීක්ෂණ (RCT)[16]<br><br>**බලපෑම**: පිරිනැමීම්වලින් දළ වශයෙන් මාස හයකට පමණ පසුව සහකරුවන් විසින් සිදුකරනු ලබ ශාරීරික සහ/ හෝ ලිංගික ප්‍රචණ්ඩත්වය 30%කින් අවම කළ හැකි බව ඇගයීම මගින් සොයාගන්නා ලදී. පිරිනැමීම් වර්ගය අනුව ප්‍රතිඵල වෙනස් වූයේ නැත. ද්‍රව්‍ය මෙන්ම මුදල් ද කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය අවම කිරීමට ඉවහල් විය. විශ්ලේෂණය මගින් එකිනෙකට අනුපූරක වන මාර්ග තුනක අවම වීමක් පෙන්නුම් කරනු ලැබේ. 1) අවම කරන ලද විවාහක ගැටුම් මීට පෙර දෛනික පවුල් අවශ්‍යතා සම්බන්ධයෙන් මුදල් ලබාගැනීම සමග කලින් මේවා සම්බන්ධ විය. 2) පවුල් යහපැවැත්මේ හා ප්‍රීතිමත්භාවයේ වර්ධනය 3) කාන්තාවන්ගේ තීරණ ගැනීමේ හැකියාවේ, ස්වයං විශ්වාසයේ හා සංචලනයේ නිදහසෙහි වර්ධනය |

| එළඹුම | විස්තරය | ස්ථානය | ඉලක්ක ජනගහනය | මූලික ක්‍රියාකාරකම් | කාලය | ඇගයීම හා බලපෑම |
|---|---|---|---|---|---|---|
| **HPTN 068, දකුණු අප්‍රිකාවේ එච්අයිවී අවම කිරීමේ කොන්දේසිය මත මුදල් පිරිනැමීම** | ගැහැණු ළමයින්ගේ හා තරුණ කාන්තාවන් පාසල් යාමේ කොන්දේසිය මත මුදල් පිරිනැමීමේ වැඩසටහනකි. | ග්‍රාමීය දකුණු අප්‍රිකාව | ද්විතීයක පාසල්වල (වයස අවුරුදු 13 - 20 අතර) තරුණ කාන්තාවන් සහ ගැහැණු ළමයින් සහ ඔවුන්ගේ මව්පියන් සහ/ හෝ භාරකරුවන් | අවම වශයෙන් ද්විතීයක පාසල් යාම මසකට 80% ක දින ගණනක සාමාන්‍යයක් පවත්වාගැනීමේ කොන්දේසිය මත ගැහැණු ළමයින්ට හා ඔවුන්ගේ පවුලවලට මුදල් ලබාදෙන ලදී. මෙම මුදල් වැඩසටහනට පෙර පවුලේ මාසික වියදමෙන් ආසන්න වශයෙන් 15.7%ක් විය. ගැහැණු ළමයින්ට ඩොලර් 10ක් හා මව්පියන්ට/ භාරකරුවන්ට ඩොලර් 20ක් සෑම මසකම ලබාදෙන ලදී. | අවුරුදු 3 දක්වා | **ඇගයීම් වර්ගය**: සසම්භාවී පාලිත පරීක්ෂණ (RCT)[17]<br>**බලපෑම**: මුදල් ලැබීම හේතුවෙන් ගැහැණු ළමයින්ගේ හා තරුණ කාන්තාවන්ගේ ශාරීරික සමීප සහකරු ප්‍රචණ්ඩත්වය සම්බන්ධ අත්දැකීම් වසර තුනකට පසු 34% දක්වා අඩුවූ බව ඇගයීම මගින් සොයාගන්නා ලදී. මුදල් පිරිනැමීම් මගින් ප්‍රචණ්ඩ විය හැකි සහකරුවන්ට කාන්තාවන් සහ ගැහැණු ළමයින් නිරාවරණය වීමේ අවකාශය අවම විය හැකි බව සහ ඔවුන් මුල්වරට ලිංගික කටයුතුවල යෙදීම ප්‍රමාද කළ හැකි බවත්, ලිංගික සහකරුවන් සංඛ්‍යාව අඩු කළ හැකි බවත් විශ්ලේෂණය මගින් යෝජනා කරනු ලැබේ. |

# සැලසුම් සහ ක්‍රියාත්මක කිරීමේ පිරික්සුම් ලැයිස්තුව

කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය මට්ටම් අවම කිරීම සම්බන්ධයෙන් දිළිඳුකම අවම කිරීමේ මැදිහත්වීම්වල **ඵලදායී එළඹුම්වල පොදු මූලිකාංග හා මූලධර්මවලට** පහත දැක්වෙන ලක්ෂණ අඩංගු වේ:

## වැඩසටහන් සැලසුම් සහ අනුරූප වීම

**වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ ගුණාත්මකභාවය සහ ආර්ථික වැඩසටහන්කරණයේ ප්‍රමාණවත් ප්‍රතිලාභී මට්ටම් සහතික කරන්න.** දිළිඳුභාවය සම්බන්ධයෙන් කටයුතු කිරීම තුළ සහභාගිකයන් පරිවර්තනය කිරීමේ විභවයක් තිබෙන අතර, ක්‍රියාත්මක කිරීමේ හා ප්‍රතිලාභ මට්ටම්වල ගුණාත්මකබව ඉතා වැදගත් වේ. උදාහරණයක් ලෙස, අඩු වටිනාකම් සහිත හා දුර්වල ලෙස ක්‍රියාත්මක කරනු ලබන, ක්‍රියාත්මක වීම පවා හරිහැටි කිව නොහැකි මුදල් පිරිනැමීමේ වැඩසටහන් මගින් ප්‍රතිලාභීන්ට පුළුල් ප්‍රතිඵල ලබාදීමේ හැකියාව අඩුය. ඒ හා සමාන ලෙසම, සූරාකෑමේ හා අනාරක්ෂිත තත්වයන් මත පදනම් වූ, කාන්තාවන්ට වෙනස්කම් සිදුකරන රැකියා හා ශ්‍රම ප්‍රතිපත්ති සහ වැඩසටහන් මගින්ද සමාජභාවී සමානාත්මතා ප්‍රතිඵල නිර්මාණය කිරීමේ හැකියාව අඩුය. ජීවනෝපාය පුහුණුව පසුබිමට අනුව කුසලතා සහිත පුහුණුකරුවන් හරහා ක්‍රියාත්මක කිරීම සඳහා යෝග්‍ය විය යුතුය. අධික හා ගොදුරු කරගන්නා අන්දමේ පොළී අනුපාතික සහිත ඉතුරුම් හා ණය වැඩසටහන් මගින් දරිද්‍රතාව සහ දරිද්‍රතාව ආශ්‍රිත ආතතිය අවම කිරීමේ හැකියාවක් නැත. ඒ අනුව, කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන් මැදිහත්වීම හා එය අවම කිරීම සාර්ථක වීමට නම්, වැඩසටහන්කරණය විසින් දරිද්‍රතාව දුරලීම සම්බන්ධ ප්‍රබල බලපෑමක් ඇතිකිරීමේ හැකියාව තිබිය යුතුය.

1. **කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේ ප්‍රධාන මාර්ග සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා පිරිනැමීම් මැදිහත්වීම් සැලසුම් කර අනුරූප කරගන්න.** දරිද්‍රතාව දුරලීම සඳහා කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන් කරනු ලබන මැදිහත්වීම්වල ප්‍රතිඵල ප්‍රශස්ථ කිරීම සඳහා සංදර්භීය හා සැලසුම් ලක්ෂණ නිශ්චිත පසුබිමක කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය අවම කිරීම සඳහා යොදාගත හැකි මාර්ග යට බලපාන්නේ කෙසේද යන්න පරිස්සමෙන් සලකා බැලීම වැදගත්ය. උදාහරණයක් ලෙස, ආර්ථික පිරිනැමීම් වැඩසටහන් සම්බන්ධයෙන්, මුදල් පිරිනැමීම් කරන්නේ පිරිමි ගෘහ මූලිකයන්ට ද කාන්තාවන්ට ද යන කාරණය, පිරිනැමීම හා සම්බන්ධ පණිවුඩ මගින් සුබවාදී සමාජභාවී සමාජ සම්මතයන් ප්‍රවර්ධනය වෙනවාද යන්න සහ සමූහ පුහුණුවීම් වැනි කොන්දේසි සහිත ලක්ෂණ කිසිවක් පවුල තුළ විභවයන් වෙනස් කිරීමට හා ප්‍රති ක්‍රියාමාර්ග අවම කිරීමට අවශ්‍ය ද යන්න සලකා බැලිය යුතුය.[18] මෙම සාධක තීරණය වන්නේ පසුබිම අනුවය. ප්‍රධාන සමාජභාවී අසමානතා, සමාජභාවය සම්බන්ධ සමාජ සම්මතයන් සහ විශේෂිත ඉලක්ක කණ්ඩායම්වල සලකා බැලීම් පිළිබඳ තක්සේරුවක් එයට ඇතුළත් වේ.

2. **මේ දක්වා මැදිහත්වීම් පිළිබඳ සාක්ෂි මගින් කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වයේ මට්ටම් සම්බන්ධයෙන් ස්ථාවර බලපෑමක් ප්‍රදර්ශනය කර නැති නිසා ශ්‍රම බලකාය වෙනුවෙන් පමණක් හෝ ක්ෂුද්‍ර මූල්‍ය මැදිහත්වීම් අවශ්‍යද යන්න වැඩිදුරටත් පරීක්ෂා කිරීම.**[19] මෙයට එක් හේතුවක් වන්නේ, LMIC රටවල ගැඹුරු අධ්‍යයනයන්ගේ මඳකමයි. එසේම, වෙනත් උපාංග කට්ටලවලට සාපේක්ෂව ආර්ථික උපාංගවල විශේෂිත දායකත්වයන් ලබාගැනීම සම්බන්ධයෙන් අධ්‍යයනයන්ගේ සීමිත හැකියාව එයට හේතු වේ. විය හැකි බලපෑමේ ශක්තිය තක්සේරු කිරීම සඳහා එවැනි වැඩසටහන්වල ආර්ථික ඵලදායීතාව සම්බන්ධ පුළුල් සාහිත්‍යය වෙත අවධානය යොමුකළ යුතුය.[20] ඒ අනුව, මෙම වර්ගවල වැඩසටහන් නිර්දේශ කිරීමට පෙර, පරිස්සම් සහගත සලකාබැලීම් හා වැඩිදුර පරීක්ෂණ අවශ්‍යය.

3. **කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන් දිළිඳුභාවය අවම කිරීමේ වැඩසටහන්වල බලපෑම ශක්තිමත් කිරීම හා ප්‍රශස්ථ කිරීම සඳහා අනුපූරක ක්‍රියාකාරකම් සම්බන්ධ කරන්න.** පවුල්වල කාන්තාවන්ගේ තත්වය සෘජුව හෝ වක්‍රව වර්ධනය කරන අනුපූරක ක්‍රියාකාරකම් සමීප සහකරු ප්‍රචණ්ඩත්වය කෙරෙහි ඇති බලපෑම තිරසර කිරීම සඳහා වැදගත් විය හැකිය. උදාහරණයක් ලෙස, බංග්ලාදේශයේ ලෝක ආහාර වැඩසටහනේ පිරිනැමීම් වැඩසටහන් පිළිබඳ ඇගයීමක් මගින් පිරිනැමීම් ලද සහභාගිකයන් අතර ශාරීරික සමීප සහකරු ප්‍රචණ්ඩත්වවල 26%ක අඩුවීමක් වාර්තා විය. එමෙන්ම, වැඩසටහන අවසන් වීමෙන් පසු මාස 6 සිට 10 අතර කාලයක් අඛණ්ඩව ක්‍රියාත්මක කරනු ලබන පෝෂණ චර්යා විපර්යාස සන්නිවේදන උපාංග ද එයට අයත් වේ. එහෙත්, පිරිනැමීම් පමණක් ලැබුණු සහභාගිකයන් අතර එවැනි වෙනසක් වාර්තා වූයේ නැත.[21]

4. **මැදිහත්වීම් රාමුගත කරන ආකාරය පරිස්සමෙන් සලකා බලන්න.** උදාහරණයක් ලෙස, ළමා සෞඛ්‍යය හෝ ගෘහ යහපැවැත්ම ආවරණය කරන පිරිනැමීම් වැඩසටහනක් රාමුගත කිරීම වඩා පහසුවෙන් පිළිගත හැකිය. වැඩසටහන සෘජුව කාන්තාවන් සවිබලගැන්වීම වටා රාමුගත කිරීමේදී සිදුවනවාට වඩා එයට එරෙහි ක්‍රියාමාර්ග අවම විය හැකිය.[22] මෙම පිරිනැමීම් අධ්‍යයනය කිරීම කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය පිළිබඳ වෙනත් සාහිත්‍යයන් සමග අනුගත ප්‍රමාණාත්මක සාක්ෂි නැති නමුදු, පිරිමින් වැඩසටහන් දකින හා පිළිගන්නා ආකාරය (පිරිමි සම්බන්ධතාව) කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන් වැඩසටහන් බලපෑම නිර්ණය කිරීමේදී වැදගත් විය හැකි බව විශේෂඥවරු උපකල්පනය කරති.

## ක්‍රියාත්මක කිරීම හා පුළුල් කිරීම

5. **වැඩසටහන් විසින් කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය අවම කිරීම පිළිබඳ සාක්ෂි ජනනය කිරීම සඳහා අධීක්ෂණ හා ඇගයීම් රාමු සැලසුම් කරන්න**. වෙනසෙහි මාර්ගය ග්‍රහණය කරගැනීම සඳහා සහ විවිධ උපාංගවල වාසි තේරුම් ගැනීම සඳහා විශ්වසනීය ප්‍රමාණාත්මක හා ගුණාත්මක ක්‍රම (වැඩිදුර විස්තර සඳහා අධීක්ෂණ හා ඇගයීම් මාර්ගෝපදේශය බලන්න) රැසක් මෙයට ඇතුළත් විය යුතුය. යෝග්‍ය තැන්වලදී, කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සිදුවන නිරන්තරභාවය සහ එහි බැරෑරුම්භාවය සුළු වෙනස්කම් සහිතව ග්‍රහණය කරගැනීම සඳහා ක්‍රියාමාර්ග ඇතුළත් කළ යුතුය. වැදගත් කාරණය වන්නේ, දිගු කාල පරාසයන් තුළදී වැඩිපුර සාක්ෂි අවශ්‍ය වීමයි. ප්‍රතිලාභ අවසන් වීමෙන් පසු හෝ ප්‍රතිලාභ බලපෑම තවදුරටත් පවතිද්දී කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වැඩසටහනට පෙර පැවති මට්ටම දක්වා අවම වී තිබේදැයි අවබෝධ කරගැනීම සඳහා මධ්‍ය හා දිගු කාලීන මැදිහත්වීම් (අවුරුදු 5 -10) සහ පශ්චාත් මැදිහත්වීම් බලපෑම් ද එයට අයත් වේ.

6. **ශාරීරික හා ලිංගික ස්වරූපවලට අමතරව ආර්ථික සහ චිත්තවේගී ස්වරූපවල ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන් ඇති බලපෑම මනින්න, ග්‍රහණය කරගන්න**. දරිද්‍රතාව අවම කිරීමේ වැඩසටහන් ආර්ථික හා චිත්තවේගී ප්‍රචණ්ඩත්වයට බලපාන ආකාරය පිළිබඳ සාක්ෂිවල අඩුවක් තිබේ. ඇතැම් ඇගයීම් විසින් යෝජනා කරනු ලබන්නේ ප්‍රචණ්ඩත්වයේ මෙම ස්වරූප වෙනස් කිරීම ශාරීරික හෝ ලිංගික ස්වරූප වෙනස් කිරීමට වඩා දුෂ්කර බවයි. එසේ නැතහොත්, පවුල් මට්ටම්වලදී සම්පත්වල සහ සමාජභාවී බල විභවයන්ගේ වෙනස්වීම් අනුව පිරිමින්ගේ ප්‍රතිචාරවල ප්‍රතිඵලයක් ලෙස වැඩිවීමේ හැකියාවක් ද තිබේ.

7. **විවිධ වර්ගයේ පවුල්වලට සිදුදු බලපෑම් වඩා හොඳින් අවබෝධ කරගැනීම සඳහා දත්ත විශ්ලේෂණය කරන්න**. කාන්තා ගෘහ මූලික පවුල්, ආබාධ සහිත කාන්තාවන් සහ ගැහැණු ළමයින් සිටින පවුල්, අවතැන් වූ පවුල් සහ විවාහ කීපයක් සහිත පවුල් ආදිය මෙම පවුල් වර්ග වේ. උදාහරණයක් ලෙස, ඝානාවේ අලුත් මව්වරුන් සඳහා වන LEAP 1000 මුදල් පිරිනැමීමේ වැඩසටහන ක්‍රියාත්මක වෙද්දී සමස්ත මැදිහත්වීම තුළම සමීප සහකරු ප්‍රචණ්ඩත්ව සිදුවීමේ නිරන්තරභාවය අඩු විය. එහෙත්, සමීප සහකරු ප්‍රචණ්ඩත්ව අත්දැකීම් අඩු වූයේ එක විවාහයක් සහිත පවුල් තුළ පමණි. (බහු විවාහක පවුල්වල ඉහළ මට්ටමින් සමීප සහකරු ප්‍රචණ්ඩත්වය තිබේ.)[23] එයට ප්‍රතිවිරුද්ධව, මාලිහි පවුල්වල පිරිමි ගෘහ මූලිකයන් ඉලක්ක කර ක්‍රියාත්මක කරන ලද ජාතික පිරිනැමීම් වැඩසටහනක් සම්බන්ධයෙන් සිදුකරන ලද ඇගයීමකදී බහු විවාහක පවුල් තුළ සමීප සහකරු ප්‍රචණ්ඩත්වය කැපී පෙනෙන අන්දමේ අඩුවීමක් වාර්තා විය. එහෙත්, ඒක විවාහක පවුල්වල එම බලපෑම වඩා සීමිතය.[24] මේ පිළිබඳ පැහැදිලි කිරීමක් සංදර්භයට අනුව නිශ්චිත විය හැකිය. මට්ටම් දෙකේම ප්‍රචණ්ඩත්වය සහ වැඩසටහන්කරණය සඳහා ප්‍රතිචාර පවුල් ව්‍යුහය අනුව වෙනස් විය හැකි බව මතුවෙමින් තිබෙන සාක්ෂි මගින් යෝජනා කරනු ලැබේ.

# මූලෝපාය සාරාංශය

## ඇතුළත් වීමේ ස්ථාන

පහත දැක්වෙන වගවු විසින් අවධාරණය කරනු ලබන්නේ මෙම මූලෝපාය ක්‍රියාත්මක කිරීම සඳහා ඇතුළත් විය හැකි ස්ථානයි. සමීප සහකරු ප්‍රචණ්ඩත්වය සම්බන්ධ සාධනීය ප්‍රතිඵල උපරිම කිරීම සඳහා දැනට පවතින දරිද්‍රතාව අවම කිරීමේ වැඩසටහන් හෝ වේදිකාවන් උසස් කිරීම මෙයට අයත් වේ. ඒ අතරතුර විය හැකි ඍණාත්මක බලපෑම් අවම කළ යුතුය. එයට පහත දැක්වෙන ආකාරයේ වැඩසටහන් ද ඇතුළත් වේ.

| පිවිසුම් ලක්ෂ්‍ය | තර්කනය |
|---|---|
| **සමාජ ආරක්ෂණ ජාල**<br>• සෘජු ආර්ථික පිරිනැමීම් | LMIC රටවල බිලියන 2.5ක් ජනයා කිසියම් ආකාරයක සමාජ ආරක්ෂණ ජාලයක ආවරණය ලබති.[25] ආර්ථික පිරිනැමීම් ද එයට අයත් වේ. පහළ මට්ටමේ සම්පත් සහිත පසුබිම් තුළ ඔවුන්ගේ පුළුල් හා පුළුල් වෙමින් තිබෙන ප්‍රවේශය සහ කාන්තාවන් හා ආර්ථික වශයෙන් කොන් කරන ලද කණ්ඩායම් සෘජුව ඉලක්ක කිරීමේ ඔවුන්ගේ හැකියාව හේතුවෙන්, සමාජ ආරක්ෂණ ජාල වැඩසටහන් විසින් ප්‍රතිපත්ති සම්පාදකයන් හට මහා පරිමාණ ප්‍රතිඵල ලබාගැනීමට පෙර නොවූ අවස්ථා සපයනු ලැබේ.<br><br>ආර්ථික පිරිනැමීම් මගින් කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය අවම කිරීම සෘජුව ඉලක්ක කර නැති විටදී පවා, එමගින් මහා පරිමාණයෙන් සමීප සහකරු ප්‍රචණ්ඩත්වය අවම වීම සිදුවිය හැකි බව මතුවන සාක්ෂි විසින් පෙන්වා දී තිබේ. නිවෙස් තුළ ගතිකයන් ඇතුළු වෙනස සඳහා අවශ්‍ය වැදගත් සවිබලගැන්වීම් සිතාමතා ග්‍රහණය කරගැනීම සඳහා සැලසුම වෙනස් කිරීමෙන් හෝ අමතර උපාංග එකතුකිරීමෙන්, කාන්තාවන්ගේ ආර්ථික සවිලගැන්වීම සහ පවුල් ආර්ථික යහපැවැත්ම විශාල කළ හැකිය. කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වයේ වඩා තිරසර අඩුකිරීම් කළ හැකිය.<br><br>උදාහරණයක් ලෙස, බංග්ලාදේශයේ පිරිනැමීම් මාදිලි සමීක්ෂණ මුලපිරුමෙහි (මව්වරුන් සඳහා අන්තර් ක්‍රියාකාරී කණ්ඩායම් පුහුණුව මෙන්ම ප්‍රජාව සම්බන්ධ වීම ඇතුළත් වූ) අමතර චර්යා වෙනස් කිරීමේ උපාංගය ආහාර හා මුදල් පිරිනැමීම අවසන් වී මාස 6 - 10 කාලයකට පසු ප්‍රතිඵල තිරසර කිරීම සඳහා වැදගත් විය. මෙම අතිරේක උපාංගය කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය අවම කිරීමේ ප්‍රධාන මාර්ග තුනකට සෘජුව බලපා ඇති බව සාක්ෂි මුලපිරුමෙහි ඇගයීමක් මගින් පෙන්නුම් කරන ලදී. කාන්තාවන්ගේ වැඩි කරන ලද සමාජ ප්‍රාග්ධනය හා කේවල් කිරීමේ බලය, ප්‍රචණ්ඩත්වය ඇතිකරන පිරිමින්ට දැරීමට සිදුවන පුළුල් සමාජ පිරිවැය සහ පවුල් යහපැවැත්මේ දිගුකාලීන වර්ධනය එයට ඇතුළත් විය.[26] |
| **දැනට තිබෙන ප්‍රජා පාදක ආර්ථික ආයතන උදා: ඉතුරුම් හා ණය කණ්ඩායම්, ස්වයං උපකාර කණ්ඩායම්, සමාජ ආරක්ෂණ ප්‍රතිලාභීන්** | තනි මැදිහත්වීම් ලෙස පවතිනවාට අතිරේකව, ප්‍රජා මට්ටමේ දැනට තිබෙන ආර්ථික ව්‍යුහයන් සහ ආයතන විසින් වෙනත් ආකාරයේ කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේ කාර්යයන් වෙනුවෙන් පිරිවැය අතින් කාර්යක්ෂම සහ පුළුල් කළ හැකි පිවිසුම් ස්ථාන පිරිනැමිය හැකිය. මේ ආකාරයේ මැදිහත්වීම් පමණක් කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය අඩුකිරීමෙහිදී ඵලදායී බවට දෘඪ සාක්ෂි නැත. අනුපූරක සාක්ෂි මගින් යෝජනා කරනු ලබන්නේ ඒකාබද්ධ කරන ලද ආර්ථික හා සමාජ සවිබලගැන්වීමේ මැදිහත්වීම් සාර්ථක වන බවයි. මෙම මැදිහත්වීම් සාර්ථක වී තිබෙන්නේ කාන්තාවන්ගේ සමාජ කුසලතා, විශ්වාසය හා ජාල ගොඩනැගීම ඔස්සේය. එය ආර්ථික උපාංගවලට සමාන්තර වේ.<br><br>උදාහරණයක් ලෙස, රුවන්ඩාවේ Indashyikirwa මැදිහත්වීම මගින් CARE සංවිධානය විසින් පවත්වාගෙන ගිය VSLA ඇතුළත් වීමේ ස්ථානයක් ලෙස පාවිච්චි කර අසමාන සම්බන්ධතා විභවයන් වර්ධනය කිරීමට හා සමීප සහකරු ප්‍රචණ්ඩත්වය අවම කිරීම සඳහා යුවල සම්බන්ධ කරගන්නා ලදී.[27] ඒ අනුව, හවුල්කරුවන් සහ පුළුල් ප්‍රජාව විසින් දැනටමත් පිළිගෙන තිබෙන ජාලයක් ඔස්සේ ආර්ථික වැඩසටහන්කරණය කාන්තාවන් වෙත ළඟාකරවීමට හා ඔවුන් සම්බන්ධ කරගැනීම සඳහා ප්‍රයෝජනවත්ය.<br><br>ටැන්සානියාවේ MAISHA මැදිහත්වීම විසින් ක්ෂුද්‍ර මූල්‍ය සමාජභාවී සවිබලගැන්වීමේ මැදිහත්වීම් සමග සම්බන්ධ කරන ලදී. එහි අරමුණ කාන්තාවන් ශාරීරික සහ/ හෝ ලිංගික සමීප සහකරු ප්‍රචණ්ඩත්ව අත්දැකීමේ අවදානම අවම කිරීමයි. ඒකාබද්ධ කරන ලද එළඹුම් පිළිබඳ වැඩිදුර විස්තර සඳහා බලන්න:**RESPECT Strategy Summaries on Relationships Skills Strengthened and Empowerment of Women** |

# ප්‍රධාන සම්පත්

## සාක්ෂි සමාලෝචන

A Mixed-Method Review of Cash Transfers and Intimate Partner Violence in Low- and Middle-Income Countries. Buller, A. M., Peterman, A., Ranganathan, M., Bleile, A., Hidrobo, M., & Heise, L. The World Bank Research Observer, 33(2), pp.218–258. 2018
පහළ සහ මධ්‍ය මට්ටමේ ආදායම් සහිත රටවල ප්‍රමාණාත්මක අධ්‍යයන 14ක හා ගුණාත්මක අධ්‍යයන අටක මෙම මිශ්‍ර ක්‍රමයේ අධ්‍යයන සමාලෝචනය මගින් මාර්ග තුනක් යෝජනා කරන න්‍යායක් ඉදිරිපත් කරන ලදී. එමගින් මූල්‍ය පිරිනැමීම් මගින් සමීප සහකරු ප්‍රචණ්ඩත්වයට බලපෑමක් විය හැකිය. 1) ආර්ථික සුරක්ෂිතබව හා චිත්තවේගී යහපැවැත්ම වැඩි කරයි. 2) පවුල් තුළ ගැටුම් වෙනස් කරයි. 3) කාන්තාවන් සවිබලගැන්වීම වෙනස් කරයි.

What Works to Prevent Violence against Women and Girls? A Rigorous Global Evidence Review of Interventions to Prevent Violence against Women and Girls, Kerr Wilson A, Gibbs A, McAslan Fraser E, Ramsoomar L, Parke A, Khuwaja H and Jewkes R. What Works to Prevent VAWG. 2020
මෙම ගැඹුරු සාක්ෂි සමාලෝචනය මගින් ආර්ථික පිරිනැමීම් වැඩසටහන්වල, ක්ෂුද්‍ර මූල්‍ය ඉතුරුම්වල හා මූල්‍ය මැදිහත්වීම්වල සහ සමීප සහකරු ප්‍රචණ්ඩත්වය වැළැක්වීම සම්බන්ධ ඒකාබද්ධ ආර්ථික සවිබලගැන්වීමේ හා සමාජ සවිබලගැන්වීමේ මැදිහත්වීම්වල ප්‍රතිඵල හඳුනාගෙන ඉදිරිපත් කරනු ලැබේ.

Humanitarian Cash Transfer Programming and Gender-Based Violence Outcomes: Evidence and Future Research Priorities, Cross, A, Manell, T. & Megevand, M. R. New York: Women's Refugee Commission and IRC. 2018.
මෙම වාර්තාව මගින් මානුෂීය සංදර්භයන් තුළ සමාජභාවය හා මුදල් පිරිනැමීම් වැඩසටහන් පිළිබඳ අධ්‍යයන 28ක සාක්ෂි සාරාංශගත කරනු ලැබේ.

## සිද්ධි අධ්‍යයන හා සාරාංශ

Cash, food, and vouchers reduce intimate partner violence in urban areas in Ecuador. Cash Transfer and Intimate Partner Violence Research Collaborative. Washington, DC: International Food Policy Research Institute (IFPRI). 2019.
මෙම සිද්ධි අධ්‍යයනය විසින් උතුරු ඉක්වදෝරයේ නාගරික දිළින්දන් අතර කෙටිකාලීන ආහාර, මුදල් හා වව්චර වැඩසටහන් සාරාංශගත කරයි. එමගින් ශාරීරික සහ/හෝ ලිංගික සමීප සහකරු ප්‍රචණ්ඩත්වයෙහි 30%ක අඩුවීමක් වාර්තා විය.

Food and cash transfers coupled with nutrition behaviour change communication lead to sustained reductions in intimate partner violence in Bangladesh. Cash Transfer and Intimate Partner Violence Research Collaborative. Washington, DC: International Food Policy Research Institute (IFPRI). 2019.
මෙම සිද්ධි අධ්‍යයනය විසින් බංග්ලාදේශයේ ආර්ථික පිරිනැමීම් වැඩසටහනක සොයාගැනීම් සාරාංශගත කරයි. එම වැඩසටහන පෝෂණ චර්යා වෙනස් කිරීම් සන්නිවේදන උපාංගයක් සමග ද සම්බන්ධය. එමගින් ශාරීරික සහ සමීප සහකරු ප්‍රචණ්ඩත්වහි 26%ක අඩුවීමක් සිදුවිය.

Cash transfers conditional on schooling reduce IPV among young women in South Africa. Cash Transfer and Intimate Partner Violence Research Collaborative. Washington, DC: International Food Policy Research Institute (IFPRI). 2019.
මෙම ඉදිරිපත් කිරීම මගින් දකුණු අප්‍රිකාවේ නව යොවුන් ගැහැණු ළමයින් ඉලක්ක කළ කොන්දේසි සහිත මුදල් පිරිනැමීම් වැඩසටහනක බලපෑම සාරාංශගත කරනු ලැබේ.

එම වැඩසටහන මගින් ශාරීරික සමීප සහකරු ප්‍රචණ්ඩත්වය 34%කින් අඩු විය. එසේ කරනු ලැබුවේ ගැහැණු ළමයින්ට අවදානම් විය හැකි ප්‍රචණ්ඩ සම්බන්ධතා වැළැක්වීමෙනි. මුදල් පිරිනැමීම් හේතුවෙන් පළමු ලිංගික අත්දැකීම ලැබීම ප්‍රමාද වූ අතර ලිංගික සහකරුවන් ගණන අඩු විය.

Getting down to business: Women's economic and social empowerment in Burundi. International Rescue Committee (IRC), New York: IRC.
මෙම සිද්ධි අධ්‍යයනය විසින් බුරුන්ඩියේ IRC ආයතනයේ EA$E (Economic And Social Empowerment for women) වැඩසටහනේ සොයාගැනීම් සාරාංශගත කරනු ලැබේ. VSLA වෙත සමාජභාවය පිළිබඳ සාකච්ඡා කරන කණ්ඩායමක් එකතු කිරීමෙන් සමීප සහකරු ප්‍රචණ්ඩත්වයේ කැපීපෙනෙන අඩුවීමක් (අවසන් සති දෙක තුළ 22%) ප්‍රතිඵල විසින් පෙන්නුම් කරනු ලැබේ. බලන්න: EA$E Programme Implementation Manual.

## ප්‍රායෝගික මගපෙන්වීම්

Resources for Mainstreaming Gender-Based Violence (GBV) Considerations in Cash and Voucher Assistance (CVA) and Utilizing CVA in GBV Prevention and Response. Women's Refugee Commission, Mercy Corps, IRC. New York: Women's Refugee Commission and IRC; Portland: Mercy Corps. 2020.
අර්බුද හා ගැටුම් මගින් පීඩාවට පත් ජනගහනයන්ගේ මුදල් හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය සම්බන්ධ මෙහෙයුම්කරුවන්ට සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වයෙන් ආරක්ෂාව ලැබීම තහවුරු කිරීම මෙම සාරාංශය සහාය සපයයි.

Cash & Voucher Assistance and Gender-Based Violence Compendium: Practical Guidance for Humanitarian Practitioners. CARE and Cash Learning Partnership (CaLP). 2019.
මෙම එකතුව මගින් ඉලක්ක කරනු ලබන්නේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ අවදානම අවම කිරීම හා වැළැක්වීම ඇතුළත් කරගැනීම සඳහා මානුෂීය සේවා මෙහෙයුම්කරුවන්ට උපකාර කිරීමයි. මුදල් ලෙස ලබාදෙන ආධාර, වව්චර් මගින් සහාය වීමේ මැදිහත්වීම්, ඒවා ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය වැළැක්වීම සමග සම්බන්ධ කිරීම හා යෝග්‍ය පරිදි ප්‍රතිචාර දැක්වීම එයට අයත් වේ.

## වෙබිනාර්

Leveraging Cash Transfers to Reduce Intimate Partner Violence at Scale, Promise and Potential from Research around the Globe. The Transfer Project (2019) CSW63 Side Event [online video]. Available at: https://www.youtube.com/watch?v=dtNxb8FKmyc
එක්සත් ජාතීන්ගේ කාන්තා ඒකකය, සිඩා සහ ටැන්සානියාවේ අගමැති කාර්යාලය විසින් සත්කාරකත්වය දරන මෙම CSW63 අතුරු වැඩසටහන විසින් මුදල් පිරිනැමීම කාන්තාවන්ට එරෙහි සමීප සහකරු ප්‍රචණ්ඩත්වය අවම කිරීමට උපකාර වන අකාරය පිළිබඳ ලෝකය පුරා මතුවෙමින් තිබෙන සාක්ෂි ඉදිරිපත් කරනු ලැබේ.

# පසු සටහන

[1] දරිද්‍රතාව පිළිබඳ සංකල්ප, ආර්ථික සුරක්ෂිතභාවය, ආර්ථික අනාරක්ෂිතභාවය, ධනය, දේපළ අතර වෙනස්කම් තිබෙන බව මෙම මූලෝපාය විසින් පිළිගනු ලැබේ. එහෙත්, ආඛ්‍යාන/ ව්‍යුහමය අරමුණු වෙනුවෙන් එකිනෙක අතර භාවිතා කරනු ලැබේ. විශේෂිත සමීක්ෂණයක් විස්තර කිරීමේදී පුද්ගල දර්ශක වෙනුවෙන් වඩා නිශ්චිත සංකල්ප භාවිතා කරනු ලැබේ.

[2] Stockl H, March LM, Pallitto C, et al. (2014) Intimate partner violence among adolescents and young women: prevalence and associated factors in nine countries: a cross sectional study. BMC Public Health. 2014;14:751;
Decker MR, Peitzmeier S, Olumide A, et al. (2014) Prevalence and health impact of intimate partner violence and non-partner sexual violence among female adolescents aged 15–19 years in vulnerable urban environments: a multi-country study. J Adolesc Health;55:S58–S67; Heise L, Kotsadam A. (2015) Cross-national and multilevel correlates of partner violence: an analysis of data from population-based surveys. Lancet Global Health. 2015;3:e332–e340. Jewkes, R. (2017) What are the drivers of violence against women and girls and how to prevent it. Presentation for What Works to Prevent VAWG.

[3] Peterman, A., Roy, S., and Ranganathan, M. (2019) How is economic security linked to gender-based violence? New insights from the Sexual Violence Research Initiative Forum 2019. IFPRI Blog.

[4] Gibbs, A and Bishop, K (2019) Combined economic empowerment and gender-transformative interventions. Evidence Review. What works to prevent VAWG programme.

[5] Ibid.

[6] සමාජ ආරක්ෂණ ජාල මෙසේ නිර්වචනය කළ හැකිය: 'දුප්පත් සහ අවදානමට මුහුණදෙන පුද්ගලයන්ට උපකාර කිරීමේ අරමුණෙන් මූල්‍ය හෝ ද්‍රව්‍ය ලෙස සපයනු ලබන දායක නොවන ප්‍රතිලාභ. ඒවා විශාල සමාජ ආරක්ෂණ පද්ධතියක උපාංගයකි. විශ්‍රාම වැටුප් හා සෞඛ්‍ය රක්ෂණ මෙන්ම ශ්‍රම වෙළඳපොළ ප්‍රතිපත්ති හා වැඩසටහන් සම්බන්ධ දායකත්ව සමාජ රක්ෂණය ද එයට අයත් වේ.' – p.4 of Beegle, K., Coudouel, A. & Monsalve, E. (2019) Realizing the Full Potential of Social Safety Nets in Africa, Washington D.C.: World Bank.

[7] සාක්ෂි ශ්‍රේණිගත කිරීම් විශාල වශයෙන් උකහාගනු ලබන්නේ පද්ධතිමය සමාලෝචන මගිනි. එය මැදිහත්වීම් එකකට වඩා වැඩි ගණනක විය යුතුය. එමගින් සසම්භාවී, පොකුරු වශයෙන් සසම්භාවී හා අර්ධ පර්යේෂණාත්මක ක්‍රම වැනි පර්යේෂණාත්මක සැලසුම් භාවිතා කළ යුතුව තිබේ. යුක්ති ක්ෂේත්‍රයේ මැදිහත්වීම්, විකල්ප ඇගයීම් ක්‍රම වැනි ඇතැම් මූලෝපායන් සඳහා කාල ශ්‍රේණි,නිරීක්ෂණාත්මක හා හරස්කඩ සැලසුම් (ගුණාත්මකභාවයෙන් අඩු වුව ද) වඩා යෝග්‍ය වියහැකි බව හඳුනාගෙන තිබේ. මෙය අලුත් ක්ෂේත්‍රයක් වන අතර, අධ්‍යයන සැලසුමෙහි හා ඇගයීමෙහි දැඩිබව සම්බන්ධයෙන් පුළුල් වෙනස්කම් තිබේ. මෙම සමාලෝචන හා අධ්‍යයන සම්බන්ධ මූලාශ්‍ර යොමුවල කොටසක් ලෙස ඉදිරිපත් කර තිබේ.

[8] උදා: සමාන දේපළ හිමිකම් වැනි නීතිමය මැදිහත්වීම් ඉන්දියාවේ දිළිඳුබව සෘජුව අවම කිරීමේ මැදිහත්වීම්වල මූලෝපායන්හිදී සාර්ථක වී තිබේ. බලන්න: Amaral, S (2017) Do Improved Property Rights Decrease Violence Against Women in India? Institute for Social and Economic Research.

[9] Buller, A. M., Peterman, A., Ranganathan, M., Bleile, A., Hidrobo, M., & Heise, L. (2018) A Mixed-Method Review of Cash Transfers and Intimate Partner Violence in Low- and Middle-Income Countries. The World Bank Research Observer, 33(2), pp.218–258.

[10] Ibid.

[11] Falb, K., Annan, J., Blackwell, A., & Stennes, J. (2019). Cash transfers in Raqqa Governorate, Syria: Changes over time in women's experiences of violence and wellbeing. Washington DC: International Rescue Committee and London: UK Department for International Development; Kerr Wilson A, Gibbs A, McAslan Fraser E, Ramsoomar L, Parke A, Khuwaja H and Jewkes R (2020) What Works to Prevent Violence against Women and Girls? A Rigorous Global Evidence Review of Interventions to Prevent Violence against Women and Girls, South Africa; What Works to Prevent VAWG

[12] Pettifor, A., MacPhail, C., Selin, A., Gómez-Olivé, F. X., Rosenberg, M., Wagner, R. G., Mabuza, W., Hughes, J. P., Suchindran, C., Piwowar-Manning, E., Wang, J., Twine, R., Daniel, T., Andrew, P., Laeyendecker, O., Agyei, Y., Tollman, S., Kahn, K., & HPTN 068 protocol team (2016). HPTN 068: A Randomized Control Trial of a Conditional Cash Transfer to Reduce HIV Infection in Young Women in South Africa-Study Design and Baseline Results. AIDS and behavior, 20(9), 1863–1882.

[13] Kerr Wilson A, Gibbs A, McAslan Fraser E, Ramsoomar L, Parke A, Khuwaja H and Jewkes R (2020) Ibid.

[14] The Trickle-Up programme comprised a control arm and an economic intervention-only arm, with VSLA, livelihoods training and start-up capital for women over a six-month period.

[15] Kerr Wilson A, Gibbs A, McAslan Fraser E, Ramsoomar L, Parke A, Khuwaja H and Jewkes R (2020) Ibid.

[16] Hidrobo, Melissa, Amber Peterman, and Lori Heise. (2016). "The Effect of Cash, Vouchers, and Food Transfers on Intimate Partner Violence: Evidence from a Randomized Experiment in Northern Ecuador." American Economic Journal: Applied Economics, 8 (3): 284-303.

[17] Pettifor, A., MacPhail, C., Huges, J., Selin, A., Wang, J., Gomez-Olive, F.X…Khan, K. (2016) The effect of a conditional cash transfer on HIV incidence in young women in rural South Africa (HPTN 068): a phase 3, randomized controlled trial. Lancet Global Health, 4(12) PE978-E988

[18] Prevention Collaborative (2019) Cash transfers and intimate partner violence: Findings from a review of quantitative and qualitative studies in low and middle-income countries. Prevention Collaborative evidence brief. Prevention Collaborative.

[19] Kerr Wilson A, Gibbs A, McAslan Fraser E, Ramsoomar L, Parke A, Khuwaja H and Jewkes R (2020) Ibid.

[20] Peterman A, Palermo TM, Ferrari G. (2018) Still a leap of faith: microfinance initiatives for reduction of violence against women and children in lowincome and middle-income countries. BMJ Glob Health;3:e001143. doi:10.1136/ bmjgh-2018-001143

[21] Roy, Shalini & Hidrobo, Melissa & Hoddinott, John & Ahmed, Akhter. (2018). Transfers, Behavior Change Communication, and Intimate Partner Violence: Post-Program Evidence from Rural Bangladesh. The Review of Economics and Statistics. 1-45.

[22] Buller, A. M., Peterman, A., Ranganathan, M., Bleile, A., Hidrobo, M., & Heise, L. (2018). Ibid.

[23] Peterman, A., Valli, E. & Palermo, T. (2020) Government Anti-Poverty Programming and Intimate Partner Violence in Ghana, Economic Development and Cultural Change (in press).

[24] Heath, R., Hidrobo, M., and Shalini, R (2020) Cash transfers, polygamy, and intimate partner violence: Experimental evidence from Mali Journal of Development Economics, Vol 143 March 2020

[25] The World Bank (2018) The State of Social Safety Nets 2018. World Bank. Washington DC.

[26] Roy, S., Hidrobo, M., Hoddinott, J., & Ahmed, A. (2019) Ibid.

[27] Dunkle, K., Stern, E., Chatterji, S,. and Heise, L., (2019) Indashyikirwa programme to reduce intimate partner violence in Rwanda: Report of findings from a cluster randomized control trial. CARE. London.

[28] Kapiga, S., Harvey, S., Mshana, G., Holm Hansen, C., Mtolela, G.J., Madaha, F. … & Watts, C. (2019). A social empowerment intervention to prevent intimate partner violence against women in a microfinance scheme in Tanzania: findings from the MAISHA cluster randomised controlled trial. The Lancet Global Health, 7(10), 1423- 34.

**© UN Women 2020**

මෙම ලේඛනය **RESPECT ව්‍යූහයේ ක්‍රියාත්මක කිරීමේ මාර්ගෝපදේශයේ** කොටසකි. එය එක්සත් ජාතීන්ගේ කාන්තා ඒකකයේ අනුග්‍රහය මත Social Development Direct විසින් සංවර්ධනය කරන ලදී. එය මෙතැනින් ලබාගත හැකිය.

**Suggested citation:** UN Women and Social Development Direct (2020) Poverty Reduced, RESPECT: Preventing Violence against Women Strategy Summary

RESPECT
WOMEN

# මූලෝපාය සාරාංශය

## කාන්තාවන් සවිබලගැන්වීම

(Empowerment of women)

UN WOMEN

World Health Organization

# කාන්තාවන් සවිබලගැන්වීම

**මූලෝපායේ අභිමතාර්ථය :** කාන්තාවන්ගේ ආර්ථික ස්වාධීනත්වය ප්‍රවර්ධනය කිරීම, සම්බන්ධතා වර්ධනය කිරීම සහ පවුල්, ප්‍රජාවන් සහ සමාජය තුළ සාධාරණ සමාජභාවී බල සම්බන්ධතා ගොඩනැගීම සඳහා ආර්ථික, සමාජ, මානසික,සහ දේශපාලනික වශයෙන් කාන්තාවන් සහ ගැහැණු ළමයින් සවිබලගැන්වීම සඳහා පහසුකම් සැපයීම.

## තාර්කිකත්වය

ආර්ථික සමාජ, මානසික සහ දේශපාලනික වශයෙන් කාන්තාවන් සවිබලගැන්වීම යනු කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය අවම කිරීමේ ආරක්ෂණ සාධකයකි.[1] කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය යනු, සමාජය හා පවුල තුළ කාන්තාව හොබවන පහත් තත්වය පවත්වාගෙන යන සාධකයකි.

මෙම මූලෝපාය යටතේ කරනු ලබන මැදිහත්වීම් විසින් කාන්තාවන්ගේ සහ ගැහැණු ළමයින්ගේ ස්වයං සඵලත්වය (self-efficacy) ගැන ස්වයං විශ්වාසය හා කුසලතා ද, ස්වයං ගරුත්වය සහ සාකච්ඡා කුසලතාද ගොඩනගනු ලැබේ. එමගින් කාන්තාවන්ගේ ආර්ථික සාක්ෂරතාව, දේපල හා ස්වාධිපත්‍යය ද වර්ධනය වේ. පිරිමින් සහ පවුලේ වෙනත් සාමාජිකයන් මත මූල්‍ය වශයෙන් රඳාපැවතීම අවම වේ. සවිබලගැන්වීමේ මූලෝපායන් හේතුවෙන් කාන්තාවන්ගේ කේවල් කිරීමේ බලය, විශ්වාසය, තීරණ ගැනීමේ ස්වාධිපත්‍යය වර්ධනය වේ. ඔවුන්ට තමන් සහ තම පවුල වෙනුවෙන් ගෞරවනීය හා ආරක්ෂාකාරී ලෙස ක්‍රියාත්මක වීම සම්බන්ධයෙන් තෝරාගැනීම් හා නියෝජිතභාවය හිමිවේ.

ප්‍රජාවේ සිටින කොන්කරන ලද කාන්තා කණ්ඩායම් (උදා: කාන්තා ලිංගික ශ්‍රමිකයන් සහ ආබාධ සහිත කාන්තාවන්) ඇතුළු කාන්තාවන් සහ ගැහැණු ළමයින් සමග වැඩකිරීමේ ප්‍රවේශයන් මූලෝපායට අයත් වේ. විශේෂිත කාන්තා කණ්ඩායම් සමග එළඹුම් කෙරෙහි අවධානය RESPECT මාර්ගෝපදේශ මූලධර්මවලට අනුකූල වේ. බහුවිධ හා එකිනෙක විනිවිද යන විෂමතා ස්වරූප සහ අසමානතා සම්බන්ධයෙන් කටයුතු කිරීම මගින් කිසිවකු අත්හැර නොදැමීම එයට අයත් වේ.[2] තම තරුණ විය හා සම්බන්ධ බල ගතිකයන් හේතුවෙන් විශේෂ අවදානම්වලට හා අනතුරුවලට ලක්විය හැකි නවයොවුන් ගැහැණු ළමයින් ඉලක්ක කිරීමේ ප්‍රයත්නයන් ද එයට අයත් වේ.

## අවදානම් සහ ආරක්ෂණ සාධක


පහත දැක්වෙන අවදානම් සාධක සම්බන්ධයෙන් කටයුතු කිරීමට සහ කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සඳහා වන පහත දැක්වෙන ආරක්ෂණ සාධක ප්‍රවර්ධනය කිරීමට මෙම මූලෝපාය ඉලක්ක කරයි.

| මට්ටම | අවදානම් සාධක | ආරක්ෂණ සාධක |
|---|---|---|
| **පුද්ගල** | ආර්ථික අනාරක්ෂිතභාවය (කාන්තා)<br><br>ප්‍රචණ්ඩත්වය සාමාන්‍ය හෝ පිළිගත හැකි දෙයක් ලෙස සාධාරණීකරණය කරන ආකල්ප (පිරිමි සහ ගැහැණු)<br><br>පහළ ස්වයං සඵලත්වය සහ ස්වයං අභිමානය[3] | ආර්ථික අනාරක්ෂිතභාවය (පිරිමි සහ කාන්තාවන්)<br><br>මූල්‍ය ස්වාධිපත්‍යය (කාන්තා)<br><br>සමාජභාවී වශයෙන් සාධාරණ ආකල්ප හා භාවිතාවන් (පිරිමි සහ ගැහැණු)<br><br>ස්වයං සඵලත්වය හා ස්වයං අභිමානය පිළිබඳ ඉහළ හැඟීම (ගැහැණු) |
| **අන්තර් පුද්ගල** | සමීප සහකරු හා නීතියෙන් ඇති වූ සම්බන්ධතාවලදී ඉහළ මට්ටමේ අසමානතාව.<br><br>කාන්තාවන්ගේ මූල්‍ය ස්වාධීනත්වය හා පවුලේ තීරණ ගැනීමේදී සීමිත බලය | සමීප සම්බන්ධතාවල ලක්ෂණ වන්නේ, සමාජභාවී සමානතාවයි. පවුලේ තීරණ හා වගකීම් හවුලේ ගැනීම එයට අයත් වේ.<br><br>කාන්තාවන් සහ පිරිමින් අතර අධ්‍යාපන මට්ටමේදී වැඩි සමානත්වය |
| **ප්‍රජාව** | පිරිමින් වරප්‍රසාදිත තත්වයට පත්කරන හා කාන්තාවන් පවුලේ තීරණ ගැනීම සීමාකරන හානිකර සමාජභාවී සම්මතයන් | අවිහිංසාවට, විවිධත්වයට ගරුකිරීමට හා සමාජභාවී සමානාත්මතාව දිරිදෙන සමාජ සම්මතයන් සහ කාන්තාවන් සවිබලගැන්වීම ප්‍රවර්ධනය කිරීම |
| **සමාජයීය** | විරැකියාවෙන් පෙළෙන, ඌන රැකියා නියුක්තිය සහිත සහ සූරාකෑම සිදුවන සේවා පරිසරයන්හි සිටින කාන්තාවන්<br><br>කාන්තාවන්ගේ පහළ මට්ටමේ දේශපාලන සහභාගීත්වය | කාන්තා රැකියා නියුක්තියේ ඉහළ මට්ටම<br><br>කාන්තාවන්ගේ අධ්‍යාපනයේ ඉහළ මට්ටම<br><br>කාන්තාවන් සක්‍රිය ලෙස දේශපාලනයේ නියුතු වීමේ ඉහළ මට්ටම |

### වෙනස්වීමේ න්‍යාය

පහත දැක්වෙන රූපසටහනෙන් නිරූපණය කරනු ලබන්නේ, සමාජමය හා ආර්ථික වශයෙන් කාන්තාවන් සවිබලගන්වන හා කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය අඩුකිරීමට හේතු වන සාක්ෂි මත පදනම් වූ මැදිහත්වීම් සඳහා සරල කරන ලද වෙනස්කිරීමේ න්‍යායකි. එය විශේෂිත වැඩසටහන් සඳහා තවදුරටත් සංවර්ධනය කර අනුරූප කරගත යුතුය.

## E: කාන්තාවන් සවිබලගැන්වීම



### මැදිහත්වීම් වර්ග

මෙම මූලෝපාය යටතේ මැදිහත්වීම්වලට පහත සඳහන් කරුණු ඇතුළත් වේ:කාන්තාවන්ගේ වෘත්තීය, මූල්‍ය හා ජීවන කුසලතා, අසමාන ලෙස උරුමය බෙදීයාම හා දේපළ අයිතිය වැනි සමාජ, දේශපාලනික හා ආර්ථික වශයෙන් ඇතුළත් කරගැනීමට ඇති බාධා සහ සමාජ ජාල හා සාමූහික නියෝජනයන් නිර්මාණය කරගැනීම. මෙම මූලෝපායන්ගේ අරමුණ වන්නේ, තම සම්බන්ධතාවන්වලදී, පවුල්වලදී හා ප්‍රජාවේදී අසමානතාවට හා යටත් කරගැනීමට අභියෝග කිරීම සඳහා පුද්ගල, කණ්ඩායම් හා සමූහ බලය ගොඩනැගීමයි. ඇතැම් අවස්ථාවලදී, වැඩසටහන් විසින් සහමුලින්ම එක් ආර්ථික හෝ සමාජ සවිබලගැන්වීමක් කෙරෙහි අවධානය යොමුකරනු ලැබේ. වෙනත් වැඩසටහන් සමාජ හා ආර්ථික මැදිහත්වීම් සමග සම්බන්ධ කරයි. පහත දැක්වෙන වගුව විසින් නිරූපණය කරනු ලබන්නේ RESPECT ව්‍යුහයෙහි දක්වා තිබෙන ප්‍රධාන මැදිහත්වීම් වර්ගයි. වර්තමාන සාක්ෂි පදනම හා වැඩසටහන් උදාහරණ ගැන ද එහි දැක්වේ.

**LEGEND**

- ● **බලාපොරොත්තු සහගත**, <1 පරිණාමය විසින් ප්‍රවණ්ඩත්ව ප්‍රතිඵලවල සැලකියයුතු අඩුවීමක් පෙන්නුම් කරනු ලැබේ.
- ■ **වැඩිදුර සාක්ෂි අවශ්‍යය**, <1 පරිණාමය විසින් ප්‍රචණ්ඩත්වය සම්බන්ධ මධ්‍යකාලීන ප්‍රතිඵලවල වර්ධනයක් පෙන්නුම් කරයි.
- ◆ **ගැටලු සහගත** - පරිණාමය විසින් ප්‍රචණ්ඩත්වය අවම කිරීම සම්බන්ධයෙන් පෙන්නුම් කරන්නේ එකිනෙකට පරස්පර ප්‍රතිඵලය.
- □ **සාක්ෂි නොමැත** - මැදිහත්වීම තවමත් එතරම් බැරෑරුම් ලෙස පරිණාමය වී නැත.
- ▼ **අකාර්යක්ෂම**, <1 පරිණාමය විසින් ප්‍රචණ්ඩත්ව ප්‍රතිඵලවල අඩුවීමක් පෙන්නුම් කරනු නොලැබේ.
- H ලෝක බැංකුවේ ඉහළ ආදායම් රටවල් (HIC)
- L ලෝක බැංකුවේ පහළ හා මැදි ආදායම් රටවල් (LMIC)

| මැදිහත්වීම් වර්ගය | විස්තරය | | කාර්යක්ෂමතාවේ සාක්ෂි | උදාහරණ වැඩසටහන් |
|---|---|---|---|---|
| **කාන්තාවන් සහ ගැහැණු ළමයින් සඳහා සවිබලගැන්වීම පුහුණුකිරීම. ජීවන කුසලතා, ආරක්ෂිත අවකාශ[4] සහ මාර්ගෝපදේශය** | කාන්තාවන් සහ ගැහැණු ළමයින්ගේ සමාජ සවිබලගැන්වීම කෙරෙහි අවධානය යොමු කළ මැදිහත්වීම් මෙයට ඇතුළත් වේ. ජීවන කුසලතා, ආරක්ෂිත අවකාශ සහ මාර්ගෝපදේශය එයට අයත්ය.<br><br>ලිංගික ශ්‍රමිකයන් වැනි කොන්කරන ලද කාන්තා කණ්ඩායම් ද එයට ඇතුළත් විය හැකිය. | L ●<br><br>H ■ | මෙම වර්ගයේ මැදිහත්වීම් මගින් කාන්තාවන් සහ ගැහැණු ළමයින් සමීප සහකරු ප්‍රචණ්ඩත්වය ඇතුළු ප්‍රචණ්ඩත්වය අත්දැකීම අඩුකළ හැකි බවට LMIC රටවලින් **බලාපොරොත්තු සහගත** සාක්ෂි තිබේ.<br><br>මෙම වර්ගවල ප්‍රවේශයන් මගින් ප්‍රචණ්ඩත්වය වැඩිවිය හැකි බවට HIC රටවලින් **වැඩිදුර සාක්ෂි අවශ්‍යය**.<br><br>නවයොවුන් ගැහැණු ළමයින් සමග වැඩකිරීමේදී, වඩාත්ම ඵලදායී ප්‍රවේශයට වසරක් හෝ වැඩි කාලයක් තුළ සම්පාදනය කරන ලද තීව්‍ර කණ්ඩායම් පාදක සමාජ සවිබලගැන්වීමේ මැදිහත්වීම් සම්බන්ධ වේ.[5] | The Adolescent Girls Initiative (AGI) (කෙන්යාව)<br><br>AVAHAN sex worker collectivisation (ඉන්දියාව) |
| **උරුමය හා දේපළ හිමිකාරිත්වය ප්‍රතිපත්ති සහ මැදිහත්වීම්** | ඉඩම් සහ වෙනත් ඵලදායී දේපළ සම්බන්ධයෙන් කාන්තාවන්ගේ ප්‍රවේශය හා පාලනය උරුමය සහ දේපළ හිමිකම් සම්බන්ධ නීති වැඩිදියුණු කිරීම ඉලක්ක කරන මෙන්ම පවුල්වලට ගැහැණු ළමයින්ගේ වටිනාකම වැඩිකරන මැදිහත්වීම් මෙයට ඇතුළත්ය. | L ●<br><br>H □ | අසමාන උරුමය හා දේපළ අයිතිය සංශෝධනය කිරීම සමස්ත කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය මට්ටම අඩුකිරීමේදී වැදගත් වන බව බහුෂක රටවලින් **බලාපොරොත්තු සහගත සාක්ෂි** තිබේ. උරුම හිමිකම් පිරිමින් හා ගැහැණුන් අතර සමාන අන්දමින් බෙදී යන තත්වය සැකසූ ඉන්දියාවේ ප්‍රාන්තව විශ්ලේෂණවලින් ද එය හෙළි විය. 1976 - 2004 අතර වකවානුවේදී පොලිසියට වාර්තා වූ කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය 36%කින් පහළ වැටිණි. HIC රටවලින් **සාක්ෂි ලැබී නැත**. | The change in inheritance law (ඉන්දියාව) |

| මැදිහත්වීම් වර්ගය | විස්තරය | කාර්යක්ෂමතාවේ සාක්ෂි | උදාහරණ වැඩසටහන් |
|---|---|---|---|
| **සමාජභාවය සමග සම්බන්ධ කරන ලද ක්ෂුද්‍ර මූල්‍ය ණය සහ සවිබලගන්වන ලද පුහුණු සංරචක** | ආර්ථික හා සමාජ සවිබලගැන්වීමේ ෂංරචක ඒකාබද්ධ කරන බලාපොරොත්තු සහගත එළඹුම් රැසක් තිබේ. මෙම මැදිහත්වීම් කාන්තාවන්ගේ හා ගැහැණු ළමයින් සවිබලගැන්වීම, කාන්තාවන්ගේ සමාජ කුසලතා හා විශ්වාසය සහ ඔවුන්ගේ මූල්‍ය සාක්ෂරතාව හා ස්වාධීනත්වය වර්ධනය කිරීම අරමුණු කරගත් ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් සාකල්‍ය දැක්මකින් කටයුතු කරයි. ඇතැම් මැදිහත්වීම්වලදී පිරිමි සහකරුවන් හෝ සම වයස් පිරිමි ළමයින් සම්බන්ධ කරගනු ලැබේ. එහි අරමුණ වන්නේ ඇතිවිය හැකි ප්‍රතිරෝධයන් අවම කිරීම සහ පිරිමින්ගේ හා පිරිමි ළමයින්ගේ සහාය ලබාගැනීමයි. පිරිමින් හෝ පිරිමි ළමයින් වඩා ගැඹුරින් මෙම වැඩසටහන් සමග සම්බන්ධ කිරීම වෙනත් වර්ගවල මැදිහත්වීම්වලට අයත්ය. එහි අරමුණ වන්නේ පිරිමින් හා පිරිමි ළමයින් හට ද මැදිහත්වීම හරහා පූර්ණ ආර්ථික හා සමාජ සවිබලගැන්වීම ලබාදීමයි. | ආර්ථික හා සමාජ සවිබලගැන්වීමේ සංරචක (ජීවන කුසලතා, ආරක්ෂිත අවකාශ සහ ආර්ථික මැදිහත්වීම් සමග සම්බන්ධ මාර්ගෝපදේශනය ඇතුළු) ඒකාබද්ධ කළ කාන්තාවන්ගේ හා ගැහැණු ළමයින්ගේ සමාජ සවිබලගැන්වීමේ අරමුණු මගින් කාන්තාවන් සහ ගැහැණු ළමයින් සමීප සහකරු ප්‍රචණ්ඩත්වයට මුහුණදීම අඩුකළ හැකි බවට LMIC රටවලින් **බලාපොරොත්තු සහගත සාක්ෂි** තිබේ. මෙම මැදිහත්වීම්වලට පිරිමින් හා කාන්තාවන් සම්බන්ධ විටදී, ඔවුන්ට පිරිමින්ගේ වාර්තාගත සමීප සහකරු ප්‍රචණ්ඩත්ව වැරදි අඩුකළ හැකි බවට ද සාක්ෂි තිබේ. HIC රටවලින් **සාක්ෂි ලැබී නැත**. | MAISHA (ටැන්සානියාව)<br><br>Zindagii Shoista (තජිකිස්තානය)<br><br>Do Kadam Barabari Ki Ore (Two Steps Towards Equality) (ඉන්දියාව) |

## උදාහරණ වැඩසටහන්

වැඩසටහන් කාල රාමුව තුළදී කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය පැවැත්මෙහි අඩුවීමක් වාර්තා කළ එකිනෙකට වෙනස් වැඩසටහන් තුනක් පහත දැක්වෙන වගුවේ සාරාංශගත කර තිබේ. මෙම ක්‍රමවේද ඕනෑම එකක් අනුරූප කරගැනීමේදී මෙම වගුව 8වන පිටුවෙහි තිබෙන **සැලසුම් හා ක්‍රියාත්මක කිරීමේ පිරික්සුම් ලැයිස්තුව** සහ සඞ්ජෑඣ ව්‍යුහය සමග ලබාදී තිබෙන **ඵලදායී වැඩසටහන්කරණයේ මාර්ගෝපදේශ මූලධර්ම** සමග සමාලෝචනය කළ යුතුය. සෑම වැඩසටහනක් ගැනම වඩා සවිස්තර තොරතුරු **වැඩසටහන් සාරාංශවල** සපයා තිබේ.

| වැඩසටහන | විස්තරය | ස්ථානය | ඉලක්ක ජනගහනය | මූලික ක්‍රියාකාරකම් | කාල පරිච්ඡේදය | ඇගයීම හා බලපෑම |
|---|---|---|---|---|---|---|
| MAISHA **(based on IMAGE)**[6] | ක්ෂුද්‍ර මූල්‍ය හා සමාජභාවී සවිබලගැන්වීමේ මැදිහත්වීමකි. එහි අරමුණ වන්නේ ප්‍රජාවන්ගේ ආර්ථික යහපැවැත්ම සහ ස්වාධීනත්වය වර්ධනය කිරීමයි. එච්අයිවී හා කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය අවදානම අඩුකිරීමට ද ඉලක්ක කරනු ලැබේ. | ටැන්සානියාව | ක්ෂුද්‍ර මූල්‍ය කණ්ඩායම්වල දුප්පත් ග්‍රාමීය කාන්තාවන් | කලින් පිහිටුවන ලද ක්ෂුද්‍ර මූල්‍ය කණ්ඩායම්වල කාන්තාවන්ට දින 20ක කාලයක් තුළ **සහභාගීත්ව සවිබලගැන්වීමේ සැසි 10කට** සහභාගී වීමට ආරාධනා කරන ලදී.<br><br>සෑම වැඩසටහනක්ම පැය 1.5 - 2 අතර කාලයක් පැවැත්විණි. එය ඉදිරිපත් කරනු ලැබුවේ කාන්තා මෙහෙයවන්නියක විසිනි. Wanawake Na Maisha (කිස්වහිලි බසින් කාන්තාවන් හා ජීවිතය) විෂයමාලාව අනුගමනය කරන ලදී | මාස 24 | **ඇගයීම් වර්ගය:** අහඹු ලෙස පාලිත පරීක්ෂණය (RCT) සහ සිරස් ගුණාත්මක පර්යේෂණ (longitudinal qualitative research)[7]<br><br>**ප්‍රධාන සොයාගැනීම්:**<br>• කාන්තාවන් ශාරීරික සහ/ හෝ ලිංගික සමීප සහකරු ප්‍රචණ්ඩත්වයට ගොදුරු වීම 25%කින් අඩුවීම<br>• සමීප සහකරු ප්‍රචණ්ඩත්වය හා වැඩිවුණු කාන්තා ආත්ම විශ්වාසය සම්බන්ධයෙන් වර්ධනය වූ අදහස් |

| වැඩසටහන | විස්තරය | ස්ථානය | ඉලක්ක ජනගහනය | මූලික ක්‍රියාකාරකම් | කාල පරිච්ඡේදය | ඇගයීම හා බලපෑම |
|---|---|---|---|---|---|---|
| Zindagii Shoista<br>**(ගරුත්වයෙන් ජීවත් වීම)** | සමාජභාවී සවිබල-ගැන්වීම, ආදායම් උත්පාදනය කිරීමේ ක්‍රියාකාරකමක් ආරම්භ කිරීමේ පුහුණුව සහ පවුල් තුළ එයට සහාය වීම සඳහා ක්ෂුද්‍ර ප්‍රදාන සහිත පවුල් මූලික මැදිහත්වීමකි. | ග්‍රාමීය තජිකිස්තානය | තරුණ විවාහක කාන්තාවන් සහ ඔවුන්ගේ පවුල් (නීතිමය ඥාතීන් ද ඇතුළුව) | මැදිහත්වීම ක්‍රියාත්මක කරනු ලැබුවේ බහු පාරම්පරික පවුල් සාමාජිකයන් සිව්දෙනෙකු දක්වා පිරිසකගෙනි. එහි පහත දැක්වෙන අය ඇතුළත් වූහ:<br>• සති 10ක් පුරා සමාජභාවී සාධාරණත්වය, ගරුත්වය, සන්නිවේදනය සහ ප්‍රචණ්ඩත්වය අවම කිරීම ඇතුළත් සමාජ සවිබලගැන්වීමේ සැසි 10ක්ග<br>• සති 10ක් පුරා සමාජභාවය, වැඩ සහ ජීවනෝපාය ශක්තිමත් කිරීම, ව්‍යාපාර සංවර්ධනය සහ ආදායම් උත්පාදන ක්‍රියාකාරකම් සහිත තරුණ විවාහක කාන්තාවන් සහ පවුලේ වෙනත් සාමාජිකයන් ඉලක්ක කරගත් ආර්ථික සවිබලගැන්වීමේ සැසි<br>• සෑම පවුලකටම ආදායම් උත්පාදන ක්‍රියාකාරකමක් ආරම්භ කිරීම සඳහා ඩොලර් 370ක මුදලක් ලබාදෙන ලදී.<br>• අධීක්ෂණය සහ ආදායම් උත්පාදන ක්‍රියාකාරකම් සඳහා උපකාර කිරීම[8] | මාස 18යි | **ඇගයීම් වර්ගය:** මිශ්‍ර ක්‍රමය<br>**ප්‍රධාන සොයාගැනීම්:**<br>• සම්බන්ධතා ගතිකයන්ගේ, මානසික සෞඛ්‍යයේ සහ සමාජ ආර්ථික තත්වයන්ගේ සාධනීය වෙනස්කම් සොයාගන්නා ලදී.<br>• පිරිමින් විසින් සිදුකරන හා කාන්තාවන් විසින් විඳිනු ලබන සමීප සහකරු ප්‍රචණ්ඩත්වයේ සෑම ස්වරූපයකම සංඛ්‍යාත්මක වශයෙන් කැපීපෙනෙන අඩුවීමක් සිදුවිය. |

| වැඩසටහන | විස්තරය | ස්ථානය | ඉලක්ක ජනගහනය | මූලික ක්‍රියාකාරකම් | කාල පරිච්ඡේදය | ඇගයීම හා බලපෑම |
|---|---|---|---|---|---|---|
| The Adolescent Girls Initiative, **කෙන්යාව** | නවයොවුන් ගැහැණු ළමයින් සඳහා බහුආංශික සවිබලගැන්වීමේ මැදිහත්වීම් (සමාජ, සෞඛ්‍ය, අධ්‍යාපනික සහ ආර්ථික) | කෙන්යාවේ කොන්කරන ලද ප්‍රදේශ දෙකක්<br>නයිරෝබිහි කිබරා සහ ඊසානදිග කෙන්යාවේ වජීර් ප්‍රාන්තය | වයස 11-15 අතර නව යොවුන් වියේ පසුවන ගැහැණු දරුවන් | මෙම වැඩසටහනෙහි එකිනෙකට වෙනස් අංග හතරකි. ප්‍රජා පාදක ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේ වැඩසටහනක්, අධ්‍යාපන කොන්දේසිය මත මුදල් ලබාදීමේ වැඩපිළිවෙලක්, සෞඛ්‍යය මූලික කරගත් ගැහැණු ළමයින් සවිබලගැන්වීමේ සමාජ සහ මූල්‍ය අධ්‍යාපය හා ඉතුරුම් | වයස අවුරුදු 20 වැඩි | **ඇගයීම් වර්ගය:** අහඹු ලෙස පාලිත පරීක්ෂණය (RCT) සත්කාර අංග හතරක් සමග[10]<br><br>**අවුරුදු දෙකක මැදිහත්වීමෙන් පසු ප්‍රධාන සොයාගැනීම්:**<br>• ප්‍රචණ්ඩත්වය අඩුකිරීම සම්බන්ධයෙන් කැපීපෙනෙන සාධනීය ප්‍රතිඵල, ප්‍රාථමික අධ්‍යාපනය සම්පූර්ණ කිරීම, ලිංගික හා ප්‍රජනන සෞඛ්‍ය දැනුම, සමාජ ආරක්ෂණ ජාල, මූල්‍ය සාක්ෂරතාව සහ ඉතුරුම් චර්යා සහ නාගරික ප්‍රදේශවල පවුල් ආර්ථික තත්වය<br><br>**සම්පූර්ණ කිරීමෙන් දෙවසරකට පසු ප්‍රධාන සොයාගැනීම්:**<br>• ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන් තිරසර බලපෑමක් නැත.<br>• වජීර්හි මූලික මට්ටමේදී පාසලෙන් ඉවත්වූ ගැහැණු ළමයින් සම්බන්ධයෙන් විවාහය හා ගර්භණීභාවය ප්‍රමාද වීම සම්බන්ධ කැපීපෙනෙන සාධනීය බලපෑම් සහ පාසලට ඇතුළත්වීම වැඩිවීම<br>• කිබරාහි වැඩිමහල් ගැහැණු ළමයින් සම්බන්ධයෙන් ලිංගික ජීවිතයට ඇතුළු වීම හා ළමයින් හැදීම සම්බන්ධයෙන් කැපීපෙනෙන සාධනීය බලපෑම් |

# සැලසුම් සහ ක්‍රියාත්මක කිරීමේ පිරික්සුම් ලැයිස්තුව

කාන්තාවන්ගේ සමාජ හා ආර්ථික සවිබලගැන්වීමට අදාළ වන **ඵලදායී එළඹුමක පොදු ලක්ෂණ සහ මූලධර්ම**

## වැඩසටහන් සැකසීම හා අනුරූප කරගැනීම

1. **ඉලක්ක ජනගහනය හඳුනාගන්න.** ජීවිත යථාර්ථයන්ට අනුව හැඩගස්වන ලද ඉලක්ක එළඹුම් හා යෝග්‍ය මැදිහත්වීම් ඔස්සේ වඩාත්ම කොන්කරන ලද කාන්තාවන් සහ ගැහැණු ළමයින් සමග වැඩකරන්න. සංදර්භයන්ට නිශ්චිත අවදානම් හඳුනාගැනීමට හා පාසලෙන් බැහැර වූ ගැහැණු ළමයින් සහ ආබාධ සහිත කාන්තාවන් හා ගැහැණු ළමයින් වැනි විශේෂයෙන් කොන්කරන ලද උප ජනගහනයන් වෙත ළඟාවීම සඳහා සහභාගීත්ව මෙවලම් හා උපදෙස් විමසීමේ ක්‍රියාවලි උපයෝගී කරගත හැකිය. මැදිහත්වීම් සැලසුම් කිරීමට පෙර, විශේෂිත කාන්තා උප කණ්ඩායම් මුහුණදෙන බාධක හඳුනාගැනීම් සඳහා තත්ව විශ්ලේෂණයක් හා අවශ්‍යතා තක්සේරුවක් සිදුකළ යුතුය.[11] මැදිහත්වීම් සැලසුම් කළ යුතු වන්නේ සහ හැඩගස්වාගත යුත්තේ ඒ අනුවයි.

2. **සමාජභාවී භූමිකා සහ ආදායම් උත්පාදනය පිළිබඳ සංවර්ධනාත්මක සමීක්ෂණ පවත්වන්න.** විවාහක සහ අවිවාහක කාන්තාවන් විසින් ආදායම් ඉපැයීම භාරගත හැක්කේ කුමන තත්වයන් යටතේද, කළ යුත්තේ කුමන රැකියාද, ඒ ඇයිද යන්න තේරුම්ගැනීම සඳහා මෙය ඉතා වැදගත්ය. වැඩකරන කාන්තාවකට පිරිමින්, පවුල සහ ප්‍රජාව ප්‍රතිචාර දක්වන්නේ කෙසේද යන්න සම්බන්ධයෙන් එහි විශාල බලපෑමක් තිබේ. මැදිහත්වීම් සමාජභාවී භූමිකාවන්ට අභියෝගාත්මක වන විට ඇතිවිය හැකි ප්‍රතිචාර අවම කිරීම සඳහා සූදානම් වන්න.

3. **ආර්ථික සවිබලගැන්වීමේ සංරචක ප්‍රාදේශීය ජීවනෝපාය අවස්ථා මත පදනම් වන බව සහතික කරන්න.** උදාහරණයක් ලෙස, ආර්ථික සවිබලගැන්වීමේ මැදිහත්වීම් සැලසුම් කළ යුත්තේ කාන්තාවන් සඳහා තිබෙන ජීවනෝපාය විකල්ප පිළිබඳ වෙළඳපොළ විශ්ලේෂණයක් මතය. හැකි විටදී, තිබෙන සහාය ලබාගත යුතුය.[12] (උදා: ක්ෂුද්‍ර ණය, ග්‍රාමීය ඉතුරුම් සහ ණය සංගම් (VSLAs), ස්වයං උපකාර කණ්ඩායම් (SHGs)

4. **ඇතිවිය හැකි ප්‍රතිචාර හඳුනාගෙන අවම කරන්න.** මෙම මූලෝපාය මගින් පීතෘමූලික පසුබිම් තුළදී සම්ප්‍රදායික සමාජභාවී භූමිකාවන්ට ඍජුව අභියෝග විය හැකිය. එම නිසා, ඇතිවිය හැකි ප්‍රතිරෝධය අවම කිරීමේ උත්සාහයන් එයට ඇතුළත් විය යුතුය. ප්‍රචණ්ඩත්වය වැඩිකිරීමේ අවදානම ද එයට අයත් වේ. සම්බන්ධතාවලදී හෝ පවුලේදී මූල්‍ය ගැටුම් හැසිරවිය යුත්තේ කෙසේද යන පුහුණුව ද එයට ඇතුළත් විය යුතුය.[13] පිරිමි සහකරුවන් සමග සම්බන්ධ වන මූලෝපාය ද එහි තිබිය යුතුය.[14] උදාහරණයක් ලෙස, කාන්තාවන්ගේ ඉහළ ගිය මූල්‍ය ආදායම් පවුලේ ආදායමට දායකත්වයක් ලෙස සැලකීම ප්‍රවර්ධනය කිරීම සහතික කිරීම සඳහා පවුලේ ආර්ථික සංවර්ධනය වෙනුවෙන් එක්ව වැඩකිරීමේ අදහස උපකාරී විය හැකිය. නීතියෙන් ඥාති වූවන්ගේ බලපෑම් මත කාන්තාවන්ගේ ජීවිත සීමාකර තිබෙන විටදී, පවුල් පාදක එළඹුම් යෝග්‍ය විය හැකිය. උදාහරණයක් ලෙස, තජිකිස්තානයේ Zindagii Shoista විසින් තරුණ විවාහක කාන්තාවන් සහ ඔවුන්ගේ ඥාතීන් (නීතිමය නෑදෑයන්) ඉලක්ක කරන ලදී. විය හැකි ප්‍රතිරෝධය අවම කිරීමට එය ඉවහල් විය. එසේ වන්නේ පවුල තුළ කාන්තාවන්ගේ තත්වය සහ ඔවුන් මුහුණදෙන විවිධ ස්වරූපවල ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන් කටයුතු කරන අතරය.[15]

5. **පුහුණුව හා ධාරිතා ගොඩනැගීම මෙහෙයවන්නන්ට ප්‍රමාණවත් කාලය සහ සම්පත් තහවුරු කිරීම.** සමාජභාවී පරිවර්තනීය මැදිහත්වීම් සඳහා හොඳින් පුහුණු වූ මෙහෙයවන්නන් අවශ්‍යය. එසේම, ප්‍රමාණවත් කාලය සහ පෞද්ගලික නැවත සලකාබැලීම් හා ප්‍රශ්න කිරීම් සහ මෙහෙයවන්නන්ට විවිධ තත්වයන් හා සහභාගිකයන්ගේ ප්‍රශ්න හැසිරවීම ඉගෙනීම සඳහා ප්‍රමාණවත් කාලයක් අවශ්‍යය.[16] උදාහරණයක් ලෙස, මෙහෙයවන්නන්ට විෂය මාලාව සහ භාවිතා කිරීමේ කුසලතා හුරුවීම සඳහා පුළුල් පුහුණුව MAISHA තුළ අඩංගු විය.[17]

6. **ක්‍රියාත්මක කිරීමේ හවුල්කරුවන් සතුව ප්‍රමාණවත් විශේෂඥභාවය තිබෙන බව සහතික කරන්න.** ක්ෂුද්‍ර මූල්‍ය වැනි මැදිහත්වීම් සඳහා ආයතනික (යෝග්‍ය අධීක්ෂණ හා ඇගයීම් පද්ධති වැනි) සහ පුද්ගල කාර්ය මණ්ඩල නිපුණතා (ශක්තිමත් මෙහෙයවීමේ කුසලතා සහ සමාජභාවී සාධාරණ ආකල්ප වැනි) විශේෂිත කුසලතා සහ අත්දැකීම් අවශ්‍යය. සේවා සම්පාදනය කළ යුතු වන්නේ ශක්තිමත් ක්‍රියාත්මක කිරීමේ හවුල්කරුවන් සමගය. ඔවුන්ට අදාළ අත්දැකීම් තිබිය යුතුය. එවැනි මැදිහත්වීම් මෙහෙයවීම සම්බන්ධයෙන් පුළුල් පුහුණුව ලබා සිටිය යුතුය. වටිනාකම්, මූලධර්ම හා එළඹුම් ගැන අවබෝධය තිබිය යුතුය.[18]

## ක්‍රියාත්මක කිරීම හා පුළුල් කිරීම

7. **කාන්තාවන්ගේ ආර්ථික තත්වයෙහි සැලකියයුතු වෙනසක් ඇතිකිරීම සඳහා ආර්ථික වශයෙන් සවිබලගැන්වීමේ කාර්යයන් සඳහා අවශ්‍ය තරම් අරමුදල් තහවුරු කරගන්න.** පරිණත වීම සඳහා ප්‍රමාණවත් කාලයක් ලබාදෙන්න. ක්ෂුද්‍ර මූල්‍ය සහ කුඩා පරිමාණ ආදායම් උත්පාදන ක්‍රියාකාරකම්වල ආර්ථික වාසි කාන්තාවන්ට හා ඔවුන්ගේ පවුල්වලට ලැබීමට කාලයක් (මාස 12කට වැඩි) ගතවේ. අනපේක්ෂිත කම්පනයන් නිසා ඒවාට තර්ජන එල්ලවීමට ද පුළුවන. කාන්තාවන්ගේ ආර්ථික වාසි කාන්තාවන්ට තම සම්බන්ධතා පරිවර්තනය කරගැනීම සඳහා අවශ්‍ය ආර්ථික වත්කම් ලබාදීම සඳහා ප්‍රමාණවත් තරම් කැපීපෙනෙන මට්ටමක තිබිය යුතුය. සමාජභාවී ආකල්ප හා භාවිතාවන්ගේ වෙනස්කම්වලට ඉඩදීම සඳහා ද කාලයක් ගතවේ. ක්‍රියාත්මක කිරීම සඳහා නිර්දේශිත කාලය අවුරුදු තුනකට වැඩිය. අවුරුද්දක සූදානම් වීමේ කාලයක් ද අවශ්‍යය.

8. **සෑම සංරචකයක් වෙනුවෙන්ම වෙනම අරමුදලක් පවත්වාගන්න.** සමාජභාවී සවිබලගැන්වීම තහවුරු කිරීම සඳහා පුළුල් කිරීමේදී ස්වයංව තිරසර වීමේ හැකියාව තිබෙන ක්ෂුද්‍ර මූල්‍ය වියදම්වලට බලපෑමක් ඇතිවන්නේ නැත. සමාජභාවී සවිබලගැන්වීමේ සංරචකය සඳහා බාහිර අරමුදල් අවශ්‍ය වීමේ ඉඩක් තිබේ.[19]


9. **වැඩිකරන ලද ඉතුරුම් සහ ආදායම් ගෘහස්ථ මට්ටමේදී භාවිතා කරන බව තහවුරු කිරීම සඳහා පරිස්සමෙන් අධීක්ෂණය කරන්න.** උදාහරණයක් ලෙස, කාන්තාවන්ට සම්පත් සම්බන්ධයෙන් තනි හෝ හවුල් පාලනය තිබෙන බව තහවුරු කිරීම සඳහාත්, මැදිහත්වීම්වල ප්‍රතිඵලයක් ලෙස සම්බන්ධතාවල හා පවුල්වල ප්‍රචණ්ඩත්වය වැඩි නොවන බව තහවුරු කිරීම සඳහාත් අධීක්ෂණය අවශ්‍යය.[20] සවිබල-ගැන්වීමේ මූලෝපායන් ක්‍රියාත්මක කිරීම, විශේෂයෙන්ම, ආර්ථික වශයෙන් සවිබලගැන්වීමට අදාළ ඒවා ද අධීක්ෂණය කරන්න. වැටුප් නොගෙවන කාන්තා ශ්‍රමය භාවිතා කිරීම පිළිබඳ අදහස වැරගැන්වීම හෝ සුරැකෙන පරිදි කටයුතු කිරීම නොකරන්න. ඔවුන්ගේ සවිබලගැන්වීම අහිමි කරන අමතර කාලභාරයන් නොපණවන්න.[21]

10. **ගැහැණු ළමයින්ගේ සංකීර්ණ හා බහුවිධ අවශ්‍යතා සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා සවිබලගැන්වීමේ මැදිහත්වීම් අධ්‍යාපනය හා සෞඛ්‍යය සමග ඒකාබද්ධ කරන්න.** ඒ නවයොවුන් ගැහැණු ළමයින්ගේ ජීවිතවල ඉතා වැදගත් සමයන්හිදී මැදිහත්වීම්වල බලපෑම සහ පිරිවැය කාර්යක්ෂමතාව උපරිම කිරීම සඳහාය. උදාහරණයක් ලෙස, ලිංගික හා ප්‍රජනන සෞඛ්‍ය තොරතුරු වෙත ප්‍රවේශය තහවුරු කිරීම නවයොවුන් ගැහැණු ළමයින්ට ඉතා වැදගත්ය. එමගින් ඔවුන්ට තම ශරීරය හා ජීවිත ගැන තෝරාගැනීම් කළ හැකිය.[22] ලිංගික හා ප්‍රජනන සෞඛ්‍ය තොරතුරු සහ සේවා බොහෝවිට අහිමි වන ආබාධ සහිත නවයොවුන් ගැහැණු ළමයින් ඇතුළත් කරගත යුතුය. කිසිවකුට හානි නොකිරීමේ මූලධර්මය මත පදනම්ව, නවයොවුන් ගැහැණු ළමයින්ගේ ජීවනෝපාය ඉපයීමේ ඕනෑම ක්‍රියාකාරකමක් ප්‍රවේශමෙන් අධීක්ෂණය කරන්න. එමගින් ඔවුන් නොසිතූ අන්දමේ සූරාකෑමකට හෝ අපයෝජනයට ලක්නොවිය යුතුය. එසේම, එමගින් ඔවුන්ට අධ්‍යාපනය අහිමි නොවිය යුතුය.

11. **කාන්තාවන් සහ ගැහැණු ළමයින් සම්බන්ධයෙන් පවත්නා යථාර්ථයන් හා සීමාවන් සමග ගැලපෙන පරිදි ක්‍රියාකාරකම් සැලසුම් කරන්න.** උදාහරණයක් ලෙස, ගෘහස්ථ හා ළමයින් රැකබලාගැනීමේ වගකීම්, පාසල් හා විශ්වවිද්‍යාල අධ්‍යයන. කාන්තාවන්ට හා ගැහැණු ළමයින්ට අඳුරු වැටුණු පසු ගමන් යාමේ සීමා, ආරක්ෂාව හා ගමන් බිමන් යාම සම්බන්ධ ගැටලු ආදිය සැලකිය හැකිය.

12. **කාන්තාවන් සහ ගැහැණු ළමයින් නමට පමණක් සහභාගී කරගැනීමෙන් වළකින්න.** ඒ වෙනුවට, ව්‍යාපෘතිය හරහා කෙතරම් හොඳින් කාන්තාවන් සවිබලගැන්විය හැකිද යන කරුණ සම්බන්ධයෙන් අඛණ්ඩව සිහි කැඳවීම වෙනුවෙන් අවස්ථා නිර්මාණය කරන්න. හවුල් නිෂ්පාදනය ද සිතෙහි තබාගන්න.

13. **කාන්තාවන්ට සහ ගැහැණු ළමයින්ට හමුවිය හැකි, සමාජානුයෝගය විය හැකි, වැදගත් කරුණු සාකච්ඡා කළ හැකි සහ කුසලතා සංවර්ධනය කරගත හැකි ආරක්ෂිත ස්ථාන සපයන්න.** උදාහරණයක් ලෙස, විශේෂිත වශයෙන් සැලසුම් කරන ලද ආරක්ෂිත ස්ථාන, කාන්තා මධ්‍යස්ථාන, සැලෝන් හෝ ප්‍රජා මධ්‍යස්ථානයක හමුවීම සඳහා වෙන්කරන ලද නිශ්චිත කාලයක්, සායන ආදිය සැලකිය හැකිය. කණ්ඩායම් පාදක මැදිහත්වීම් මගින් කාන්තාවන්ට සම්බන්ධතා ගොඩනැගීම, සන්නිවේදනය, ගැටලු විසඳීම හා ව්‍යාපාරික කුසලතා සම්බන්ධයෙන් එකිනෙකාට අවවාද දීමෙන් උපකාර කරගැනීම සඳහා වේදිකාවක් සැපයේ. එය ආර්ථික, චිත්තවේගී සහ ශාරීරික ලිංගික ප්‍රචණ්ඩත්වයේ අවදානම අඩුකිරීමට දායක වන බව සොයාගෙන තිබේ.[23] ආරක්ෂිත ස්ථාන විශේෂිත අවදානම් සහිත අය ද ඇතුළු සියලු කාන්තාවන්ට සහ ගැහැණු ළමයින්ට පිවිසිය හැකි ස්ථාන විය යුතුය. ඒවා කාන්තාවන්ට හා ගැහැණු ළමයින්ටත්, වෙනත් පවුල් සාමාජිකයන්ටත් පිළිගත හැකි ඒවා විය යුතුය.



## ඇතුළත් වීමේ ස්ථාන

පහත දැක්වෙන වගුවෙහි අවධාරණය කරනු ලන්නේ මෙම මූලෝපාය සඳහා වන ප්‍රධාන පිවිසුම් ලක්ෂ්‍යයන්ය. වැඩසටහන් උදාහරණ ද එයට ඇතුළත් වේ.

| පිවිසුම් ලක්ෂ්‍ය | තර්කනය |
|---|---|
| **දැනට පවතින ප්‍රජා ව්‍යුහයන් සහ ක්ෂුද්‍ර මූල්‍ය හෝ ඉතුරුම් හා ණය සේවා, ස්වයං උපකාරී කණ්ඩායම්ල ඉතුරුම් ගිනුම්ල ගැමි ඉතුරුම් හා ණය සමිති** | කාන්තාවන්ගේ ස්වයං උපකාරී කණ්ඩායම් හෝ ගැමි ඉතුරුම් හා ණය සමිති වැනි කාන්තාවන් සහභාගී වන දැනට පවත්නා ප්‍රජා ව්‍යුහයන් විසින් කාන්තාවන් සවිබලගැන්වීමේ මැදිහත්වීම් සඳහා පිවිසුම් ස්ථාන සැපයිය හැකිය. එම වැඩසටහන් අනුකරණය කිරීමට සහ පුළුල් කිරීමට එමගින් අවස්ථාව ලැබේ.<br><br>උදාහරණයක් ලෙස, බිහාරයේ Do Kadam Barabari Ki Ore (සමානාත්මතාව දෙසට පියවර දෙකක්) වැඩසටහන විවිධ කණ්ඩායම් ඉලක්ක කළ මැදිහත්වීම් හතරකින් සමන්විත විය. එක් මැදිහත්වීමක් විසින් විවාහක කාන්තාවන් ඉලක්ක කරන ලදී. ඔවුහු ඒ වන විටත් ගම් මට්ටමේ ස්වයං උපකාරී කණ්ඩායමක සාමාජිකයෝ වූහ. වැඩසටහන විසින් මෙම ස්වයං උපකාරී කණ්ඩායම් ශක්තිමත් කරන ලදී. කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය පිළිබඳ දැනුම හා දැනුවත්භාවය වර්ධනය කරන ලදී. එමගින් වැළැක්වීමේ කටයුතුවලට සහාය දෙන ලද අතර බේරුණු පුද්ගලයන්ට සහාය පිරිනමන ලදී. මෙම මැදිහත්වීම් උදාහරණය දැනට පවත්නා ඉතුරුම් කණ්ඩායම් සඳහා පිවිසුම් ලක්ෂ්‍යයක් ලෙස භාවිතා කරන ලදී. ඉතුරුම් කණ්ඩායම් පිහිටුවීම මගින් අනිවාර්යයෙන්ම ප්‍රචණ්ඩත්වය අඩුවීමක් සිදු නොවන බව සඳහන් කළ යුතුය. මේ වෙනුවෙන් වැඩිදුර සමීක්ෂණ අවශ්‍යය. සාක්ෂි පරස්පර වීම එයට හේතුවයි.<br><br>විශේෂයෙන්ම මෙම ප්‍රජා ව්‍යුහයන් පවත්වාගැනීම ශක්තිමත් කිරීම, නායකත්වය ගොඩනැගීම හා තිරසර කිරීම (සාක්ෂරතාව සහ සංඛ්‍යාත්මක සංරචක එකතු කිරීම ඇතුළුව) සහ පිරිමි සහකරුවන් වෙත ළඟාවීම සඳහා ක්‍රීඩා සහ තරුණ සමාජ වැනි විවිධ වේදිකා සලකාබැලීමේ අවශ්‍යතාව සඳහා සම්පත් කැපකිරීමේ අවශ්‍යතාව උගත් පාඩම් අතරට ඇතුළත්ය. |
| **ගැහැණු ළමයින් කණ්ඩායම් සහ පාසල්වල සහ/ හෝ ප්‍රජාවන්හි ආරක්ෂිත අවකාශ** | කාන්තාවන් සහ ගැහැණු ළමයින්ට ශාරීරික හා චිත්තවේගී ආරක්ෂාව සැලසෙන කාන්තාවන්ට පමණක් වන අවකාශයන් කාන්තාවන් සහ ගැහැණු ළමයින් සවිබලගැන්වීම සඳහා හොඳ පිවිසුම් ලක්ෂ්‍ය විය හැකිය. එමගින් ප්‍රචණ්ඩත්වය සම්බන්ධ ප්‍රතිචාර සේවා ගැන තොරතුරු සහ ඒවා වෙත ප්‍රවේශය ද සැපයේ. ආරක්ෂිත ස්ථාන සාමාන්‍යයෙන් පාදක වන්නේ පාසල් හෝ ප්‍රජාවන් මතය. ප්‍රජා පාදක වැඩසටහන් විවාහක ගැහැණු ළමයින්, පාසලින් පිටවූ ගැහැණු ළමයින් සහ/ හෝ ආබාධ සහිත ගැහැණු ළමයින් වැනි කොන්කරන ලද නවයොවුන් පුද්ගලයන් වෙත සමීප වීමට උපකාරී වේ. ඔවුහු ප්‍රචණ්ඩත්වයට ලක්වීමේ වැඩි අවදානමකට ලක්වෙති. ඔවුන් වෙත සමීප වීමේ අභිලාෂය සහිත ප්‍රයත්නයන් නොමැති වීමෙන් ඔවුන් නොතකාහැරීමට ලක්විය හැකිය.<br><br>උදාහරණයක් ලෙස, කෙන්යාවේ නවයොවුන් ගැහැණු ළමයින්ගේ මූලපිරුම (AGI) ගැහැණු ළමයින් සවිබලගැන්වීමේ සමාජ සම්බන්ධ කරගන්නා ලදී. එම සමාජවල අවධානය යොමුවන්නේ සෞඛ්‍ය දැනුම වර්ධනය, ස්වයං සඵලත්වය සහ සමාජ ආරක්ෂණ ජාල කෙරෙහිය. ගැහැණු ළමයි සතිපතා කණ්ඩායම් රැස්වීම්වලට හෝ ආරක්ෂිත අවකාශවලට සහභාගී වූහ. ඒවා මෙහෙයවනු ලැබුවේ ප්‍රජාවේ තරුණ කාන්තා මාර්ගෝපදේශකවරයකු විසිනි.<br><br>ගැහැණු ළමයින් විසින් සෞඛ්‍ය සහ ජීවන කුසලතා මාතෘකා පරාසයක් සාකච්ඡා කරන ලදී. විවෘත සාකච්ඡාවලට අවස්ථාව ලබාගන්නා ලදී. මැදිහත්වීමේ කොටසක් ලෙස ඇතැම් ගැහැණු ළමයින් මූල්‍ය අධ්‍යාපන විෂයමාලාවක් තම ආරක්ෂිත අවකාශයේදී හදාරන ලදී.<br><br>සති අන්ත පාසල් සැසි, නේවාසික පාසල්වල ඉගෙනීම, පවුල් වගකීම් සහ ආගමික සේවා වැනි ගැටුම් සහගත වගකීම් හේතුවෙන් ගැහැණු ළමයින්ට ආරක්ෂිත අවකාශවලට ස්ථාවරව සහභාගී වීමට තිබෙන ගැටලු උගත් පාඩම් අතරට අයත් වේ. කාලීනව කාන්තාවන්ගේ සහ ගැහැණු ළමයින්ගේ ජීවිත යථාර්ථයන් සම්බන්ධව අවබෝධය ගොඩනගාගැනීම සහ පවුලේ සහාය සහ අවබෝධය ලබාගැනීමේ වැදගත්කම සොයාගැනීම් මගින් අවධාරණය කරනු ලැබේ.[24] |

| පිවිසුම් ලක්ෂ්‍ය | තර්කනය |
|---|---|
| **නීති සහ ව්‍යවස්ථා** | 2020 ලෝක බැංකුවේ කාන්තා, ව්‍යාපාරික සහ නීති වාර්තාව අනුව, ලෝක ආර්ථිකයන්ගෙන් 40%ක් විසින් කාන්තාවන්ගේ දේපළ අයිතිවාසිකම් සීමාකරනු ලැබේ.[25] නීතිය විසින් කාන්තාවන්ගේ දේපළ හිමිකම් පිළිගන්නා අවස්ථාවලදී පවා එහි ප්‍රායෝගිකත්වය අභියෝගාත්මක වේ. ප්‍රචණ්ඩත්වය අඩු කිරීමට කටයුතු කරන උද්දේශකයන් සහ සමාජ ව්‍යාපාර විසින් කාන්තාවන්ට සහ ගැහැණු ළමයින්ට වෙනස් අන්දමින් සලකන උරුමය, විවාහය, පවුල සහ දේපළ සම්බන්ධ නීති ප්‍රතිසංස්කරණය කිරීම සඳහා බලපෑම් කළ යුතුය. |
| **කාන්තා ලිංගික ශ්‍රමිකයන් සමග මැදිහත්වීම්** | කාන්තා ලිංගික ශ්‍රමිකයන් සවිබලගැන්වීම ඉලක්ක කරන මැදිහත්වීම් ගනුදෙනුකරුවන්, පොලිසිය සහ සමීප සහකරුවන් වෙතින් සිදුවන ප්‍රචණ්ඩත්වය අඩුකිරීම සඳහා ප්‍රවේශයට හොඳ ලක්ෂ්‍යයකි.<br><br>මෙම වැඩසටහන්වලදී බොහෝවිට ලිංගික ශ්‍රමිකයන් එක්රැස් කර ජීවත් වීමේ හා වැඩකිරීමේ තත්වයන් වැඩිදියුණු කිරීම පිළිබඳ පැහැදිලි කරනු ලැබේ. මානව හිමිකම් පිළිබඳ පුහුණුව, අපකීර්තිමත් ආකල්ප අවම කිරීම සඳහා ප්‍රචාරණ කටයුතු සහ ප්‍රචණ්ඩත්වයට මුහුණදෙන ලිංගික ශ්‍රමිකයන් සඳහා ප්‍රතිචාරාත්මක සේවා වැනි වෙනත් මූලෝපායන් ද ක්‍රියාත්මක වේ. ඒවා සාමාන්‍යයෙන් ක්‍රියාත්මක කරනු ලබන්නේ සෞඛ්‍ය රාජ්‍ය නොවන සංවිධාන, කාන්තා අයිතිවාසිකම් සංවිධාන හෝ ලිංගික ශ්‍රමිකයන් විසින් පිහිටුවන ලද සංවිධාන ආදිය මගිනි.<br><br>උදාහරණයක් ලෙස, ඉන්දියාවේ 'අවහන්' වැඩසටහන මගින් තම අයිතිවාසිකම් වෙනුවෙන් උද්දේශනය කිරීම සඳහා කාන්තා ලිංගික ශ්‍රමිකයන් බලමුළුගන්වනු ලැබේ. කර්ණාටක සෞඛ්‍ය ප්‍රවර්ධන භාරය විසින් ක්‍රියාත්මක කරනු ලබන මෙම මැදිහත්වීමට ගනුදෙනුකරුවන් සහ පොලිසිය වෙතින් සිදුවන ප්‍රචණ්ඩත්ව වැළැක්වීමේ සංරචකයක් ද අයත් වේ. ඒ වෙනුවෙන් සෑම දිස්ත්‍රික්කයකම 24 පැයේ ක්‍රියාත්මක වන අර්බුද කළමනාකරණ කණ්ඩායමක් තිබේ. මානව හිමිකම් නීතිඥවරුන් විසින් ලිංගික ශ්‍රමිකයන්ගේ අයිතිවාසිකම් පිළිබඳ ඔවුන් පුහුණු කර ඇත. වැරදිකරුවන් නීතිය හමුවට ගෙන ඒමට කටයුතු කර තිබේ. අවහන් පිළිබඳ කරන ලද ඇගයීමකින් සොයාගත් පරිදි ලිංගික ශ්‍රමිකයන් ගනුදෙනුකරුවන් සහ පොලිස් නිලධාරීන් වෙතින් ප්‍රචණ්ඩත්වයට ලක්වීම කැපීපෙනෙන පරිදි අඩුවී තිබිණි.[26] |

# ප්‍රධාන සම්පත්

### සවිබලගැන්වීම අර්ථ නිරූපණය කිරීම හා මැනීම

Understanding and Measuring Women's Economic Empowerment. Definition, Framework and Indicators, Washington, DC. International Center for Research on Women (ICRW) Golla, Anne Marie, Anju Malhotra, Priya Nanda, and Rekha Mehra. 2011
මෙම ප්‍රයෝජනවත් ලේඛනය විසින් කාන්තාවන්ගේ ආර්ථික සවිබලගැන්වීම අර්ථ නිරූපණය කරයි. මිනුම් රාමුවක් සහ දර්ශක සපයයි. කාන්තාවන් ආර්ථික වශයෙන් සවිබලගැන්වීම සඳහා වැඩසටහන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ ඇගයීම එයට අයත් වේ.

A Review of Approaches and Methods to Measure Economic Empowerment of Women and Girls, Gender and Development 22(2): 233–251. Pereznieto, Paola, and Georgia Taylor. 2014
මෙම විවරණයේ අරමුණ වන්නේ ඇගයීම් මෙහෙයවන ප්‍රතිපත්ති සම්පාදකයන්ට කාන්තාවන් ආර්ථික වශයෙන් සවිබලගැන්වීම ඇතුළත් කරගැනීම සඳහා තොරතුරු සැපයීමයි. ඒ අතර, සාර්ථක ආර්ථික සවිබලගැන්වීමේ වැඩසටහන්වල මූලිකාංග හඳුනාගැනීම සඳහා භාවිතා කරන්නන්ට උපකාර කරනු ලැබේ.

### ආර්ථික සහ සමාජ සවිබලගැන්වීමේ මැදිහත්වීම්වල සාක්ෂි

Combined Economic Empowerment and Gender-transformative Interventions. Evidence Review. What Works to Prevent VAWG programme. Gibbs, A and Bishop, K. 2019
මෙම විවරණය විසින් සවිබලගැන්වීමේ මැදිහත්වීම් හතරක සොයාගැනීම් ඉදිරිපත් කරනු ලැබේ.  DFID හි What Works to Prevent Violence against Women and Girls Global Programme (What Works) වැඩසටහන මගින් ඒවා ඇගයීමට ලක්කරනු ලැබේ.

Promoting Women's Economic Empowerment: What Works? The World Bank Group, Policy Research Working Paper 7087. Buvinic, M. and Furst-Nichols, R. 2014
ආර්ථික සවිබලගැන්වීමේ මැදිහත්වීම්වල දැඩි ඇගයීම්වල ලෝක බැංකු විවරණයකි.

Gender, livelihood capabilities and women's economic empowerment: Reviewing Evidence Over the Life Course. London: AGEG. Kabeer, N (2018)
මෙම විවරණය විසින් ආර්ථික හා ජීවනෝපාය ක්ෂේත්‍රවල කාන්තාවන් සවිබලගැන්වීම ප්‍රවර්ධනය කිරීම සඳහා සැලසුම් කරන ලද ප්‍රතිපත්ති සහ වැඩසටහන් සම්බන්ධ සාක්ෂි අධ්‍යයනය කරනු ලැබේ. වැඩිහිටි (60ට වැඩි) කාන්තාවන්, වැඩකරන වයසේ කාන්තාවන් (20-59) සහ අවසානයේදී නවයොවුන් ගැහැණු ළමයින් (10-19) පිළිබඳ සාක්ෂි විශ්ලේෂණයක් ද එයට ඇතුළත් වේ.

### ආර්ථික සවිබලගැන්වීමේ වැඩසටහන

UN Women Economic Empowerment, New York: UN Women, 2020.
මෙම වෙබ් පිටුව විසින් එක්සත් ජාතීන්ගේ කාන්තා ඒකකයේ කාන්තාවන් ආර්ථික වශයෙන් සවිබලගැන්වීමේ තොරතුරු ඉදිරිපත් කරනු ලැබේ.

A Roadmap for Promoting Women's Economic Empowerment. Exxon and the United Nations Foundation. Buvinic, M. et al. 2013
සාක්ෂි මත පදනම් වූ ක්‍රියාමාර්ග සඳහා වන මාර්ග සිතියමක් මෙම සමීක්ෂණය වාර්තාව විසින් ඉදිරිපත් කරනු ලැබේ. විවිධ රාජ්‍ය සංදර්භයන් තුළ කාන්තාවන් ආර්ථික වශයෙන් සවිබලගැන්වීම සහ ප්‍රතිපත්ති සඳහා වන විකල්ප එමගින් ඉදිරිපත් කරනු ලැබේ. එය මූලික වශයෙන් ඉලක්ක කරනුයේ පෞද්ගලික සහ රාජ්‍ය හවුල්කාරිත්වයන්ය. වාර්තාව විසින් සවිබලගැන්වීම මනිනු ලබන්නේ ඵලදායීතාවේ හා ආදායම්වල වර්ධනය ලෙසයි.

### නවයොවුන් ගැහැණු ළමයින්

Investments in Adolescent Girls' Physical and Financial Assets: issues and review of the evidence. Girl Hub. Quisimbing, A.R. and Kovarik, C. 2013
දේපළ සමාජභාවී වශයෙන් බෙදීයාම, සවිබලගැන්වී සහ යහපැවැත්ම පිළිබඳ සංකල්පීය රාමුවක් මෙම පත්‍රිකාව විසින් ඉදිරිපත් කරනු ලැබේ. ගැහැණු ළමයින්ගේ දේපළ වර්ධනය කිරීම අරමුණු කරගනිමින් කරනු ලබන මැදිහත්වීම් පිළිබඳ සාක්ෂි එමගින් විවරණය කරනු ලැබේ. විශේෂයෙන්ම, මූල්‍ය සම්පත් වර්ධනය කිරීමේ ප්‍රයත්නයන් අධ්‍යාපනය සහ පුහුණුව සමග ඒකාබද්ධ කරන ඒකාබද්ධ සහ සාකල්‍ය වැඩසටහන් කෙරෙහි අවධානය යොමුකරනු ලැබේ.

Interventions Promoting Adolescent Girls' Economic Capabilities: What Works? London: GAGE Programme, Stavropolou, M, 2018
මෙම වේගවත් සාක්ෂි සමාලෝචනය විසින් අවධානය යොමුකරනු ලබන්නේ LMIC රටවල ගැහැණු ළමයින්ගේ ආර්ථික හැකියාවන් ප්‍රවර්ධනය කිරීම සහ ඔවුන් සවිබලගැන්වීම ඉලක්ක කරනු ලබන ආර්ථික මූලෝපායන් කෙරෙහිය.

Delivering Impact for Adolescent Girls: Emerging Findings from Population Council Research. New York: Girl Center, 2018
නවයොවුන් ගැහැණු ළමයින් සම්බන්ධයෙන් හොඳම ප්‍රතිඵල ලබාදිය හැක්කේ කුමන මැදිහත්වීම් පැකේජය විසින්ද යන්න ගවේෂණය කිරීම සඳහා වන බලපෑම් ඇගයීම් නවයක සොයාගැනීම් මෙම සමීක්ෂණය විසින් සාරාංශගත කරයි. ප්‍රචණ්ඩ සහ සමාජභාවී සාධාරණ ප්‍රතිඵල ද එයට අයත් වේ.

# පසු සටහන

[1] රටවල් 44ක සහ කාන්තාවන් 481,205ක සමීප සහකරු ප්‍රචණ්ඩත්වයේ අවදානම් සමග සම්බන්ධ මහේක්ෂ මට්ටමේ සාධක අධ්‍යයනයක් මගින් පෙන්වාදෙන ලද පරිදි සමීප සහකරු ප්‍රචණ්ඩත්වය පුද්ගල මට්ටමේදී අවම කිරීම සම්බන්ධ මහේක්ෂ මට්ටමේ සාධකවලට ඉඩම්, දේපළ, උරුමය හා සම්පත් අදාළ වේ. සමාජ මට්ටමේදී රැකියා, අධ්‍යාපනය සහ දේපළ වෙත කාන්තාවන්ගේ ප්‍රවේශය ද කාන්තාවන් සවිබලගැන්වීමේ සහ සමීප සහකරු ප්‍රචණ්ඩත්වයේ මට්ටම අනුමාන කිරීමේ දර්ශක බව අධ්‍යයනය විසින් නිගමනය කරන ලදී. මූලාශ්‍රය:
Heise, L. & Kotsadam, A. (2015) Cross-national and multilevel correlates of partner violence: an analysis of data from population-based surveys, Lancet Global Health, 3(6): E332-E340

[2] තිරසර සංවර්ධන අරමුණුවල කිසිවකු අත්නොහැරීමේ මූලධර්මය පිළිබඳ වැඩිදුර විස්තර සඳහා බලන්න:
United Nations Committee for Development Policy (CDP) (2018) Leaving no one behind; UNDP (2018) What does it mean to leave no one behind? New York: UNDP; United Nations SDG (2019) Leaving No One Behind: A UNSDG Operational Guide for UN Country Teams, New York: UNSDG.

[3] ස්වයං සඵලතාව මගින් අදහස් කරනු ලබන්නේ පුද්ගලයකුට නිශ්චිත කාර්යසාධන ජයග්‍රහණයන් නිර්මාණය කරගැනීම සඳහා අවශ්‍ය චර්යාවන් සඳහා තමන්ගේ හැකියාව කෙරෙහි තිබෙන විශ්වාසයයි. (Bandura, A. (1997). Self-Efficacy: The exercise of control. New York, NY: W. H. Freeman)

[4] ආරක්ෂිත ස්ථාන යනු කාන්තාවන්ට සහ ගැහැණු ළමයින්ට සවිබලගැන්වීමේ ක්‍රියාවලියක් හරහා උපකාර කළ හැකි ස්ථානයි. බලන්න:
International Medical Corps (IMC) and International Rescue Committee (IRC) (2020) Women and Girls Safe Spaces: A Toolkit for Advancing Women's and Girls' Empowerment in Humanitarian Settings. London and New York: IMC and IRC.

[5] Kerr Wilson A, Gibbs A, McAslan Fraser E, Ramsoomar L, Parke A, Khuwaja H and Jewkes R (2020) What Works to Prevent Violence against Women and Girls? A Rigorous Global Evidence Review of Interventions to Prevent Violence against Women and Girls, South Africa; What Works to Prevent VAWG

[6] Intervention for Microfinance for AIDS and Gender Equity (IMAGE) Project (South Africa) – an intervention combining microfinance and gender training for women. See: Pronyk, P. M., Hargreaves, J. R., Kim, J. C., Morison, L. A., Phetla, G., Watts, C., ... & Porter, J. D. (2006) Effect of a structural intervention for the prevention of intimate-partner violence and HIV in rural South Africa: A cluster randomised trial. The Lancet, 368(9551), 1973- 1983

[7] Harvey, S., Mshana, G., Kapinga, I., Lees, S., Kapiga, S. (2019) STRIVE Impact Case Study: MAISHA – set to reduce violence against women in Tanzania; Mwanza Intervention Trials Unit, Mwanza, Tanzania; National Institute for Medical Research, Mwanza, Tanzania; London School of Hygiene & Tropical Medicine, London, UK; 2019; Kapiga, S., Harvey, S., Mshana, G., Holm Hansen, C., Mtolela, G.J., Madaha, F. … & Watts, C. (2019). A social empowerment intervention to prevent intimate partner violence against women in a microfinance scheme in Tanzania: findings from the MAISHA cluster randomised controlled trial. The Lancet Global Health, 7(10), 1423- 34.

[8] Gibbs, A., and Bishop, K., (2018) Combined economic empowerment and gender-transformative interventions. Evidence Review. What Works to Prevent VAWG programme.

[9] Mastonshoeva, S., Shonasimova, S., Gulyamova P., Jewkes R., Shai, N., Chirwa, E.D., & Myrttinen, H. (2019). Mixed methods evaluation of Zindagii Shoista (Living with dignity) intervention to prevent violence against women in Tajikistan.

[10] Austrian, K., Soler-Hampejsek, E., Mumah, J., Kangwana, B., Wado, Y., Abuya, B., Shah, V. and Maluccio, J. (2018). Adolescent Girls Initiative-Kenya: Midline Results Report. Nairobi: Population Council.

[11] සමීප සහකරු ප්‍රචණ්ඩත්වයේ අවදානමට වැඩිපුර ගොදුරු වන වයස අවුරුදු 30ට අඩු කාන්තාවන් ගෙදරදොර කටයුතු සහ ළමයින් බලාගැනීමේ වගකීම් හේතුවෙන් සහභාගීත්වය සීමිත වේ. WEE සහ SE වැඩසටහන් අත්නොහැර තබාගැනීම අවශ්‍යය. සමාජ සහායෙන් සහ සම වයස් කණ්ඩායම් සහායෙන් ප්‍රතිඵල ලබාගැනීම අඩුය. බලන්න:
Knight, L., Ranganathan, M., Abramsky, T., Polzer-Ngwato, T., Muvhango, L., Molebatsi, M., Stockl, H., Lees, S. & Watts, C. (2020) Intervention with Microfinance for AIDS and Gender Equity (IMAGE): Women's Engagement with the Scaled-up IMAGE Programme and Experience of Intimate Partner Violence in Rural South Africa. Prevention science, 21, 268-281.
(Knight, 2019).

[12] මෑතදී ආරම්භ කරන ලද ආර්ථික සවිබලගැන්වීමේ වැඩසටහන් මෙන් නොව, දැනට පවත්නා සහ හොඳින් පිහිටුවන ලද වේදිකා බොහෝ විට වඩා ස්ථාවර සහ එකතු කරන ලද සංරචක ඒකාබද්ධ කරගැනීමට සූදානම් ඒවාය. ආර්ථික සවිබලගැන්වීමේ මැදිහත්වීම් දැනට පවත්නා සමාජ සවිබලගැන්වීමේ (ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේ) වැඩසටහන්වලට එකතු කළ හැකිය. ක්‍රියාත්මක කරන, සෑම හවුල්කරුවකුම වෙනුවෙන් ඒකාබද්ධ මැදිහත්වීම් මෙහෙයවන සහ ධාරිතා ගොඩනගන මාදිලිය තීරණය කිරීම වැදගත්ය. බලන්න:
Pronyk, K., Hargreaves, M., Morison L.A., Watts, C. & Porter, J. (2005) Microfinance and HIV prevention–emerging lessons from rural South Africa. Small Enterprise Development, 16, 26-38.

[13] Knight, L. et al (2020) Ibid.

[14] Manji, K, Heise, L and Cislaghi, B (2020) Couples' Economic Equilibrium, Gender Norms and Intimate Partner Violence in Kirumba, Tanzania in Violence Against Women 1-21

[15] What Works (2018) Working with families to prevent violence against women and girls in Tajikistan. What Works Evidence review.

[16] Goldmann, L., Lundgren, R., Welbourn, A., Gillespie, D., Bajenja, E., Muvhango, L. and Michau, L., 2019. On the CUSP: the politics and prospects of scaling social norms change programming. Sexual and reproductive health matters, 27(2), pp.51-63.

[17] Kapiga, S et al (2019) Ibid.

[18] Milat, A., Bauman, A. & Redman, S. (2015) Narrative review of models and success factors for scaling up public health interventions, Implementation Science, 10(15).

[19] Hargreaves, J., Hatcher, A., Strange, V., Phetla, G., Busza, J., Kim, J., Watts, C., Morison, L., Porter, J., Pronyk, P. and Bonell, C., 2010. Group-microfinance and health promotion among the poor: Six-year process evaluation of the Intervention with Microfinance for AIDS and Gender Equity (IMAGE) in rural South Africa. Health Education Research, 25(1), pp.27-40.

[20] Ranganathan, M., Knight, L., Abramsky, T., Muvhango, L., Polzer Ngwato, T., Mbobelatsi, M., Ferrari, G., Watts, C. and Stöckl, H., (2019) Associations between women's economic and social empowerment and intimate partner violence: Findings from a microfinance plus program in rural North West Province, South Africa. Journal of interpersonal violence, p.0886260519836952

[21] Molyneux, M (2008) Conditional Cash Transfers: A Pathway to Women's Empowerment? Pathways to Women's Empowerment Working Paper 5, Institute of Development Studies, Brighton

[22] For example, the Abriendo Oportunidades ('Opening Opportunities') Initiative which provides vulnerable Mayan girls in Belize, Guatemala, and Mexico with skills and support to improve their lives.

[23] Knight, L. et al. (2020) Ibid.

[24] Austrian, K., Soler-Hampejsek, E., Kangwana, B., Maddox, N., Wado, Y., Abuya, B., Shah, V., & Maluccio, J. (2020) Adolescent Girls Initiative–Kenya: Endline Evaluation Report. Nairobi: Population Council.

[25] World Bank (2020) Women, Business and the Law 2020. Washington DC.

[26] Beattie, T. S., Bhattacharjee, P., Isac, S., Mohan, H. L., Simic-Lawson, M., Ramesh, B. M., ... & Heise, L. (2015) Declines in violence and police arrest among female sex workers in Karnataka state, South India, following a comprehensive HIV prevention programme. Journal of the International AIDS Society, 18(1), 20-32.

**© UN Women 2020**

මෙම ලේඛනය **RESPECT ව්‍යූහයේ ක්‍රියාත්මක කිරීමේ මාර්ගෝපදේශයේ** කොටසකි. එය එක්සත් ජාතීන්ගේ කාන්තා ඒකකයේ අනුග්‍රහය මත Social Development Direct විසින් සංවර්ධනය කරන ලදී. එය මෙතැනින් ලබාගත හැකිය.

**Suggested citation:** UN Women and Social Development Direct (2020) Empowerment of Women, RESPECT: Preventing Violence against Women Strategy Summary

RESPECT

WOMEN

# මූලෝපාය සාරාංශය

## ළමා සහ නවයොවුන් අපයෝජන වැළැක්වීම

(Child and adolescent abuse prevented)

UN WOMEN

World Health Organization

# ළමා සහ නවයොවුන් අපයෝජන වැළැක්වීම

**මූලෝපායේ අභිමතාර්ථය :** සාධනීය පවුල් සම්බන්ධතා නිර්මාණය කිරීම, ශාරීරික දඬුවම් තහනම් කිරීම, රළු ළමයින් හදාවඩාගැනීමේ ක්‍රම අවම කිරීම සහ ධනාත්මක මාපිය-දූදරු සම්බන්ධතා නිර්මාණය කිරීම

## තාර්කිකත්වය


ගෝලීයව, වයස අවුරුදු 2-17 අතර ළමයින්ගෙන් අඩක්ම පසුගිය වසර තුළදී යම් ආකාරයක අපයෝජනයන්ට මුහුණදී තිබේ.[1] කෙසේ වෙතත්, බොහෝ සංදර්භයන්හිදී ළමයින් හා නවයොවුන් පුද්ගලයන් අපයෝජනයට ලක්වීම වාර්තාවන්නේ අඩුවෙන් නිසා එය සිදුවන ප්‍රමාණය වැඩිය.

ළමයින්ට එරෙහි ප්‍රචණ්ඩත්වය (VAC)[2] විවිධ ස්වරූපයන්ගෙන් සිදුවිය හැකිය. ළමා සංවර්ධනයේ විවිධ අවධිවලදී සිදුවන ළමයින් සම්බන්ධව නරක ලෙස සැලකීම, විනෝද හිංසනය (bullying), තරුණ ප්‍රචණ්ඩත්වය, සමීප සහකරු ප්‍රචණ්ඩත්වය (IPV), ලිංගික ප්‍රචණ්ඩත්වය හෝ චිත්තවේගී ප්‍රචණ්ඩත්වය එයට අයත් වේ.[3]

ළමයින්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සහ කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සමීපව සම්බන්ධය. මේ දෙක අතර බහුවිධ සම්බන්ධතා පිළිබඳ ප්‍රබල සාක්ෂි දක්නට ලැබේ. පොදු අවදානම්, පොදු ප්‍රතිඵල සහ එකිනෙක මත ක්‍රියාත්මක වීම් එහි තිබේ. (1 රූපය බලන්න).

- **සහකරුවන් අතර ප්‍රචණ්ඩත්වය සහ ළමා අපයෝජන/ නරක ලෙස සැලකීම් බොහෝ විට එකම නිවස තුළ සිදුවේ.**[4] මව අපයෝජනයට ලක්වන නිවෙස් තුළ ජීවත් වන ළමයින් ප්‍රචණ්ඩ විනයගත කිරීමේ අවදානමට ලක්වීමේ වැඩි අවදානමක් තිබේ.[5] විශේෂයෙන්ම, දැඩි පීතෘමූලික ව්‍යූහයන් සාමාන්‍යකරණය හා සාධාරණීකරණය වී තිබෙන විට ප්‍රචණ්ඩත්වය භාවිතා කිරීම වැඩිවේ. උදාහරණයක් ලෙස, ඇෆ්ගනිස්තානයේ සමීක්ෂණ මගින් හෙළිදරව් වූ පරිදි, පසුගිය මාස 12 තුළදී ශාරීරික සමීප සහකරු ප්‍රචණ්ඩත්වයේ අත්දැකීම් ලද කාන්තාවන් එසේ නොවූ කාන්තාවන්ට වඩා තම ළමයින්ට පහරදීමට ඉඩ තිබෙන බව වාර්තා වී තිබේ.[6]

**1 රූපය: කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සහ ළමයින්ට එරෙහි ප්‍රචණ්ඩත්වය අතර සම්බන්ධතා**




මූලාශ්‍රය: උපුටාගැනීමකි Fulu et al (2017)[1]

- මෙම පීතෘමූලික ව්‍යූහයන් **හානිකර සමාජ සම්මතයන්** මගින් තිරසර කරනු ලැබේ. ප්‍රචණ්ඩත්වය වාර්තා කිරීම සීමාකරන, ප්‍රචණ්ඩ විනයගත කිරීම පිළිගන්නා (බිරිඳට පහරදීම සහ ශාරීරික දඬුවම්), පවුලේ ගරුත්වයට ප්‍රමුඛතාව දෙන හා බේරුණු පුද්ගලයන්ට බණින, සමාජභාවී අසමානතාවලට උපකාර කරන සමාජ සම්මතයන් ඒ අතර වේ.[7]

- ළමයින්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සහ කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය **නවයොවුන් වියේදී** (වයස අවුරුදු 10-19) **බොහෝවිට එකිනෙක මත ක්‍රියාත්මක වේ**. එය මුලින්ම සමීප සහකරු ප්‍රචණ්ඩත්වය වැනි ප්‍රචණ්ඩත්වයන්ගේ අත්දැකීම් ලබන හා වැරදි සිදුකරන, අපයෝජනයට වැඩි අවදානමක් තිබෙන කාලය වේ. සමීප සම්බන්ධතාවක් පවත්වාගෙන යන වයස අවුරුදු 15-19 අතර නවයොවුන් වියේ ගැහැණු ළමයින් සෑම තිදෙනෙකුගෙන්ම එක් අයෙකු කිසියම් දිනෙක චිත්තවේගී, ශාරීරික හෝ ලිංගික ප්‍රචණ්ඩත්වයට ලක්වී තිබේ. එය උප සහරා අප්‍රිකාවේ ඇතැම් රටවලදී 50%ට ආසන්න වේ.[8] කෙසේ වෙතත්, නවයොවුන් විය ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේ අවස්ථාවක් ද සපයයි.[9]

- ළමයින්ට එරෙහි ප්‍රචණ්ඩත්වය **පරම්පරාන්තර අපයෝජන චක්‍රය** සමග ද සම්බන්ධය. ළමාවියේ ප්‍රචණ්ඩත්වය හේතුවෙන් අනාගතයේ සමීප සහකරු ප්‍රචණ්ඩත්වය අත්දැකීමේ හා එම වරද සිදුකිරීමේ අවදානම වැඩිවේ. ළමාවියේ ක්ෂතිය, සමීප සහකරු ප්‍රචණ්ඩත්වය සහ රළු ළමයින් හදාවඩාගැනීම අතර සම්බන්ධයක් තිබේ.[10]

සමීප සහකරු ප්‍රචණ්ඩත්වය සහ ළමයින්ට එරෙහි ප්‍රචණ්ඩත්වය අතර පුළුල්ව පැතිර පවත්නා සම්බන්ධය හේතුවෙන් ඒ දෙක අතර අවදානම් සාධක හා අන්තර් සම්බන්ධතා සම්බන්ධයෙන් කටයුතු කිරීමේ වැඩි අවශ්‍යතාවක් නිර්මාණය වේ. ළමයින්ට එරෙහි ප්‍රචණ්ඩත්වය හා කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේ ක්ෂේත්‍ර අතර පුළුල් සන්නිවේදනයක් සහ සහයෝගයක් අවශ්‍ය වේ.

## මූලෝපාය සාරාංශය

INSPIRE ව්‍යුහය තුළ ළමයින්ට එරෙහි ප්‍රචණ්ඩත්වය අවසන් කිරීම සඳහා මූලෝපායන් හතක් අඩංගු වේ. INSPIRE නම් වචනයෙහි සෑම අකුරක් විසින්ම එම එක් මූලෝපායක් නියෝජනය කරනු ලැබේ. 2 වගුව මගින් නිරූපණය කරනු ලබන්නේ RESPECT සහ INSPIRE ව්‍යුහයන් අතර වෙනස්කම්ය.

**2 වගුව: INSPIRE සහ RESPECT ව්‍යුහයන් සැසඳීම**[11]

### 2 INSPIRE සහ RESPECT ව්‍යුහයන් සැසඳීම

| INSPIRE: ළමයින්ව එරෙහි ප්‍රචණ්ඩත්වය අවසන් කිරීම | RESPECT: කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වැළැක්වීම |
|---|---|
| නීති ක්‍රියාත්මක හා බලාත්මක කිරීම | නීති හා ප්‍රතිපත්ති සම්පාදනය හා බලාත්මක කිරීම සඳහා පහසුකම් සැපයීම* |
| සමාජ සම්මතයන් සහ වටිනාකම් | ආකල්ප, විශ්වාසයන් හා සම්මතයන් පරිවර්තනය වීම |
| ආරක්ෂිත පරිසරයන් | පරිසරයන් ආරක්ෂා කර තිබේ |
| මව්පියන්ගේ හා රැකබලාගන්නන්ගේ සහාය | ළමා හා නවයොවුන් අපයෝජන වළක්වා තිබේ |
| ආදායම් හා ආර්ථිකය ශක්තිමත් කිරීම | දිළිඳුකම අවමකර තිබේ |
| | කාන්තාවන් සවිබලගැන්වීම |
| ප්‍රතිචාර සහ සහායක සේවා | සේවා සහතික කර තිබේ |
| අධ්‍යාපනය සහ ජීවන කුසලතා | සම්බන්ධතා කුසලතා ශක්තිමත් කර තිබේ |
| බහු පාර්ශ්වීය සහයෝගය*** | අංශ හරහා සම්බන්ධීකරණය හා හවුල්කාරීත්වය** |
| අධීක්ෂණය හා ඇගයීම*** | අධීක්ෂණ හා ඇගයීම් පද්ධති ශක්තිමත් කිරීම** |

* පරිසරය සැකසීමේ උපාංගය  ** එලදායී වැඩසටහන්කරණයේ මාර්ගෝපදේශ මූලධර්ම  *** එකිනෙක සමග සම්බන්ධ වන මූලෝපාය

### අවදානම් හා ආරක්ෂක සාධක

මෙම මූලෝපාය මගින් ඉලක්ක කරනු ලබන්නේ ළමයින්ට හා නවයොවුන් පුද්ගලයන්ට එරෙහි ප්‍රචණ්ඩත්වයේ බහුවිධ ස්වරූප වැළැක්වීමයි. සිතාමතා පොදු අවදානම් සාධක අවම කිරීම හා පරම්පරාන්තර ප්‍රචණ්ඩත්ව චක්‍රය වැළැක්වීමත්, පවුල් හා ප්‍රජාවන් තුළ අපයෝජනය වැළැක්වීමත් සඳහා වන ඒකාබද්ධ එළඹුම් කෙරෙහි එහිදී අවධානය යොමුකරනු ලැබේ.[12,13]

නවයොවුන් පුද්ගලයන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වැළැක්වීම ඉලක්ක කරන ලද එළඹුම් මෙම මූලෝපාය තුළ අඩංගු වේ. එම ප්‍රචණ්ඩත්ව ස්වරූප අතරට, විනෝද හිංසනය, සම වයස් සහ අවිවාහක සහකරුවන් අතර තාවකාලික සම්බන්ධතාවලදී සිදුවන ප්‍රචණ්ඩත්වය සහ පාසල් පරිසරයන් තුළ සිදුවන ලිංගික සූරාකෑම් අත්දැකීම් අයත් වේ.

**Environments Made Safe RESPECT Strategy Summary** හි සමස්ත පාසල් සඳහා වන එළඹුම් ඇතුළත් කර තිබේ. නවයොවුන් වියේ ගැහැණු ළමයින් සවිබලගැන්වීම සම්බන්ධ ජීවන කුසලතා එළඹුම් කෙරෙහි අවධානයන් පහත දැක්වෙන ලේඛනයෙහි ඇතුළත් වේ: **Empowerment of Women Strategy Summary.**


මෙම මූලෝපායෙහි අරමුණ වන්නේ පහත දැක්වෙන සාධක සම්බන්ධයෙන් කටයුතු කිරීමයි. එම සාධක මගින් ළමයින්ට හා වැඩිහිටියන්ට තිබෙන ප්‍රචණ්ඩත්ව අවදානම අඩු වැඩි කළ හැකිය.

| මට්ටම | අවදානම් සාධක | ආරක්ෂණ සාධක |
|---|---|---|
| **පුද්ගල** | ළමාවියේ ප්‍රචණ්ඩත්ව අත්දැකීම් සහ/ හෝ පවුල තුළ ප්‍රචණ්ඩත්වයට නිරාවරණය වීම (පිරිමි සහ ගැහැණු)<br><br>පහළ අධ්‍යාපන මට්ටම (පිරිමි හෝ ගැහැණු)<br><br>මත්පැන් හෝ මත්ද්‍රව්‍ය හානිකර ලෙස භාවිතා කිරීම (පිරිමි සහ ගැහැණු)<br><br>මානසික වශයෙන් වැරදි ක්‍රියාකාරීත්වය/ දුර්වල චිත්තවේගී නියාමනය (පිරිමි)<br><br>ප්‍රචණ්ඩත්වය සාමාන්‍ය හෝ පිළිගත හැකි දෙයක් ලෙස සාධාරණීකරණය කිරීම (පිරිමි සහ ගැහැණු) | ප්‍රචණ්ඩ නොවන සන්නිවේදන මාර්ග පිළිබඳ ළමාවියේ අත්දැකීම් + ගැටුම් විසඳීම (පිරිමි සහ ගැහැණු)<br><br>අධ්‍යාපනය සහ සාක්ෂරතාව (පිරිමි සහ ගැහැණු)<br><br>ස්වයං සඵලත්වය හා ස්වයං අභිමානය පිළිබඳ ඉහළ හැඟීම (පිරිමි සහ ගැහැණු)<br><br>සමාජභාවී වශයෙන් සාධාරණ ආකල්ප හා භාවිතාවන් (පිරිමි සහ ගැහැණු) |
| **අන්තර් පුද්ගල** | දුර්වල/නිශේධාත්මක දරුවන් හැදීමේ භාවිතා<br><br>විවාහ ගැටුම් හා පවුල් බිඳීම්<br><br>දුර්වල සන්නිවේදනය, අකාර්යක්ෂම ගැටුම් කළමනාකරණය හා ගැටලු විසඳීමේ කුසලතා<br><br>ප්‍රචණ්ඩත්වයේ නියුතු සමවයස් පුද්ගලයන් | සාධනීය දරුවන් හැදීමේ භාවිතා<br><br>ප්‍රචණ්ඩතාව ඇතිකිරීමට ඉවහල් වන සාධක අවම කිරීමේ සම්බන්ධතා කුසලතා (උදා: ගැටුම් නිරාකරණය, සන්නිවේදනය) |
| **ප්‍රජාව** | පිරිමින්ගේ වරප්‍රසාදිත තත්වය ප්‍රවර්ධනය කරන සහ කාන්තා ස්වාධිපත්‍යය සීමාකරන හානිකර සමාජභාවී සම්මතයන්<br><br>පාසල්වල පුළුල් ලෙස ශාරීරික දඬුවම් භාවිතා කිරීම<br><br>ප්‍රචණ්ඩත්වය ඉවසන/ එයට ප්‍රතිචාර දැක්වීමට අසමත් වන ප්‍රජා ආයතන | අහිංසාවට උපකාරී වන සමාජ සම්මතයන්, විවිධත්වයට හා සමාජභාවී සමානාත්මතාවට ගරු කිරීම සහ කාන්තාවන් සවිබලගැන්වීම ප්‍රවර්ධනය කිරීම<br><br>ළමා හිතවාදී සහ සමාජභාවී වශයෙන් සාධාරණ විෂයමාලා හා ඉගැන්වීම් ප්‍රවර්ධනය කරන පාසල් පරිසරයන් |

### වෙනස්වීමේ න්‍යාය

පහත දැක්වෙන රූපසටහනෙන් නිරූපණය කරනු ලබන්නේ සාක්ෂි මත පදනම් වූ මැදිහත්වීම් සඳහා සරල කරන ලද වෙනස්කිරීමේ න්‍යායකි. එමගින් පවුල් සම්බන්ධතා ස්ථාපිත කිරීමට, ශාරීරික දඬුවම් තහනම් කිරීමට, රළු දරුවන් හැදීමේ භාවිතාවන් අවම කිරීමට හා සාධනීය මාපිය-දූදරු සම්බන්ධතා නිර්මාණය කිරීමට උපකාර කරනු ලැබේ. ඒවා විශේෂිත වැඩසටහන් සඳහා තවදුරටත් සංවර්ධනය කර අනුරූප කරගත යුතුය.

## C: ළමා සහ නවයොවුන් අපයෝජන වැළැක්වීම



## මැදිහත්වීම් වර්ග

කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය හා ළමයින්ට එරෙහි ප්‍රචණ්ඩත්වය පාලනය කිරීම සඳහා විවිධ රටවල සංදර්භයන් තුළ විවිධාකාරයේ මැදිහත්වීම් සිදුකර තිබේ. වඩාත්ම විශ්වාසවන්ත එළඹුම වන්නේ සුබවාදී දරුවන් හදාවඩාගැනීමේ භාවිතාවන්ය. වෙනත් වර්ගවල මැදිහත්වීම් සම්බන්ධයෙන් වඩා සීමිත සාක්ෂි තිබේ. විශේෂයෙන්ම පහළ සහ මැද මට්ටමේ ආදායම් සහිත රටවලින් විශේෂිත සාක්ෂි තිබේ.

පහත දැක්වෙන වගුව විසින් නිරූපණය කරනු ලබන්නේ RESPECT ව්‍යුහයෙහි දක්වා තිබෙන ප්‍රධාන මැදිහත්වීම් වර්ගයි. වර්තමාන සාක්ෂි පදනම හා වැඩසටහන් උදාහරණ ගැන ද එහි දැක්වේ. LMIC රටවල වැඩසටහන් උදාහරණ ඒවා තිබෙන තැන්වලදී ප්‍රමුඛතාව ලබාදී තිබේ.

**LEGEND**

- ● **බලාපොරොත්තු සහගත**, <1 පරිණාමය විසින් ප්‍රචණ්ඩත්ව ප්‍රතිඵලවල සැලකියයුතු අඩුවීමක් පෙන්නුම් කරනු ලැබේ.
- ■ **වැඩිදුර සාක්ෂි අවශ්‍යය**, <1 පරිණාමය විසින් ප්‍රචණ්ඩත්වය සම්බන්ධ මධ්‍යකාලීන ප්‍රතිඵලවල වර්ධනයක් පෙන්නුම් කරයි.
- ◆ **ගැටලු සහගත** - පරිණාමය විසින් ප්‍රචණ්ඩත්වය අවම කිරීම සම්බන්ධයෙන් පෙන්නුම් කරන්නේ එකිනෙකට පරස්පර ප්‍රතිඵලය.
- □ **සාක්ෂි නොමැත** - මැදිහත්වීම තවමත් එතරම් බැරෑරුම් ලෙස පරිණාමය වී නැත.
- ▼ **අකාර්යක්ෂම**, <1 පරිණාමය විසින් ප්‍රචණ්ඩත්ව ප්‍රතිඵලවල අඩුවීමක් පෙන්නුම් කරනු නොලැබේ.
- H ලෝක බැංකුවේ ඉහළ ආදායම් රටවල් (HIC)
- L ලෝක බැංකුවේ පහළ හා මැදි ආදායම් රටවල් (LMIC)

| මැදිහත්වීම් වර්ගය | විස්තරය | | කාර්යක්ෂමතාවේ සාක්ෂි | උදාහරණ වැඩසටහන් |
|---|---|---|---|---|
| **සමීප සහකරු ප්‍රචණ්ඩත්වය සහ ළමයින්ට නරක ලෙස සැලකීම සම්බන්ධයෙන් කටයුතු කරන මව්පිය මැදිහත්වීම්** | මෙම මූලෝපාය යටතේ වඩාත්ම බලාපොරොත්තු සහගත එළඹුම වන්නේ භාරකාර - ළමා සම්බන්ධතා සහ විනයගත කිරීමේ භාවිතාවන් මෙන්ම සිතාමතා සමාජභාවී සමානාත්මතාව ප්‍රවර්ධනය කරන සහ සීමාකාරී සමාජභාවී සම්මතයන්, භූමිකාවන් හා සම්බන්ධතා අභියෝගයට ලක්කරන සංවර්ධනය කිරීම ඉලක්ක කරන මැදිහත්වීම් හෝ සේවාවන්ය.<br><br>මෙම වැඩසටහන් විසින් පියවරුන් හා යුවල ඉලක්ක කරනු ලැබේ. ඒවා විසින් මව්පිය - ළමා සන්නිවේදනය සහ ළමයින්ට එරෙහි ප්‍රචණ්ඩ විනයගත කිරීම, ආපසු හැරී බැලීම ප්‍රවර්ධනය කිරීම, සංවාදය හා ක්‍රියාකාරීත්වය කෙරෙහි අවධානය යොමුකරනු ලැබේ. ළමයින් හදාවඩාගැනීමේ මැදිහත්වීම් අතරට සාමාන්‍යයෙන් පුද්ගල උපදේශනය හෝ කණ්ඩායම් සාකච්ඡා, සාධනීය ආදර්ශ චරිත, මව්පියන් හා ඔවුන්ගේ ළමයින් අතර ව්‍යුහගත ක්‍රීඩා ඇතුළත් වේ.[14] | ● H<br>● L | මෙය සමීප සහකරු ප්‍රචණ්ඩත්වය සහ ප්‍රචණ්ඩ ලෙස ළමයින් විනගයගත කිරීම ඵලදායී මැදිහත්වීමක් බවට HICs සහ LMICs[15] රටවල් වෙතින් **බලාපොරොත්තු සහගත සාක්ෂි** ලැබී තිබේ. HIC රටවල් වෙතින් ලැබෙන සාක්ෂි මගින් පෙන්වා දෙනු ලබන්නේ ළමයින්ට නරක ලෙස සැලකීම හා තරුණයන් කෙරෙහි හා ඔවුන් විසින් කරනු ලබන ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේ දිගුකාලීන ප්‍රතිඵලයි. | Bandeberho (රුවන්ඩා)<br><br>Real Fathers (උගන්ඩා)<br><br>Parenting for Lifelong Health (දකුණු අප්‍රිකාව)<br><br>Parents Make the Difference (ලයිබීරියාව)<br><br>Building Happy Families (තායිලන්තය) |
| **ජීවන කුසලතා/ පාසල් පාදක විෂයමාලා - දූෂණය හා තාවකාලික සම්බන්ධතා ඇතුළුව** | පාසලේ හා ඉන් පිටත හා නවයොවුන් පුද්ගලයන් සමාජභාවී සමානාත්මතාව හා සම වයස් සම්බන්ධතා ප්‍රචණ්ඩත්වය  විෂයමාලා පාදක එළඹුම් මෙයට ඇතුළත් වේ. | ◆ H<br>■ L | තාවකාලික සම්බන්ධතාවල ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේ වැඩසටහන් ඇතුළු HIC රටවල පාසල් පාදක මැදිහත්වීම් සම්බන්ධ ඇගයීම් පෙන්නුම් කරන්නේ **පරස්පර ප්‍රතිඵලයි**. මෙම වැඩසටහන් විසින් ළමයින්ට එරෙහි ප්‍රචණ්ඩත්වය අඩුකර තිබේද යන්න ගැටලු සහගතය. | Prepare (දකුණු අප්‍රිකාව)<br><br>Right to Play (පකිස්තානය) |

| මැදිහත්වීම් වර්ගය | විස්තරය | කාර්යක්ෂමතාවේ සාක්ෂි | උදාහරණ වැඩසටහන් |
|---|---|---|---|
| **ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේ පුහුණුව** | | LMIC රටවල ප්‍රචණ්ඩත්වය අවම කිරීමේදී මෙම මැදිහත්වීම් වර්ගයේ ඵලදායීතාව සම්බන්ධයෙන් **වැඩිපුර සාක්ෂි අවශ්‍යය.**<br><br>එයට අමතරව, විද්‍යාල පාදක ස්වයං ආරක්ෂක මැදිහත්වීම් HIC රටවල ඵලදායී බව පෙන්වාදීම සඳහා විධිමත් සාක්ෂි තිබේ. LMIC රටවල පාසල්වල තාවකාලික සම්බන්ධතාවල ප්‍රචණ්ඩත්වය අවම කිරීමේදී ස්වයං ආරක්ෂක මැදිහත්වීම් ඵලදායී බවට පරස්පර සාක්ෂි තිබේ. | Ujamaa/ No Means No Empowerment Transformation Training (කෙන්යාව) |
| **නිවෙස් නිරීක්ෂණය සහ සෞඛ්‍ය සේවකයන්ගේ සේවා ව්‍යාප්තිය** | මෙම මැදිහත්වීම්වලට නිවෙස් නිරීක්ෂණයන් අයත් වේ. එය සාමාන්‍යයෙන් සිදුකරනු ලබන්නේ ප්‍රජා සෞඛ්‍ය සේවකයන් විසිනි. එමගින් ඉලක්ක කරනු ලබන්නේ සමීප සහකරු ප්‍රචණ්ඩත්වය අත්දකින අවදානමට පත් මව්වරුන් සහ ළමා අපයෝජන සිදුවීමේ අවදානම සහිත නිවාසය. මෙම වැඩසටහන් සාමාන්‍යයෙන් ගර්භණී මව්වරුන්, සෑම වයසකම ළමයින්ගේ මව්වරුන් සහ දරුවන් ඇතුළු මව්වරුන් සමග වැඩකරයි. හදාවඩාගැනීමේ කුසලතා ශක්තිමත් කිරීම ඉලක්ක කරයි.[16] | H<br>HIC රටවල බහුවිධ සැසි සහිත නිවෙස් නිරීක්ෂණය හා සෞඛ්‍ය සේවකයන්ගේ සේවා විහිදීම සම්බන්ධ වැඩසටහන් කාන්තාවන් හා ළමයින් අත්දකින ප්‍රචණ්ඩත්ව මට්ටම් අඩුකිරීමේදී **බලාපොරොත්තු තැබිය හැකි එළඹුම්** බවට සාක්ෂි තිබේ.<br><br>L<br>මැදිහත්වීම් මගින් සමීප සහකරු ප්‍රචණ්ඩත්වයේ සහ ළමයින්ට වැරදි ලෙස සැලකීමේ මට්ටම් අඩුකළ හැකි බවට LMIC රටවලින් **වැඩිදුර සාක්ෂි අවශ්‍යය**. සාධනීය ප්‍රතිඵල තිරසර කර හැකිද යන කරුණ සම්බන්ධයෙන් පසු විපරම් අධ්‍යයනයන් එයට ඇතුළත් වේ.[17] | Nurse-Family Partnership (එක්සත් ජනපදය)<br><br>VoorZorg (නෙදර්ලන්තය)<br><br>The Infants programme (දකුණු අප්‍රිකාව) |
| **ප්‍රචණ්ඩත්වයට මුහුණදෙන සහ සමීප සහකරු ප්‍රචණ්ඩත්වය අත්දකින ළමයින් සඳහා මානසික සහාය මැදිහත්වීම්** | මෙම මානසික මැදිහත්වීම් කට්ටලය විසින් ඉලක්ක කරනු ලබන්නේ ළමා අත්දැකීම් හෝ ප්‍රචණ්ඩත්වය දැකීම මගින් මානසික සෞඛ්‍යයට සහ ක්ෂතියට සම්බන්ධ ප්‍රතිඵල පිළිබඳ කටයුතු කිරීමයි. එය කරනු ලබන්නේ ප්‍රචණ්ඩත්වයේ චක්‍රය අවසන් කිරීමේ ද්විතීයක වැළැක්වීමේ එළඹුම් ලෙසයි. මෙම මැදිහත්වීම් ළමා යහපැවැත්ම වර්ධනය කිරීමේදී සහ පරම්පරාන්තර ප්‍රචණ්ඩත්ව චක්‍රය වැළැක්වීමේදී වැදගත් විය හැකිය. | H<br>මෙම වර්ගවල මැදිහත්වීම් මගින් කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය හා ළමයින්ට එරෙහි ප්‍රචණ්ඩත්වය මට්ටම් අඩුකළ හැකි බවට **බලාපොරොත්තු ඇතිකරන සාක්ෂි** HIC රටවලින් ලැබේ.<br><br>L<br>LMIC රටවලින් ලැබෙන සාක්ෂිවලින් පෙන්නුම් කරන්නේ වෙන වෙනම සැසිවලින් හා සියලු සැසි එක්කර මව්වරුන් හා ඔවුන්ගේ ළමයින් ඉලක්ක කරන වැඩසටහන් මගින් ප්‍රචණ්ඩත්වයේ මනෝ සමාජයීය බලපෑම් සම්බන්ධයෙන් කටයුතු කිරීමේදී විශේෂයෙන් වාසිදායක වේ.[18] කෙසේ වෙතත්, මෙම එළඹුම් වර්ගයන් මගින් අනාගත ළමා අපයෝජන මෙන්ම නිවෙස්වල සමීප සහකරු ප්‍රචණ්ඩත්වය වැළැක්වීම පිළිබඳ බළඑෂක රටවලින් **වැඩිදුර සාක්ෂි අවශ්‍යය.** | WHO Guidelines for Mental Health (mh-GAP) (ගෝලීය)<br><br>VEGA Family Violence Project (කැනඩාව) |

## උදාහරණ වැඩසටහන්

වැඩසටහන් කාලරාමු තුළ ළමයින්ට එරෙහි ප්‍රචණ්ඩත්වය හා කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය අවම කිරීම සිදුකරන බව පෙන්නුම් කළ එකිනෙකට වෙනස් වැඩසටහන් තුනක් පහත දැක්වෙන වගුව විසින් සාරාංශ කරනු ලැබේ. මෙම ඕනෑම ක්‍රමවේදයක් අනුරූප කරගැනීමේදී වගුව සමාලෝචනය කළ යුත්තේ 9 පිටුවෙහි තිබෙන **සැලසුම් හා ක්‍රියාත්මක කිරීමේ පිරික්සුම් ලැයිස්තුව** සහ RESPECT ව්‍යූහය විසින් සපයා තිබෙන **ඵලදායී වැඩසටහන්කරණය සම්බන්ධ මාර්ගෝපදේශ මූලධර්ම** සමගය. එක් එක් වැඩසටහනක් පිළිබඳ වඩා සවිස්තර තොරතුරු **වැඩසටහන් සාරාංශවල** සපයා තිබේ.

| වැඩසටහන | විස්තරය | ස්ථානය | ඉලක්ක ජනගහනය | මූලික ක්‍රියාකාරකම් | කාල පරිච්ඡේදය | ඇගයීම හා බලපෑම |
|---|---|---|---|---|---|---|
| **Bandebereho, MenCare+, රුවන්ඩා පිරිමින්ගේ සම්පත් මධ්‍යස්ථානය (RWAMREC)** | සාධනීය පීතෘභාවය සහ සමාජභාවී සමානාත්මතාව පියවරුන් හා ඔවුන්ගේ සහකරුවන අතර ප්‍රවර්ධනය කිරීම සඳහා යුවලකගේ මැදිහත්වීම. මෙහි අරමුණ වන්නේ සමාජභාවී බල අසමානතා වෙනස් කිරීම සහ සමීප සහකරු ප්‍රචණ්ඩත්වය හා ළමයින් ප්‍රචණ්ඩ ලෙස විනයගත කිරීම අවම කිරීමයි. | රුවන්ඩාවේ දිස්ත්‍රික්ක හතරක කරන ලදී. Karongi, Musanze, Nyaruguru සහ Rwamagana | විවාහක හෝ අවිවාහකව එකට ජීවත් වන, පියවරුන් වීමට අපේක්ෂා කරන සහ වයස අවුරුදු පහට අඩු ළමයින්ගේ පියවරුන් වන වයස අවුරුදු 21-35 අතර පිරිමි සහ ඔවුන්ගේ සහකරු/කාරියන් | පිරිමින් හා ඔවුන්ගේ සහකරු/කාරියන්ට සහභාගීත්ව, කුඩා කණ්ඩායම් සැසි, පිරිමින්ට සැසි 15ක් හා ඔවුන්ගේ සහකරු/කාරියන්ට සැසි අටක්.<br><br>සැසිවල අරමුණ වන්නේ, සමාජභාවය හා බලය, පීතෘත්වය, දරුවන් රැකබලාගැනීම, ළමා සංවර්ධනය, යුවල අතර සන්නිවේදනය හා තීරණ ගැනීම සම්බන්ධයෙන් ගැඹුරින් නැවත විමසීම හා සංවාදය ප්‍රවර්ධනය කිරීමයි.<br><br>විෂයමාලාව අනුරූප කරගනු ලැබුවේ, මාතෘ හා ළමා සෞඛ්‍යය සම්බන්ධ MenCare+'s Program P ඇසුරෙනි. | අවුරුදු 1 | **ඇගයීම් වර්ගය:** අහඹු ලෙස පාලනය කරන ලද පරීක්ෂා (RCT)<br><br>**බලපෑම:** මාස 21 පශ්චාත් පදනම් මට්ටම. මෙමගින් කාන්තාවන්ගේ ශාරීරික සමීප සහකරු ප්‍රචණ්ඩත්වය සහ සමීප සහකරු ලිංගික ප්‍රචණ්ඩත්වය අත්දැකීම් සැලකියයුතු අන්දමින් අවම වියග<br><br>මැදිහත්වීමෙහි නිමග්න කාන්තාවන් සහ පිරිමින් ද වාර්තා කළේ ළමයින්ට දඬුවම් කිරීම කැපීපෙනෙන ලෙස අඩුවූ බවයි.[19] |

| වැඩසටහන | විස්තරය | ස්ථානය | ඉලක්ක ජනගහනය | මූලික ක්‍රියාකාරකම් | කාල පරිච්ඡේදය | ඇගයීම හා බලපෑම |
|---|---|---|---|---|---|---|
| **PREPARE,** Western Cape Department of Health, the City of Cape Town Health Department, the Desmond Tutu HIV Foundation; Centre for Justice and Crime Prevention (CJCP)[20] | බහු පාසල් පාදක එච්අයිවී සහ නවයොවුන් පුද්ගලයන් සඳහා සමීප සහකරු ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේ වැඩසටහන් | දකුණු අප්‍රිකාවේ බටහිර කේප්හි උසස් පාසල් 42ක ක්‍රියාත්මක කරන ලදී. | වයස අවුරුදු 13 - 14 අතර 8 ශ්‍රේණියේ සිසුන් | සහභාගී වන්නන් 25 දක්වා පිරිස් වෙනුවෙන් පුහුණු පහසුකම් සපයන්නන් විසින් සැසි 21ක් මෙහෙයවන ලදී. සාධනීය සමාජභාවී සම්මතයන් හා ලිංගිකත්ව අධ්‍යාපනය දරාගැනීමේ හැකියාව සම්බන්ධයෙන් පරීක්ෂා කරන ලදී. සැසි විසින් සන්නිවේදනය, සම්බන්ධතා, සමාජභාවී බල අසමානතා සහ සමීප සහකරු ප්‍රචණ්ඩත්වය ආවරණය කරන ලදී. අධ්‍යාපනික උපාංගයට පාසල් සෞඛ්‍ය සේවා සහ පාසල් ආරක්ෂක වැඩසටහන් මගින් සහාය ලැබිණි. පුහුණුව සහ අනාරක්ෂිත ශාරීරික අවකාශයන් සිතියම්ගත කිරීම එයට ඇතුළත් වේ. | මාස 12 | **ඇගයීම් ස්වරූපය:** RCT<br><br>**බලපෑම:** ආරම්භක මට්ටමේ සිට මාස 12ක් තුළදී තාවකාලික සම්බන්ධතාවලදී ගැහැණු ළමයින් අත්දකින ප්‍රචණ්ඩත්වයේ අඩුවීමක්.[21] |
| Right to Play<br>Right to Play Pakistan (RTP) and the Aga Khan Foundation | පාසල්වල සම වයස් ප්‍රචණ්ඩත්වය අවම කිරීම අරමුණු කරගත් සෙල්ලම් හා ක්‍රීඩා පාදක වැඩසටහනක් | පකිස්තානයේ සින්ධ් පළාතේ හයිදරාබාද් | සාමාන්‍යයෙන් වයස අවුරුදු 12ක් වන 6 ශ්‍රේණියේ සිසුන් | සතියට දෙවරක් විනාඩි 40 බැගින් වන ව්‍යුහගත හා අන්තර් ක්‍රියාකාරී සෙල්ලම් පාදක ඉගෙනුම් ක්‍රියාකාරකම් පාසල් වැඩ සැලැස්මට ඇතුළත් කරන ලදී. ක්‍රියාකාරකම්වල අවධානය යොමුවුණේ අත්‍යවශ්‍ය ජීවන කුසලතා ගොඩනගාගැනීම කෙරෙහිය. ප්‍රචණ්ත්වයට සහ සමාජභාවී අසමානතාවට අභියෝග කිරීම සඳහා විචාරශීලී ලෙස සිතීමේ හැකියාව එයට ඇතුළත්ය.<br><br>තරගාවලි, උත්සව සහ ස්ථාවර තේමාත්මක 'සෙල්ලම් දින' (උදා: 'ප්‍රචණ්ඩත්වය නැවැත්වීම' යන තේමාවට අවධානය යොමුකළ) මව්පියන් හා පුළුල් ප්‍රජාව සම්බන්ධ කරගැනීම ද පාසල් පාදක මැදිහත්වීම්වලට අයත් වේ.[22] | අවුරුදු 2යි | **ඇගයීම් ස්වරූපය:** RCT<br><br>**බලපෑම:** සම වයස් ප්‍රචණ්ඩත්වයේ, පාසල්වල සහ නිවසේ ශාරීරික දඬුවම්වල, සැලකියයුතු මට්ටමේ අඩුවීමක්. පිරිමි සහ ගැහැණු ළමයින් විසින් නිවසේදී ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය දැකීම පිළිබඳ වාර්තාවල කැපීපෙනෙන අඩුවක්. පිරිමි සහ ගැහැණු ළමයින් තුළ සමාජභාවී වශයෙන් සාධාරණ ආකල්ප වර්ධනය වීම.[23] |

# පිරික්සුම් ලැයිස්තුව සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම

ළමා සහ නවයොවුන් අපයෝජනය වැළැක්වීමේ **පොදු මූලිකාංග සහ කාර්යක්ෂම එළඹුමක මූලධර්ම**වල පහත දැක්වෙන ලක්ෂණ අඩංගු වේ.[24, 25]

## වැඩසටහන් සැකසීම හා අනුරූප කරගැනීම

1. **ළමයින්ට එරෙහි ප්‍රචණ්ඩත්වය හා කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සම්බන්ධ අවදානම් සාධක සම්බන්ධයෙන් කටයුතු කරන වැඩසටහන් සැලසුම් කරන්න.** ළමා අපයෝජන පමණක් සැලකිල්ලට ගන්නා වැඩසටහන් මගින් තම මව්වරුන් සමීප සහකරු ප්‍රචණ්ඩත්වයට ලක්වන ආකාරය දිගින් දිගටම දකින ළමයින්ට වන්නේ සීමිත බලපෑමක් බව සාක්ෂි මගින් පෙන්නුම් කරනු ලැබේ.[26] ළමයින්ට එරෙහි ප්‍රචණ්ඩත්වය හා කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වයට පොදු අවදානම් සාධක දුරලීම කෙරෙහි අවධානය යොමුකරන වැඩසටහන්වලට ප්‍රචණ්ඩත්වයේ ස්වරූප දෙකම අවම කිරීමේ වැඩි විභවයක් තිබේ. උදාහරණයක් ලෙස, වඩා ඒකාබද්ධ වැඩසටහන් මගින් පවුල් තුළ ප්‍රචණ්ඩත්වයේ ස්වරූපයන් සියල්ල වැළැක්විය හැකි බව උගන්ඩාවේ මැදිහත්වීමේ අධ්‍යයනයක් මගින් හඳුනාගන්නා ලදී.[27]

2. **පවුල තුළ ඇතුළුව සමාජභාවය හා බලය සම්බන්ධයෙන් විචාරශීලී ප්‍රත්‍යාවලෝකන කෙරෙහි අවධානය.**[28] සමාජභාවී සම්මතයන් ළමයින්ට ඉගැන්වීම සම්බන්ධ ආදර්ශ සැකසීමට සහ තම චර්යාවන් ගැන අධ්‍යාපනය අත්හැරීමට හා වෙනස්කිරීමට උපකාර වන රුවන්ඩාවේ Bandebereho යුවල වෙත මැදිහත්වීමේ වැඩසටහන වැනි වැඩසටහන් ළමයින්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සහ කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය අවම කිරීමේදී බලාපොරොත්තු සහගත ප්‍රතිඵල ඇතිකරන බව පෙන්නුම් කර තිබේ.[29]

3. **සරල ලෙස දැනුවත්භාවය ඇතිකිරීමට වඩා සම්බන්ධතා ගොඩනැගීම සහ ළමයින් හදාවඩාගැනීමේ කුසලතා කෙරෙහි අවධානය යොමුකිරීම.**[30]
සම්බන්ධතා කුසලතා සංවර්ධනය කිරීම සඳහා සැබැවින්ම අරමුණු කරන මැදිහත්වීම්, එම කුසලතා ආරක්ෂිත අවකාශයන්හිදී භාවිතා කිරීමේ අවස්ථා ඇතුළුව, ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේදී සාර්ථක බව ඔප්පු වී තිබේ.[31] මව්පියන් අතර සාධනීය විනයගත කිරීමේ කුසලතා ගොඩනැගීම, කෝපය හා කලකිරීම වැනි දුෂ්කර හැඟීම් පාලනය කරගැනීමට මව්පියන්ට උපකාර කිරීම සහ සමීප සහකරුවන් අතර ධනාත්මක සන්නිවේදන කුසලතා මෙයට අයත් වේ.[32]

4. **එළඹුම් දේශීය සංදර්භයන්ට ගැලපෙන පරිදි අනුරූප කරගත යුතුය.** වැඩසටහන් අනුරූප කරගැනීම මගින් බඳවාගැනීම්වලට සහ බාධක ඉවත්කිරීමට උපකාර විය හැකිය. විශේෂයෙන්ම, පියවරුන් සම්බන්ධ කරගැනීමේදී එය වැදගත් වේ. එයට අමතරව, වැඩසටහන් විසින් ඉලක්ක කණ්ඩායමට ඔබ්බෙන් සමාජ සම්මතයන් සම්බන්ධයෙන් කටයුතු කළ යුතුය. එහි අරමුණ වන්නේ, පුද්ගල මට්ටමේ වෙනස්කම් තිරසර කළ හැකි සක්‍රිය පරිසරයක් නිර්මාණය කිරීමයි. උදාහරණයක් ලෙස, සමාජ හා චර්යා ක්‍රියාමාලා වැනි වෙනත් මූලෝපායන් හරහා විවිධ ක්‍රියාකරුවන් (ප්‍රජා හා ආගමික නායකයන්, සෞඛ්‍ය සේවකයන්, ගුරුවරුන්, පාසල් කළමනාකාර මණ්ඩලයේ මව්පියන්, පූර්ව ළමාවිය අධ්‍යාපනික සේවා සම්බන්ධ කරගැනීමෙන්

## ක්‍රියාත්මක කිරීම හා ක්‍රමානුකූලව වර්ධනය කිරීම

5. **මව්පියන් හා රැකබලාගන්නන් සඳහා මූලික සංකල්ප වැරග න්වන හා සති ගණන්වලට වඩා මාස ගණන් ඉගෙනගන්නා බහුවිධ සැසි ඇතුළත් කරන්න.**[33, 34] එක් වරක් පමණක් පවත්වන සැසි එතරම් ඵලදායී බවක් නොපෙනේ. ළමයින්ට එරෙහි ප්‍රචණ්ඩත්වය හා කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය නිර්මාණය කරන හා පවත්වාගෙන යන හානිකර සමාජ සම්මතයන් වෙනස් කිරීම සඳහා ඉගෙනීම නැවත වැරගැන්වීම සහ කාලයක් තුළ වැදගත් පණිවුඩ නැවත නැවත ලබාදීම අවශ්‍යය. තනි ලිංගික-භාවය හා මිශ්‍ර ලිංගික කණ්ඩායම් යන දෙකටම ඉඩදෙන බහුවිධ සැසි වැඩසටහන් කීපයකදීම සාර්ථකත්වය සඳහා වැදගත් සාධක විය.[35]

6. **පහසුකම් සපයන්නන් මනාව පුහුණු කර ඇති බව, නිරීක්ෂණය හා අධීක්ෂණය කරන බව තහවුරු කරන්න.**[36, 37] මාර්ගෝපදේශ හා සහාය වෙත ප්‍රවේශය සහතික කරන්න. නිවෙස් නිරීක්ෂණ වැඩසටහන්වල සාක්ෂි මගින් පෙන්නුම් කරනුයේ මෙම සාධක සාධනීය වැඩසටහන් ප්‍රතිඵල සමග සම්බන්ධ බවයි. ළමයින්ට නරක ලෙස සැලකීම සම්බන්ධ කාරණා ද එයට අයත් වේ.[38]

7. **ළමයින් හදාවඩාගැනීම පිළිබඳ සැසිවලට කුඩා කණ්ඩායම් සැසි මෙන්ම තනි සැසි ද ඇතුළත් කරන්න.** සමාජභාවී සම්මතයන් පිළිබඳ සහ බලය පිළිබඳ අනෙක් අය සමග සාකච්ඡාවන්ට සහභාගී වන්නන්ට අවස්ථා සැපයීම මගින් ආරක්ෂිත අවකාශයන් තුළ අලුත් ආකල්ප හා චර්යාවන් භාවිතා කිරීම හා ආදර්ශ සැකසීම සිදුවේ. එමගින් පුද්ගල හැඟීම් උපදේශකවරුන් සමග බෙදාගැනීම ද සිදුවේ.[39]

8. **ප්‍රචණ්ඩත්වයේ ඉහළ අවදානමක් තිබෙන පවුල් වෙත ළඟාවීමට සලකාබලන්න.** ස්ථිරව සේවා සමග සම්බන්ධ නැති නිවෙස් නිරීක්ෂණය විශේෂයෙන් ප්‍රයෝජනවත් වේ. නිවස තුළ ප්‍රචණ්ඩත්වය අත්දැකීමේ වැඩි අවදානමක් සහිත අය එයට අයත් වේ.[40]

9. **සහභාගීත්ව හා සෙල්ලම් පාදක කරගත් එළඹුම් භාවිතා කරන්න.**[41] පාසල් කාලසටහනට සම්පූර්ණයෙන් ඇතුළත් කර තිබෙන, අන්තර් ක්‍රියාකාරී, විෂයමාලා පාදක එළඹුම් ළමයින් හා තරුණ පුද්ගලයන් සම්බන්ධ කරගැනීමේදී විශේෂයෙන් වැදගත් බව අවධාරණය කර තිබේ.[42] උදාහරණයක් ලෙස පකිස්තානයේ Right to Play's Positive Youth Development programme සැලකිය හැකිය. ළමයින්ට සමාජ සම්මතයන් තේරුම් ගැනීමට හා ඒවා තමන්

වෙතින් ඉදිරිපත් කිරීමට ඉවහල් වන විෂයමාලා පාදක පාසල් ක්‍රියාකාරකම් කට්ටලයක් එයට ඇතුළත් විය. මව්පියන් හා දේශීය ප්‍රජාවන් වෙනුවෙන් තේමාත්මක නාට්‍ය එයට අයත් වේ.[43]

10. **ළමා හිතවාදී සහ සමාජභාවී වශයෙන් සංවේදී වාර්තාකරණය සහ යොමුකිරීම් යාන්ත්‍රණයන් ක්‍රියාත්මක බව සහතික කරන්න. ළමා ආරක්ෂණ ක්‍රියාකරුවන් සම්බන්ධීකරණය කිරීම ද එයට ඇතුළත්ය.** ක්‍රියාත්මක කිරීම ආරම්භ කිරීමට පෙර මෙය සිදුකළ යුතුය. ක්‍රියාත්මක කරන්නන් මෙම යාන්ත්‍රණයන් පිළිබඳ දැනුවත් බව සහතික කරන්න.[44] මෙය ආරක්ෂා කිරීමේ හා 'හානියක් නොකිරීමේ' වැඩසටහනෙහි අත්‍යවශ්‍ය කොටසකි. වැඩසටහන් විසින් ළමයින්ට එරෙහි ප්‍රචණ්ඩත්වය හා කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වයට යෝග්‍ය පරිදි ප්‍රතිචාර දැක්වීමට සූදානම් විය යුතුය (ඒ වෙනුවෙන් බොහෝවිට විවිධ පාර්ශ්වකරුවන් සමග ක්‍රියාකිරීමට සිදුවේ). වාර්තා කිරීම අත්‍යවශ්‍ය පසුබිම්වලදී සේවා සම්පාදකයන් විසින් ශාරීරික හෝ ලිංගික අපයෝජන සිද්ධි පිළිබඳ බලධාරීන්ට දැනුම්දිය යුතුය. අනිවාර්ය වාර්තා කිරීම හා සම්බන්ධ ආචාරධාර්මික හා ආරක්ෂක සලකාබැලීම් ලෝක සෞඛ්‍ය සංවිධානයේ Good Practice Statement 7 Responding to children and adolescents who have been sexually abused හි දැක්වේ.

11. **ක්‍රමානුකූලව වර්ධනය කිරීමේදී පද්ධති හා ආයතන ශක්තිමත් කිරීම ඉතා වැදගත්ය.** විශේෂයෙන්ම, සිද්ධි කළමනාකරණය, යොමුකිරීම් සහ මනෝසමාජයීය සහාය ආදිය සපයන ප්‍රමාණවත් පුහුණු සමාජ ක්‍රියාකරුවන් කාඩරයක් සිටින ළමා ආරක්ෂණ පද්ධති මෙයට අදාළ වේ.

## ඇතුළත් වීමේ ස්ථාන

ළමා සහ නවයොවුන් අපයෝජන සම්බන්ධයෙන් කටයුතු කිරීමේ එළඹුම්වල බලපෑම උපරිම කිරීම සඳහා බහුවිධ පසුබිම් සහ අංශ සමග සම්බන්ධ කළ හැකිය. දැනට කරමින් තිබෙන මුලපිරුම් මත පදනම් වීම වැළැක්වීමේ වැඩසටහන්වල ව්‍යාප්තිය වර්ධනය කිරීම සඳහා ඵලදායී විය හැකිය. එම මුලපිරුම් වෙනුවෙන්ම අමතර ධනාත්මක ප්‍රතිඵල ජනනය කිරීමේ විභවය එයට තිබේ. පහත දැක්වෙන වගුවෙහි අවධාරණය කරනු ලන්නේ මෙම මූලෝපාය සඳහා වන ප්‍රධාන පිවිසුම් ලක්ෂ්‍යයන්ය. වැඩසටහන් උදාහරණ ද එයට ඇතුළත් වේ.

| පිවිසුම් ලක්ෂ්‍ය | තර්කනය |
|---|---|
| **සමාජ ආරක්ෂාව සහ ආර්ථිකය සවිබලගැන්වීමේ මැදිහත්වීම්**<br>• මුදල් හුවමාරු<br>• සමාජභාවී සම්මතයන් පිළිබඳ පුහුණුව සමග සම්බන්ධ ග්‍රාමීය ඉතුරුම් හා ණය සංගමය - Village Savings and Loans Associations (VSLAs)<br>• සමාජභාවී සම්මතයන් පුහුණු කිරීම සමග සම්බන්ධ ක්ෂුද්‍ර මූල්‍ය<br>• තරුණ රැකියා වැඩසටහන් | ආදායම් සහ ආර්ථිකය ශක්තිමත් කිරීමේ වැඩසටහන් විසින් ළමයින්ට එරෙහි ප්‍රචණ්ඩත්වය හා කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන් කටයුතු කිරීමේ අවස්ථා සෘජුව හා වක්‍රව සපයයි. එය කරනු ලබන්නේ අවදානම් සාධක වෙත අවධානය යොමු කරමිනි.<br><br>පවුල් හා කාන්තාවන්ට සමාජභාවී සම්මතයන් පිළිබඳ පුහුණුව සමග ආර්ථික අවස්ථා සපයන වැඩසටහන් ප්‍රචණ්ඩත්වය අවම කිරීමේදී සාර්ථක බව දක්නට ලැබේ.[45] නවයොවුන් පුද්ගලයන් සම්බන්ධයෙන් ගත් කල බහු ස්ථර දිගුකාලීන මැදිහත්වීම් වඩා ඵලදායී වේ.[46]<br><br>උදාහරණයක් ලෙස ඇෆ්ගනිස්තානයේ සහ උගන්ඩාවේ නවයොවුන් පුද්ගලයන්ගේ ජීවනෝපාය සවිබලගැන්වීමේ - Empowerment and Livelihood for Adolescents (ELA) වැඩසටහන් හේතුවෙන් දූෂණය 50%කින් අඩු විය. එය නවයොවුන් ගැහැණු ළමයින්ට නවයොවුන් සමාජ හරහා මාර්ගෝපදේශනය, ජීවන කුසලතා හා ක්ෂුද්‍ර මූල්‍ය පුහුණුව සපයයි. වැඩසටහන මෙහෙයවනු ලබන්නේ සම වයස් මාර්ගෝපදේශකවරුන් විසිනි. සමාජභාවී සම්මතයන් හා ලිංගික හා ප්‍රජනන සෞඛ්‍යය පිළිබඳ දැනුවත්භාවය ඇතිකිරීම එයට අයත් වේ.[47]<br><br>මූල්‍ය පහසුකම් සැපයීම ඇතුළු සමාජ ආරක්ෂණ ජාලයන් මගින් ළමයින්ට එරෙහි ප්‍රචණ්ඩත්වය හා කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන් ආරක්ෂණ ප්‍රතිඵල නිර්මාණය කළ හැකිය.[48] වඩාත්ම බලාපොරොත්තු සහගත සාක්ෂි අප්‍රිකාවේ නවයොවුන් කාන්තාවන්ට එරෙහි ලිංගික ප්‍රචණ්ඩත්වය සමග සම්බන්ධය. උදාහරණයක් ලෙස, කෙන්යාවේ අනාථ හා අවදානමට ලක්වන ළමයින්ට මුදල් ලබාදීමේ වැඩසටහන සම්බන්ධ ඇගයීම විසින් නවයොවුන් ගැහැණු ළමයින් අතර මුදල් වෙනුවෙන් කරනු ලබන ලිංගික චර්යා අඩු වී ඇති බව පෙන්වාදී තිබේ.[49] මුදල් ලබාදීම මගින් නරක ලෙස සැලකීම් 10%කින් අඩු කළ හැකි බව ද සමීක්ෂණය විසින් පෙන්නුම් කර තිබේ. නවයොවුන් පිරිමි ළමයින් අතර සමාජ හිතවාදී චර්යාවන් ද වැඩිකළ හැකිය.[50] කෙසේ වෙතත්, ළමයින් හා කාන්තාවන් වැඩියෙන් ප්‍රචණ්ඩත්වයෙන් ආරක්ෂා කිරීමේ හැකියාව ඇති සැලසුම් ලක්ෂණ ගවේශනය කිරීම සඳහා මෙන්ම, විය හැකි නරක බලපෑම් අවම කරන ආකාරය සම්බන්ධයෙන් ද වැඩිදුර සමීක්ෂණ අවශ්‍යය.[51] වැඩිදුර විස්තර සඳහා බලන්න: RESPECT strategy on 'Poverty Reduced' |

| පිවිසුම් ලක්ෂ්‍ය | තර්කනය |
|---|---|
| **අධ්‍යාපනය**<br>• ජීවන කුසලතා හා දැනුවත්භාවය නැංවීම<br>• පරිපූර්ණ ලිංගිකත්ව අධ්‍යාපනය<br>• ක්‍රීඩා සහ සෙල්ලම්<br>• මුල් ළමාවිය සංවර්ධනය | ළමයින්ට එරෙහි ප්‍රචණ්ඩත්වය හා කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා පාසල් විශේෂයෙන් යෝග්‍ය පරිසරයන් වේ. ප්‍රචණ්ඩත්වය හා සම්බන්ධ සමාජ සම්මතයන් අභ්‍යන්තරගත වන්නට පෙර වයසකදී එම වැඩසටහන් විශාල ළමයින් සංඛ්‍යාවක් වෙත සන්නිවේදනය වේ. මෙම වැඩසටහන් මගින් ළමයින්ට ප්‍රචණ්ඩත්වය පිළිබඳ ඉගැන්වීමේ හැකියාව තිබේ. ඒවා බොහෝ විට වැඩිහිටියන් හා වෙනත් ළමයින් වෙතින් ප්‍රචණ්ඩත්වයට නිරාවරණය වීමෙහිලා තම අවදානම අවම කරගැනීම පිළිබඳ ඔවුන්ගේ කුසලතා සංවර්ධනය කරයි.<br><br>උදාහරණයක් ලෙස, පකිස්තානයේ Right to Play වැඩසටහන විසින් සමාජභාවී සමානාත්මතාව හා අවිහිංසාව සමග බැඳුණු සමාජ සම්මතයන් වෙනස් කිරීම සඳහා සෙල්ලම් සහ ක්‍රීඩා පාවිච්චි කරන ලදී. අවසාන මට්ටමේ සමීක්ෂණය විසින් පෙන්වාදෙනු ලැබුවේ නිවසේදී හා පාසලේදී ශාරීරික දඬුවම් පැමිණවීම කැපීපෙනෙන පරිදි අඩුවී තිබෙන බවයි. එසේම, සම වයස් ප්‍රචණ්ඩත්වය පාසලේදී හා නිවසේදී ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය දැකීම අඩුවී තිබිණි.[52,53] |
| **සෞඛ්‍ය**<br>• ලිංගික, ප්‍රජනන සෞඛ්‍ය වැඩසටහන්කරණය, විශේෂයෙන්ම පූර්ව ප්‍රසව සත්කාර<br>• ප්‍රජා සෞඛ්‍ය සේවකයන්ගේ සේවා ව්‍යාප්තිය | ප්‍රචණ්ඩත්වය අත්දැකීම, විශේෂයෙන්ම, නිවසේදී ප්‍රචණ්ඩත්වය අත්දැකීම බොහෝවිට සෞඛ්‍ය ක්ෂේත්‍රයට නිරීක්ෂණය වේ. ඒ සඳහා පිවිසුම් ලක්ෂ්‍යයන් වන්නේ පරීක්ෂා කිරීම් සහ සෞඛ්‍ය සේවකයන් විසින් නිවෙස් වෙත ගොස් පරීක්ෂා කිරීම් ආදියයි. වෙනත් වර්ගවල ප්‍රජා පාදක වැඩසටහන්කරණයන්ට ඇතුළත් නොවන පුද්ගලයන් එමගින් ඉලක්ක කළ හැකිය.<br><br>උදාහරණයක් ලෙස, Parenting for Lifelong Health (PLH) වැඩසටහන තුළ පූර්ව ප්‍රසව මෙන්ම නවයොවුන් ළමයින් හදාවඩාගැනීම සම්බන්ධ එළඹුම් ද ඇතුළත් වේ. Infants වැඩසටහන මෙහෙයවනු ලබන්නේ සෞඛ්‍ය සේවකයන් විසිනි. මව්වරුන් ගර්භණී සමයේ ආරම්භ වන එය දරුවන් මාස හයක් වයස් වනතුරු ක්‍රියාත්මක වේ. වැඩසටහන විසින් උපදේශන එළඹුමක් භාවිතා කරනු ලැබේ. ධනාත්මක දරුවන් රැකබලාගැනීමේ හා මාපිය-ළදරු සම්බන්ධතා ගොඩනැගීමේ ක්‍රම එය සමග සම්බන්ධය.[54,55] මව්පියන් සහ නවයොවුන් ළමයින් සඳහා වන PLH විසින් ද මව්පියන් හා වයස අවුරුදු 10 - 17 අතර ළමයින් සඳහා ඒ හා සමාන එළඹුමක් භාවිතා කරනු ලැබේ. දකුණු අප්‍රිකාවේ වැඩසටහන් දෙකේම අධ්‍යයන මගින් සොයාගනු ලැබුවේ, අවම කරන ලද අපයෝජන හා ශාරීරික දඬුවම් සම්බන්ධයෙන් දිගුකාලීන මැදිහත්වීම් ප්‍රතිඵල සොයාගන්නා ලදී. එසේම ධනාත්මක අන්දමින් ළමයින් හදාවඩාගැනීම ද වර්ධනය වී තිබිණි. |

# ප්‍රයෝජනවත් සම්පත්

## ළමා අපයෝජන සහ කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සමග එහි සම්බන්ධය අවබෝධ කරගැනීම

Bridging the gaps: a global review of intersections of violence against women and violence against children, Guedes, A. Bott, S., García-Moreno, C. and M. Colombini. Global Health Action, vol. 9, no. 10. 2016
ළමයින්ට එරෙහි ප්‍රචණ්ඩත්වය හා කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය අතර අන්තර් ඡේදනය පිළිබඳ සාක්ෂිවල ආඛ්‍යානමය සමාලෝචනයක් ඉදිරිපත් කරයි. සහකරුවන්/කාරියන් නොවන අයගේ ලිංගික ප්‍රචණ්ඩත්වය එයට අයත් වේ. පහළ සහ මැද ආදායම් රටවල් සම්බන්ධයෙන් අවධාරණය කරනු ලැබේ.

Intersections of violence against women and violence against children. Fulu, E., McCook, S. and K. Falb. What Works Evidence Review Cape Town: South Africa. 2017
ළමයින්ට එරෙහි ප්‍රචණ්ඩත්වය හා කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය අතර සම්බන්ධතා පිළිබඳ සාක්ෂිවල සාරාංශයක් ඉදිරිපත් කරයි. පොදු අවදානම් සාධක, පොදු සමාජ සම්මතයන් හා සමගාමී සිදුවීම හා පරම්පරාන්තර අපයෝජන චක්‍රය එයට අයත් වේ.

Global prevalence of past-year violence against children: a systematic review and minimum estimates Hillis, S., Mercy, J., Amobi, A., et al. Pediatrics, vol. 137; no. 3. 2016
ළමයින්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන් ඉතාම රළු සහ පසුගිය සමීප අවුරුදුවල ගෝලීය ව්‍යාප්ති තක්සේරු සපයයි.

Hidden in plain sight: a statistical analysis of violence against children, New York: UNICEF. 2014.
විවිධ ස්වරූපවල ළමයින්ට එරෙහි ප්‍රචණ්ඩත්වය පැවැත්ම පිළිබඳ දත්ත සපයයි. රටවල් 190ක ගෝලීය සංඛ්‍යා සහ දත්ත ඉදිරිපත් කරයි.

What works to prevent sexual violence against children: Evidence Review. Ligiero, D., Hart, C., Fulu, E., Thomas, A., & Radford, L. Together for Girls. 2019
ළමයින්ට හා නවයොවුන් පුද්ගලයන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වැළැක්වීම සම්බන්ධයෙන් සාර්ථක වන්නේ කුමක්ද යන්න ගැන දැනට පවත්නා සාක්ෂි පිළිබඳ භාවිතයට පහසු සාරාංශයක් ඉදිරිපත් කරයි.

## ළමයින්ට එරෙහි ප්‍රචණ්ඩත්වයේ පරිමාණය අවබෝධ කරගැනීම සහ එයට ප්‍රතිචාර දැක්වීම

Violence Against Children Surveys (VACS), US Centers for Disease Control and Prevention (CDC).
ළමයින්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සමීක්ෂණවලට නායකත්වය දෙනු ලබන්නේ Together for Girls යටතේ තිබෙන CDC මගිනි. එමගින් පිරිමි හා ගැහැණු ළමයින්ට එරෙහි ශාරීරික, චිත්තවේගී සහ ලිංගික ප්‍රචණ්ඩත්වය මනිනු ලැබේ. බහුවිධ LMIC රටවල සමීක්ෂණ සිදුකර තිබේ. වෙබ් අඩවියෙන් විශ්ලේෂණය ලබාගත හැකිය.

The Economist Out of the Shadows index යනු රටවල් 60ක සැසඳුම් නියාමන දර්ශකයන්ය. එමගින් රටවල් ළමයින්ට එරෙහි ලිංගික ප්‍රචණ්ඩත්වයේ තර්ජනයට ප්‍රතිචාර දක්වන ආකාරය නිරීක්ෂණය කරනු ලැබේ.

## ජාත්‍යන්තර කාර්යරාමු සහ මාර්ගෝපදේශ

United Nations Convention on the Rights of the Child (UNCRC), 1992
ළමා අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර ප්‍රකාශය. එහි වගන්ති 54ක් අඩංගුය. ඉතිහාසයේ වැඩියෙන්ම අපරානුමත කරන ලද ජාත්‍යන්තර මානව හිමිකම් ගිවිසුමයි.

INSPIRE: Seven strategies for Ending Violence Against Children, Geneva: World Health Organization (WHO); 2016
ළමයින්ට හා නවයොවුන් පුද්ගලයන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේ හා එයට ප්‍රතිචාර දැක්වීමේ යෙදීසිටින රාජ්‍ය, ප්‍රජාමූල, සිවිල් සමාජ සහ පෞද්ගලික අංශ සඳහා සාක්ෂි මත පදනම් වූ සම්පත් එකතුවකි.

INSPIRE Handbook: action for implementing the seven strategies for ending violence against children, New York: UNICEF; 2018
ප්‍රතිපත්ති සම්පාදකයන්ට, සැලසුම්කරුවන්ට, භාවිතා කරන්නන්ට, අරමුදල් සපයන්නන්ට සහ උද්දේශනය කරන්නන්ට තම රට තුළ හෝ පසුබිම තුළ INSPIRE මූලෝපායන් හත ක්‍රියාත්මක කිරීම සඳහා උපකාර කිරීමට ඉලක්ක කරයි.

INSPIRE Indicator Guidance and Results Framework, New York: UNICEF; 2018
රජයට හා රාජ්‍ය නොවන සංවිධානවලට INSPIRE මූලෝපායන් හතේ ප්‍රගතිය කාලය තුළ අධීක්ෂණය කිරීම සඳහා සහ ගමන් පථය වෙනස් කිරීම සඳහා සැලසුම් කර තිබේ. ප්‍රතිඵල රාමුවක් හා මූලික දර්ශක කට්ටලයක් ලේඛනයෙහි අඩංගු වේ. එය භාවිතා කරන ආකාරය පිළිබඳ සවිස්තර මාර්ගෝපදේශයක් ද එහි අඩංගු වේ.

Preventing and responding to violence against children: Theory of Change, New York: UNICEF; 2017
ගැහැණු හා පිරිමි ළමයින්ටත්, නව යොවුන් පුද්ගලයන්ටත් එරෙහි ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේ හා එයට ප්‍රතිචාර දැක්වීමේ UNICEF ආයතනයේ කටයුතුවලට මාර්ගෝපදේශ සැපයීම සඳහා ප්‍රමුඛ හා බහු ආංශික වෙනස්වීමේ න්‍යායක් ඉදිරිපත් කරයි.

Global Guidance on Addressing School-related Gender-based Violence, Paris and New York: UNESCO and UN Women; 2016
පාසල සම්බන්ධ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය (SRGBV) පිළිබඳ පරිසමාප්ත, සියල්ල ඇතුළත් සම්පත් පද්ධතියක් සපයයි.

# පසු සටහන

[1] Hillis, S., Mercy, J., Amobi, A,, and Kress, H (2016) ) Global prevalence of past-year violence against children: a systematic review and minimum estimates. Pediatrics;137(3):e20154079.

[2] වයස අවුරුදු 18ට අඩු ඕනෑම පුද්ගලයකුට එරෙහි ප්‍රචණ්ඩත්වය

[3] ගැහැණු හා පිරිමි ළමයින් යන දෙකොටසම විසින් ළමා හා නවයොවුන් අපයෝජන සම්බන්ධ අත්දැකීම් ලැබිය හැකිය. පිරිමි ළමයින් මිනීමැරුම්වල වින්දිතයන් හා වැරදිකරුවන් වීමේ වැඩි අවදානමක් තිබේ. සමීප සම්බන්ධයක් පවත්වන වයස අවුරුදු 15 - 19 අතර සෑම ගැහැණු ළමයින් තුන්දෙනෙකුගෙන් එක් අයෙකුම කිසියම් දිනෙක චිත්තවේගී, ශාරීරික හෝ ලිංගික ප්‍රචණ්ඩත්ව අත්දැකීම් ලබා තිබෙන බව වාර්තා කර තිබේ. එය උප සහරා අප්‍රිකාවේ ඇතැම් කොටස්වලදී 50%කට ආසන්න වේ. නවයොවුන් වයස යනු (පිරිමි ළමයින් සඳහා) ලිංගික ප්‍රචණ්ඩත්වය සිදුකිරීම ආරම්භ කරන වයස වේ. එහෙත්, එම වයස එය වැළැක්වීම සඳහා ප්‍රවේශ කවුළුවක් ලෙස ද සැලකිය හැකිය. බලන්න:
Stoltenborgh, MA., van Ijzendoorn MH, Euser, E., Bakerman-Kranenburg,. MJ (2011) A global perspective on child sexual abuse: Meta-analysis of prevalence around the world. Child Maltreatment. 16:79–101; WHO (2015) Preventing Youth Violence: An Overview of the Evidence. Geneva: World Health Organization;

[4] Guedes, A. Bott, S., García-Moreno, C. and M. Colombini (2016) Bridging the gaps: a global review of intersections of violence against women and violence against children, Global Health Action, vol. 9, no. 10.

[5] Guedes, A. Bott, S., García-Moreno, C. and M. Colombini (2016) Ibid.

[6] Fulu E, McCook S, Falb K (2017) What Works Evidence Review: Intersections of violence against women and violence against children

[7] Kenny, L., Cislaghi, B. et al. (2019) Addressing Social Norms at the VAW/VAC Intersection Learning Group on Social Norms and Gender-related Harmful Practices Convened by the Gender, Violence and Health Centre (GVHC) of the London School of Hygiene & Tropical Medicine (LSHTM).

[8] UNICEF (2014) A Statistical Snapshot of Violence against Adolescent Girls. New York: United Nations Children's Fund

[9] Guedes, A. Bott, S., García-Moreno, C. and M. Colombini (2016) Ibid; Fulu E, McCook S, Falb K (2017) Ibid.

[10] Fulu E, McCook S, Falb K (2017) Ibid.

[11] Guedes, A. (2020) Personal communication - table shared for forthcoming paper

[12] Guedes, A. Bott, S., García-Moreno, C. and M. Colombini (2016) Ibid.

[13] Fulu E, McCook S, Falb K (2017) Ibid.

[14] Kerr Wilson A, Gibbs A, McAslan Fraser E, Ramsoomar L, Parke A, Khuwaja H and Jewkes R (2020) What Works to Prevent Violence against Women and Girls? A Rigorous Global Evidence Review of Interventions to Prevent Violence against Women and Girls, South Africa; What Works to Prevent VAWG

[15] DFID කාන්තාවන්ට හා ගැහැණු ළමයින්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේදී සාර්ථක වන්නේ කුමක්ද යන වැඩසටහන මත පදනම්ව RESPECT රාමුව දියත් කිරීමෙන් පසු මෙම වර්ග කිරීම යාවත්කාලීන කර තිබේ. ධනාත්මක ළමයින් හදාවඩාගැනීමේ මැදිහත්වීම් පිළිබඳ වැඩිදුර විස්තර සඳහා කරුණාකර බලන්න: Ker Wilson et al (2020)

[16] WHO (2013) Preventing Violence: Evaluating Outcomes of Parenting Programmes. Geneva: World Health Organization.

[17] Prosman, GJ., Lo Fo Wong, SH., van der Wouden, JC., Lagro-Janssen, AL (2015) Effectiveness of home visiting in reducing partner violence for families experiencing abuse: a systematic review, Family Practice. 32(3):247-56.

[18] Anderson, K, & van Ee, E (2018) Mothers and Children Exposed to Intimate Partner Violence: A Review of Treatment Interventions, International journal of environmental research and public health, 15(9), 1955.

[19] Doyle, K., Levtov, RG., Barker, G., Bastian, GG., Bingenheimer, JB., Kazimbaya, S & Shattuck D (2018) Gender-transformative Bandebereho couples' intervention to promote male engagement in reproductive and maternal health and violence prevention in Rwanda: Findings from a randomized controlled trial. PloS One, 13(4), e0192756

[20] Mathews, C., Eggers, SM., Townsend, L., Aarø LE, de Vries, PJ., Mason-Jones, AJ & Wubs, A (2016) Effects of PREPARE, a multi-component, school-based HIV and intimate partner violence (IPV) prevention Programme on adolescent sexual risk behaviour and IPV: Cluster randomised controlled trial. AIDS and Behavior, 20(9), 1821-1840.

[21] Mathews et al., (2016) Ibid.

[22] McFarlane, J., Karmalian, R. et al (2017) Preventing Peer Violence Against Children: Methods and Baseline Data of a Cluster Randomized Controlled Trial in Pakistan, Global Health: Science and Practice, 5(1): 115-137.

[23] What Works (2018) Right to Play: Preventing violence among and against children in schools in Hyderabad, Pakistan. Evidence Brief

[24] Kerr Wilson, A et al (2020) Ibid.

[25] UNICEF (2020) What works to prevent online and offline child sexual abuse and exploitation. A review of national education policies in East Asia and the Pacific. Bangkok.

[26] Eckenrode J, Ganzel B, Henderson CR Jr et al. Preventing child abuse and neglect with a program of nurse home visitation: the limiting effects of domestic violence. JAMA 2000; 284: 1385–91, cited in Prosman, GJ., Lo Fo Wong, SH., van der Wouden, JC., Lagro-Janssen, AL (2015) Effectiveness of home visiting in reducing partner violence for families experiencing abuse: a systematic review, Family Practice. 32(3):247-56.

[27] Kyegombe, N., Abramsky, T., Devries, K., Michau, L., Nakuti, J., Starmann, E., Musuya, T., Heise, L. & Watts, C. (2015) What is the potential for interventions designed to prevent violence against women to reduce children's exposure to violence? Findings from the SASA! study, Kampala, Uganda. Child abuse & neglect, 50. pp. 128-140.

[28] Kerr Wilson et al (2020) Ibid.

[29] Doyle K et al (2018) Ibid.

[30] Kerr Wilson et al (2020) Ibid.

[31] Jewkes, R., Willan, S., Heise, L., Washington, L., Shai, N., Kerr-Wilson, A, Christofides, N. (2020) Effective design and implementation elements in interventions to prevent violence against women and girls. What Works To Prevent VAWG? Global Programme Synthesis Product Series. South African Medical Research Council, Pretoria; Kerr Wilson et al (2020) Ibid.

[32] Prevention Collaborative (2019) Evidence Review: Parenting and caregiver support programmes to prevent and respond to violence in the home.

[33] Kerr Wilson et al (2020) Ibid.

[34] WHO (2009) Violence Prevention: The Evidence. Promoting gender equality to prevent violence against women. Geneva: WHO

[35] Siu GE, Wight D, Seeley J et al. (2017) Men's Involvement in a Parenting Programme to Reduce Child Maltreatment and Gender-Based Violence: Formative Evaluation in Uganda. Eur J Dev Res 29, 1017–1037.

[36] Kerr Wilson et al (2020) Ibid.

[37] Ligiero D, Hart C, Fulu E, Thomas A, & Radford L. (2019) What Works to Prevent Sexual Violence against Children: Evidence Review. Together for Girls. togetherforgirls.org/svsolutions

[38] Casillas KL, Fauchier A, Derkash BT, & Garrido EF (2016) Implementation of evidence-based home visiting programs aimed at reducing child maltreatment: A meta-analytic review. Child Abuse & Neglect, 53, 64-80

[39] Prevention Collaborative (2019) Ibid.

[40] Prosman et al. (2015) Ibid.

[41] Kerr Wilson et al (2020) Ibid.

[42] Ligiero et al (2019) Ibid.

[43] What Works (2018) Ibid.

[44] Wathen CN and HL MacMillan (2013) Children's exposure to intimate partner violence: impacts and interventions. Paediatric Child Health 18(8):419-422.

[45] Kerr Wilson et al (2020) Ibid.

[46] Kerr Wilson et al (2020) Ibid.

[47] WHO (2016) INSPIRE Framework: Seven strategies for ending violence against children. Geneva: World Health Organisation.

[48] Peterman, A., Neijhoft, A., Cook, S., & Palermo, T. M. (2017). Understanding the linkages between social safety nets and childhood violence: A review of the evidence from low- and middle-income countries. Health Policy and Planning, 32(7), 1049-1071;

[49] Rosenberg, M., Pettifor, A., Thirumurthy, H., Halpern, C. T., & Handa, S. (2014) The impact of a national poverty reduction program on the characteristics of sex partners among Kenyan adolescents. AIDS and Behavior, 18(2), 311-316; Buller, A. M., Peterman, A., Ranganathan, M., Bleile, A., Hidrobo, M., & Heise, L. (2018) A mixed-method review of cash transfers and intimate partner violence in lowand middle-income countries. UNICEF Office of Research Innocenti Working Paper.

[50] WHO (2016) INSPIRE: Seven Strategies for Ending Violence against Children, Geneva: World Health Organisation; Cancian M, Yang M, Slack KS. (2013) The effect of additional child support income on the risk of child maltreatment. Social Service Review.87(3): 417–37; Huston AC, Miller C, Richburg-Hayes L, Duncan GJ, Eldred CA, Weisner TS et al. (2003) New hope for families and children: five year results of a program to reduce poverty and reform welfare. New York: Manpower Demonstration Research Corporation. 117; Ozer EJ, Fernald LCH, Manley JG, Gertler PJ. (2009) Effects of a conditional cash transfer program on children's behavior problems. Pediatrics. 123:e630–7

[51] Ligiero D, Hart C, Fulu E, Thomas A, & Radford L. (2019) Ibid.

[52] What Works (2018) Ibid.

[53] Fulu et al (2017) Ibid.

[54] https://www.who.int/violence_injury_prevention/violence/child/PLH_Infants/en/

[55] WHO (2016) Ibid.

**© UN Women 2020**

මෙම ලේඛනය **RESPECT ව්‍යුහයේ ක්‍රියාත්මක කිරීමේ මාර්ගෝපදේශයේ** කොටසකි. එය එක්සත් ජාතීන්ගේ කාන්තා ඒකකයේ අනුග්‍රහය මත Social Development Direct විසින් සංවර්ධනය කරන ලදී. එය මෙතැනින් ලබාගත හැකිය.

**Suggested citation:** UN Women and Social Development Direct (2020) Child and Adolescent Abuse Prevented, RESPECT: Preventing Violence against Women Strategy Summary.

RESPECT

WOMEN

# මූලෝපාය සාරාංශය

## ආකල්ප, විශ්වාස සහ සමාජ සම්මතයන් වෙනස් කිරීම

(Transformed attitudes, beliefs and norms)

UN WOMEN

World Health Organization

# අර්ථ නිරූපණ

**විශ්වාස** = ලෝකය පිළිබඳ පුද්ගලයන්ගේ පිළිගැනීම්
(උදා:කාන්තාවන්ට ස්වාභාවිකවම පිරිමින් විසින් මගපෙන්විය යුතු බව)

**වටිනාකම්** = පුද්ගලයකු වැදගත් යයි සලකන ගුණාංග. බොහෝවිට මේවා කාලයෙන් තොරව ගෝලීයව පිළිගත් ඒවාය
(උදා: සමානාත්මතාව, අවංකබව, පක්ෂපාතීත්වය)

**ආකල්ප** = පුද්ගලයකු තම විශ්වාසයන් හා වටිනාකම් ලෝකය තුළ සන්නිවේදනය කරන හා ප්‍රකාශ කරන අකාරය
(උදා: මගේ බිරිඳ වෙනුවෙන් මා තීරණ ගැනීම නිවැරදිය)

**ඒකාකෘති** = කණ්ඩායමක වටිනාකම්, ආකල්ප සහ චර්යාවන් සම්බන්ධයෙන් පුළුල්ව පිළිගත් අපේක්ෂා
(උදා: කාන්තාවන්ට පිරිමින්ට තරම් හැකියාවන් නොමැත)

**චර්යා** = පුද්ගලයකු සැබැවින්ම කරන දෙය. ඒවා බොහෝ විට ඔවුන්ගේ විශ්වාසයන් සහ වටිනාකම් සමග සමපාත වෙයි. එහෙත්, හැමවිටම නොවේ.

**සමාජ සම්මතයන්** = සාමාන්‍ය තත්වය හා සංස්කෘතික හෝ සමාජ කණ්ඩායමක යෝග්‍ය තත්වය පිළිබඳ පොදු විශ්වාසය
(උදා: පිරිමියෙකුට කාන්තාවක විනයගත ක හැකිය)

# ආකල්ප, විශ්වාස සහ සමාජ සම්මතයන් වෙනස් කිරීම

**මූලෝපායේ අරමුණ:** සමාජභාවී සමානාත්මතාව ප්‍රවර්ධනය කරන, පිරිමි බලයට සහ වරප්‍රසාදවලට අභියෝග කරන, වෙනස්කම් හා කාන්තාවන් යටත් කරන සමාජ සම්මතයන්ට අභියෝග කරන, කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය හෙළාදකින ධනාත්මක ආකල්ප, විශ්වාසයන් සහ සමාජ සම්මතයන් ප්‍රවර්ධනය කිරීම.

## තාර්කිකත්වය

සමාජභාවී වශයෙන් අසමාන ආකල්ප, විශ්වාසයන් සහ සමාජ සම්මතයන් යනු කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය ධාවනය කරන බලවත් සාධක වේ. පිරිමියකු හෝ කාන්තාවක වීම, නිවසේ, ප්‍රජාවේ හ පුළුල් පොදු ජීවිතයේ අසමාන සමජභාවී භූමිකාවන්, ප්‍රචණ්ඩත්වයට දිරිදෙන ආකල්ප සහ එය පවුලේ කාරණයක් බවට තර්ක කිරීම සමග සම්බන්ධ පුද්ගල විශ්වාසයන් හා සමාජ සම්මතයන් මේවාට අයත් වේ (1 රූපය බලන්න). වෙනත් ස්වරූපවල වෙනස්කොට සැලකීම්වලට අදාළ වන ජාතිවාදය, සමලිංගික භීතිකාව සහ පන්ති භේදය වැනි ආකල්ප, විශ්වාසයන් සහ සමාජ සම්මතයන් ද එයට අයත් විය හැකිය. සුබවාදී ආකල්ප, විශ්වාසයන් සහ සමාජ සම්මතයන් ප්‍රවර්ධනය කිරීමේ ප්‍රයත්නයන් දිගුකාලීන ලෙස තිරසරව කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය අඩුකිරීම, සමාජභාවී සමානාත්මතාව සාක්ෂාත් කරගැනීම සහ ප්‍රීතිමත්, සෞඛ්‍ය සම්පන්න, ආරක්ෂිත ප්‍රජාවන් නිර්මාණය කිරීම සඳහා අත්‍යවශ්‍ය වේ.

**1 රූපය: කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සාධාරණීකරණය හා තිරසර කරන පුද්ගල විශ්වාසයන් හා සමාජ සම්මතයන්**

| විශ්වාස/ සමාජ සම්මත වර්ගය | නිශ්චිත විශ්වාසයන් හා සමාජ සම්මතයන් සඳහා උදාහරණ |
|---|---|
| පුරුෂාධිපත්‍යය හා ස්ත්‍රීත්වය සම්බන්ධ පරමාදර්ශ | පුරුෂාධිපත්‍යය හා කාන්තා යටහත්භාවය<br>පිරිමි ලිංගික හිමිකම් (විවාහය තුළ/ ඉන් පිටත)<br>විවාහය තෙක් කාන්තාවන් කන්‍යාවන් විය යුතු බව සහ විවාහයෙන් බාහිර ලිංගික සම්බන්ධතා නොපැවැත්විය යුතු බව<br>පිරිමින් රළු විය යුතු බව හා කාන්තා හැසිරීම් පාලනය කළ යුතු බව<br>කාන්තාවන්ගේ වටිනාකම් සම්බන්ධ වන්නේ විවාහය හා දරුවන් හැදීම මත බව<br>දික්කසාද, වැන්දඹු, තනිකඩ සහ සරුභාවය නොමැති කාන්තාවන් පිළිකුල් කිරීම |
| දැඩි සමාජභාවී භූමිකා | පිරිමින් ගෘහ මූලිකයන් වන අතර ප්‍රධාන තීරකයෝය.<br>දැඩි ලෙස සමාජභාවී වන ශ්‍රම විභජනය - පිරිමින් සපයන්නන් ලෙස හා කාන්තාවන් සත්කාරකයන් ලෙස<br>ගෘහ ආදායම හා දේපළ සම්බන්ධයෙන් පිරිමින්ගේ අධිකාරී බලය<br>බිරියන් සැමියන්ට කීකරු විය යුතු බව |
| කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය භාරගැනීම | කාන්තාවන් විනයගත කිරීම පිරිමින්ගේ භූමිකාවන් අතර වේ.<br>ප්‍රචණ්ඩත්වය විනයගත කිරීමේ සාධාරණ ක්‍රමයකි.<br>ප්‍රචණ්ඩත්වය ගැටුම් විසඳීමේ සාධාරණ ක්‍රමයකි.<br>ප්‍රචණ්ඩත්වය පුද්ගල හා පවුල් ගරුත්වය ආරක්ෂා කිරීමේදී සාධාරණය. |
| පවුලේ පෞද්ගලිකත්වය | ප්‍රචණ්ඩත්වය හෙළිදරව් වීම පවුලේ ගෞරවයට තර්ජනයකි.<br>වෙනත් අය පවුලේ කාරණාවලට අත නොපෙවිය යුතුය.<br>ප්‍රචණ්ඩත්වය හෙළිදරව් කරන කාන්තාවන් පවුලට කරන්නේ අගෞරවයකි. |

## මූලෝපාය සාරාංශය

### අවදානම් සහ ආරක්ෂක සාධක

මෙම මූලෝපාය විසින් පහත දැක්වෙන අවදානම් සාධක සම්බන්ධයෙන් කටයුතු කිරීමට ඉලක්ක කරයි. කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන් පහත දැක්වෙන ආරක්ෂණ සාධක ප්‍රවර්ධනය කරයි.

| මට්ටම | අවදානම් සාධක | ආරක්ෂණ සාධක |
|---|---|---|
| **පුද්ගල** | ප්‍රචණ්ඩත්වය සාමාන්‍ය දෙයක් ලෙස සාධාරණීකරණය කරන ආකල්ප (කාන්තා සහ පිරිමි)<br>කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය පිළිබඳ දැනුම අඩුවීම - නීති, ප්‍රතිපත්ති සහ වාර්තාකරන පටිපාටි ඇතුළු (කාන්තා සහ පිරිමි) | සමාජභාවී වශයෙන් සාධාරණ ආකල්ප (පිරිමි සහ කාන්තා)<br>කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වැළැක්වීම සඳහා ක්‍රියාකිරීමේ දැනුවත්භාවය සහ කුසලතා (පිරිමි සහ කාන්තා) |
| **අන්තර් පුද්ගල** | දුර්වල සන්නිවේදනය, අකාර්යක්ෂම ගැටුම් නිරාකරණය සහ ගැටලු විසඳීමේ කුසලතා<br>සමීප සහකරු හා නීතිමය ඥාති සම්බන්ධතාවලදී ඉහළ මට්ටමේ අසමානතාව | ප්‍රචණ්ඩත්වය අවම කිරීමට හේතුවන සම්බන්ධතා කුසලතා (උදා: ගැටුම් නිරාකරණය, සන්නිවේදනය)<br>සමාජභාවී සමානාත්මතාව ලක්ෂණයක් වන සම්බන්ධතා කුසලතා - තීරණ ගැනීමේ හා පවුල් වගකීම් මෙයට අයත් වේ. |
| **ප්‍රජා** | පිරිමින්ගේ වරප්‍රසාදිත තත්වය ප්‍රවර්ධනය කරන, කාන්තාවන්ගේ ස්වාධිපත්‍යය සීමාකරන හානිකර සමාජභාවී සමාජ සම්මතයන් | අහිංසාව සහ සමාජභාවී සාධාරණ සම්බන්ධතාවලට සහාය වන සහ කාන්තාවන් සවිබලගැන්වීම දිරිගන්වන සමාජ සම්මතයන් |

**1 කොටුව: සමාජ සම්මතයන් යනු මොනවාද? එමගින් කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය පාලනය වන්නේ කෙසේද?**

**සමාජ සම්මතයන් යනු**, කිසියම් 'යොමු කණ්ඩායමකට' (යම් පුද්ගලයකුගේ අපේක්ෂාවන්ට බලපාන අවිධිමත් හෝ සංවිධිත සමාජ හා සංස්කෘතික කණ්ඩායම් හෝ ජාල) **සාමාන්‍ය සහ යෝග්‍ය තත්වය සම්බන්ධයෙන් පොදු විශ්වාසයන් වේ**.

**සමාජ සම්මතයන් අනිවාර්යයෙන්ම පුද්ගල ආකල්ප සහ විශ්වාසයන් සමග සම්බන්ධ වන්නේ නැත**. එමගින් නිර්මාණය කරනු ලබන සමාජ අපේක්ෂා පුද්ගල චර්යාවන් හසුරුවන ප්‍රබල සාධකයක් විය හැකිය. කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය පිළිබඳ පුද්ගල දැනුමේ හා ආකල්පවල වර්ධනයන් මගින් අනිවාර්යයෙන්ම ප්‍රචණ්ඩත්වය සිදුකිරීම සම්බන්ධ චර්යාවන්ගේ වෙනසක් සහ සිදු නොවන්නේ ඇයිද යන්න පැහැදිලි කරනු ලැබේ. පුද්ගලයන්ගේ චර්යාවන් ඔවුන්ගේ ආකල්පවලට පෙර වෙනස් විය හැකිය. ආකල්ප සහ චර්යාවන් යන දෙකම යහපත් අන්දමින් වෙනස් වීම අපේක්ෂා කරන නමුදු එම වෙනස සිදුවන ක්‍රියාවලිය රේඛීය නොවේ.


**සමාජ සම්මතයන් ගතික වන අතර වෙනස් විය හැකිය**. ප්‍රමාණවත් තරම් සංඛ්‍යාවකට වෙනස් අන්දමින් හැසිරීම සඳහා බලපෑමක් සිදුවේ නම්, කිසියම් හැරවුම් ස්ථානයක් හමුවිය හැකිය. එහිදී සාමාන්‍ය චර්යාවක් ලෙස පිළිගැනුණු දෙය වෙනස් වීමට ලක්විය හැකිය. මිථ්‍යාවන් පරාජය කිරීම හා පුද්ගලයකුගේ දැක්ම යථාර්ථය නොවන බව පෙන්වාදීම ද මෙහිදී ප්‍රයෝජනවත් විය හැකිය.

මූලෝපාය සාරාංශය

### වෙනස් කිරීමේ න්‍යාය

සමාජභාවී සමානාත්මතාව සහ කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සම්බන්ධ ආකල්ප, විශ්වාසයන් සහ සමාජ සම්මතයන් වෙනස් කිරීම සඳහා සාක්ෂි මත පදනම් වූ මැදිහත්වීම් උදෙසා සරල කරන ලද වෙනස් කිරීමේ න්‍යායක් පහත දැක්වෙන රූපසටහන විසින් ඉදිරිපත් කරනු ලැබේ. ඒ සඳහා විශේෂිත වැඩසටහන් වැඩිදුර සංවර්ධනය කිරීම හා අනුරූප කරගැනීම අවශ්‍යය.

## T: ආකල්ප, විශ්වාස සහ සමාජ සම්මතයන් වෙනස් කිරීම



## මැදිහත්වීම් වර්ග

ඉහළ ආදායම් රටවල (HICs), අඩු සහ මැදි ආදායම් රටවල (LMICs) සමාජභාවය, බලය සහ කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය ආශ්‍රිතව අධිපති සමාජ සම්මතයන් හා සම්බන්ධව පුද්ගල විශ්වාසයන්, ආකල්ප සහ චර්යාවන් වෙනස්කිරීම සඳහා විවිධ මැදිහත්වීම් රැසක් ක්‍රියාත්මක කර තිබේ. RESPECT ව්‍යුහයෙහි අවධාරණය කර තිබෙන ප්‍රධාන මැදිහත්වීම් වර්ග වගුව විසින් විස්තර කරනු ලැබේ. වර්තමාන සාක්ෂි[1] පදනම සහ උදාහරණ වැඩසටහන් ද එහි සංක්ෂිප්තව දැක්වේ. තිබෙන අවස්ථාවලදී, LMIC රටවල වැඩසටහන් උදාහරණ ප්‍රමුඛ ලෙස දක්වා තිබේ.

යතුර

- ● **බලාපොරොත්තු සහගත,** <1 පරිණාමය විසින් ප්‍රචණ්ඩත්ව ප්‍රතිඵලවල සැලකියයුතු අඩුවීමක් පෙන්නුම් කරනු ලැබේ.
- ■ **වැඩිදුර සාක්ෂි අවශ්‍යය,** <1 පරිණාමය විසින් ප්‍රචණ්ඩත්වය සම්බන්ධ මධ්‍යකාලීන ප්‍රතිඵලවල වර්ධනයක් පෙන්නුම් කරයි.
- ◆ **ගැටලු සහගත** - පරිණාමය විසින් ප්‍රචණ්ඩත්වය අවම කිරීම සම්බන්ධයෙන් පෙන්නුම් කරන්නේ එකිනෙකට පරස්පර ප්‍රතිඵලය.
- □ **සාක්ෂි නොමැත** - මැදිහත්වීම තවමත් එතරම් බැරෑරුම් ලෙස පරිණාමය වී නැත.
- ▼ **අකාර්යක්ෂම,** <1 පරිණාමය විසින් ප්‍රචණ්ඩත්ව ප්‍රතිඵලවල අඩුවීමක් පෙන්නුම් කරනු නොලැබේ.
- H ලෝක බැංකුවේ ඉහළ ආදායම් රටවල් (HIC)
- L ලෝක බැංකුවේ පහළ හා මැදි ආදායම් රටවල් (LMIC)

| මැදිහත්වීම් වර්ගය | විස්තරය | | කාර්යක්ෂමතාවේ සාක්ෂි | උදාහරණ වැඩසටහන් |
|---|---|---|---|---|
| **ප්‍රජා ක්‍රියාකාරීත්වය/ එළඹුම් බලමුළුගැන්වීම** | මෙම මූලෝපාය යටතේ වඩාත්ම කාර්යක්ෂම එළඹුමට ප්‍රජා ක්‍රියාකාරීත්වය/ එළඹුම් බලමුළුගැන්වීම අයත් වේ. ස්වේච්ඡා 'ප්‍රජා ක්‍රියාකාරකම්' මෙම එළඹුම සමග සම්බන්ධ වේ. එම ස්වේච්ඡා ප්‍රජා ක්‍රියාකාරකම් සිදුවන්නේ මෙම ප්‍රජාවන් තුළ ජීවත් වන හා වැඩකරන, ප්‍රජාවේ පිරිමින් සහ කාන්තාවන් සමග මම සම්බන්ධ හානිකර සමාජ සම්මතයන් සහ ආකල්පවලට අභියෝග කිරීම සඳහා අවිධිමත් ක්‍රියාකාරකම් ඔස්සේ සම්බන්ධ වීමට පුහුණුව සහ සහාය ලද අයයි. ආගමික හා සම්ප්‍රදායික නායකයන්, පොලිසිය, සෞඛ්‍ය සහ සමාජ සේවා අංශවල ප්‍රධාන ජනමත නායකයන් සමග ද මෙම එළඹුම් සම්බන්ධ වේ. එමගින් සමාජ සම්මතයන්ට බලපෑම් කරනු ලබන අතර දිවි ගලවාගත් පුද්ගලයන් වෙනුවෙන් ප්‍රාදේශීය මට්ටමේ ප්‍රතිචාරාත්මක සේවා ශක්තිමත් කරනු ලැබේ. | L (●)<br><br>H (□) | මනාව සැලසුම් කරන ලද, බහු වාර්ෂිකව ක්‍රියාත්මක කරන ලද මෙම වර්ගයේ මැදිහත්වීම් මගින් ප්‍රජා මට්ටමේ ශාරීරික සහ ලිංගික සමීප සහකරු ප්‍රචණ්ඩත්වය අඩුකිරීම සඳහා වැඩසටහන් කාල රාමුව තුළදී කටයුතු කළ හැකි බව LMIC රටවලින් **බලපොරොත්තු සහගත සාක්ෂි** ලැබී තිබේ.[2]<br><br>ප්‍රජා ක්‍රියාකාරකම්/ බලමුළුගැන්වීම් එළඹුම් වඩාත්ම සාර්ථක වන්නේ ඒවාට අධි තීව්‍රතාවකින් යුක්ත සම්පාදනයක්, ප්‍රජාවන්ගේ හරස්කඩක සම්බන්ධ වීමක් සහ අවිධිමත් ක්‍රියාකාරකම් සම්බන්ධ වීමක් තිබේ නම් බව සාක්ෂි මගින් පෙනේ. එමගින් විචාරාත්මක ලෙස ගැඹුරින් සලකා බැලීම හා සාකච්ඡා කිරීම පුබුදු කරවන අවිධිමත් ක්‍රියාකාරකම් නිර්මාණය වන බව ද සාක්ෂි විසින් පෙන්වාදෙනු ලැබේ.[3]<br><br>මෙම මැදිහත්වීම් තවමත් ගැඹුරින් ඇගයීමට ලක්කර නැති බැවින් HIC රටවලින් **සාක්ෂි ලැබී නැත**. | SASA! (රටවල් 25+)<br><br>SHARE (උගන්ඩාව)<br><br>COMBAT (ඝානාව) |

| **මැදිහත්වීම් වර්ගය** | **විස්තරය** | **කාර්යක්ෂමතාවේ සාක්ෂි** | | **උදාහරණ වැඩසටහන්** |
|---|---|---|---|---|
| **ආකල්ප සහ සමාජ සම්මතයන්ගේ වෙනස්කම් ප්‍රවර්ධනය කිරීම සඳහා වන පිරිමි සහ කාන්තා කණ්ඩායම් පාදක වැඩමුළු** | පිරිමින්, කාන්තාවන්, පිරිමි ළමයින් සහ ගැහැණු ළමයින් ඇතුළත් කුඩා සම කණ්ඩායම් වැඩමුළු මෙම එළඹුමට අයත් වේ. ඒවායේ අරමුණ විශ්වාසයන්, ආකල්ප සහ චර්යාවන් වර්ධනය කිරීමයි. සමාජභාවය, බලය සම කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වටා නිර්මාණය වන සාකච්ඡාවලට සහභාගී වන්නන් බැඳීරුම් ලෙස සම්බන්ධ කරගන්නා සහභාගීත්ව සාමූහික අධ්‍යාපනික එළඹුම් ඒවායේ සාමාන්‍යයෙන් අන්තර්ගත වේ. මෙම එළඹුම් මගින් පුළුල් ප්‍රජා වෙනස්කම්වලට බලපෑම් කිරීම සඳහා කුඩා පුද්ගල කණ්ඩායම්වලට කුසලතා හා විශ්වාසය ලබාදිය හැකිය.[4] | L<br><br>H | පිරිමින් සහ කාන්තාවන් සමග කරනු ලබන තීව්‍ර සමූහ පාදක වැඩමුළු මගින් ඉලක්ක කරනු ලබන අයගේ කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය පැවැත්ම අඩුකිරීම ඇතුළු පුද්ගල ආකල්ප සහ චර්යාවන් වැඩිදියුණු කළ හැකි බවට LMIC රටවලින් **බලාපොරොත්තු සහගත සාක්ෂි** ලැබී තිබේ. HIC රටවලින් **වැඩිදුර සාක්ෂි අවශ්‍යය**.<br><br>සාක්ෂි මගින් යෝජනා කරනු ලබන්නේ මෙම එළඹුව් වඩාත් සාර්ථක වන්නේ ඒවා පිරිමින්, කාන්තාවන්, පිරිමි ළමයින් සහ ගැහැණු ළමයින් සමග ඒකාබද්ධ කළ විට බවයි. ඒ යුවල ලෙස හෝ සම්බන්ධීකරණය කරන ලද සම කණ්ඩායම් අධ්‍යාපන ක්‍රියාකාරකම් ලෙයසි. ඒවා සාමාන්‍යයෙන් සාර්ථක වන්නේ වෙන වෙනම වන අතර පසුව ඒකාබද්ධ කළ හැකිය. (වැඩිදුර විස්තර සඳහා බලන්න:**Relationships Skills Strengthened RESPECT Strategy Summary).** | Stepping Stones<br><br>The Indashyikirwa programme (යුවල උපාංගය) (රුවන්ඩාව)<br><br>Transforming Masculinities (DRC) |
| **පිරිමින් සහ පිරිමි ළමයින් සමග ආකල්ප හා සමාජ සම්මතයන් වෙනස් කිරීමේ සමූහ අධ්‍යාපනය** | මෙම එළඹුම සාර්ථක වන්නේ පිරිමින් සහ පිරිමි ළමයින් පමණක් සමගය (එනම්, එයට කාන්තාවන් සහ ගැහැණු ළමයින් සම්බන්ධ කර නොගත යුතුය). එහි අරමුණ වන්නේ, පිරිමින් කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සිදුකිරීම අඩුකිරීම සඳහා සමාජභාවී වශයෙන් සාධාරණ ආකල්ප, සමාජ සම්මතයන් සහ චර්යාවන් ප්‍රවර්ධනය කිරීමයි. ඒ සඳහා සාමාන්‍යයෙන් සහභාගීත්ව සමූහ අධ්‍යාපනික එළඹුම් භාවිතා කරනු ලැබේ. පුරුෂාධිපත්‍යය සහ අසමාන සමාජභාවී ආකල්ප සහ චර්යාවන් මෙන්ම ප්‍රචණ්ඩත්වය භාවිතා කිරීම පිළිබඳ සංකල්ප ද සාකච්ඡා කරනු ලැබේ. | L<br><br>H | LMIC රටවලින් ලැබී තිබෙන සාක්ෂි මගින් නිරූපණය වන්නේ පිරිමින් සහ පිරිමි ළමයින් සමග පමණක් වැඩකිරීම ප්‍රචණ්ඩත්ව ප්‍රතිඵල අඩුකිරීම සම්බන්ධයෙන් ඵලදායී නොවන බවයි. HIC රටවලින් වැඩිදුර සාක්ෂි අවශ්‍යය.<br><br>සාක්ෂි මගින් යෝජනා කරන පරිදි, පිරිමින් සහ කාන්තාවන් සමග (සහ පිරිමි ළමයින් සහ ගැහැණු ළමයින් සමග) වැඩකිරීම ප්‍රචණ්ඩත්වය අඩු කිරීමේදී තනි ලිංගික මැදිහත්වීම්වලට වඩා ඵලදායී වේ.[5] | Yaari Dosti (ඉන්දියාව)<br><br>ඉතියෝපියානු පිරිමි සමාජ සම්මත මුලපිරුම (ඉතියෝපියාව) |

| මැදිහත්වීම් වර්ගය | විස්තරය | | කාර්යක්ෂමතාවේ සාක්ෂි | උදාහරණ වැඩසටහන් |
|---|---|---|---|---|
| **සමාජ වෙළඳපොළ ක්‍රියාමාලා හෝ 'විනෝද අධ්‍යාපනික' එළඹුම් සහ සමූහ අධ්‍යාපනය** | මෙම එළඹුම විසින් ජනප්‍රිය විනෝදාස්වාද මාධ්‍ය (රූපවාහිනී සහ රේඩියෝ වැනි) සමග පණිවුඩ ඒකාබද්ධ කරනු ලැබේ. ඒ සමග කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය අඩුකිරීම සඳහා මුහුණට මුහුණ අධ්‍යාපනික වැඩසටහන් පැවැත්වේ. | H | සමාජ වෙළඳපොළ ක්‍රියාමාලා හෝ 'විනෝද අධ්‍යාපනික' එළඹුම් සහ සමූහ අධ්‍යාපනය හරහා පමණක් කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය මට්ටම් අඩුකිරීම සම්බන්ධයෙන් LMIC සහ HIC රටවලින් වැඩිදුර සාක්ෂි අවශ්‍යය.[6] | Bell Bajao (ඉන්දියාව)<br>Soul City (දකුණු අප්‍රිකාව)<br>Sexto Sentido (නිකරගුවාව) |
| | | L | කෙසේ වෙතත්, මනාව සැලසුම් කරන ලද ක්‍රියාමාලා සහ එළඹුම් ප්‍රජා ක්‍රියාකාරීත්වය/ බලමුළුගැන්වීම හෝ කණ්ඩායම් පාදක වැඩමුළු සමග දිගුකාලයක් (අවුරුදු 20 වැඩි) ක්‍රියාත්මක කිරීම මගින් වැදගත් භූමිකාවක් ඉටුවේ. එය සිදුකරනුයේ විශේෂයෙන්ම ප්‍රජා මට්ටම සමග සම්බන්ධව කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය පිළිග ැනීම හා පුද්ගල ආකල්ප වෙනස් කිරීම සම්බන්ධව දැනුම වැඩිකිරීම හා සංවාද නිර්මාණය කිරීම සඳහාය.[7] | |
| **තනි දැනුවත් කිරීමේ ක්‍රියාමාලා** | මෙම එළඹුම විසින් ඉලක්ක කරනු ලබන්නේ ජන සන්නිවේදනය (රූපවාහිනිය, රේඩියෝව, දැන්වීම් පුවරු, අන්තර්ජාලය) හරහා කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය පිළිබඳ දැනුවත්භාවය ඉහළ නැංවීමයි. කෙසේ වෙතත්, ඉහත දක්වන ලද එළඹුම් කුමක් වෙතත්, එයට පුද්ගලයන් හෝ ප්‍රජාවන් සමග මීට වඩා තීව්‍ර කාර්යයන් අයත් වන්නේ නැත. | L<br>H | LMIC සහ HIC රටවලින් ලැබී ඇති සාක්ෂි මගින් යෝජනා කරන පරිදි තනි දැනුවත් කිරීමේ ක්‍රියාමාලා කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය අඩුකිරීම සම්බන්ධයෙන් ගත්කල ඵලදායී නැත. සාමාන්‍යයෙන් කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය පිළිබඳ දැනුවත් කිරීම සඳහා ජනසන්නිවේදන මාධ්‍ය භාවිතා කරන මෙම වැඩසටහන්වලට මහා පරිමාණ ජනගහනයකට ළඟාවීමේ හැකියාව තිබේ. එසේම ජනප්‍රිය ද විය හැකිය.[8] | වාර්ෂිකව එක් වරක් පමණක් ජාතිකව පැවැත්වෙන ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වයට එරෙහි 16 දින ක්‍රියාකාරීත්වය (දැනුවත් කිරීම පමණක් ඉලක්ක කරන ඒවා) |

## උදාහරණ වැඩසටහන්

ආකල්ප, විශ්වාසයන් සහ සමාජ සම්මතයන් වෙනස් කිරීමෙහි සහ වැඩසටහන් කාර්යරාමුව තුළ කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය අඩුකරීමෙහිලා ඉවහල් වන වැඩසටහන් තුනක් පහත වගුවෙහි සාරාංශ කර දැක්වේ. මෙම වගුව 11 පිටුවෙහි තිබෙන **සැලසුම් හා ක්‍රියාත්මක කිරීමේ පිරික්සුම් ලැයිස්තුව** සහ RESPECT ව්‍යුහය සමග ලබාදී තිබෙන **ඵලදායී වැඩසටහන්කරණයේ මාර්ගෝපදේශ මූලධර්ම** සමග සමාලෝචනය කළ යුතුය. සෑම වැඩසටහනක් ගැනම වඩා සවිස්තර තොරතුරු **වැඩසටහන් සාරාංශවල** සපයා තිබේ.

| වැඩසටහන | විස්තරය | ස්ථානය | ඉලක්ක ජනගහනය | මූලික ක්‍රියාකාරකම් | කාල පරිච්ඡේදය | ඇගයීම හා බලපෑම |
|---|---|---|---|---|---|---|
| SASA! | සමාජභාවී අසමානතාව, කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සහ කාන්තාවන් වැඩියෙන් එච්අයිවී අවදානමට ලක්වීම පවත්වාගෙන යාමට හේතු වන සමාජ සම්මතයන් හා චර්යාවන් ප්‍රජා නායකත්වයෙන් වෙනස් කිරීම සඳහා වන ප්‍රජා බලමුළුගැන්වීමේ එළඹුමකි. | සෑම කලාපයකම රටවල් 25කට වැඩි ගණනක් | ප්‍රචණ්ඩත්වය, බලය සහ අයිතිවාසිකම් සම්බන්ධ ප්‍රශ්න පිළිබඳ උනන්දුවක් දක්වන කාන්තාවන්ගෙන් සහ පිරිමින්ගෙන් සැදුම් ලද ප්‍රජා ක්‍රියාකාරිකයන්.<br><br>පළාත් පාලන සහ සංස්කෘතික නායකයන් ඇතුළු ප්‍රජා නායකයන්, ආයතනික නායකයන්, වෘත්තිකයන් මෙන්ම වෙනත් ප්‍රජා සාමාජිකයන්. | කාර්ය මණ්ඩලය පුහුණු කර එළඹුම අභ්‍යන්තර කරගැනීම හා ක්‍රියාත්මක කිරීම සඳහා කාලය ලබාදෙනු ලැබේ. දේශීය ක්‍රියාධරයන් ගැඹුරු පුහුණුවකට සහභාගී වන අතර අවිධිමත් ක්‍රියාකාරකම් ප්‍රජා මට්ටමෙන් ක්‍රියාත්මක කිරීම සඳහා මගපෙන්වීම ලබාදෙයි.<br><br>ප්‍රජාවක් තුළ විවිධ ජන පරාසයන් වෙත ළඟාවීම සඳහා බහුවිධ මූලෝපායන් භාවිතා කරනු ලැබේ. ප්‍රාදේශීය ක්‍රියාකාරීත්වය, මාධ්‍ය හා උද්දේශනය සහ සන්නිවේදන මෙවලම් එයට අයත් වේ.<br><br>SASA! Activist Kit[9] සංවිධානය කර තිබෙන්නේ සැලසුම් කර තිබෙන අදියර සඳහාය. දේශීය සංවිධායකයන්ට එය ඵලදායී හා විධිමත් ආකාරයෙන් භාවිතා කර ප්‍රජා මට්ටමේ වෙනස් කිරීමේ ක්‍රියාවලියක් මෙහෙයවිය හැකිය. | අවුරුදු 3+ | **ඇගයීම් ස්වරූපය:** සසම්භාවී පාලක පරීක්ෂණය (RCT)[10]<br><br>**බලපෑම:** මැදිහත්වීම මගින් සමීප සහකරු ප්‍රචණ්ඩත්වය භාරගන්නා ආකල්පවල කැපීපෙනෙන අඩුවීමක් සිදුවිය. කාන්තාවන් සමීප සහකරු ප්‍රචණ්ඩත්වයේ අත්දැකීම් ලැබීම ද කැපීපෙනෙන ලෙස අඩුවිය. |

| වැඩසටහන | විස්තරය | ස්ථානය | ඉලක්ක ජනගහනය | මූලික ක්‍රියාකාරකම් | කාල පරිච්ඡේදය | ඇගයීම හා බලපෑම |
|---|---|---|---|---|---|---|
| **ප්‍රජා පාදක ක්‍රියාකාරී කණ්ඩායම් (COMBAT) හරහා ප්‍රජා පාදක ග්‍රාමීය ප්‍රතිචාර මූලෝපාය (RRS)** | ඝානාවේ කාන්තාවන්ට හා ගැහැණු ළමයින්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සිදුවීම අඩුකරන ප්‍රජා බලමුළුගැන්වීමේ එළඹුමකි. රාජ්‍ය සහ ප්‍රජා පාදක ව්‍යුහයන් ඔස්සේ කාන්තා අයිතිවාසිකම් ආරක්ෂා කරනු ලැබේ. | ඝානා | දේශීය පිරිමින්ගෙන් සහ කාන්තාවන්ගෙන් සමන්විත ප්‍රජා පාදක ක්‍රියාකාරී කණ්ඩායම් (COMBATs).<br><br>කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය ප්‍රතිචාර කටයුතුවල නියුතු ආගමික හා සම්ප්‍රදායික නායකයන්, රාජ්‍ය නියෝජිතායතන ඇතුළු ප්‍රජා පාර්ශ්වකරුවන් සහ වෙනත් ප්‍රජා සාමාජිකයන්. | ප්‍රජා පාදක ක්‍රියාකාරී කණ්ඩායම් පරිස්සමෙන් තෝරාගනු ලබන අතර, පුළුල් ප්‍රජාව කෙරෙහි සංවේදී කිරීම පිණිස පුහුණු කරනු ලැබේ. ඔවුන්ට දැඩි ලෙස අවශ්‍ය දිවි ගලවාගත් පුද්ගලයන් සඳහා වන උපදේශනය, සහාය සහ යොමුකිරීම් තොරතුරු සපයනු ලැබේ.<br><br>COMBATs සහභාගීත්ව ක්‍රමයට චරිත රංගන, නාට්‍ය හා දෙබස් අයත් වේ. එහි අරමුණ ප්‍රජා සාමාජිකයන් හට ප්‍රජා රැස්වීම් සහ වෙනත් සමාජ ගොනුවීම් හරහා අධ්‍යාපනය ලබාදීම හා ඔවුන් සංවේදී කිරීමයි. | අවුරුදු 2+ | **ඇගයීම් ස්වරූපය:** අර්ධ පරීක්ෂණාත්මක<br><br>**බලපෑම:** කාන්තාවන් ලිංගික සහ ශාරීරික සමීප සහකරු ප්‍රචණ්ඩත්වය අත්දැකීමේ අඩුවක්. පිරිමි සහකරුවන් චර්යාවන් පාලනය කරගැනීමේ කැපීපෙනෙන වර්ධනයක් සහ කාන්තාවන් අතර විෂාදයේ අඩුවක්. පිරිමින් සහ කාන්තාවන් අතර සමාජභාවී ආකල්පවල වර්ධනයක්.[11] |
| **ආරක්ෂිත නිවාස සහ සෑම කෙනෙකුටම ගරුකිරීමේ (SHARE) මැදිහත්වීම්** | කාලානුරූපව සිදුකරනු ලබන එච්අයිවී වැළැක්වීමේ සහ ප්‍රතිකාර සේවා සමග ඒකාබද්ධ කරන ලද ප්‍රජා පාදක බලමුළුගැන්වීම් | උගන්ඩාව | ප්‍රජා ස්වේච්ඡා සේවකයන් 40ක් - දේශීය කාන්තාවන් සහ පිරිමි<br><br>ස්වේච්ඡා ප්‍රජා උපදේශන ආධාරකරුවන් 12ක් | සමීප සහකරු ප්‍රචණ්ඩත්වයට සහ එච්අයිවී අවදානමට දායක වන ආකල්ප සහ සමාජ සම්මතයන් වෙනස් කිරීම අරමුණු කරගත් ඒකාබද්ධ ප්‍රජා පාදක බලමුළුගැන්වීම. එච්අයිවී සම්බන්ධ හෙළිදරව් කිරීම ආශ්‍රිත ප්‍රචණ්ඩත්වය සහ එච්අයිවී ප්‍රතිකාර හා උපදේශනය සොයන හා පරීක්ෂා කරන කාන්තාවන් මුහුණදෙන අවදානම අඩුකිරීම සඳහා පරීක්ෂා කිරීම් සහ මැදිහත්වීම්.<br><br>SHARE සැලසුම් කරනු ලැබුවේ SASA! සහ Stepping Stones එළඹුම් අනුසාරයෙනි. එහිදී, කලින් පැවති සෞඛ්‍ය සහ සමාජ සහාය ව්‍යුහයට ඉහළ ගුණාත්මකභාවය සහ සංස්කෘතික වශයෙන් යෝග්‍ය ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේ ක්‍රියාකාරකම් ඒකාබද්ධ කර තිබේ. | අවුරුදු 5 | **ඇගයුම් ස්වරූපය:** පොකුරු සසම්භාවී පරීක්ෂණය<br><br>**බලපෑම:** කලින් වසරේ ශාරීරික සහ ලිංගික සමීප සහකරු ප්‍රචණ්ඩත්වය වාර්තා කළ කාන්තාවන් සංඛ්‍යාව අඩුවීම. පිරිමින් සහ කාන්තාවන් අතර එච්අයිවී ව්‍යාප්තිය අඩුවීම සහ එච්අයිවී හෙළිදරව් කිරීමේ අනුපාතිකය අඩුවීම.[12] |

| වැඩසටහන | විස්තරය | ස්ථානය | ඉලක්ක ජනගහනය | මූලික ක්‍රියාකාරකම් | කාල පරිච්ඡේදය | ඇගයීම හා බලපෑම |
|---|---|---|---|---|---|---|
| **සමාජභාවී භූමිකා, සමානාත්මතාව සහ වෙනස් කිරීම (GREAT) වැඩසටහන** | නවයොවුන් පුද්ගලයන් කෙරෙහි අවධානය යොමුකරන ලද සමාජ සම්මතයන් වෙනස්කිරීමේ වැඩසටහන | උගන්ඩාව | **ළාබාල නවයොවුන් පුද්ගලයන්:** වයස අවුරුදු 10-14 අතර පාසල් යන පිරිමි ළමයින් හා ගැහැණු ළමයින්<br><br>වයස අවුරුදු 15-19 අතර **වැඩිහිටි නවයොවුන්** ගැහැණු හා පිරිමි ළමයින්<br><br>**අලුත විවාහ වූ හෝ දරුවන් සිටින නව යොවුන්** පුද්ගලයන්: වයස අවුරුදු 15-19 අතර විවාහක/ එකට ජීවත්වන, ළමයින් ඇති හෝ නැති පිරිමි සහ ගැහැණු ළමයි.<br><br>වැඩසටහන විසින් නවයොමුන් පුද්ගලයන්ට වෙනස් වීම හා ප්‍රජාව පුරා විහිදුණු වෙනස අත්පත් කරගැනීම සඳහා සහාය පිණිස **ප්‍රජා සාමාජිකයන්** ද සම්බන්ධ කරගනු ලැබේ. | GREAT විසින් අවුරුදු පහක මැදිහත්වීම් නිර්මාණය කර පරීක්ෂා කරන ලදී:<br>• ප්‍රජා ක්‍රියාකාරී චක්‍රය (CAC) විසින් ප්‍රජා නායකයන් (ගෝත්‍ර නායකයන්, ආගමික නායකයන් සහ පත්වූ ග්‍රාමීය නායකයන්) සම්බන්ධ කරගනු ලැබේ.<br>• ඔවුන් විසින් රේඩියෝ මාලා නාට්‍යයක්, මුහුණට මුහුණ සාකච්ඡා සහිත රේඩියෝ වැඩසටහනක් පවත්වනු ලැබේ.<br>• ග්‍රාමීය සෞඛ්‍ය කණ්ඩායම (VHT) සතුව සේවා සම්බන්ධතා තිබේ.<br>• GREAT මෙවලම් කට්ටලය - සහභාගීත්ව සහ අන්තර් ක්‍රියාකාරී එළඹුමකි. විශේෂයෙන් නිර්මාණය කරනු ලැබුවේ නවයොවුන් පුද්ගලයන් හට තම සමාජභාවී සම්මතයන් සහ ලිංගික හා ප්‍රජනන සෞඛ්‍යය පිළිබඳ සාකච්ඡා කිරීම සඳහාය. | අවුරුදු 5 | **ඇගයුම් ස්වරූපය:** මිශ්‍ර ක්‍රම සහ අර්ධ පරීක්ෂා<br><br>**බලපෑම:** නවයොවුන් පුද්ගලයන් විසින් පහත දැක්වෙන කරුණු වාර්තා කරන ලදී:<br>• පවුල් සැලසුම පිළිබඳ වැඩිදියුණු කරන ලද ආකල්ප සහ චර්යාවන්<br>• සෞඛ්‍ය සේවා වෙත පැමිණීමේ අවස්ථාව වැඩිවීම සහ ඪ්‍යඹ වෙතින් සේවා ලබාගැනීමේදී වැඩි පහසුව<br>• වැඩිදියුණු වූ සහකරු සන්නිවේදනය සහ හවුල් තීරණ ගැනීම<br>• කාන්තාවන්ට එරෙහිව පිරිමින්ගේ ප්‍රචණ්ඩත්වය අඩුවෙන් පිළිගැනීම<br>• අලුතෙන් විවාපත්/ දරුවන් සහිත තරුණ කාන්තාවන් සහ පිරිමින් විසින් කෝපයට පත්වූ විට තමන් තම සහකරුට/කාරියන්ට ප්‍රචණ්ඩ ලෙස ප්‍රතිචාර දක්වන බව පැවසීමේ අනුපාතිකය අඩුවීම |

# සැලසුම් සහ ක්‍රියාත්මක කිරීමේ පිරික්සුම් ලැයිස්තුව

ධනාත්මක ආකල්ප, විශ්වාසයන් සහ සමාජ සම්මතයන් ප්‍රවර්ධනය කිරීමේ සහ/ හෝ හානිකර ඒවා පිටුදැකීමේ **ඵලදායී එළඹුම්වල පොදු මූලිකාංග හා මූලධර්මවලට** පහත දැක්වෙන ලක්ෂණ අඩංගු වේ:[13]

## වැඩසටහන් සැලසුම් සහ අනුරූප වීම:

1. **ඕනෑම සන්දර්භයක් තුළ කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය මෙහෙයවන නිශ්චිත සම්මතයන් සහ ආකල්ප හඳුනා ගැනීමට උසස් තත්ත්වයේ සංවර්ධනාත්මක සන්දර්භ විශ්ලේෂණ සහ පර්යේෂණ සිදු කරන්න.** සාර්ථක මැදිහත්වීම් කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සඳහා මූලික හේතු පිළිබඳ ස්ත්‍රී පුරුෂ සමාජභාවී බලය විශ්ලේෂණයක් සිදු කරයි. එය ඔවුන්ට ප්‍රවර්ධනය කිරීමට හෝ වෙනස් කිරීමට අවශ්‍ය හැසිරීම, ප්‍රාදේශීය සන්දර්භය තුළ මෙම හැසිරීම් වලට බලපාන සම්මතයන් සහ ආකල්ප පිළිබඳ හොඳ අවබෝධයක් සහ සම්මතයන් පැවතීමට හේතු වන සමාජ ප්‍රතිලාභ සහ සම්බාධක පිළිබඳව විශේෂිත වේ. සමාජ සම්මතයන් සහ ඒවා විශේෂිත සන්දර්භයන් තුළ ක්‍රියාත්මක වන ආකාරය හඳුනා ගැනීම සඳහා භාවිත කිරීමට යොදාගන්නා ලද සහ පරීක්ෂා කරන ලද ගුණාත්මක ප්‍රවේශයන් කිහිපයක් දැන් තිබේ. විවිධ තත්ත්වයන් යටතේ හැසිරීමක් සාමාන්‍ය සහ යෝග්‍ය ලෙස සැලකිය හැකිද යන්න නිර්ණය කිරීම සඳහා වන කණ්ඩායම් පසුබිමකදී විවෘත අවසානයක් සහිත ප්‍රශ්න භාවිතා කිරීම සහ නිශ්චිත සම්මතයන් වටා ඇති ගතිකත්වය පිළිබඳ ගැඹුරු අවබෝධය සඳහා ව්‍යුහගත ප්‍රශ්න සමග උපකල්පිත ලේඛන භාවිතා කිරීම මෙයට ඇතුළත් වේ.[14] දැනට ක්‍රියාත්මක වැඩසටහන් අනුවර්තනය කිරීමේදී, මූලික මූලධර්මවලට පක්ෂපාතීත්වය සහතික කිරීම සහ වෙනත් තැන්වල අනුවර්තනය කරගැනීම් සම්බන්ධ අත්දැකීම්වලින් ඉගෙනගැනීම සඳහා ආරම්භකයින් සම්බන්ධ කරගන්නා ලෙස තරයේ නිර්දේශ කරනු ලැබේ.[15]

2. **මැදිහත්වීම සඳහා ශක්තිමත් ආයතනික සහාය සහතික කිරීම.** ප්‍රජා මට්ටමින් ස්ත්‍රී පුරුෂ සමාජභාවය වෙනස් කිරීමට සහ සමාජ සම්මතය සම්බන්ධ වැඩසටහන්වල නියැළීමට ඕනෑම සංවිධානයක් සුදුසු නොවේ. ප්‍රචණ්ඩත්වය, වෙනස් කොට සැලකීම, බලය සහ ඔවුන්ගේම ජීවිත තුළ මෙන්ම සංවිධානය තුළ ද ඇති සබඳතා ගැන මෙනෙහි කිරීම සඳහා නායකයින් ඇතුළු තමන්ගේම කාර්ය මණ්ඩලයට සහාය වීමට කාලය ගත කිරීමට කැමති, සාරධර්ම මත පදනම් වූ සංවිධාන විසින් සාර්ථක මැදිහත්වීම් ලබා දී ඇත.[16]

3. **සන්දර්භය සම්බන්ධයෙන් නිශ්චිත ධනාත්මක සමාජ සම්මතයන් සහ හැසිරීම් ප්‍රවර්ධනය කිරීම කෙරෙහි අවධානය යොමු කරන්න.** කාලයත් සමග බහුවිධ වේදිකා හරහා ධනාත්මක නව සමාජ සම්මතයන්, ආකල්ප සහ හැසිරීම් ප්‍රවර්ධනය කිරීම සාමාන්‍යයෙන් වඩා ඵලදායී වේ. එනම්, හානිකර සමාජ සම්මතයන් සහ චර්යාවන් අවධාරණය කිරීමට වඩා 'කුමක් විය හැකිද?' යන්න අවධාරණය කිරීම වැනි වේ. එනම්, මෙම චර්යාව සාමාන්‍ය එකක් ලෙස අයෝග්‍ය පරිදි සන්නිවේදනය කළ හැකි 'ගැටලුව' සම්බන්ධයෙනි.[17] නිදසුනක් වශයෙන්, 'ගෘහස්ථ සංවර්ධනය සඳහා එකට වැඩ කිරීම' හෝ 'පියවරුන් ලෙස පිරිමින්ගේ භූමිකාව' වැනි අභිලාෂකාමී පණිවිඩ, ඉලක්කගත ජනගහනය කම්පනයට ලක්කිරීමට මෙන්ම ප්‍රති ප්‍රහාර ඒලවීමේ විභවය වළක්වා ගැනීමට ද උපකාරී වේ.[18] කෙසේ වෙතත්, පවුල් තුළ ඇති ගැඹුරු අසමාන විශ්වාසයන් සහ බල ගතිකත්වයන් නොසලකා හැරීම වැදගත් වේ. එය වඩාත් දුෂ්කර විය හැකි අතර වෙනස් වීමට වැඩි කාලයක් ගතවනු ඇත.

4. **පුද්ගලයන් සහ කුඩා ඉලක්ක කණ්ඩායම් කෙරෙහි අවධානය යොමු කරනවාට වඩා පුළුල් සමාජ වෙනසක් උත්ප්‍රේරණය කිරීමට සැලසුම් කිරීම.** සමාජ සම්මතයන් වෙනස් කිරීමේ මූලපිරීම් එකිනෙකින් වෙනස් වේ. බොහෝ විට කුඩා කණ්ඩායම්වල මෙනෙහි කිරීම් මත පදනම් වූ වැඩසටහන් (උදා: REAL සහ GREAT) සැලකිය හැකිය. ප්‍රජාව පුරා මෙනෙහි කිරීම් සිදුකිරීම සඳහා මාධ්‍ය (ගුවන්විදුලි නාට්‍ය, ප්‍රජා දැන්වීම් පුවරු) භාවිතා කරනු ලැබේ. ප්‍රජා බලමුළුගැන්වීමේ ප්‍රවේශයන් යනු තනි පුද්ගල සහ කණ්ඩායම් මට්ටමට වඩා ජනගහන මට්ටමින් වෙනස් වීම ස බලපෑම් කිරීමට උත්සාහ කරන බැවින් ඒවා වෙනත් බොහෝ මූලෝපායන්ට වඩා වෙනස් වේ. වෙනසක් සඳහා සහාය දක්වන පුද්ගලයන්ගේ තීරණාත්මක ලක්ෂ්‍යයකට හෝ විචාරාත්මක පුද්ගල සමූහයකට ළඟාවීම සඳහා, සංවිධානාත්මක මැදිහත්වීම් ක්‍රියාවලියක් හෝ උපාය මාර්ගයක් හරහා ප්‍රජාවේ හෝ ආයතනයේ ඉහළ ප්‍රතිශතයකට ළඟාවීමට ඉලක්ක කළ යුතුය. පොදු පසුබිම් තුළ ධනාත්මක හැසිරීම් ආදර්ශ ඉදිරිපත් කිරීම උදෙසා බලපෑම් සහගත ප්‍රජා සාමාජිකයින් සමග වැඩ කිරීම සහ ප්‍රධාන පණිවිඩ ප්‍රචාරය කිරීමට සහ මුහුණට මුහුණ අන්තර්ක්‍රියාවල බලපෑම වැඩිදියුණු කිරීමට සන්නිවේදන උපායමාර්ග ඒකාබද්ධ කිරීම උදාහරණ ලෙස සැලකිය හැකිය.[19]

5. **හුදකලා දැනුවත් කිරීමේ ක්‍රියාකාරකම්වලින් වළකින්න.** මේ දක්වාම කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සමග කටයුතු කිරීමේදී මෙය වඩාත් පොදු ප්‍රවේශයන්ගෙන් එකක් ලෙස සැලකුණද, සාක්ෂි විසින් පෙන්නුම් කරන්නේ එය ප්‍රමාණවත් නොවන බවයි. ඒවා විවේචනාත්මක චින්තනය ඇති කිරීමට වඩා පණිවිඩ යැවීම හෝ තොරතුරු ලබා දීම මත රඳා පවතී. එසේ නැතිනම්, ගැඹුරින් මුල් බැස ඇති සමාජ සම්මතයන් වෙනස් කිරීමට හෝ කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය අඩු කිරීමට තරම් ප්‍රමාණවත් ලෙස ඒවා න්‍යාය මත පදනම් වීම සිදු නොවේ.

## ක්‍රියාත්මක කිරීම සහ පුළුල් කිරීම

6. **ප්‍රජා ස්වේච්ඡා සේවකයන් හෝ පහසුකම් සපයන්නන් ඇතුළු සමස්ත වැඩසටහන් කාර්ය මණ්ඩලය පරිස්සමෙන් තෝරාගෙන, පුහුණු කර, අධීක්ෂණය කරන්න.** සාර්ථක එළඹුම් රඳාපවතින්නේ ප්‍රජාව තුළ හොඳින් මුල්බැසගත් ප්‍රජා ස්වේච්ඡා සේවකයන්ගේ හෝ ක්‍රියාකාරිකයන්ගේ මැදිහත්වීම මතය. මැදිහත්වීම ආරම්භයේ ඔවුන් ද කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන් දරන්නේ එකම ආකල්ප හා සමාජ සම්මතයන්ය. වැඩසටහන ඉලක්ක කරන්නේ ඒවා වෙනස් කිරීමටයි. ස්ත්‍රී පුරුෂ සමාජභාවය, බලය සහ කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන් සාකච්ඡා ආරම්භ කිරීම සඳහාත්, ප්‍රමාණවත් ලෙස පෙළඹවීමෙන් යුක්ත වීම සඳහාත්, සමස්ත මැදිහත්වීම අතරතුරදී ප්‍රමාණවත් පුහුණුවක් සහ සහායක් ලබාගැනීම සඳහාත් සඳහා මෙම පුද්ගලයින්ට ප්‍රජාව තුළ හෝ ආයතනය තුළ විශ්වසනීයත්වයක් තිබිය යුතුය.[20] එය අවශ්‍ය වනුයේ ස්ත්‍රී පුරුෂ සමාජභාවයට ප්‍රතිචාර දක්වන ආදර්ශ චර්යාවන් සැකසීමටත්, සාකච්ඡා සඳහා දක්ෂ ලෙස පහසුකම් සැලසීමට සහ කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වැළැක්වීම සඳහා ප්‍රජාවන් සහ ආයතන පෙළඹවීමටත් ය.[21] වෙනස ආරම්භ වන්නේ ඇතුළතිනි. පළමුව ව්‍යාපෘති කාර්ය මණ්ඩලයට මෙනෙහි කිරීම සහ පුහුණුව සඳහා කාලය අවශ්‍ය වේ.[22]


7. **7. කාන්තාවන් සහ පිරිමින්, පිරිමි ළමයින් සහ ගැහැණු ළමයින් යන දෙපිරිසම සම්බන්ධ කරගන්න.**[23] පිරිමින් සහ ගැහැණුන් සහ පිරිමි ළමයින් සහ ගැහැණු ළමයින් විසින් කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වටා ඇති සමාජ සම්මතයන් අනුගමනය කරනු ලැබේ. එබැවින් ඔවුන් දෙපිරිසම සම්බන්ධ කරගැනීම වැදගත්ය.[24] කෙසේ වෙතත්, බොහෝ විට සමලිංගික කණ්ඩායම් සමග වෙනම සැසි කිහිපයක් පැවැත්වීම සහ සංවාද පැවැත්වීම මෙම උත්සාහයන්හිදී ප්‍රයෝජනවත් වේ. එය සහභාගිවන්නන්ට පහසුවෙන් කතා කිරීමට සහ අදහස් ගවේෂණය කිරීමට උපකාර කරයි.

8. **8. වෙනස ඉහළ සිට පහළට බලාත්මක නොකරන්න.** මෙම ප්‍රවේශයන් මිනිසුන් විසින් මෙහෙයවිය යුතු අතර බහු පාර්ශවකරුවන් (ප්‍රජා සාමාජිකයින්, ආගමික සහ සම්ප්‍රදායික නායකයින්, රාජ්‍ය ආයතන සහ පරිත්‍යාගශීලීන්) වැළැක්වීමේ ප්‍රයත්නයන් සඳහා සම්බන්ධ කර ගත යුතුය. බහුවිධ මාර්ග සහ නිරාවරණයන් හරහා පණිවිඩ ශක්තිමත් කළ යුතුය. පසුබෑම වැනි අනපේක්ෂිත ඍණාත්මක ප්‍රතිවිපාක හේතුවෙන් ප්‍රවේශමෙන් සැලසුම් කිරීම, නිරීක්ෂණය කිරීම සහ අවම කිරීම වැදගත් වේ.[25]

9. **අර්ථවත් පෞද්ගලික සම්බන්ධවීම් හරහා තිරසාර, විචාරාත්මක මෙනෙහි කිරීම් සඳහා ආරක්ෂිත අවකාශයන් නිර්මාණය කරන්න.** සාර්ථක ප්‍රවේශයන් එක් වරක් පවත්වන පුහුණුවීම් සහ සිදුවීම් ඉක්මවා යයි. වෙනස් කිරීමේ ක්‍රියාවලියකට පහසුකම් සැලසීම, ඔවුන්ගේ අදහස් සහ උපකල්පන ගවේෂණය කිරීමට සහ අභියෝග කිරීමට මිනිසුන් දිරිමත් කිරීම සහ ආරක්ෂිත අවකාශයන්හි ව්‍යුහගත සහභාගීත්ව ප්‍රවේශයන් හරහා විකල්ප ධනාත්මක හැසිරීම් පුහුණු කිරීම මෙහි අරමුණයි. මෙම ප්‍රවේශය සඳහා ප්‍රාදේශීය යෙදුම්, රූප, නිරූපණයන් සහ සංකල්ප සහිත සමාජ-සංස්කෘතික සැකසුමට උචිත වූ ප්‍රවේශමෙන් නිර්මාණය කරන ලද අධ්‍යාපනයක් අවශ්‍ය වේ.

10. **ප්‍රමාණවත් කාලය සහ තීව්‍රතාව (අවුරුදු 3 - 5).** ගැඹුරු සමාජ සම්මතයන් වෙනස් කිරීම අරමුණු කරගත් ප්‍රවේශයන් සඳහා 'සැහැල්ලු ස්පර්ශ' මැදිහත්වීම් සහ කෙටි කාල රාමු හරහා සාක්ෂාත් කරගත නොහැකි සංකීර්ණ සමාජ වෙනස්කම් සිදුකිරීමේ ක්‍රියාවලීන් අවශ්‍ය වේ. ගැඹුරින් මුල් බැසගත් සමාජ සම්මතයන් මහා පරිමාණයෙන් වෙනස් කිරීම සඳහා වසර ගණනාවක් ගත විය හැකි අතර සැලසුම් සහ අනුවර්තනය සඳහා ප්‍රමාණවත් කාලය ඇතුළු බහු ආංශික මැදිහත්වීම් අවශ්‍ය වේ.

11. **කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වයට මුහුණදී දිවි ගලවා ගත් අය සඳහා ප්‍රජා පාදක රැකවරණය සහ සහාය ශක්තිමත් කිරීම.** නිදසුනක් වශයෙන්, ප්‍රජා ස්වේච්ඡා සේවකයන්ට ප්‍රජා සාමාජිකයින් සහ රාජ්‍ය ආයතන සහ අනෙකුත් රාජ්‍ය නොවන සේවා සපයන්නන් අතර වැදගත් පාලමක් ලෙස සේවය කළ හැකි අතර දිවි ගලවා ගත් අයට ශාරීරික හා මානසික සෞඛ්‍යය, ආරක්ෂාව, සමාජ සුබසාධනය සහ නීතිමය සේවාවන් සඳහා ප්‍රවේශය ලබාදිය හැකිය. එසේම, අවශ්‍ය තත්වයන්හිදී කාන්තාවන්ට යුක්තිය වෙත ප්‍රවේශය ලබාදිය හැකිය. (වැඩිදුර විස්තර සඳහා බලන්න **Services Ensured RESPECT Strategy Summary**)



# මූලෝපාය සාරාංශය

## ඇතුළත් වීමේ ස්ථාන

හානිකර සමාජ සම්මතයන්, ආකල්ප සහ විශ්වාසයන් වෙනස් කිරීමේ ප්‍රවේශයන්ගේ බලපෑම උපරිම කිරීම සඳහා ඒවා බහු පසුබිම් සහ අංශවලට ඒකාබද්ධ කළ හැකිය. පහත දැක්වෙන වගුව විසින් අවධාරණය කරනු ලබන්නේ හානිකර සමාජ සම්මතයන්, ආකල්ප සහ විශ්වාසයන් වෙනස් කිරීම සඳහා වැදගත් ඇතුළත් විය හැකි ස්ථානයි. වැඩසටහන් උදාහරණ ද එයට ඇතුළත් වේ.

| ඇතුළත් වීමේ ස්ථානය | තර්කනය |
|---|---|
| **දැනට තිබෙන ප්‍රජා රැස්වීම් හා ව්‍යුහයන්** | ප්‍රජාව තුළ කාන්තා අයිතිවාසිකම් සංවිධාන සමග කටයුතු කිරීම වැදගත් වන අතර විශ්වාසවන්ත පුද්ගලයන් සහ කණ්ඩායම් සමග වැඩ කිරීමට ඔබට සහාය ලබා දීම සඳහා ප්‍රාදේශීය ප්‍රජා නායකත්වය දිනාගැනීම ද වැදගත් වේ. ක්ෂුද්‍ර මූල්‍ය වැඩසටහන් රැස්වීම්, ක්‍රීඩා සමාජ, දෙමාපියන්ගේ රැස්වීම් හෝ ආගමික රැස්වීම් වැනි පිරිමින් සහ/හෝ කාන්තාවන්, පිරිමි ළමයින් සහ ගැහැණු ළමයින් මුණගැසෙන අවකාශයන්හි වැඩ කිරීම මගින් පුද්ගල කණ්ඩායම් සමග පුහුණුව ඇතුළත් වැඩසටහන් නිර්මාණය කළ හැකිය. මෙය සහභාගීත්වයේ සහ නියැලීමේ අනුපාතයන් ඉහළ නැංවීමට පමණක් නොව, කාන්තාවන් සවිබල ගැන්වීම වැඩි කිරීම වැනි අතරමැදි ප්‍රතිඵල කෙරෙහි වැඩි බලපෑමක් කිරීමට ද උපකාරී වේ.[26]<br><br>උදාහරණයක් ලෙස, රුවන්ඩාවේ Indashyikirwa වැඩසටහන මගින් යුවල උපදේශනය ප්‍රජා ක්‍රියාකාරීත්වය සමග සම්බන්ධ කරනු ලැබේ. එමගින් දැනට ක්‍රියාත්මක කණ්ඩායම් මත පදනම්ව ප්‍රජාවන් සමග සම්බන්ධ වීමට අවස්ථාව ලබාදෙයි. දෙමාපියන්ගේ සන්ධ්‍යා සංසද සහ ගමේ ඉතුරුම් සහ ණය (VSLA) රැස්වීම් ද ඒ අතර වේ.[27] |
| **පාසල් හා අධ්‍යාපනික පහසුකම්** | පාසල් පසුබිම් තුළ පුද්ගල ආකල්ප, විශ්වාසයන් සහ සමාජ සම්මතයන් වැඩිදියුණු කිරීම සඳහා ප්‍රවේශයන් ඒකාබද්ධ කිරීම මගින් (විෂයමාලා ඇතුළු සමස්ත පාසල් එළඹුම් හරහා) විශාල සංඛ්‍යාවක් ළමයින් සහ තරුණ පුද්ගලයන් වෙත ළඟාවීමේ හැකියාව ලැබේ. ඔවුන් අයත් වන්නේ ඉතා වැදගත් වයසකට වන අතර ඔවුන්ගේ ආකල්ප හා සමාජ සම්මතයන් ගොඩනැගෙමින් පවතී. එබැවින් ඒවා වෙනස සඳහා පහසුවෙන් අනුරූප වේ. මෙම මුලපිරීම් ඔස්සේ නවයොවුන් පුද්ගලයන් අතර ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ සම්මතයන්, තාවකාලික සම්බන්ධතාවන්ගේ ප්‍රචණ්ඩත්වය සහ ලිංගික අපයෝජන ආමන්ත්‍රණය කරනු ලැබේ.<br><br>උදාහරණයක් ලෙස, ඉන්දියාවේ පාසල් පාදක ප්‍රවේශයෙහි ප්‍රධාන එළඹුමක් හැඳින්වෙන්නේ Gender Equity Movement in Schools (GEMS) ලෙසයි. උසස් පාසල් සිසුන් (වයස අවුරුදු 12 -14) අතර ස්ත්‍රී පුරුෂ සමාජ සමානාත්මතා සම්මතයන් ප්‍රවර්ධනය කරන එය මහාරාෂ්ට්‍රයේ පාසල් 25,000ක පමණ විෂයමාලාවට ඒකාබද්ධ කර තිබේ.[28] |
| **ලිංගික සහ ප්‍රජනක සෞඛ්‍යය සහ එච්අයිවී උපදේශනය, පරීක්ෂණ සහ ප්‍රතිකාර ඇතුළු සෞඛ්‍ය සේවා** | සමාජ සම්මතයන් සම්බන්ධ වැඩසටහන්වල නිරත වීම සඳහා වැදගත් ප්‍රවේශ ස්ථානයක් සැපයීමට සෞඛ්‍ය අංශයට හැකිය. රැඳීසිටින ශාලා, විභාග ශාලා සහ උපදේශන අවකාශයන්හි ඇති අධ්‍යාපනික ද්‍රව්‍ය සහ සම්පත්වලට වැදගත් පණිවුඩ ඇතුළත් කළ හැකි අතර, කාන්තා සහ පිරිමි සේවාදායකයින්ට/රෝගීන්ට වෙන වෙනම ද ඒවා ලබා දිය හැක.<br><br>පවුල් සැලසුම් උපදේශනය සහ එච්.අයි.වී, උපදේශනය සහ පරීක්ෂණ වැනි සෞඛ්‍ය සේවාවන්ට ප්‍රාථමික වැළැක්වීමේ ක්ෂේත්‍රයෙහිදී වැදගත් කාර්යභාරයක් ඉටු කළ හැකිය. උදාහරණයක් ලෙස, ටැන්සානියාවේ Stepping Stones with Children වැඩසටහන විසින් එච්අයිවී ආසාදිත ළමයින් (වයස අවුරුදු 5-14 අතර) සහ ඔවුන්ගේ සත්කාරකවරුන් සඳහා වැඩමුළු පවත්වන ලදි. එහිදී ඔවුන් එච්අයිවී, ලිංගික හා ප්‍රජනන සෞඛ්‍යය සහ ඔරොත්තුදීමේ කුසලතා පිළිබඳ ඉගෙනගත්හ. වැඩසටහන හේතුවෙන් ළමයින්ට එරෙහි ප්‍රචණ්ඩත්වය පාලක කණ්ඩායමට සාපේක්ෂව අඩුවිය. වෙනත් ප්‍රතිඵල අතර, CD4 සංඛ්‍යා සහ එච්අයිවී සමග ජීවත් වන ළමා සහභාගිකයන්ගේ බර වැඩි විය.[29] |

# වැදගත් සම්පත්

## සමාජ සම්මත න්‍යාය අවබෝධ කරගැනීම

Violence prevention: the evidence. Changing cultural and social norms that support violence. Geneva: World Health Organisation; 2009.
උපදේශකයින්, වැඩසටහන් නිර්මාණකරුවන් සහ ක්‍රියාත්මක කරන්නන් සඳහා ප්‍රචණ්ඩත්වය පිළිබඳ සම්මතයන්ගේ බලපෑම ආමන්ත්‍රණය කිරීම සඳහා මැදිහත්වීම් පිළිබඳ දැනට පවත්නා දැනුම විස්තර කරන කෙටි විස්තරයකි.

Shifting social norms to tackle VAWG: A DFID Guidance Note. London: DFID 2016
මෙම මාර්ගෝපදේශ සටහනෙහි අරමුණ වන්නේ කාන්තාවන්ට සහ ගැහැණු ළමයින්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වැළැක්වීම සඳහා වැඩසටහන් සන්දර්භය තුළ හානිකර සමාජ සම්මතයන් ආමන්ත්‍රණය කරන්නේ කෙසේද යන්න පිළිබඳ සාක්ෂි, අදාළ උදාහරණ සහ ප්‍රායෝගික මාර්ගෝපදේශ සමගින් උපදේශකයින්ට සහ වැඩසටහන් කළමනාකරුවන්ට සහාය වීමයි.

Addressing Social Norms at the VAW/VAC Intersection. London: London School of Hygiene & Tropical Medicine; 2019
සමාජ සම්මතයන් සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය සමග සම්බන්ධ හානිකර පිළිවෙත් පිළිබඳ ඉගෙනුම් කණ්ඩායමේ දින දෙකක රැස්වීමක් මත පදනම්ව, සමාජ සම්මතයන් සහ කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය (VAW) සහ ළමයින්ට එරෙහි හිංසනය (VAC) අතර අන්තර් සම්බන්ධය පැහැදිලි කරන කෙටි සාරාංශයකි.

Social norms, gender norms and adolescent girls: a brief guide. London: Overseas Development Institute; 2015.
නව යොවුන් වියේ ගැහැණු ළමයින්ට බලපාන ස්ත්‍රී පුරුෂ සමාජභාවී අසමානතාවයට අදාළ සමාජ සම්මතයන් පිළිබඳ දළ විශ්ලේෂණයක් සපයයි. ඉතියෝපියාව, නේපාලය, වියට්නාමය සහ උගන්ඩාව යන රටවල ක්ෂේත්‍ර කටයුතු මත පදනම්ව දිළිඳුකම සහ වෙනස්කොට සැලකීමේ සමාජභාවී සම්මතයන් අතර සම්බන්ධය සලකා බලයි.

Piecing together the evidence on social norms and VAW' Melbourne, Equality Institute; 2017
කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය ධාවනය කරන සහ එයට දායක වන සාධක පිළිබඳ වර්තමාන සාක්ෂි පිළිබඳ දළ විශ්ලේෂණයක් සපයන සරල පොත් පිංචක් වන මෙය සමාජ සම්මතයන්ගේ භූමිකාව කෙරෙහි අවධානය යොමු කරයි.

## කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේ සමාජ සම්මත එළඹුම

Community-based norms focused interventions: definition and attributes. The Learning Collaborative to Advance Normative Change; 2018
මෙම සාරාංශය විසින් ස්ත්‍රී පුරුෂ සමාජභාවය සම්බන්ධ සම්මතයන් වෙනස් කිරීම සඳහා අවශ්‍ය ඵලදායී ප්‍රජා පාදක ප්‍රවේශයන්ගේ ප්‍රධාන ගුණාංග අවධාරණය කරයි. නවයොවුන් පුද්ගලයන්ගේ සහ තරුණ ජනයාගේ ප්‍රජනන සෞඛ්‍යය ප්‍රවර්ධනය කිරීම සඳහා සැලසුම් ද එයට අයත්ය.

## සමාජ සම්මතයන් තක්සේරු කිරීමේ සමීක්ෂණ ක්‍රමවේද

Measuring gender-related social norms, Learning Report 1. London: Learning Group on Social Norms and Gender-related Harmful Practices of the London School of Hygiene & Tropical Medicine; Cislaghi B, Heise L. 2017
කාන්තාවන්ට සහ ගැහැණු ළමයින්ට එරෙහි හිංසනයට විසඳුම් සෙවීමේ වැඩසටහන්වල අත්දැකීම් සමග සමාජ සම්මතයන් මැනීම සඳහා පරිණාමය වන ශිල්පීය ක්‍රම විස්තර කරයි.

Applying theory to practice: CARE's journey piloting social norms measures for gender programming. Cooperative for Assistance and Relief Everywhere, Inc (CARE); 2017
සංවර්ධන පරිචය සම්බන්ධයෙන් සමාජ සම්මත න්‍යාය යොදාගැනීම සඳහා CARE සංවිධානයේ කාර්යභාරය කෙරෙහි අවධානය යොමු කරයි.

## සමාජ සම්මතයන් සම්බන්ධ මැදිහත්වීම් පුළුල් කිරීම

On the CUSP: the politics and prospects of scaling social norms change programming. Goldman, L., Lundgren, R., Gillespie, D., Bajenja, E., Muyhango, L. and Michau, L., Sexual and Reproductive Health Matters; 2019
කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වැළැක්වීම සහ ලිංගික හා ප්‍රජනක සෞඛ්‍ය සහ අයිතීන් වැඩිදියුණු කිරීම සඳහා ස්ත්‍රී පුරුෂ සමාජ සමානාත්මතාවය සඳහා වූ මූල පිරිමි සමාජ සම්මතයන් පරිමාණය කිරීම පිළිබඳ පාඩම් සහ ඇඟවුම් සාරාංශ කරන ලිපියකි. Community for Understanding Scale Up (CUSP) වෙතිනි. සමාජ සම්මතයන් පිළිබඳ මැදිහත්වීම් පුළුල් කිරීමේ තවත් සිද්ධි අධ්‍යයන, අධ්‍යාපනික මෙවලම් සහ සම්පත් සඳහා CUSP බලන්න.

Guidance Note on Scaling Up Social Norm Change. K4D Emerging Issues Report. Brighton, UK: Institute of Development Studies. 2019
ආන්තික සහ අවදානමට ලක්විය හැකි කණ්ඩායම් සඳහා සංකීර්ණ සමාජ වෙනස්කම් සඳහා ඇතුළත් ප්‍රවේශයන් පරිමාණය කිරීමට DFID සහාය ලබාදිය හැකි ආකාරය පිළිබඳ මාර්ගෝපදේශ සපයයි. එයට සංකල්ප සහ සම්පත් පිළිබඳ අමතර සාරාංශ හතරක් ඇතුළත් වේ. පරිමාණකරණ වර්ග, සම්පත් සහ පරිමාණකරණයේ මූල්‍යමය වටිනාකම සහ අවදානම් කළමනාකරණය හා අධීක්ෂණය ද එයට ඇතුළත්ය වේ.

USAID. Scaling-up interventions to prevent and respond to gender-based violence: an analytical report. Washington DC: USAID; 2015
ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය හා සම්බන්ධ වැඩසටහන් විශාලනය කිරීමේ අත්දැකීම විස්තර කරන අතර INSPIRE වැඩසටහන්, Yaari Dosti, IMAGE, Stepping Stones සහ Soul City හි සිද්ධි අධ්‍යයන ඉදිරිපත් කරයි.

# පසු සටහන

[1] සාක්ෂි ශ්‍රේණිගත කිරීම් බොහෝ දුරට සසම්භාවී, පොකුරු සසම්භාවී සහ අර්ධ පර්යේෂණාත්මක ක්‍රම ඇතුළු පර්යේෂණාත්මක සැලසුම් භාවිතා කරන මැදිහත්වීම් එකකට වඩා වැඩි ගණනක ක්‍රමානුකූල සමාලෝචනවලින් ලබාගෙන ඇත. අධිකරණ අංශයේ මැදිහත්වීම් වැනි සමහර මූලෝපායන් සඳහා, සාමාන්‍යයෙන් අඩු ගුණාත්මක බවින් සලකනු ලැබුවද, කාල ශ්‍රේණි, නිරීක්ෂණ සහ හරස්කඩ සැලසුම් ඇතුළුව විකල්ප ඇගයීම් ක්‍රම වඩාත් යෝග්‍ය විය හැකි බව හඳුනාගෙන ඇත. මෙය නැගී එන ක්ෂේත්‍රයක් වන අතර, එබැවින් අධ්‍යයන සැලසුම් සහ ඇගයීමේ දැඩි බවෙහි විශාල වෙනසක් ඇත. මෙම සමාලෝචන සහ අධ්‍යයන සඳහා මූලාශ්‍ර සපයා ඇත්තේ යොමුකිරීම්වල කොටසක් ලෙස ය.

[2] Kerr-Wilson, Gibbs, Fraser et al., (2020) What Works Evidence Review

[3] Jewkes, R., Willan, S., Heise, L., Washington, L., Shai, N., Kerr-Wilson, A, Christofides, N. (2020) Effective design and implementation elements in interventions to prevent violence against women and girls. What Works To Prevent VAWG? Global Programme Synthesis Product Series. Pretoria: South African Medical Research Council.

[4] Fulu, E. Kerr-Wilson, A. and Lang, J. (2014). What works to prevent violence against women and girls? Evidence Review of interventions to prevent violence against women and girls.

[5] Ibid,; Jewkes, Flood and Lang (2014) From work with men and boys to changes of social norms and reduction of inequities in gender relations: a conceptual shift in prevention of violence against women and girls. Bangkok: UNDP, Bangkok

[6] Ellsberg et al, (2015) Prevention of violence against women and girls: what does the evidence say? Lancet, 18;385(9977):1555-66

[7] Kerr-Wilson et al (2020) Ibid.

[8] Ellsberg et al (2015) Ibid.; Jewkes, R., Willan, S., Heise, L., et al. (2020). Effective design and implementation elements in interventions to prevent violence against women and girls. What Works to Prevent VAWG? Global Programme Synthesis Product Series. South African Medical Research Council, Pretoria.

[9] මුල් SASA! Activist Kit පර්යේෂණ සහ ප්‍රායෝගික දැනුම මත පදනම්ව සංශෝධනය කර ඇත. ප්‍රජාවක සියලුම ස්ථර (ප්‍රාදේශීය ක්‍රියාකාරකම්, ප්‍රජා නායකයින්, ආයතනික ශක්තිමත් කිරීම) හරහා ළඟාවන නව උපාය මාර්ග SASA Together! හි ඇතුළත් වන අතර එය 2020 පෙබරවාරි මාසයේදී නිකුත් කරන ලදී. www.raisingvoices.org/sasatogether.

[10] Abramsky, T., Devries, K., Kiss, L. et al.(2014) Findings from the SASA! Study: a cluster randomized controlled trial to assess the impact of a community mobilization intervention to prevent violence against women and reduce HIV risk in Kampala, Uganda. BMC Med 12, 122 (2014).

[11] Adolphina A. Addo-Lartey, Deda Ogum Alangea, Yandisa Sikweyiya, Esnat D. Chirwa, Dorcas Coker-Appiah, Rachel Jewkes & Richard M. K. Adanu (2019) Rural response system to prevent violence against women: methodology for a community randomised controlled trial in the central region of Ghana, Global Health Action, 12:1,

[12] The Prevention Collaborative (2019a) Study Summary: Integrating IPV and HIV Prevention: Impacts of the SHARE Intervention in Uganda

[13] Informed by combined experiences of practitioners including the Community for Understanding Scale Up (CUSP)–a group of nine organisations with robust experience in scaling social norms approaches in various contexts.

[14] See for example Cislaghi, B and Heise, L (2017) Measuring social norms. Technical Brief July 2017. STRIVE.

[15] The Community for Understanding Scale-up (CUSP) have produced guidance on how to adapt and scale different initiatives effectively and ethically.

[16] Michau, L. Letiyo, E. Musuya, T. Goldmann, L. (2019) Social norms change at scale: insights from SASA! Community for understanding scale up (CUSP), July 2018.

[17] McLean, Lyndsay, Heise, Lori L and Stern, Erin A (2019) Shifting and transforming gender-inequitable beliefs, behaviours and norms in intimate partnerships: the Indashyikirwa couples programme in Rwanda. Culture, Health and Sexuality. ISSN 1369-1058; Cislaghi, B & Heise, L (2018) Theory and practice of social norms interventions: eight common pitfalls, Globalisation and Health, 8(83).

[18] McLean et al (2019) Ibid.

[19] Heise, L. (2011). What works to prevent partner violence? An evidence overview. London: STRIVE Research Consortium; Alexander-Scott, M., Bell, E. and Holden, J. (2016). Shifting social norms to tackle violence against women and girls. London: VAWG Helpdesk.

[20] Attention also needs to be paid to fund and support trainers to build networks, membership, and standards etc.

[21] Bartel, D (2018) Training and Mentoring Community Facilitators to Lead Critical Reflection Groups for Preventing Violence Against Women. The Prevention Collaborative.

[22] CUSP (2018) Social Norms Change at Scale: CUSP's Collective Insights

[23] As promoted in the original Stepping Stones structure and principles, involving intermittent sessions when the 4 peer groups come together to share and compare and build mutual respect, collaboration, empathy and trust across the genders and generations. See Guidelines for Adapting Stepping Stones and Salamandar Trust (2019) Stepping Stones and Stepping Stones Plus.

[24] Fulu, Kerr-Wilson and Lang (2014) Ibid. ; Jewkes, Flood and Lang (2014) Ibid.

[25] CUSP (2018) Ibid; Cislaghi, B & Heise, L (2018) Ibid.

[26] Alexander-Scott et al (2016) Ibid.

[27] The Prevention Collaborative (2019b) Programme Summary: The Indashykirwa programme, Rwanda.

[28] https://www.icrw.org/research-programs/gender-equity-movement-in-schools-gems/

[29] Holden, S., Gordon-Dseagu, V., Gordon, G., Chiziza, N., Kiwia, P., Magesa, D., Manyama, W. and Welbourn, A. (2018) Building resilience to adverse childhood experiences: An assessment of the effects of the Stepping Stones with Children training programme on Tanzanian children affected by HIV and their caregivers, Health Education Journal. https://doi.org/10.1177/0017896918787217

**© UN Women 2020**

මෙම ලේඛනය **RESPECT ව්‍යුහයේ ක්‍රියාත්මක කිරීමේ මාර්ගෝපදේශයේ** කොටසකි. එය එක්සත් ජාතීන්ගේ කාන්තා ඒකකයේ අනුග්‍රහය මත Social Development Direct විසින් සංවර්ධනය කරන ලදී. එය මෙතැනින් ලබාගත හැකිය.

**Suggested citation:** UN Women and Social Development Direct (2020) Transformed Attitudes, Beliefs and Norms, RESPECT: Preventing Violence against Women Strategy Summary.